# සාමග්‍රී Unity

Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines

ISSN 3121-4266
පළමු වෙළුම, පළමු කලාපය
2025 ජූලි-දෙසැම්බර්



**National Institute of Co-operative Development**
**Polgolla, Kandy**

## කවරයේ සිතුවම

ප්‍රංශයේ කලා කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති ප්‍රංශ චිත්‍ර ශිල්පී Gustave Courbet 1865 දී සිතුවමට නගන ලද “Proudhon and His Children“ සමූහ ආලේඛ්‍ය චිත්‍රය. මෙහි පෘදොන් සිය දියණියන් සමඟ සිටිනු සිතුවමට නගා ඇත. [1]

[1] Courbet, G. (1865). *Pierre-Joseph Proudhon and his children in 1853* [Painting]. Petit Palais, Paris, France. https://en.wikipedia.org/wiki/Proudhon_and_His_Children



සාමග්‍රී Unity
BY NC ND

ISSN 3121-4266
9 773121 426004

# සාමග්‍රී Unity

**සමුපකාර අධ්‍යයනය හා ආශ්‍රිත ශික්ෂණයන් පිළිබඳ අර්ධ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය**

ISSN 3121-4266

**i වෙළුම, i වන කලාපය - 2025 ජූලි-දෙසැම්බර්**

---

**ප්‍රකාශනය**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

පොල්ගොල්ල, මහනුවර

+94 81 249 8679

+94 81 249 8680

+94 81 250 0378

Fax: +94 81 249 9741

nicd@sltnet.lk

**Technical Specifications**

Fonts:

Abhaya Libre (Unicode)

Yaldevi (Unicode)

Page Size: A4 - 8.27 x 11.67 inches

Format: Portable Document Format (PDF)

Full Journal access https://www.nicd.edu.lk/

**Submit your papers to** prabath.nicdstaff@gmail.com

මෙම ප්‍රකාශනයේ ඇතුළත් අන්තර්ගතයන් තුළ එන අදහස්, දත්ත හා අනෙකුත් සියලුම දෑ ඔස්සේ පිළිබිඹු වන්නේ එම කතුවරුන්ගේ අදහස් මිස ආයතනයේ අදහස් නොවන බව කාරුණිකව සලකන්න.


CC BY NC ND
ISSN 3121-4266

සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

# සාමග්‍රී Unity

**Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines**

**ISSN 3121-4266**

**පළමු වෙළුම, පළමු කලාපය**

**2025 ජූලි-දෙසැම්බර්**


---


**සම-විධායක සංස්කාරකවරු (Co-executive editors)**

වී.පී.කේ. පිලපිටිය (අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

පී. සක්තියවේලු (අධ්‍යක්ෂ - අධ්‍යයන හා සංවර්ධන, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

**සම-ප්‍රධාන සංස්කාරකවරු (Co-editors-in-chief)**

ප්‍රභාත් ගලගමගේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ධම්මික වීරකෝන් (ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

**සංස්කාරක මණ්ඩලය (Editorial board)**

නන්දන බණ්ඩාර හපුආරච්චි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

එච්.වී.අයි.එන් නානායක්කාර (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

කුමුදු කුසුම් පී.ආර්. රත්නසිරි (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ආර්.සී.පී. රණසිංහ (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ඩබ්ලිව්.ඩී.සී.පී. අමසේකර (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

එස්.කේ. වෙදගෙදර (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ආර්.එම්.එන්.එස්. දිසානායක (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

**සම්බන්ධීකරණ සංස්කාරක (Coordinating Editor)**

ඒ.එම්.එල්. අත්තනායක (පුස්තකාලයාධිපති, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

**භාෂා සංස්කාරණය (Language Editor)**

නාලක ජයසේන (බාහිර කථිකාචාර්ය, වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය)





CC BY NC ND



ISSN 3121-4266

# සාමග්‍රී Unity

Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines

ISSN 3121-4266

**පළමු වෙළුම, පළමු කලාපය**

**2025 ජූලි-දෙසැම්බර්**



## විමර්ශක මණ්ඩලය

ආචාර්ය සුසන්ත රස්නායක
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

ශානිකා මුදන්නායක
(කථිකාචාර්ය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය)

ප්‍රභාත් ගලගමගේ
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)





CC BY NC ND



ISSN 3121-4266

# සාමග්‍රී Unity

**සමුපකාර අධ්‍යයනය හා ආශ්‍රිත ශික්ෂණයන් පිළිබඳ අර්ධ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය**

ISSN 3121-4266

**පළමු වෙළුම, පළමු කලාපය**

2025 ජූලි-දෙසැම්බර්


---

## සංස්කාරකවරුන්ගේ සටහන

“සාමග්‍රී“ සිංහල බසින් නිකුත්වන සමුපකාර අධ්‍යයනය හා ආශ්‍රිත ශික්ෂණයන් ඔස්සේ ලියවුණු පර්යේෂණ හා සාහිත්‍යය විමර්ශන මත ප්‍රධාන වශයෙන් පදනම් වන විවරණාත්මක පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ග්‍රන්ථ විචාර ආදී ශාස්ත්‍රීය ලේඛන පෙළගැස්වෙන විමර්ශිත ශාස්ත්‍රීය වාරික ප්‍රකාශනයකි. මෙම පත්‍රිකාවන්ට අමතරව ගෝලීය දැනුම් පද්ධතියට සිංහල භාෂීය පාඨකයින් රැගෙන යාමට ක්‍රියේටිව් කොමන්ස් (Creative Commons - CC) අවසර පත්‍රය යටතේ නිකුත් කර ඇති ඉංග්‍රීසි භාෂීය විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රයන්ගේ පළවී ඇති සමුපකාර ව්‍යාපාරය හා ආශ්‍රිත පර්යේෂණ පත්‍රිකා සිංහල බසට පරිවර්තනය කර ඉදිරිපත් කිරීමටද කටයුතු කරනු ඇත. සමුපකාර ව්‍යාපාරය පිළිබඳ දැනුම් නිෂ්පාදනය පුළුල් වීමට ඉඩකඩ සැපයීම සඳහා මෙම ශාස්ත්‍රීය සංග්‍රහයද නිකුත් වන්නේ ක්‍රියේටිව් කොමන්ස් අවසර පත්‍රය යටතේයි.

ශාස්ත්‍රීය සංග්‍රහයේ පළමු කලාපය ප්‍රකාශයට පත්වන මොහොතේ ස්තූතිය පළකළ යුතු පිරිසක්ද වෙයි. ඒ අනුව මෙම ශාස්ත්‍රීය සඟරාවේ ශාස්ත්‍රීය වපසරිය පිළිබඳව උපදේශනය සැපයූ වෙළඳ වාණිජ හා සමුපකාර අමාත්‍යාංශයේ උපදේශක ආචාර්ය ශාන්ත ජයරත්න සහ ශාස්ත්‍රීය සංග්‍රහයේ නම, ආකෘතිය හා අන්තර්ගතය පිළිබඳ අදහස් ලබාදුන් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සභාපති උපාලි හේරත් යන මහත්වරුන්ට, එසේම සඟරාවට පත්‍රිකා සැපයූ ශාස්ත්‍රාලයීය හා ව්‍යවහාරික ක්ෂේත්‍රයේ බුද්ධිමතුන්ට හා එම පත්‍රිකා විමර්ශනයට ලක්කළ විමර්ශක මඬුල්ලට සංස්කාරකවරුන්ගේ ස්තූතිය හිමිවිය යුතුවෙයි.



CC BY NC ND


ISSN 3121-4266

# පටුන


සමුපකාරය, පෘදොනියානු අරාජිකවාදය සහ තිරසාරත්වය:
ප්‍රාග්ධනය කේන්ද්‍ර කරගත් පාලනයට එරෙහිව කම්කරු හිමිකාරිත්වයේ බලය............................ 9

මහජන බැංකුව හා සණස සංවර්ධන බැංකුව:
අනුපාත පාදක සංසන්දනාත්මක අධ්‍යයනයක්........................................................................... 20

මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව සහ අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතා:
ශ්‍රී ලංකාවේ වතු, ග්‍රාමීය සහ නාගරික සමාජ ආශ්‍රිත සංසන්දනාත්මක අධ්‍යයනයක්................. 40

සමාජ විද්‍යාව පුද්ගලික ආශ්වාදයක් ලෙස හා ඉන් ඔබ්බට:
පීටර්. එල්. බ-ගර්ගේ අදහස් පිළිබඳ ප්‍රතිවිමර්ශනයක්...................................................................85

කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශයේ විකුණුම් අවප්‍රමාණ වීම
හේතුවෙන් ලාභදායිත්වය අඩුවීමට බලපාන සාධක:
අලෙවිකරණ ප්‍රවේශාත්මක අධ්‍යයනයක්........................................................................... 98

විගණනයේ පරිණාමය සහ සංවර්ධනය.......................................................................................125





සාමග්‍රි Unity



cc BY NC ND



ISSN 3121-4266

සාමග්‍රී Unity
Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines
**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජූලි-දෙසැම්බර්**
**පත්‍රිකා අංක 01**

# සමුපකාරය, ප්‍රෞදොනියානු අරාජිකවාදය සහ තිරසාරත්වය: ප්‍රාග්ධනය කේන්ද්‍ර කරගත් පාලනයට එරෙහිව කම්කරු හිමිකාරිත්වයේ බලය

ජේ. ඩී. ඒ. කුමාර[2]
darshanak@kdu.ac.lk

**සාරසංක්ෂේපය**

පියර්–ජෝසෆ් ප්‍රෞදොන් (Pierre-Joseph Proudhon) (1809–1865) යනු අන්‍යෝන්‍යවාදය (Mutualism) මත පදනම් වූ අනාර්කිවාදී (අරාජිකවාදී) චින්තනය ප්‍රමුඛ කර ගත් ප්‍රංශ දාර්ශනිකයෙකි. ඔහුගේ සමාජ දර්ශනය, අධිකාරීත්වයට සහ ප්‍රාග්ධන සූරාකෑමට විරුද්ධව, සහයෝගිතාව, කම්කරු හිමිකාරත්වය සහ අන්‍යෝන්‍ය සහය මත පදනම් වූ ආර්ථික–සමාජ ව්‍යුහයක් යෝජනා කරයි. මෙම අධ්‍යයනයේදී ප්‍රෞදොන්ගේ අන්‍යෝන්‍යවාදී ආර්ථික දැක්ම, සමුපකාර ව්‍යාපාරය සහ ඔහුගේ අනාර්කිවාදී (අරාජිකවාදී) දේශපාලන සංවිධාන අදහස් විමර්ශනය කෙරේ.

ඔහු පෙන්වා දුන්නේ, කම්කරු සමුපකාර හරහා නිෂ්පාදන මාධ්‍යවල හිමිකාරත්වය ස්ථාපිත කිරීම, පොලී රහිත ණය (ජනතා බැංකු) මඟින් මුදල් පාලනය විමධ්‍යගත කිරීම සහ ස්වේච්ඡා ගිවිසුම් මත පදනම් වූ සම්මේලන පද්ධතියක් හරහා දේශපාලන බලය විසුරුවා හැරීම තුළින් සූරාකෑමෙන් තොර සාධාරණ සමාජයක් බිහි කළ හැකි බවයි.

ප්‍රෞදොන්ගේ “දේපල සොරකමකි” යන ප්‍රසිද්ධ ප්‍රකාශය පුද්ගලික දේපල සියල්ලට නොව, කම්කරුවන්ගේ ශ්‍රමයෙන් උපදින අතිරික්ත අගය අයිතිකරගන්නා සූරාකාරී හිමිකාරත්වයට එරෙහි විවේචනයක් ලෙස තේරුම් ගත යුතුය. නූතන සන්දර්භය තුළ, ඩිජිටල් ආර්ථිකයේ සූරාකෑම, වේදිකා සමුපකාර (Platform Cooperatives) සහ විමධ්‍යගත ස්වයං පාලන සංවිධාන (DAOs) වැනි නව ව්‍යුහයන් ඔහුගේ අදහස්වල නව යථාර්ථාත්මකත්වය පෙන්වයි.

**ප්‍රමුඛ පද:** අන්‍යෝන්‍යවාදය, අරාජිකවාදය, සමුපකාර, කම්කරු හිමිකාරිත්වය, ජනතා බැංකු

---

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යනාංශය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන | PhD (PGIHS – University of Peradeniya), MA (Kelaniya), MA (Kelaniya), Postgraduate Diploma (University of Sri Jayewardenepura), BSc (University of Sri Jayewardenepura)


ISSN 3121-4266
CC BY NC ND

**හැඳින්වීම**

ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු සහ දේශපාලන න්‍යාය වේදියෙකු වූ පියරේ-ජෝසෆ් ප්‍රෑදොන් (1809-1865) ප්‍රකාශ කළේ. "දේපළ යනු සොරකමකි" ("Property is theft") යනුවෙනි (Proudhon, 2011, p. 254) මෙම වාක්‍ය ඛණ්ඩයෙහි සැබෑ අර්ථය බොහෝ විට වරදවා වටහාගෙන ඇති බවක් පෙනී යන අතර ප්‍රෑදොන් සියලු ආකාරයේ දේපළවලට විරුද්ධ නොවීය. ඔහු විරුද්ධ වූයේ අනෙක් අයගේ ශ්‍රමය තුළින් පුද්ගලයන්ට ලාභ ලැබීමට ඉඩ සලසන පෞද්ගලික හිමිකාරිත්වයට පමණි. හිමිකරුවන් ශ්‍රමය නොමැති ව ලාභ ලබන විට සහ වටිනාකම නිෂ්පාදනය කළ කම්කරුවන්ට සුළු මුදලක් ගෙවන විට දී අසාධාරණයක්, කොල්ලයක් හෝ සොරකමක් සිදු වන බව ප්‍රෑදොන් විශ්වාස කළේය. දේපොළ හිමිකාරිත්වය පිළිබඳ මෙවැනි සංවිධානයක් මඟින් කම්කරුවන් විසින් නිර්මාණය කරන ලද ධනය ඒවා උපයා ගැනීම සඳහා ශ්‍රමය නොවැගිරූ අය අතට වැඩි වශයෙන් සමුච්චනය වීම ප්‍රෑදොන් ප්‍රශ්න කළේය. එබැවින් ඔහු එය " සොරකමක් " ලෙස හැඳින් වීමට පසුබට නොවීය. කෙටියෙන් කිවහොත්, ප්‍රෑදොන් විරුද්ධ වූයේ සූරාකෑමේ හිමිකාරිත්වයට මිස පුද්ගලික දේපළවලට නොවේ (Graham, 2015). පුද්ගලික දේපොළවල හිමිකාරීත්වයේ අයිතිය ප්‍රෑදොන් පැහැදිලි ලෙසින් ම හඳුනා ගෙන ඇති අතර මෙය මාක්ස්වාදයෙන් පැහැදිලි විතැන් වීමක් පෙන්නුම් කරයි. ඔහු දේපළ යනු සොරකමකැයි එක් වරක දී පැවසුව ද තවත් තැනක දී පවසන්නේ දේපළ යනු නිදහස බවයි. ඒ සම්බන්ධයෙන් මතු වූ විවාදයේ දී ඔහු පෙන්වා දුන්නේ තමා කිසිසේත් මතය වෙනස් කර නැති බවයි (Ansart, 2023). කම්කරුවන් කණ්ඩායමක ඒකාබද්ධ හා සාමූහික ශ්‍රමය මගින් නිපදවන ලද වටිනාකම, එම කම්කරුවන් සංඛ්‍යාව තනි තනිව නිපදවන වටිනාකමට වඩා බොහෝ සෙයින් වැඩි වේ. එම අතිරික්ත වටිනාකම ධනපතියෙකු විසින් අයිති කර ගැනීමේ දී නොලැබිය යුතු ආදායමක් (unearned income) තමන් සතු කර ගැනීම ප්‍රෑදොන් දුටුවේ මිනිසාගේ නිදහස අහිමි කිරීමක් ලෙසිනි (Brogan, 1934, p. 28). ධනේෂ්වර ක්‍රමය තුළ ඇති සූරාකෑමේ හා අයුතු ප්‍රයෝජන ගැනීමේ විභවය විසින් එය ස්වභාවික සහ ස්වයංසිද්ධ නිර්මාණයක් ලෙසින් ඒත්තු ගැන්වීමට කටයුතු කෙරේ. කෙසේ වෙතත්, ප්‍රෑදොන්ගේ අදහස් අතර විසංවාදයන් දැක ගැනීමට ද ලැබෙන අතර කලින් කලට එම අදහස් වෙනස් වෙමින් පරිණාමය වෙමින් පැවති බව පෙනී යයි.

**පර්යේෂණ අරමුණු (Research Objectives)**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ පියරේ - ජෝසෆ් ප්‍රුදොන්ගේ අන්‍යෝන්‍යවාදී සමුපකාර ආකෘතිය විශ්ලේෂණය කිරීම සහ නූතන ආර්ථික දේශපාලන සන්දර්භය තුළ එහි අදාළත්වය තක්සේරු කිරීමයි.

**අරමුණු**

ප්‍රෑදොන්ගේ අන්‍යෝන්‍යවාදී ආකෘතියේ මූලික මූලධර්ම විමර්ශනය කිරීම. රාජ්‍ය පාලනයෙන් හා ධනපති සූරාකෑමෙන් තොර විමධ්‍යගත ආර්ථික දැක්මක් ලෙස ඔහු යෝජනා කළ කම්කරු


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

සමුපකාර සංගම්වල හිමිකාරිත්වය සහ ජනතා බැංකු (පොලී රහිත ණය) සංකල්ප විශ්ලේෂණය කිරීම.

ප්‍රෑදොන්ගේ සමුපකාර ක්‍රමය, ධනවාදය සහ විප්ලවවාදී සමාජවාදය යන මතවාදයන්ගෙන් වෙනස් වන ආකාරය සංසන්දනය කිරීම. ප්‍රචණ්ඩ විප්ලවයකින් තොරව, සහයෝගීතාව, අධ්‍යාපනය සහ ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් ක්‍රමයෙන් සමාජ වෙනසක් ඇති කිරීමේ ප්‍රවේශයේ සුවිශේෂීත්වය විග්‍රහ කිරීම.

ප්‍රෑදොන්ගේ 'කම්කරු හිමිකාරිත්වය' සහ 'ආර්ථික ප්‍රජාතන්ත්‍ර වාදය' යන සංකල්පවල නූතන අදාළත්වය ඇගයීම. වර්තමාන ආර්ථික අසමානතාවය, ආයතනික අධිකාරය සහ නවලිබරල්වාදී සමාජයක පවතින සූරාකෑමට එරෙහිව කම්කරු සමුපකාර විකල්ප විසඳුම් සපයන ආකාරය තක්සේරු කිරීම.

ප්‍රෑදොන්ගේ සමුපකාර දැක්ම තුළින් පුද්ගල නිදහස තහවුරු වන ආකාරය සහ රාජ්‍ය බලය සංකේන්ද්‍රණය වීම සීමා වන ආකාරය විමර්ශනය කිරීම. ආර්ථිකය විමධ්‍යගත කිරීම තුළින් සමාජ නිදහස සහ සාධාරණත්වය උදාකර ගැනීමට උත්සාහ කරන ප්‍රවේශය දේශපාලන දර්ශනයක් ලෙස ඇගයීම.

**සාහිත්‍ය විමර්ශනය**

පියරේ - ජෝසෆ් ප්‍රෑදොන් ප්‍රංශ බසින් කියවන පාඨකයකුට වුවද තේරුම් ගැනීමට අපහසු සංකීර්ණ කතුවරයෙකු වන අතර ඊට හේතුව ඔහුගේ භාෂාව සහ තර්ක කිරීමේ විලාසය නිසා පමණක් නොව. ඔහුගේ චින්තනය ඉහත කී ආකාරයට විරෝධා භාසගත ආකාරයෙන් ගොඩනැගී තිබීමයි. දේශපාලන දර්ශනයක් ලෙස "අරාජිකවාදය" යන පදය ප්‍රථම වරට භාවිතා කළේ ප්‍රෑදොන් ය. ඔහුගේ මූලික යෝජනා ආර්ථික අන්‍යෝන්‍ය වාදය (Mutualism) මත පදනම් වූ අතර, එහිදී කම්කරු සමුපකාර, පොලී රහිත ණය සහ සාධාරණ හුවමාරුව කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය (Asimakopoulos, 2014, p. 11). දේශපාලන සංවිධානය සම්බන්ධයෙන් ගත් කල. මධ්‍යගත රාජ්‍යයක් වෙනුවට, ස්වේච්ඡා ගිවිසුම් මත පදනම් වූ විමධ්‍යගත ස්වයං පාලන ප්‍රජාවන්ගේ සම්මේලන පද්ධතියක් (System of Federations) ඔහු යෝජනා කළේය. ඔහුගේ මෙම අදහස් පසුකාලීනව ලිබටේරියන් සමාජ වාදයේ සහ අරාජිකවාදී ව්‍යාපාර වල අදහස් කෙරෙහි ද දැඩි ලෙස බලපෑවේය. අරාජිකවාදී චින්තනයේ පුරෝගාමියෙකු ලෙස ප්‍රෑදොන් විශ්වාස කළේ සමාජය සමුපකාර සංගම් සහ පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය එකඟතා මත රඳා පැවතිය යුතු බවයි. අරාජිකවාදීන් විශ්වාස කරන්නේ අධිකාරීන් පාදක වූ ආයතන විසින් අසමානතාව ඇති කර නිදහස සීමා කරන බැවින්, රජයන්, සංගත හෝ වෙනත් අධිකාරීන් තුළ බලය සංකේන්ද්‍රණය වී ඇති පද්ධති ප්‍රතික්ෂේප කළ යුතු බවයි (McLaughlin, 2016, p. 137). අරාජිකවාදය තුළ දී මිනිසුන් අතර සහයෝගීතාව, ස්වේච්ඡා එකඟතාව සහ ස්වයං - සංවිධානය ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රජාවන් බලහත්කාරයෙන් බලාත්මක කරන නීති වෙනුවට අන්‍යෝන්‍ය ගෞරවය. හවුල් වගකීම සහ සමාන සහභාගීත්වය තුළින් තමන්වම කළමනා කරණය කර ගනු ඇතැයි විශ්වාස කෙරේ (Osgood, 1889, p. 2).


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

එබැවින්, අරාජිකවාදය තුළ දී පාලනය හා ආධිපත්‍යය වෙනුවට නිදහස, සාධාරණත්වය සහ සහයෝගීතාව මත පදනම් වූ සමාජයක් අපේක්ෂා කෙරේ.

ප්‍රෑදොන්ගේ ප්‍රවේශය විප්ලවවාදී සමාජ වාදයෙන් වෙනස් වූ අතර ප්‍රචණ්ඩ විප්ලවයක් හෝ රාජ්‍ය පාලනයක් වෙනුවෙන් ඔහු ඉදිරිපත් නොවීය. විප්ලවවාදී සමාජවාදය තුළ දී සිදු වූයේ ධනවාදයෙන් සමාජ වාදයට මාරු වීම සඳහා විප්ලවයක අවශ්‍යතාවය අවධාරණය කිරීමයි. මෙම මතවාදය දරන්නන් විශ්වාස කරන්නේ ධනවාදයේ මූලික ගැටළු පවතින ක්‍රමයේ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ (Reforms) මගින් විසඳිය නොහැකි බවත්,ඒ වෙනුවට පවතින දේශපාලන හා ආර්ථික ව්‍යුහයන් මුළුමනින්ම පෙරලා දැමිය යුතු බවත්ය. එය ප්‍රතිසංස්කරණවාදී සමාජ වාදයට (Reformist Socialism) විරුද්ධ වන අතර, ඒ වෙනුවට කම්කරු පන්තියේ දැවැන්ත ව්‍යාපාර මගින් රාජ්‍ය බලය අත්පත් කර ගැනීම හෝ අහෝසි කිරීම තුළින් සමාජවාදී රාජ්‍යයක් හෝ අරාජිකවාදී සමාජයක් පිහිටුවීම අපේක්ෂා කරයි (Vincent, 1984, p. 232). මෙම විප්ලවය මඟින් පාලක පන්තියට (ධනපති පන්තියට) වාසි වන ආකාරයට ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන කම්කරු පන්තිය විසින් පාලනය කිරීම හෝ මුලින්ම විසුරුවා හැරීම ඉලක්ක කර ගනී. විප්ලවවාදී සමාජවාදයේ හරය වන්නේ, ධනපති පන්තිය විසින් පවත්වාගෙන යනු ලබන ආර්ථික සූරාකෑම හා පීඩනය අවසන් කිරීම සඳහා රාජ්‍යය නම් උපකරණය පෙරළා දැමීම අත්‍යවශ්‍ය බවයි. මෙම මතවාදයේ ප්‍රධාන චින්තකයින් වන කාල් මාක්ස් සහ ලෙනින් තර්ක කළේ, ධනවාදී ක්‍රමය ම අසමානතාවය ඇති කරන බැවින්, එය ක්‍රමානුකූලව වැඩිදියුණු කිරීම මඟින් සමාජවාදය කරා යොමු නොවිය හැකි බවයි (Thomas, 2008, p. 13). ඒ වෙනුවට, සැබෑ නිදහස හා සමානාත්මතාවය උදාකර ගැනීම සඳහා නිෂ්පාදන මාදිලිවල පුද්ගලික හිමිකාරිත්වය අහෝසි කර සමාජීය හිමිකාරිත්වයක් ස්ථාපිත කළ යුතුය. විප්ලවය යනු මෙම මූලික ආර්ථික හා දේශපාලන වෙනස ඇති කිරීම සඳහා වන ප්‍රධාන මෙවලම ලෙස විප්ලවවාදී සමාජ වාදය සලකයි.

මීට ප්‍රතිපක්ෂ ව ප්‍රෑදොන් විසින් අන්‍යෝන්‍යවාදී ආකෘතිය යෝජනා කළ අතර කම්කරුවන් සමුපකාර ක්‍රමයක් වෙත යොමු කිරීමට යෝජනා කළේය. ප්‍රෑදොන්ගේ සමුපකාර ක්‍රමය ඔහුගේ අරාජිකවාදී ආර්ථික දර්ශනය මත පදනම් වූ අතර රාජ්‍ය පාලනයෙන් හා ධනපති සූරාකෑමෙන් තොර සාධාරණ ආර්ථිකය මොඩලයක් ස්ථාපිත කිරීම එහි අපේක්ෂාව විය. ප්‍රෑදොන්ගේ ප්‍රධානතම යෝජනාව වූයේ නිෂ්පාදන මාදිලීන්හි හිමිකාරිත්වය තනි පුද්ගල ලාභ ලබන හිමිකරුවන්ට නොව, එහි සේවය කරන කම්කරුවන්ගේ සමුපකාර සංගම්වලට පැවරිය යුතු බවයි. මෙම සමුපකාර තුළින් කම්කරුවන්ට ඔවුන්ගේ ශ්‍රමයේ පූර්ණ වටිනාකම ලැබෙන බවට ඔහු තර්ක කළ අතර ලාභය සඳහා නොව හුවමාරුව සහ අන්‍යෝන්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වෙළෙඳ පොළ ක්‍රියාත්මක විය යුතු බව පෙන්වා දුන්නේය. සහයෝගීතාව, අධ්‍යාපනය සහ ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් සමාජ වෙනස ක්‍රමයෙන් වර්ධනය විය යුතු බව ඔහු විශ්වාස කළේය. මෙම සමුපකාර ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පදනම් වී ඇත්තේ විමධ්‍යගත ලෙස සිදු වන සංවිධානාත්මක ක්‍රියාකාරකම් මතය. එනම්, සෑම සමුපකාර ඒකකයක්ම ස්වයං පාලනයක් සහිතව ක්‍රියා කරන අතර, ඒවා අතර සම්බන්ධීකරණය සිදු වන්නේ ස්වේච්ඡා ගිවිසුම් මගිනි.


CC BY NC ND
ISSN 3121-4266

ඔහු යෝජනා කළ ජනතා බැංකු හරහා කම්කරුවන්ට පොලී රහිත ණය ලබා දීමත්, ධනවත් මූල්‍ය ආයතන වල බලපෑමෙන් තොරව ඔවුන්ට තම ව්‍යාපාර දියුණු කිරීමට අවස්ථාව සැලසීමත් මෙහි තවත් වැදගත් අංගයකි. සමූපකාර ක්‍රමය යනු ප්‍රචණ්ඩ විප්ලවයකින් තොරව ධනවාදය ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රායෝගික මාර්ගයක් බව පෲදොන් විශ්වාස කළේය. එය පාලනය හා ආධිපත්‍යය වෙනුවට නිදහස් සහයෝගීතාවය මත පදනම් වූ සාධාරණ සහ විනයගරුක සමාජයක් නිර්මාණය කිරීමේ ආර්ථික යාන්ත්‍රණය විය. ඔහුගේ ආකෘතිය තුළ දී දේශපාලන බලය අල්ලා ගැනීමට උත්සාහ නොකර, ආර්ථිකය විමධ්‍යගත කිරීම තුළින් සමාජ නිදහස සහ සාධාරණත්වය උදාකර ගැනීමට උත්සාහ කෙරේ. අධිකාරය එක් ආයතනයක් තුළ සංකේන්ද්‍රණය වන විට නිදහස අඩු වන බවට පෲදොන් තර්ක කළේය.

### ක්‍රමවේදය (Methodology)

මෙම පර්යේෂණය පදනම් වී ඇත්තේ ගුණාත්මක (Qualitative) පර්යේෂණ ප්‍රවේශයක් මත වන අතර, එය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර විශ්ලේෂණය යොදා ගනී.

### දාර්ශනික හා සංකල්පීය විශ්ලේෂණය (Philosophical and Conceptual Analysis)

පෲදොන්ගේ ප්‍රධාන කෘති, ලිපි සහ ලිපි හුවමාරු සංකල්පීය විශ්ලේෂණයට ලක් කෙරේ. ඔහුගේ අන්‍යෝන්‍ය වාදය, දේපළ, ශ්‍රමය සහ අධිකාරය පිළිබඳ සංකල්පවල නිවැරදි අර්ථ නිරූපණය සහ පරිණාමනය අවබෝධ කර ගැනීම මෙහිදී අපේක්ෂා කෙරේ.

### සංසන්දනාත්මක විශ්ලේෂණය (Comparative Analysis)

පෲදොන්ගේ අදහස් අනෙකුත් දේශපාලන ආර්ථික දර්ශන සමඟ සංසන්දනාත්මකව අධ්‍යයනය කෙරේ: උදාහරණ ලෙස විප්ලවවාදී සමාජවාදයට (මාක්ස්වාදය) හා නවලිබරල්වාදී ධනවාදයට සාපේක්ෂ ලෙස සමූපකාර ක්‍රමයේ වැදගත්කම.

### නූතන තත්ත්වය ඇගයීම (Modern Context Assessment)

පුදොන්ගේ අදහස් නූතන ලෝකයට අදාළ වන ආකාරය තක්සේරු කිරීම සඳහා සිද්ධි අධ්‍යයනය (Case Studies) උදාහරණ Mondragon Corporation වැනි සාර්ථක කම්කරු සමූපකාර ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විශ්ලේෂණය.

### සාකච්ඡාව

පෲදොන්ගේ සමූපකාර ක්‍රමය නූතන ලෝකයට ද ඉතා වැදගත් අන්තර්ඥානයන් සපයන අතර වර්තමාන ආර්ථික අසමානතාවය, ආයතනික අධිකාරය සහ මධ්‍යගත පාලනය වැනි ගැටලු සඳහා විකල්ප විසඳුම් සෙවීමේදී ඔහුගේ අදහස් පිළිබඳ සාකච්ඡාව ඉහළ වැදගත්කමක් උසුලයි. විශේෂයෙන් ඔහු විසින් ඉදිරිපත් කරන ලද සමූපකාර ක්‍රමය සහ කම්කරු හිමිකාරිත්වය (Worker Ownership) පිළිබඳ සංකල්පය යනු සූරාකෑමෙන් තොරව, ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වා ගෙන යා හැකි ව්‍යාපාර ආකෘතියක් (උදා: කම්කරු සමූපකාර) වන අතර ජනතා බැංකු


සාමගී Unity
ISSN 3121-4266
cc BY NC ND

පිළිබඳ සංකල්පය ඔස්සේ ඔහු අදහස් කළේ ධනවත් මූල්‍ය ආයතනවල බලපෑමෙන් තොරව, පොලී රහිත ණය සහ අන්‍යෝන්‍ය සහය මත පදනම් වූ ප්‍රජා මූල්‍ය පද්ධති නිර්මාණය කිරීමට හැකි අවකාශය නිර්මාණය කරයි (Vieta, 2020, p. 254). කම්කරු සමුපකාරයක් (Worker Cooperative) යනු එහි සේවය කරන සේවකයින් විසින්ම ඒකාබද්ධව හිමිකාරිත්වය දරන ක්‍රමයක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයකට හෝ කොටස් හිමියන්ට නොව, සමුපකාරයේ සියලුම සේවකයින්ට සමාගම සම්බන්ධ තීරණ ගැනීමේ බලය හිමි වේ. මෙහිදී එක් පුද්ගලයෙක් එක් ඡන්දයක් යන මූල ධර්මය ක්‍රියාත්මක වේ. ව්‍යාපාරයේ කළමනා කරණය, ලාභ බෙදා හැරීම සහ වැටුප් ව්‍යුහය වැනි වැදගත් තීරණ සාමාජිකයින්ගේ ඡන්දයෙන් තීරණය වේ. පෘදොන්ගේ අන්‍යෝන්‍යවාදී දර්ශනයට අනුව, මෙම ආකෘතිය සූරාකෑම ඉවත් කර ශ්‍රමය අගය කරන ආර්ථික සාධාරණත්වයක් ඇති කරයි (Ehrenberg, 1996, p. 56). කම්කරු සමුපකාර සංකල්පය ධනවාදී සමාගම්වලින් මූලික වශයෙන් වෙනස් වන්නේ ඒවායේ ප්‍රමුඛතාව සහ ලාභ බෙදා හැරීම සඳහා ගෙන ඇති වෙනස් ප්‍රවේශය හේතුවෙනි. ධනවාදී සමාගම්වල මූලික ඉලක්කය වන්නේ ප්‍රාග්ධනය මත ලාභය උපරිම කිරීම වන අතර, කම්කරු සමුපකාර වල ප්‍රධාන ඉලක්කය වන්නේ සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය, සුබසාධනය සහ ශ්‍රමයේ වටිනාකම උපරිම කිරීම යි (Daviddi, 1995, p. 125). සමුපකාරය ලබන අතිරික්ත ලාභය (surplus), සේවය කළ පැය ගණන හෝ දායකත්වය මත පදනම්ව සාධාරණව සාමාජිකයින් අතර නැවත බෙදා හරිනු ලැබේ. එම නිසා, කම්කරු සමුපකාර යනු ආර්ථිකය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමාජිකයින්ගේ පාලනය සහතික කරන, සැබෑ සමාජවාදී අරමුණු සහිත, ප්‍රායෝගික ව්‍යාපාරික ව්‍යුහයකි. සමූපකාර සංගම් තුළින් හවුල් අවශ්‍යතා (Shared Interests) සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ (Reciprocity) පදනම් කරගෙන සමාජය හා ආර්ථිකය සංවිධානය කිරීම කෙරෙහි පෘදොන් ඉදිරිපත් කළ වැඩපිළිවෙළ මගින් පුද්ගල නිදහස තහවුරු කිරීමට හැකි වන අතර ප්‍රජා හැඟීමක් සහ සාමූහික ගෞරවය ආරක්ෂා කෙරේ.

General Labour History of Africa: Workers, Employers and Governments, 20th-21st Centuries මැයෙන් කෘතියක් රචනා කරන ස්ටෙෆානෝ බෙලූචි සහ ඇන්ඩ්‍රන්ඩ්‍රියාස් එක්රට් පෙන්වා දෙන්නේ ප්‍රජාවන් තුළ, සාමූහික ඉඩම් හිමිකාරිත්වය (Communal Land Ownership) සහ සාමූහික ශ්‍රමය (Collective Labour) තුළින් නවලිබරල්වාදය (Neoliberalism) වැනි නූතන දේශපාලන ආර්ථික ක්‍රම මඟින් ඇති වී තිබෙන අවුල් සහගත තත්ත්වයන්ට පිළිතුරු සොයා ගත හැකි බවයි (Bellucci & Eckert, 2019). නව ලිබරල්වාදය ක්‍රියාත්මක වන සමාජයක සමුපකාර ක්‍රමය, විශේෂයෙන්ම පෘදොන්ගේ අන්‍යෝන්‍යවාදී ආකෘතිය. ඉතා වැදගත් විකල්ප ව්‍යුහයක් ලෙස ක්‍රියා කරයි. නව ලිබරල්වාදය විසින් රාජ්‍ය මැදිහත්වීම අවම කිරීම මෙන්ම වෙළෙඳ පොළ නිදහස සහ තරගකාරිත්වය අවධාරණය කරන අතර, මෙය බොහෝ විට ආර්ථික අසමානතාව, සූරාකෑම සහ කම්කරු අයිතිවාසිකම් නොසලකා හැරීම වැනි තත්කාලීන ගැටලු රැසකට මාවත විවෘත කර තිබේ. මෙවැනි පරිසරයක් තුළ දී කම්කරු සමුපකාර මගින් ලාභය සේවක සාමාජිකයන් අතර සාධාරණව බෙදී යන බවට සහතික කරයි. එමෙන්ම එක් සාමාජිකයෙක් -එක් ඡන්දයක් යන මූලධර්මය හරහා ආර්ථික තීරණ ගැනීම සෑම සේවකයෙකුටම විවෘත කිරීම මඟින් ආර්ථික


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

ප්‍රජාතන්ත්‍ර වාදය ස්ථාපිත කරයි. නව ලිබරල්වාදය තුළ ආර්ථික බලය බහුජාතික සමාගම් අත සංකේන්ද්‍රණය වන විට, සමුපකාර බලය ප්‍රජාවන් සහ කම්කරුවන් අතර විමධ්‍යගත කරයි. තවද, සමුපකාර හා අන්‍යෝන්‍ය අවබෝධය හා ගිවිසීම් මත ක්‍රියාත්මක වන ආයතන (උදා: පොලී රහිත ණය සපයන බැංකු) මගින් දැඩි තරඟකාරිත්වය වෙනුවට සහයෝගීතාව මත පදනම් වූ ආර්ථික සුසමාදර්ශයක් විවර කරයි. එබැවින්, නව ලිබරල්වාදී සමාජයක සමුපකාර ක්‍රමය යනු ආර්ථික අසාධාරණය, ඒකාධිකාරය සහ සූරාකෑම යන මිනිස් විරෝධී ක්‍රමයකට ප්‍රතිපක්ෂ ව සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ ස්වයං පාලනය ස්ථාපිත කරන ඍජු, ප්‍රායෝගික විකල්පයක් ලෙසින් නව සුසමාදර්ශයක් ලෙසින් ඉස්මතු විය හැක්කකි. සමුපකාර ක්‍රමයක දී සාධාරණ වැටුප්, ප්‍රජා සංවර්ධනය සහ පරිසරය ආරක්ෂාක කිරීම වැනි සමාජ අරමුණු සඳහා ප්‍රමුඛත්වය දීමට වැඩි ඉඩක් ඇත. ආර්ථික අර්බුද හමුවේ, සාම්ප්‍රදායික ව්‍යාපාර වලට වඩා එවැනි ක්‍රමයන් තිරසාර බව ඉතිහාසයේ සිදු කෙරුණු පරීක්ෂාවන් තුළින් ඔප්පු වී ඇත. කෙටි කාලීන ලාභය වෙනුවට දිගු කාලීන පැවැත්ම සඳහා සමුපකාර ක්‍රමයක් තුළ දී ආයෝජනය කරන බැවින් එවැනි සාර්ථකත්වයන් අත්පත් කර ගැනීමට හැකි වී තිබේ.

උදාහරණයක් ලෙස The Mondragon Corporation යනු ලොව විශාලතම කම්කරු සමුපකාර සමූහය වන අතර ස්පාඤ්ඤයේ ක්‍රියාත්මක මෙම සමුපකාරය මගින් කාර්මික නිෂ්පාදන, මූල්‍ය සේවා, සිල්ලර බඩු භාණ්ඩ සම්පාදනය පමණක් නොව අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පුරා භාණ්ඩ හා සේවා සැපයීම සිදු කෙරේ (Latinne, 2014). සේවක සාමාජිකයින් 80,000කට අධික සංඛ්‍යාවක් සිටින මෙම සමුපකාර ක්‍රමය තුළ බැංකු සහ විශ්ව විද්‍යාල ඇතුළු අනුබද්ධ ආයතන ගණනාවක් ඇත. එක්සත් රාජධානියේ John Lewis Partnership ද තවත් උදාහරණයක් වන අතර මෙහි සියලුම සේවකයින් ව්‍යාපාරයේ සම හිමිකරුවන් වන අතර, ලාභය ඔවුන් අතර ඒකාකාරීව බෙදී යයි. ඇමරිකා එක්සත් ජනපදයේ Home Care Associates (HCA) යනු සෞඛ්‍ය සේවා සපයන සමුපකාර ව්‍යාපාරයක් වන අතර, අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබල ගැන්වීම එහි දී විශේෂයෙන් සිදු වන්නකි. ඍදොනියානු සමුපකාර සංකල්පයට ඉතා සමීප ලෙසින් මෙම සමුපකාර ක්‍රියාත්මක වන අතර ඒවා මගින් නිෂ්පාදකයින්ට වෙළෙඳ පොළේ සාමූහික බලය ලබා දීම මෙන් ම සැපයුම් දාමයේ වැඩි පාලනයක් ඇති කිරීම සහතික කෙරේ. නවසීලන්තයේ පිහිටි Fonterra සමුපකාර ක්‍රමය ද ලොව විශාලතම කිරි අපනයන කරුවෙක් වන අතර එහි හිමිකාරිත්වය නවසීලන්තයේ ගොවීන් 10,000කට අධික සංඛ්‍යාවක් සතු වේ (House, 2006, p. 114). ඇමරිකා එක්සත් ජනපදයේ Sunkist Growers ද ඇමරිකානු ගොවීන් දහස් ගණනකට අයත් පලතුරු අලෙවි කිරීමේ සමුපකාරයකි. ඉන්දියාවේ AMUL (Anand Milk Union Ltd) කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙක් වන අතර එය ඉන්දියාවේ " ධවල විප්ලවය " (White Revolution) ඔස්සේ ග්‍රාමීය කිරි ගොවීන් මිලියන ගණනකගේ ආර්ථිකය සවිබල ගැන්වීමට විශාල දායකත්වයක් ලබා දුන් ව්‍යාපාරයකි (Desai, 2006, p. 197).

කැනඩාවේ පිහිටි Desjardins Group විශාලතම උතුරු ඇමරිකානු මූල්‍ය සමුපකාරය වන අතර, එය බැංකු , මූල්‍ය සේවා හා රක්ෂණ සේවා සැපයීම සිදු කරයි (Barton, Horváth, &


සාමග්‍රි Unity
ISSN 3121-4266
BY NC ND

Kipping, 2016, p. 57). ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක වන ණය සමිති ද සමිති සාමාජිකයන්ට හිමි වන අතර, සාමාන්‍යයෙන් බැංකුවලට වඩා අඩු පොලී අනුපාත යටතේ ණය සහ ඉහළ ඉතුරුම් පොලී ලබා දෙයි. මෙම ආකෘති තුළින් ගිග් ආර්ථිකය හෙවත් කෙටිකාලීන රැකියා මගින් සූරාකෑම් සිදු කිරීමට දැනටමත් ලෝකය වෙත විකල්පයක් ලබා දී ඇත. පෲදොන්ගේ විමධ්‍යගත සංවිධාන දැක්ම නූතන තාක්ෂණයට ගැලපීමක් ලෙස ද මෙම තත්ත්වය හඳුනා ගැනීමට හැකිය. ජර්මනියේ Fairmondo යනු Amazon වැනි දැවැන්ත වාණිජ ජාලයන්ට විකල්පයක් ලෙස ක්‍රියාත්මක වන අන්තර්ජාලය පාදක වූ සමුපකාරයකි. කැනඩාවේ Stocksy United ඡායාරූපකරණය සහ වීඩියෝ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සමුපකාරයක් වන අතර එහිදී සාමාජිකයින්ට ඔවුන්ගේ නිර්මාණ වලින් ඉහළ ලාභ කොටසක් හිමි වේ. මෙම ඩිජිටල් සමුපකාර මගින් තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාර තුළ ප්‍රජාතන්ත්‍රවාදය සහ සාධාරණත්වය ඇති කිරීමට අවකාශයක් නිර්මාණය වී ඇත. ඇතැම් රටවල, රජයන් විසින් ද නීති, පුහුණු වැඩසටහන් සහ මූල්‍ය සහය හරහා සමුපකාර සඳහා සහාය දැක්වීම සිදු වෙයි.

පෲදොන් විසින් සමාජ හිමිකාරිත්වය සහ කම්කරු සමුපකාර හෝ ඒ හා සමාන කම්කරු සංගම් හා කම්කරු සභා වෙනුවෙන් පෙනී සිටීමට ගත් පියවර තුළින් කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය ශක්තිමත් කිරීමට හැකි විණ. නිෂ්පාදන මාදිලි සහ ඉඩම් සමාජ අයිතියක් බවට පත් කිරීම සඳහා ඔහු විසින් ගෙන එන ලද අදහස් " දේපළ යනු කුමක්ද?"  (What Is Property?) නම් කෘතියේ දීර්ඝ වශයෙන් දැක් වේ. එහි දී ඔහු පෙන්වා දෙන්නේ ඉඩම් අපගේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයක් වන අතර එය පොදු දෙයක් වශයෙන් සැලකිය යුතු බවයි. එබැවින් එයට පුද්ගලික හිමිකම් කීම අයුක්ති සහගත වේ. 1841 දී ලුවී බ්ලැන්කි (Louis Blanqui) වෙත යැවූ ලිපියක පෲදොන් පවසන්නේ ද්‍රව්‍යමය හෝ මානසික වේවා, සියලුම ප්‍රාග්ධනය සාමූහික ශ්‍රමයේ ප්‍රතිඵලයක් වන බැවින්, සාමූහික දේපළක් වන බවයි (Vincent, 1984, p. 109). 1848 ප්‍රංශ ව්‍යවස්ථාදායක සභා මැතිවරණය වෙනුවෙන් නිකුත් කළ ප්‍රකාශනයේ පෲදොන් සටහන් කළේ සියලු දෙනාගේ ක්‍රියාකාරකම් මගින් නිපදවන ලද මෙම වටිනාකම හෝ ධනය, එය නිර්මාණය කිරීමේ හේතුව නිසාම සාමූහික ධනයක් වන අතර, එහි භාවිතය, ඉඩම් භාවිතය මෙන්, බෙදිය හැකි වුවද, දේපළක් ලෙස නොබෙදී පවතී. කෙටියෙන් පවසන්නේ නම්, ප්‍රාග්ධනයෙහි දේපළ නොබෙදිය හැකි අතර, එබැවින් පවරා දිය නොහැකි වේ. 1849 වසරේ දී පියරේ ලෙරුක්ස් (Pierre Leroux) වෙත ඔහු යැවූ ලිපියක පවසන්නේ සමුපකාර ක්‍රමය යටතේ, ධනය සම්ප්‍රේෂණය කිරීම අසමානතාවයට හේතුවක් විය නොහැකි බවයි. විශ්වීය සංගමයක් යටතේ, ඉඩම් සහ ශ්‍රම උපකරණවල හිමිකාරිත්වය සමාජ හිමිකාරිත්වයක් ලෙසින් සැලකිය යුතු බව ද එහි දී ඔහු අවධාරණය කරයි. සියලු ආකාරයේ හිමිකාරිත්වය වසම්ගත කිරීම් ප්‍රතික්ෂේප කරන බව ද ඔහු එහි දී සඳහන් කර තිබේ.

නූතන ලෝකය දෙසට පෲදොන්ගේ අදහස් ගෙන ආ විට කර්මාන්තශාලා, ඉඩම් වෙනුවට, දත්ත මධ්‍යස්ථාන, මෘදුකාංග වේදිකා (Software Platforms) සහ කෘත්‍රිම බුද්ධි ඇල්ගොරිතම (AI Algorithms) වැනි ඩිජිටල් ප්‍රාග්ධනය වෙත අපගේ අවධානය යොමු කළ යුතු වන අතර එහි දී වුව ද පෲදොන් ඉදිරිපත් කළ සංකල්ප තවමත් අදාළ වන බව පෙනී යයි. ඩිජිටල් වත්කම් සුළු


සාමග්‍රි Unity
ISSN 3121-4266
9 773121 426004
cc BY NC ND

පිරිසක් සතු වීමෙන්, බොහෝ දෙනාගේ ශ්‍රමයෙන් උත්පාදනය වූ අතිරික්ත වටිනාකම තව දුරටත් ඒකාධිකාරි ලෙස අයිති කර ගැනීමක් සිදු වේ. පෘදොන්ගේ විවේචනය, භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන කම්කරුවන්ගේ සූරා කෑමෙන් ඔබ්බට ගොස්, "ගිග් ආර්ථිකයේ" සේවකයන්, දත්ත කම්කරුවන් සහ අන්තර්ගත නිර්මාණකරුවන් සූරාකෑම දක්වා දීර්ඝ කළ හැකිය. ඩිජිටල් සමුපකාර වැනි සංකල්ප සම්බන්ධයෙන් මේ වන විටත් උගතුන්ගේ අවධානය යොමු වී ඇති අතර අන්තර්ජාල සේවා සපයන්නන් විසින්ම හිමිකාරිත්වය දරන ඩිජිටල් සමුපකාර යථාර්ථයක් ද වෙමින් පවතී. උදාහරණයක් වශයෙන් බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය පදනම් කරගත් විමධ්‍යගත ස්වයං පාලන සංවිධාන (Decentralized Autonomous Organizations - DAOs) බිහි වීම පෙන්වා දිය හැකිය (Van Kerckhoven & Chohan, 2024, p. 47). මෙහිදී තීරණ ගනු ලබන්නේ මධ්‍යගත අධිකාරියක් මගින් නොව, ගිවිසුම් (Smart Contracts) සහ සාමාජික ඡන්ද මගිනි. නූතන සමාජයේ, තනි පුද්ගලයන්ගේ දත්ත (personal data) භාවිතයෙන් බිලියන ගණනක ලාභ උපයන තාක්ෂණික සමාගම්වල ක්‍රියාවන් නව සූරාකෑමේ ආකාරයක් ලෙස දැකිය හැකි වන අතර පෘදොනියානු දර්ශනයට අනුව, පුද්ගලයන්ට තම දත්ත සහ ඔවුන්ගේම ඩිජිටල් අනන්‍යතාවය මත ඍජු පාලනයක් තිබිය යුතුය.

**නිගමනය (Conclusion)**

පියරේ - ජෝසප් පෘදොන්ගේ අන්‍යෝන්‍යවාදී සමුපකාර ආකෘතිය මධ්‍යගත අධිකාරියක් නොමැතිව, සහයෝගීතාවය සහ සාධාරණත්වය මත පදනම් වූ විමධ්‍යගත සමාජයක් නිර්මාණය කිරීමේ ප්‍රායෝගික මාර්ගයක් සපයයි. ඔහු රාජ්‍ය අධිකාරය හෝ ධනපති සූරාකෑම ප්‍රතික්ෂේප කළේ, මෙම පද්ධති තුළ බලය සහ ධනය මධ්‍යගත වීම පුද්ගල නිදහස සහ සාධාරණත්වය විනාශ කරන බැවිනි. පෘදොන්ගේ අන්‍යෝන්‍ය වාදය මගින් නිෂ්පාදන මාදිලීන්හි හිමිකාරිත්වය තනි පුද්ගල ලාභ ලබන හිමිකරුවන්ට නොව, කම්කරු සමුපකාර සංගම්වලට පැවරීම ඔස්සේ කම්කරු හිමිකාරිත්වය කෙරෙහි ඉඩ සැලසෙන අතර ඉන් සූරාකෑම ඉවත් කර ශ්‍රමයේ පූර්ණ වටිනාකම කම්කරුවන්ට ලැබෙන බව සහතික කෙරේ. ජනතා බැංකු පිළිබඳ ඔහුගේ සංකල්පය, ධනවත් මූල්‍ය ආයතනවල බලපෑමෙන් තොරව, පොලී රහිත ණය සහ අන්‍යෝන්‍ය සහය මත පදනම් වූ ප්‍රජා මූල්‍ය පද්ධති නිර්මාණය කිරීමට අවකාශය සලසයි. පෘදොන්ගේ ප්‍රවේශය විප්ලවවාදී සමාජ වාදයෙන් වෙනස් වන්නේ, ඔහු ප්‍රචණ්ඩ විප්ලවයක් වෙනුවට සහයෝගීතාව, අධ්‍යාපනය සහ ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් සමාජ වෙනස ක්‍රමයෙන් වර්ධනය විය යුතු බව විශ්වාස කළ බැවිනි. දේශපාලන බලය අල්ලා ගැනීමට උත්සාහ නොකර ආර්ථිකය විමධ්‍යගත කිරීම තුළින් සමාජ නිදහස සහ සාධාරණත්වය උදාකර ගැනීම එම දර්ශනයයි. එහි දී අධිකාරය එක් ආයතනයක් තුළ සංකේන්ද්‍රණය වන විට නිදහස අඩු වන බවට පෘදොන් කළ තර්කය අරාජිකවාදී චින්තනයේ හරය වී ඇත.

පෘදොන්ගේ සමුපකාර ක්‍රමය සහ අන්‍යෝන්‍ය වාදය නූතන ලෝකයේ ගැටලු සඳහා ද වැදගත් විසඳුම් මාලාවක් සපයයි. එය ප්‍රධාන වශයෙන් ම නවලිබරල්වාදයට විකල්පයකි. නවලිබරල්වාදය විසින් ඇති කරන ආර්ථික අසමානතාවය, ඒකාධිකාරය සහ සූරාකෑමට


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

එරෙහිව, ප්‍රෘදොන්ගේ ආකෘතිය ආර්ථික ප්‍රජාතන්ත්‍ර වාදය, සාධාරණත්වය සහ ස්වයං පාලනය ස්ථාපිත කරයි. ඩිජිටල් යුගයේ සූරාකෑම පිළිබඳ නව කියවීමක් ඒ ඔස්සේ ලැබෙන අතර ඔහුගේ 'දේපළ සොරකමකි' යන විවේචනය, ගිග් ආර්ථිකයේ සේවකයන්, දත්ත කම්කරුවන් සහ ඩිජිටල් ප්‍රාග්ධනයේ ඒකාධිකාරය දක්වා විහිදේ. ඩිජිටල් සමුපකාර සහ විමධ්‍යගත ස්වයං පාලන සංවිධාන (DAOs) වැනි නව ආකෘති, ප්‍රෘදොන්ගේ විමධ්‍යගත හා සහයෝගීතා මූලධර්ම නූතන තාක්ෂණයට ගැලපෙන ආකාරය පෙන්වා දෙයි. අවසාන වශයෙන්, ප්‍රෘදොන්ගේ සමුපකාර දැක්ම යනු පාලනය හා ආධිපත්‍යය වෙනුවට, නිදහස් සහයෝගීතාවය සහ සාමූහික ගෞරවය මත පදනම් වූ සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමේ තිරසාර හා ප්‍රායෝගික ආර්ථික යාන්ත්‍රණයකි.

**සමුද්දේශ**


Asimakopoulos, J. (2014). *Social structures of direct democracy: On the political economy of horizontalism*. Palgrave Macmillan.

Barton, D., Horváth, D., & Kipping, M. (2016). *Re-imagining capitalism: From shareholder value to sustainable business*. Palgrave Macmillan.

Bellucci, S., & Eckert, A. (Eds.). (2019). *General labour history of Africa: Workers, employers and governments, 20th–21st centuries*. Boydell & Brewer.

Brogan, D. W. (1934). *Proudhon*. Hamish Hamilton.

Daviddi, R. (1995). *Property rights and privatization in the transition to a market economy*. Ashgate.

Desai, A. H. (2006). *India guide Gujarat*. Federation of Tour Operators India.

Ehrenberg, J. (1996). *Proudhon and his age*. Humanities Press.

Graham, R. (2015). *We do not fear anarchy? We invoke it: The First International and the origins of the anarchist movement*. AK Press.

House, F. J. (2006). *Agricultural programs, terms, and laws*. Nova Science Publishers.

Latinne, A. (2014). *The Mondragon cooperatives: Workplace democracy and the promise of social transformation*. Routledge.

McLaughlin, P. (2016). *Anarchism and authority: A philosophical introduction to classical anarchism*. Ashgate.




සාමග්‍රී Unity
BY NC ND

ISSN 3121-4266

Osgood, H. L. (1889). *Socialism and anarchism*. Ginn.

Proudhon, P.-J. (2011). *Property is theft!: A Pierre-Joseph Proudhon anthology* (I. McKay, Ed.). AK Press.

Thomas, P. (2008). *Marxism and scientific socialism: From Engels to Althusser*. Routledge.

Van Kerckhoven, S., & Chohan, U. W. (2024). *Decentralized autonomous organizations: Innovation and governance in the blockchain era*. Routledge.

Vieta, M. (2020). *Workers' self-management in Argentina: Contesting neo-liberalism by occupying companies, recovering work, and rebuilding communities*. Brill.

Vincent, K. S. (1984). *Pierre-Joseph Proudhon and the rise of French republican socialism*. Oxford University Press.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

සාමග්‍රී Unity
Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines
**ISSN 3121-4266**
**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජූලි-දෙසැම්බර්**
**පත්‍රිකා අංක 02**

# මහජන බැංකුව හා සණස සංවර්ධන බැංකුව: අනුපාත පාදක සංසන්දනාත්මක අධ්‍යයනයක්

වසන්තා කුමුදුනී වර්ණකුලසූරිය[3]
wkwarnakulasooriya@gmail.com

**සාරසංක්ෂේපය**

මෙම පත්‍රිකාව මගින් 2020 සිට 2022 දක්වා කාලය තුළ මහජන බැංකුව සහ සණස සංවර්ධන බැංකුවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය අනුපාත විශ්ලේෂණය ඇසුරින් සංසන්දනය කර ඇත. ආයතනික ද්‍රවශීලතාව, ලාභදායීත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව මැනීම පත්‍රිකාවේ ප්‍රමුඛ අරමුණයි. බැංකු ද්විත්වයේ පරිමාවන් වෙනස් වුවද, ඒවායේ හිමිකාරිත්වය සහ අරමුණු අතර සමානකම් පැවතීම මෙම සංසන්දනාත්මක විශ්ලේෂණයට මෙම බැංකු ද්විත්වය තෝරා ගැනීමට පදනම සම්පාදනය කර ඇත. විශ්ලේෂණයට අනුව, ශුද්ධ පොලී අනුපාතිකය (NIR) අතින් සණස බැංකුව 5% කට ආසන්න අගයක් පවත්වා ගනිමින් ඉහළ කාර්යක්ෂමතාවක් පෙන්වූ අතර , මහජන බැංකුව ශුද්ධ ලාභ අනුපාතය (NPR) සහ කොටසක ඉපයීම (EPS) අතින් ඉදිරියෙන් සිටී. කෙසේ වෙතත්, 2022 වසරේ ආර්ථික කම්පනය හමුවේ බැංකු දෙකෙහිම ණය හානි වීමේ අවදානම (PCL) ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ. සමස්ත නිගමනයන්ට අනුව, බාහිර ණය ගැතිභාවය අවම කරගනිමින් මූල්‍ය ස්වාධීනත්වය රැකගැනීමට සණස බැංකුව සමත්ව ඇති අතර , මහජන බැංකුව වත්කම් මත ප්‍රතිලාභ (ROA) අතින් ප්‍රශස්ත මට්ටමක පවතී. එසේ වුවද, මෙම බැංකු ද්විත්වයම වත්කම් මත ප්‍රතිලාභ ලැබීමේදී ලෝක සහ දේශීය සාමාන්‍ය අගයන්ට වඩා පහළ මට්ටමක පවතින බව මෙම පත්‍රිකාව ඔස්සේ අනාවරණය වෙයි.

**ප්‍රමුඛ පද:** ශුද්ධ පොලී ආන්තිකය, ණය හානි පූර්ණ ප්‍රතිපාදන, කොටසක ඉපයීම, ප්‍රාග්ධන ව්‍යුහය, වත්කම් කළමනාකරණය

[3] සමුපකාර සංවර්ධන නිලධාරී, දකුණු පලාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | Diploma in Co-operative Development, B.Sc (Business Administration) (USJ), Master of Business Management (MBM )(UoR)


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

### හැඳින්වීම

අනුපාත යනු කළමනාකරණ ගණකාධිකරණයේ එන ප්‍රධාන සංවරකයකි. අංක ද්විත්වයක් අතර පවතින සබඳතාව ඉදිරිපත් කිරීමට අනුපාත යොදාගන්නා අතර, ඕනෑම අංක ද්විත්වයක් සංසන්දනය කිරීමේ හැකියාව ඒවා සතුය. මේ අනුව, යම් ආයතනයක හෝ ආයතන කිහිපයක මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් පිළිබඳ සංසන්දනාත්මක අදහසක් ඉදිරිපත් කර ගැනීමට අනුපාත විශ්ලේෂණය බෙහෙවින් වැදගත් වේ. අනුපාත විශ්ලේෂණය ඔස්සේ ආයතනයක ද්‍රවශීලතාවය, දීර්ඝකාලීන හෝ කෙටිකාලීන මූල්‍යමය ශක්තිමත්භාවය මෙන්ම ආයතනික කාර්යසාධනය නියාමනය කිරීමට සහ ඇගයීමට අවස්ථාව ලැබේ. මෙම පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ බැංකු දෙකක් වන මහජන බැංකුව සහ සණස සංවර්ධන බැංකුව අතර අනුපාත පදනම් කරගත් සංසන්දනාත්මක අධ්‍යයනයක් ඉදිරිපත් කරයි.

### අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනය මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණු පහත පරිදි වේ:

- මහජන බැංකුව සහ සණස සංවර්ධන බැංකුව යන ආයතන දෙකෙහි මූල්‍ය දත්ත අනුපාත ඇසුරින් සංසන්දනාත්මකව විමසා බැලීම.බැංකු දෙකෙහි ලාභදායීත්වය, ඵලදායීතාව සහ මූල්‍යමය ශක්තිමත්භාවය පරීක්ෂා කිරීම.
- එක් එක් බැංකුව අනෙකට වඩා ශක්තිමත් හෝ දුර්වල වන අවස්ථා හඳුනාගෙන එම තත්ත්වයන්ට බලපාන ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- හඳුනාගත් මූල්‍ය දුර්වලතා මකා හැරීම සඳහා ගත යුතු ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ විමසා බැලීම.

### අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා යොදාගත් ක්‍රමවේද පහත අංගයන්ගෙන් සමන්විතය:

**දත්ත මූලාශ්‍ර:** අධ්‍යයනය සඳහා මහජන බැංකුවේ සහ සණස සංවර්ධන බැංකුවේ 2020, 2021 සහ 2022 යන වර්ෂ ත්‍රිත්වයට අදාළ වාර්ෂික මූල්‍ය දත්ත සහ අනුපාතයන් ප්‍රාථමික දත්ත ලෙස භාවිතා කර ඇත.

**සංසන්දනාත්මක පදනම:** මෙහිදී අන්තර්-අස්තිත්ව සංසන්දනය (Inter-Entity comparison) මගින් බැංකු දෙක අතර පවතින වෙනස්කම් සහ සමානකම් විශ්ලේෂණය කර තිබේ.

**අනුපාත භාවිතය:** බැංකු දෙකේ කාර්යසාධනය මැන බැලීම සඳහා ශුද්ධ පොලී අනුපාතිකය (Net Interest Ratio), ශුද්ධ ලාභ අනුපාතිකය (Net Profit Ratio), ණය හිමි ස්කන්ධ අනුපාතිකය (Debt Equity Ratio), කොටසක ඉපයීම (EPS), කාර්යක්ෂමතා අනුපාතිකය


සාමග්‍රි Unity
ISSN 3121-4266
BY NC ND

(Efficiency Ratio), ණය හානි ප්‍රතිපාදන අනුපාතිකය (Provision for Credit Losses Ratio), වත්කම් මත ණය අනුපාතිකය (Loan to Asset Ratio) සහ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය (ROA/RATA) වැනි ප්‍රධාන මූල්‍ය අනුපාත ගණනය කර විශ්ලේෂණය කර ඇත.

**විශ්ලේෂණය:** ලබාගත් ප්‍රතිඵල මහ බැංකු වාර්තා සහ ජාත්‍යන්තර සාමාන්‍ය අගයන් (Benchmarks) සමඟ සසඳමින් වගු සහ ප්‍රස්ථාර ඇසුරින් නිගමන ඉදිරිපත් කර ඇත.

**අනුපාත හා කලමනාකරණ ගණකාධිකරණය**

අනුපාත කලමනාකරණ ගණකාධිකරණයේ එන ප්‍රධාන සංවරකයකි. අංක ද්විත්වයක් අතර සබඳතාව ඉදිරිපත් කිරීමට අනුපාත යොදාගැනෙයි. ඕනෑම අංක ද්විත්වයක් සංසන්දනය කිරීමට අනුපාතවලට හැකියාවක් ඇත. මේ අනුව යම් ආයතනයක හෝ කිහිපයක මූල්‍ය තත්ත්වය හා මෙහෙයුම් පිළිබඳ සංසන්දනාත්මක අදහසක් ඉදිරිපත් කර ගැනීමට අනුපාත වැදගත් වෙයි (Nayak, 2023). අනුපාත විශ්ලේෂණයේ මූලික උපකල්පනය වන්නේ සමානුපාතිකත්වයයි, එනම් අනුපාතය ගණනය කරනු ලබන විචල්‍ය දෙක අතර සමානුපාතික සම්බන්ධතාවයක් පවතින බව හෝ පැවතිය යුතු යැයි උපකල්පනය කිරීමයි (Whittington, 2007, 127). යම් ආයතනයක පෙර වසර හා ප්‍රවර්තන වසර සංසන්දනයට, ප්‍රවර්තන වසරේ සමාන්තර සංසිද්ධි සංසන්දනයට ආදී ලෙස මෙම අනුපාත කලමනාකරණ ගණකාධිකරණයේදී මෙන්ම මූල්‍ය ගණකාධිකරණයේදී පවා යොදා ගැනෙයි. මෙම අනුපාත අස්තිත්වය හා එහි පරිසරය ගැන සාමාන්‍යකරණීත ඇස්බැල්මක් අපවෙත සම්පාදනය කරයි. අනුපාත විශ්ලේෂණය (Ratio Analysis) ඔස්සේ ආයතනයක ද්‍රවශීලතාව හෝ දීර්ඝකාලීන මූල්‍යමය නුබුන්වත්කම හෝ කෙටිකාලීන මූල්‍යමය නුබුන්වත්කම ආදිය දැන ගැනීමට හැකියාව ලැබෙයි. මෙම අනුපාතවල ප්‍රාථමිකම අරමුණ වැඩිදුර විමර්ශනය සඳහා මූලික අඩිතාලමක් හඳුනා ගැනීමයි. උදාහරණයක් ලෙස කොටසක ඉපයීම ප්‍රමාණවත් නොවන මට්ටමක නොපැවතීම අස්තිත්වය පිළිබඳ තවතවත් විමර්ශනය කළ යුතු බවට සංඥාවකි (Nayak, 2023). ඇඩෙඩේජි (Adedeji, 2014, 39) පෙන්වා දෙන්නේ පහත ආකාරයට ආයතනික කාර්යයසාධනය නියාමනයට හා ඇගයුමට මෙම අනුපාත වැදගත් වන බවයි.

01. ආයතනයක සිදුකරන සාමාන්‍ය කටයුත්තක් ලෙස සහ ස්ථාවර පදනමකින් අනුපාත නිර්මාණය කිරීමෙන් ප්‍රවනතා හඳුනා ගැනීමට හා වෙනස්කම් ගවේෂණයට හැකියාව ලැබෙයි.


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

02. සම්මත ආකෘතීන්ගෙන් සකසන ලද අනුපාත යම් ආයතනයකට ඇති විට එවැනි සම්මත ආකෘතීන්ගෙන් අනුපාත සකසන තවත් ආයතනයක් සමග පහසුවෙන් සංසන්දනයට හැකියාව ලැබෙයි.

03. මූල්‍ය සාර්ථකත්වයට දායක වන සාධකවල අන්තර්-බද්ධතා (inter-locking) සහ අන්තර් පරායක්තතා (inter-dependent) දර්ශනය වීම අනුපාත ඔස්සේ සිදුවෙයි.

ඇඩෙඩේජි (Adedeji, 2014, 39-45) තවදුරටත් දක්වන්නේ අනුපාත ඔස්සේ කෙරෙන සංසන්දනයන් වර්ග තුනකට බෙදා දැක්විය හැකි බවයි.

1. අන්තර්වර්ති-අස්තිත්ව සංසන්දනය (Intra-Entity[4] comparison) හෝ පෙර වසර සමඟ සංසන්දනය

2. අන්තර්-අස්තිත්ව (Inter-Entity) සංසන්දනය හෝ සමාන ව්‍යාපාරික පදනම මත සංසන්දනය

3. කලමනාකරණය විසින් ස්ථාපිතකරනු ලබන අනුපාත පදනම්ව සංසන්දනය

මෙම අන්තර්-අස්තිත්ව සංසන්දනයන් ඔස්සේ අස්තිත්ව දෙකක් අතර ලාභදායීත්වය හා නිෂ්පාදකතාව (productivity) පරීක්ෂා කිරීමේ හැකියාව ලැබෙයි. එසේම එක් අස්තිත්වයක් අනෙකට වඩා ශක්තිමත්ද දුර්වලද යන්න පරීක්ෂා කිරීමේ අවස්ථාව හා එම දුර්වලතා හෝ ශක්තිමත් බව ගලා එන්නේ කුමන පැතිවලින්දැයි හඳුනා ගැනීමට අවස්ථාව ලැබෙයි. ඒ අනුව එම දුර්වලතා මකා හැරීමට ගතයුතු ප්‍රතිපත්ති තීන්දු සඳහා ද මෙම අනුපාත විශ්ලේෂණය සහය වෙයි.

අනුපාත ප්‍රධාන වර්ග තුනක් යටතේ හඳුනාගත හැකිය.

- මූල්‍ය තත්ත්ව අනුපාත
- ආදායම් ප්‍රකාශන අනුපාත
- අන්තර් ප්‍රකාශන අනුපාත

[4] මුල් ලේඛනයේ ඇති *Firm* යන්න වෙනුවට පර්යේෂක විසින් *අස්තිත්වය (Entity)* යන වචනය භාවිත කර ඇත.


සාමගී Unity
ISSN 3121-4266

නම්‍යතා විශ්ලේෂණ (Trend analysis), ද්‍රවශීලතාව (Liquidity position), අන්තර් අස්තිත්ව සංසන්දනය, ලාභදායත්වය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව යන ක්ෂේත්‍ර ඔස්සේ අනුපාත වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

**අනුපාත විශ්ලේෂණය: මහජන බැංකුව හා සණස සංවර්ධන බැංකුව**

මෙම අධ්‍යයනය සඳහා අප විසින් යොදාගනු ලබන්නේ මහජන බැංකුවේ හා සණස සංවර්ධන බැංකුවේ 2020, 2021 හා 2022 යන වර්ෂ ත්‍රිත්වයට අදාළ අනුපාතයි. මේ අතරින් මහජන බැංකුව පැරණි හා සමුපකාර ව්‍යාපාරයටද ඓතිහාසික සම්බන්ධයක් ඇති මුළු කොටස් අයිතියෙන් 7%ක් පමණ සමුපකාර ව්‍යාපාරයද ඉතිරි කොටස් ප්‍රමාණය රජයේ හිමිකාරිත්වයද ඇති ලංකාවේ දෙවන විශාලතම බැංකුවයි. සණස සංවර්ධන බැංකුව නව බැංකුවක් වන අතර එම බැංකුවද ආරම්භ වන්නේ සමුපකාර ව්‍යාපාරයේ එක් අංශයක් වන සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර ව්‍යාපාරයේ ප්‍රාථමික හා ද්විතීයික සමිති මගින් යෙදූ කොටස් මුදල් වලිනි. මේ අනුව බැංකු ද්විත්වයේ පරිමාව අතර වෙනස්කම් පැවතියද හිමිකාරිත්වය හා අරමුණු අතර යම් සමානකම් දැකිය හැකිය.

**ශුද්ධ පොලී අනුපාතිකය Net Interest Ratio (*Gross profit Ratio* වෙනුවට)**

දළ ලාභ අනුපාතිකය ගණනය වන්නේ දල ලාභය ශුද්ධ විකුණුම් වලින් බෙදීමෙනි. *[Gross Profit Ratio = (Gross Profit/Net Sales) X 100 ]* . කෙසේ නමුත් අප අධ්‍යයනයට යොදා ගනු ලබන්නේ බැංකු ආයතන වන නිසා බැංකු හා මූල්‍යායතන නොවන ව්‍යාපාර සඳහා අදාළ වන අනුපාතයක් වන දළ ලාභ අනුපාතය ගණනය කළ නොහැකිය. බැංකු හා මූල්‍ය ආයතන සඳහා මේ හා සමාන අනුපාතිකයක් ලෙස හඳුනා ගත හැක්කේ ශුද්ධ පොලී අනුපාතිකයයි (Net Interest Ratio). මේ අනුව එය ගණනය කිරීමට අපි කටයුතු කරමු. එහි සූත්‍රය පහතින් දැක්වෙයි.

*සූත්‍රය:*

*Net Interest Margin = [(Investment Income – Interest Expenses) / Average Earning Assets] 100*


සාමග්‍රි Unity
BY NC ND
ISSN 3121-4266

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 NIR | 2021 NIR | 2022 NIR |
| 2.97% | 3.38% | 2.70% |
| ((179717526000-118783744000)/((1873406218000+2230118665000)/2)×100) | ((197330011000-114869171000)/((2230118665000+2647640536000)/2)×100) | ((321935983000-246177918000))/((2647640536000+2972028452000)/2))×100 |
| සණස සංවර්ධන බැංකුව | | |
| 4.79% | 4.89% | 4.74% |
| ((15442002803-9314576405)/((107783624329+147818916074)/2))×100 | ((14792068260-8018419381)/((147818916074+129059724118)/2))×100 | ((23101048459-16261994676)/((129059724118+159521031879)/2))×100 |

2021 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ බැංකු වල ශුද්ධ පොලී අනුපාතිකය 3.5882 % ක් බව මහ බැංකුව මූලාශ්‍ර කර ගනිමින් ට්‍රේඩින්ග් ඉකොනොමික්ස් වෙබ් අඩවිය වාර්තා කරයි (*Sri Lanka - Bank Net Interest Margin - 2023 Data 2024 Forecast 1999-2021 Historical*, n.d.). මෙම අනුපාතය සම්බන්ධයෙන් ගත්කළ බැංකු ද්විත්වයම මහබැංකුව දක්වන සාමාන්‍ය අගයට ආසන්නව පවතින බව පෙනී යන අතර කෙසේ වෙතත් සණස සංවර්ධන බැංකුව 5% කට ආසන්න අගයක් දිගටම වාර්තා කර තිබීම විශේෂත්වයකි. මේ අනුව සණස සංවර්ධන බැංකුව ඉහළ කාර්යක්ෂමතාවක් දක්වා ඇත.

**ශුද්ධ ලාභ අනුපාතය (Net Profit Ratio)**

අයහාරයට ශුද්ධ ආදායම දක්වන අනුපාතය මෙයින් ගණනය කෙරෙයි.

*සූත්‍රය:*

*Net Profit Ratio (%) = (Net Income ÷ Revenue)×100*


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 NPR | 2021 NPR | 2022 NPR |
| 7.42% | 11.44% | 4.81% |
| (14174943000÷ 190981708000)×100 | (23720143000÷ 207249820000)×100 | (17192058000÷ 357228609000)×100 |
| සණස සංවර්ධන බැංකුව | | |
| 5.17% | 5.71% | 0.25% |
| (836287347÷1616178 7232)× 100 | (883278172÷15477595919)× 100 | (61166336÷24034136119)× 100 |

මහජන බැංකුව ඉහළ දල ලාභ අනුපාතිකයක් දක්වා ඇත. සණස සංවර්ධන බැංකුව 2022 වසර වන විට ක්ෂණික අර්බුදකාරී මට්ටමකට ගමන් කර ඇත. එම වසරේදී සාපේක්ෂව මහජන බැංකුවද අඩු අනුපාතිකයක් වාර්තා කර ඇති බවත් සණස සංවර්ධන බැංකුවට එම වසරේ එකී මූල්‍ය තත්ත්ව කම්පනය තදින් වැදී ඇති බවත් පෙනී යයි.

**බැංකු හා මූල්‍ය ආයතන සම්බන්ධව ගණනය කළ නොහැකි අනුපාත**

බැංකු හා මූල්‍ය ආයතන සම්බන්ධයෙන් අනුකූල නොවන නිසා දල ලාභ අනුපාතිකය (Gross profit Ratio) වෙනුවට (Net Interest Ratio) ඉහතින් ගණනය කර දක්වා ඇත.

පහත අනුපාත ද බැංකු හා මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගණනය කළ නොහැකි අනුපාත වන නිසා ඒ වෙනුවට බැංකු හා මූල්‍ය ආයතන සඳහා සෘජුව අදාළ ප්‍රධාන අනුපාත ඉදිරියේදී ගණනය කිරීම් වලට ලක්කර ඇත.

1. තොග පිරිවැටුම් අනුපාතය Inventory Turnover Ratio
2. ණයගැති පිරිවැටුම් අනුපාතය Debtor turnover ratio
3. සාමාන්‍ය රාශිකරන කාලය Average collection period
4. ජංගම අනුපාතය Current Ratio
5. ක්ෂණික අනුපාතය Quick Ratio
6. *Debt service Ratio (interest coverage ratio)*


සාමග්‍රි Unity
ISSN 3121-4266
CC BY NC ND

**ණය හිමි ස්කන්ධ අනුපාතය (Debt Equity Ratio)**

කොටස්කරුවන්ගේ ස්කන්ධය මත ඇති සම්පූර්ණ ණයගැතිභාවය මේ ඔස්සේ ගණනය වෙයි.

සූත්‍රය: *Debt equity Ratio= Total Debt / Total Shareholders Equity*

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 **DER** | 2021 **DER** | 2022 **DER** |
| 1,946% | 1,564% | 2,463% |
| (2826734321/145294131)× 100 | (2128135067/136077096)× 100 | (2511563440/101983598) ×100 |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| 1,201% | 946% | 1067% |
| (119143548128/ 9916175990) × 100 | (133689219543/ 14129696531) × 100 | (145861816966/ 13659214913) × 100 |

මහජන බැංකුව අරඹයා 2020 වසරේදී 1,946% ක්ව පැවති අනුපාතය 2021 දී 1,564% දක්වා අඩු වුවද, 2022 වසරේදී එය 2,463% දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇත. මෙයින් පෙනී යන්නේ බැංකුවේ කොටස් ප්‍රාග්ධනයට සාපේක්ෂව බාහිර ණය ලබා ගැනීම් ඉහළ අගයක පවතින බවයි.

සණස සංවර්ධන බැංකුවේ අනුපාතයන් නිරීක්ෂණය කිරීමේදී 2020 වසරේ 1,201% සිට 2021 දී 946% දක්වා අඩුවීමක් පෙන්නුම් කරන අතර 2022 දී එය 1,067% ක් ලෙස වාර්තා වේ.

සමස්තයක් ලෙස ගත්කළ මහජන බැංකුව සමඟ සංසන්දනය කිරීමේදී සණස සංවර්ධන බැංකුව වඩාත් ස්වාධීන මට්ටමක පවතින බව පෙනී යයි. මහජන බැංකුවට වඩා අඩු බාහිර ණය ගැතිභාවයක් සණස සංවර්ධන බැංකුව තුළ පවතින බැවින් මූල්‍යමය වශයෙන් එය වඩාත් (සාපේක්ෂ) යහපත් තත්ත්වයක් පෙන්නුම් කරයි

**සමස්ථ ප්‍රාග්ධනයට සාපේක්ෂව ණයගැති බව (Debt to total capital Ratio)**

සමස්ථ ප්‍රාග්ධනයට සංසන්දනාත්මකව ඇති ණය ගැති බව ප්‍රමාණනය කිරීම මේ ඔස්සේ සිදුකරයි.


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266

*සූත්‍රය: Debt-To-Capital Ratio= Debt / Debt + Shareholders Equity*

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 **DER** | 2021 **DER** | 2022 **DER** |
| 95% | 94% | 96% |
| (2826734321/ (145294131+2826734321)×100) | (2128135067/ (2128135067+136077096)) ×100 | (2511563440/ (2511563440+101983598)) ×100 |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| 92% | 90% | 91% |
| (119143548128/ (119143548128+9916175990)×100) | (133689219543/ (133689219543+14129696531))×100 | (145861816966)/ (145861816966+13659214913))×100 |

මෙම අනුපාතය බැංකු ද්විත්වයේම සමාන මට්ටමක ගමන් කරනු නිරීක්ෂණය වේ.

**කොටසක ඉපයීම (Earnings per share Ratio)**

කොටසකට සාපේක්ෂව ශුද්ධ ආදායමේ ඉපයීම මින් අදහස් වෙයි. අයිතිකරුවන්ට තමන් විසින් සිදුකරන ලද ආයෝජනයට සාපේක්ෂව අස්තිත්වය සිදුකරන ලද ඉපයීම ගැන අදහසක් ලබා ගැනීමටද මෙම අනුපාතය වැදගත් වෙයි.

මහජන බැංකුව සණස සංවර්ධන බැංකුවට සාපේක්ෂව විශාල වශයෙන් මේ සම්බන්ධයෙන් ඉදිරියෙන් පසුවන බව පහත වගුව අනුව පැහැදිළි වනු ඇත.

*සූත්‍රය: Earnings per share ratio = (Net Income – Preferred Dividends) / Weighted Average Number of Common Shares*



සාමගී Unity
CC BY NC ND

ISSN 3121-4266

| මහජන බැංකුව | | |
|---|---|---|
| **2020 EPS** | **2021 EPS** | **2022 EPS** |
| **903.31** | **7,521.95** | **492.94** |
| 110222016000/ (12201998000/100) | 917828636000/ (12201998000/100) | 60148268000/ (12201998000/100) |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| **10.82** | **7.83** | **0.54** |
| 836287347/ (7727941021/100) | 883278172/ (11287765221/100) | (61166336)/ (11287765221/100) |

**කාර්යක්ෂමතා අනුපාතය Efficiency Ratio**

ආයතනයක් කොතරම් කාර්යක්ෂමව සිය මෙහෙයුම් පවත්වාගෙන ගොස් ඇත්ද යන්න මැන බැලීමට භාවිත කරන අනුපාතිකයක් ලෙස මෙය හඳුනා ගත හැකිය.

සූත්‍රය: *Efficiency Ratio= Expenses[5]/Revenue*

| මහජන බැංකුව | | |
|---|---|---|
| **2020 ER** | **2021 ER** | **2022 ER** |
| 30% | 33% | 26% |
| (58023021000/ 190981708000)×100 | (70005535000/ 207249820000)×100 | (93858633000/ 357228609000)×100 |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| 37% | 42% | 30% |
| (6010923479/ 16161787232)×100 | (6575898365/ 15477595919)×100 | (7345651413/ 24034136119)×100 |

ආයතන ද්විත්වය සමාන කාර්යක්ෂමතාවක් දක්වා ඇති බව නිරීක්ෂණය වන අතර සණස සංවර්ධන බැංකුව මහජන බැංකුවට වඩා සුළු ඉහළ අගයක් දක්වයි.

[5] Non-interest expenses



සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

**ණය හානි ප්‍රතිපාදන අනුපාතිකය (Provision for Credit Losses Ratio)**

මෙම අනුපාතිකය බැංකු ආයතනයකට ඇති එක් ප්‍රධාන අවදානමක් තක්සේරු කරනු ලබන අනුපාතිකයකි. මෙම අගය ඉහළ යන්නට යන්නට බැංකුවක අවදානමද ඉහළ යයි. මේ අනුව ණය හානිවීම් හා අවදානම් සහිත ණය පිළිබඳව නිවැරදි තක්සේරුවක් බැංකුවක් විසින් සිදුකිරීම අත්‍යවශ්‍ය වෙයි. 2022 වනවිට මෙම අවධානම බැංකු ද්විත්වයේම ඉහළ ගොස් ඇතිබව පෙනී යයි.


*සූත්‍රය: Provision for Credit Losses Ratio = (Provision for Credit Losses / Net Loans and Acceptances)*100*

| මහජන බැංකුව | | |
|---|---|---|
| **2020 PCL** | **2021 PCL** | **2022 PCL** |
| 0.70% | 0.78% | 1.86% |
| (11567174000/ 1659189444000)×100 | (14472820000/ 1845829060000)×100 | (33346451000/ 1790795843000)×100 |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| 0.41% | 0.57% | 1.72% |
| (417038505/ 102662268716)×100 | (643708493/ 111891255620)×100 | (1898476112/ 110525450192)×100 |





සාමගි Unity
BY NC ND
ISSN 3121-4266




මූලාශ්‍රය: (Damyanova & Ahmad, 2021)

ලෝක මට්ටමේ තත්වය හා මෙම ශ්‍රී ලාංකේය බැංකු ද්විත්වය සලකා බැලූවිට ප්‍රස්ථාරය අනුව පෙනී යන්නේ අවදානම් ක්‍රමික වර්ධනයක්. යුරෝපීය විශාලතම බැංකු පද්ධතියද 2019-2020 වසර වල ණය අවදානමක් වාර්තා කරන බව දමියානෝවා සහ අහමඩ් (Damyanova & Ahmad, 2021) පෙන්වා දෙයි.

**වත්කම් මත ණය අනුපාතය (Loan to Asset Ratio)**


බැංකු හා මූල්‍ය ආයතන සඳහා වැඩි වශයෙන් යොදා ගන්නා මෙම වත්කම් මත ණය අනුපාතය වැදගත් කලමනාකරණ ගණකාධිකරණ අනුපාතයකි. වත්කම් මත ණය අනුපාතය ඉහළ අගයක් ගැනීම ආයතනයේ ද්‍රවශීලතා ගැටලුවක් ඇති බවට සංඥාවක් නිකුත් කරයි (Gunawardhana & Damayanthi, 2021). මෙම අනුපාතය සමඟ සහසබඳතාවක් දක්වන අනුපාතයක් වන්නේ


ISSN 3121-4266

වත්කම් මත තැන්පත් අනුපාතයයි Deposit to Asset Ratio (DAR). බැංකු පද්ධතිය සඳහා මෙම අනුපාත දෙක අන්තර්ක්‍රියාකාරිත්වයකින් යුතුව වැදගත් වෙයි.

*සූත්‍රය: Loans to Assets Ratio= (Total Loans /Total Assets)100*

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 LAR | 2021 LAR | 2022 LAR |
| 74% | 69% | 60% |
| (1659189444000/2230118665000)×100 | (1845829060000/2647640536000)×100 | \(1790795843000/2972028452000)×100 |
| සණස සංවර්ධන බැංකුව | | |
| 69% | 86% | 69% |
| (102662268716/147818916074)×100 | (111891255620/129059724118)×100 | (110525450192/159521031879)×100 |




බැංකු ද්විත්වයේම මෙම අනුපාත 2020 හා 2022 වසර ද්විත්වය තුළ ආසන්න වශයෙන් සමාන මට්ටමක පැවතියද සණස සංවර්ධන බැංකුවේ 2021 වසරේ මෙම අනුපාතය 86%ක්ව පැවතීම ද්‍රවශීලතාවය පිළිබඳ ගැටලු ඇතිවීමේ අවදානමක් දරා ඇති අතර 2022 වනවිට මෙම තත්වය මගහැර ගැනීමට බැංකුව කටයුතු කර ඇති බව පෙනෙයි.


සාමග්‍රි Unity
ISSN 3121-4266
CC BY NC ND

බංග්ලාදේශයේ AB Bank Limited, Bank Asia Limited, Dhaka Bank Limited, Eastern Bank Limited, Mercantile Bank Limited, Premier Bank Limited සහ Prime Bank Limited යන බැංකු ආයතන වල මෙම කිහිපයක දත්ත ඇසුරින් සිදුකළ පර්යේෂණ පත්‍රිකාවක දක්වන්නේ එම බැංකු ආයතන වල මෙම අනුපාතවල මධ්‍යනය 66.91%, ක්ද මධ්‍යස්ථය 66.99ක්ද, විශාලතම අගය 70.22% හා කුඩාම අගය 64.23% ක් වන බවයි. ශ්‍රී ලංකාවේ මහජන බැංකුවේ සාමාන්‍යය ඉහත ගණනය කිරීම් අනුව 67.66% කි. සණස සංවර්ධන බැංකුවේ 74.66%කි (Parvin, 2019). මේ අනුව මහජන බැංකුවේ මෙම අගය කලාපයේ සාමාන්‍යයට ආසන්නවද, සණස සංවර්ධන බැංකුවේ අගය කලාපයේ අගයට ඉහළින්ද පවතින බව පෙනෙයි. එසේම වැඩි වත්කම් ණය අනුපාතයක් යනු ද්‍රවශීලතා ගැටලු ඇතිවීමේ අවදානමක්ද වෙයි.

**වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (Return on Assets Ratio)**

වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය යම් ආයතනයක වත්කම් මත ලැබූ ලාභ අනුපාතිකය ගණනය කිරීමට යොදා ගන්නකි. එය බැංකු හා මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විශේෂිතව ගණනය කිරීමද දැකගත හැකිය.


*සූත්‍රය: Return on Assets= (Net Income / Total Assets)×100*

| **මහජන බැංකුව** | | |
|---|---|---|
| ***2020 ROA*** | ***2021 ROA*** | ***2022 ROA*** |
| **0.63%** | **0.89%** | **0.57%** |
| (14174943000/ 2230118665000)×100= 0.63% | (23720143000/ 2647640536000)×100= 0.89% | (17192058000/ 2972028452000)×100+ 0.57% |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| **0.56%** | **0.68%** | **0.03%** |
| (836287347/ 147818916074)×100= 0.56% | (883278172/ 129059724118)×100= 0.68% | (61166336/ 159521031879)×100= 0.03% |


සාමගී Unity
BY NC ND
ISSN 3121-4266
9 773121 426004

මහජන බැංකුව හා සණස සංවර්ධන බැංකුව සම්බන්ධ වත්කම් මත ප්‍රතිලාභ ලැබීම් ගණනය කළ විට දැකගත හැකි වන්නේ මහජන බැංකුව සණස සංවර්ධන බැංකුවට වඩා සාපේක්ෂ ඉහළ මට්ටමක පවතින බවයි. කෙසේ වෙතත් සණස සංවර්ධන බැංකුව 2022 වසරේදී ඉතා දුර්වල තත්ත්වය පෙන්නුම් කිරීමද කැපී පෙනෙන නිරීක්ෂණයක් ලෙස දැක්විය යුතුවෙයි.

කෙසේ වෙතත් ජාත්‍යන්තර මට්ටම හා සංසන්දනය කළ විට එහි සාමාන්‍යය 2021 වසරේදී 1.57කි. ශ්‍රී ලංකාවේ සාමාන්‍යය 2021 වසරේදී 1.36කි (TheGlobalEconomy.com, 2023). මේ අනුව මෙම බැංකු ද්විත්වයම විශ්වීය සාමාන්‍යයට හා ශ්‍රී ලංකාවේ සාමාන්‍යයට වඩා පහළින් පවතින් බව පෙනේ.




**මධ්‍යක සමස්ථ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (Return on Average Total Assets - RATA)**

යම් ආයතනයක් සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පවතින ආර්ථික සම්පත් / වත්කම් භාවිතයෙන් කෙතරම් කාර්යක්ෂමතාවකින් ඉපයුම් සිදුකර ඇත්ද යන්න හඳුනා ගැනීමට මෙම අනුපාතය භාවිත කරයි. වත්කම් මත ප්‍රතිලාභ අනුපාතයට වඩා යෙ වෙනස් වන්නේ එය ගණනය කරන්නේ වත්කම් වල සාමාන්‍යය ගණනය කිරීමත් සමඟ වීමෙනි.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

සූත්‍රය:

Return on Assets (ROA) = (Net Income ÷ Average Total Assets)×100

Average Total Assets = (Beginning + Ending Total Assets) ÷ 2

| මහජන බැංකුව | | |
|---|---|---|
| 2020 **RATA** | 2021 **RATA** | 2022 **RATA** |
| 0.69% | 0.97% | 0.61% |
| (14174943000÷ ((1873406218000+2230118665000)÷2)× 100) | (23720143000÷ ((2230118665000+2647640536000)÷2)×100) | (17192058000÷ ((2647640536000+2972028452000)÷2))×100 |
| **සණස සංවර්ධන බැංකුව** | | |
| 0.65% | 0.64% | 0.04% |
| (836287347÷ (107783624329+147818916074)÷2)) ×100 | (883278172÷ (147818916074+129059724118)/2))×100 | (61166336÷ ((129059724118+159521031879)÷2))×100 |

බැංකු ද්විත්වයම 2020 හා 2021 වර්ෂවල ආසන්න ලෙස සමාන අගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් සණස සංවර්ධන බැංකුව 2022 වසරේදී ගැටලු සහගත මට්ටමක් වාර්තා කරයි. අසල්වැසි ඉන්දියානු තත්ත්වය ගෙන බැලූ විට මෙම අනුපාතය ඉහළ අගයක් ගන්නා බව පෙනී යයි. Small Industries Development Bank of India ගතහොත් එහි 2014-2021 දක්වා දත්ත ගත්විට මෙම අගය 1ට වැඩි ප්‍රමාණයක දිගටම පැවතී ඇත (Rathore, 2023).


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

## නිගමන හා නිර්දේශ

### නිගමන

මෙතෙක් ඉදිරිපත් කළ අනුපාත සාරාංශතක කිරීමකට පහත වගුව ඔස්සේ ගමන් කර ඇත.

| අනු අංකය | අනුපාතය | මහජන බැංකුව (PB) | | | සණස සංවර්ධන බැංකුව (SDB) | | | වඩා ප්‍රශස්ත බැංකුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | *2020* | *2021* | *2022* | *2020* | *2021* | *2022* | |
| 1 | NIR | 2.97% | 3.38% | 2.70% | 4.79% | 4.89% | 4.74% | SDB |
| 2 | NPR | 7.42% | 11.44% | 4.81% | 5.17% | 5.71% | 0.25% | PB |
| 3 | DER | 1,946% | 1,564% | 2,463% | 1,201% | 946% | 1067% | SDB |
| 4 | EPS | 903.31 | 7,521.95 | 492.94 | 10.82 | 7.83 | 0.54 | PB |
| 5 | ER | 30% | 33% | 26% | 37% | 42% | 30% | SDB |
| 6 | PCL | 0.70% | 0.78% | 1.86% | 0.41% | 0.57% | 1.72% | SDB |
| 7 | LAR | 74% | 69% | 60% | 69% | 86% | 69% | PB |
| 8 | ROA | 0.63% | 0.89% | 0.57% | 0.56% | 0.68% | 0.03% | PB |
| 9 | RATA | 0.69% | 0.97% | 0.61% | 0.65% | 0.64% | 0.04% | PB |

මෙතෙක් ඉදිරිපත් කළ අනුපාත එකට කැටි කර ඉදිරිපත් කරන ඉහත වගුව ඔස්සේ මහජන බැංකුව සහ සණස සංවර්ධන බැංකුව අතර 2020-2022 කාලසීමාවේ ප්‍රධාන ක්ෂේත්‍ර 09 ක් යටතේ සංසන්දනයක් සිදු කරයි:

- **ලාභදායීත්වය (Profitability):** ශුද්ධ ලාභ අනුපාතය (NPR), වත්කම් මත ප්‍රතිලාභය (ROA) සහ මධ්‍යක වත්කම් මත ප්‍රතිලාභය (RATA) යන අංශ තුනෙන්ම **මහජන බැංකුව** වඩාත් ප්‍රශස්ත මට්ටමක පවතී. සණස බැංකුවේ ලාභදායීත්වය 2022 වසරේදී 0.25% (NPR) සහ 0.03% (ROA) වැනි ඉතා අවම මට්ටමකට ගමන් කර ඇත.
- **මෙහෙයුම් කාර්යක්ෂමතාව (Efficiency):** ශුද්ධ පොලී අනුපාතිකය (NIR) අතින් සණස බැංකුව (සාමාන්‍යය 4.8% ක් පමණ) මහජන බැංකුවට වඩා (සාමාන්‍යය 3% ක් පමණ) සැලකිය යුතු ලෙස ඉදිරියෙන් සිටී. මෙයින් පෙනී යන්නේ සණස බැංකුව සිය ආයෝජන මත ඉහළ පොලී ආන්තිකයක් පවත්වා ගන්නා බවයි.


සාමගී Unity
ISSN 3121-4266
cc BY NC ND

- **මූල්‍ය ස්ථාවරත්වය සහ අවදානම:**
    - **ණය ගැතිභාවය (DER):** සණස බැංකුව අඩු බාහිර ණය ප්‍රමාණයක් භාවිත කරමින් වඩාත් ස්වාධීන මට්ටමක් පෙන්වන අතර, මහජන බැංකුවේ ණය ගැතිභාවය 2022 වන විට 2,463% දක්වා ඉහළ ගොස් ඇත.
    - **ණය අවදානම (PCL):** බැංකු දෙකෙහිම ණය හානි පූර්ව විධිවිධාන (PCL) 2022 දී තෙගුණයකින් පමණ ඉහළ ගොස් ඇති අතර එය සමස්ත පද්ධතියේම අවදානමක් පෙන්නුම් කරයි.
- **ද්‍රවශීලතාව (Liquidity):** මහජන බැංකුව 60% - 74% අතර වත්කම් මත ණය අනුපාතයක් (LAR) පවත්වා ගනිමින් කලාපීය සාමාන්‍යයට (66.9%) ආසන්න මට්ටමක පවතී. සණස බැංකුව 2021 වසරේදී 86% ක LAR අගයක් වාර්තා කරමින් සැලකිය යුතු ද්‍රවශීලතා අවදානමකට මුහුණ දී ඇත.

නිගමන

1. **ආර්ථික කම්පනය හමුවේ ඔරොත්තු දීමේ හැකියාව:** 2022 වසරේ ඇති වූ මූල්‍ය අර්බුදය බැංකු දෙකටම බලපෑවද, මහජන බැංකුව සිය විශාලත්වය සහ රාජ්‍ය හිමිකාරිත්වය නිසා සාපේක්ෂව ස්ථාවරව පවතී. සණස බැංකුව වැනි කුඩා බැංකුවලට මෙම ආර්ථික කම්පනය (Economic Shock) එයට වඩා බලපා ඇති බව ඔවුන්ගේ ලාභදායීතාවය අවම වීමෙන් පැහැදිලි වේ.

2. **ප්‍රාග්ධන ව්‍යුහයේ වෙනස:** මහජන බැංකුව සිය වර්ධනය සඳහා විශාල වශයෙන් බාහිර ණය (External Debt) මත යැපෙන අතර, සණස බැංකුව වඩාත් ස්වයං-පෝෂිත ප්‍රාග්ධන ව්‍යුහයක් (Shareholders Equity) පවත්වා ගැනීමට උත්සාහ කරයි.
3. **ආයෝජන කාර්යක්ෂමතාව:** සණස බැංකුව සිය කුඩා වත්කම් ප්‍රමාණයෙන් උපරිම පොලී ආදායමක් (NIR) ලබා ගැනීමට සමත් වී ඇති අතර, එය ඔවුන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ ශක්තිමත් පැත්තකි.
4. **පොදු අවදානම් ප්‍රවණතාව:** ලෝක මට්ටමේ (යුරෝපා බැංකු වැනි) ප්‍රවණතාවලට හා සමානව ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළද ණය හානි වීමේ අවදානම (PCL) පිළිබඳ අනතුරු ඇඟවීම් පවතියි.

නිර්දේශ

- **සණස සංවර්ධන බැංකුව (SDB) සඳහා:**

    - 2022 දී කඩා වැටුණු ROA සහ NPR අගයන් ඉහළ නංවා ගැනීමට නම්, මෙහෙයුම් වියදම් තවදුරටත් කප්පාදු කළ යුතු අතර අක්‍රීය ණය (Non-performing loans) අයකර ගැනීම වේගවත් කළ යුතුය.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

    - 2021 වසරේදී මෙන් LAR අනුපාතය ඉහළ යාමට ඉඩ නොදී, තැන්පතු ස්කන්ධය ඉහළ නංවා ගැනීමට සහ ද්‍රවශීල වත්කම් (Liquid Assets) වැඩි කිරීමට විශේෂ වැඩපිළිවෙළක් දියත් කළ යුතුය.
- **මහජන බැංකුව සඳහා:**
    - මහජන බැංකුවේ ණය හිමි ස්කන්ධ අනුපාතය (DER) 2022 දී 2,463% වැනි ඉතා ඉහළ අගයක පවතී. මෙයට හේතුව වන්නේ එහි වත්කම් ප්‍රමාණයට සාපේක්ෂව පවතින "කොටස් හිමියන්ගේ අරමුදල්" (Shareholders' Equity) ප්‍රමාණය සාපේක්ෂව ඉතා අඩු වීමයි. අධික ලෙස ඉහළ ගොස් ඇති ණය හිමි ස්කන්ධ අනුපාතය (DER) පාලනය කිරීමටත්, කොටස් ප්‍රාග්ධනය (Equity capital) ශක්තිමත් කිරීමටත් පියවර ගැනීම සුදුසු වත්පිළිවෙත වන නමුත්, මහජන බැංකුව යනු රජයේ පූර්ණ අයිතිය (පළමුව විශාල කොටස් ප්‍රාග්ධනයක් සමුපකාර ව්‍යාපාරයට පැවත, පසුව සමුපකාර අංශයේ 7% ක කුඩා කොටසක් පමණක් වන ලෙස සැකසුණු) සහිත බැංකුවකි. එබැවින් පෞද්ගලික බැංකුවක් මෙන් කොටස් වෙළෙඳපොළ හරහා මහජනතාවට කොටස් නිකුත් කර ප්‍රාග්ධනය රැස් කිරීමට මෙයට ඇති හැකියාව සීමාවී ඇත. මෙයට විසඳුමක් වන්නේ සමුපකාර ව්‍යාපාරයට ඇති කොටස් ප්‍රමාණය පුළුල් කිරීමට අදාළ ප්‍රතිපාදන සැකසීමේ හැකියාව සොයා බැලීමයි. විශේෂයෙන් වර්තමාන සමුපකාර ව්‍යාපාරය කොටස් වෙළඳ පොළේ සිදුකර ඇති ආයෝජන වෙනුවට සැලකිය යුතු ප්‍රමාණයක් මහජන බැංකුවේ කොටස් වල ආයෝජනයට ඔ ඔස්සේ නමණ වනු ඇත.
    - සණස බැංකුවට සාපේක්ෂව මහජන බැංකුවේ පවතින අඩු ශුද්ධ පොලී අනුපාතිකය (NIR) ඉහළ නංවා ගැනීම සඳහා වඩාත් ඵලදායී ආයෝජන අවස්ථා හඳුනාගත යුතුය.
- **පොදු නිර්දේශ:**
    - බැංකු දෙකම සිය ණය නිකුත් කිරීමේ ප්‍රතිපත්ති යාවත්කාලීන කළ යුතු අතර, ණය හානි අවම කර ගැනීමට පාරිභෝගිකයාගේ ගෙවීමේ හැකියාව පිළිබඳ දැඩි විමර්ශනයක් සිදු කළ යුතුය. විශේෂයෙන්ම ආදායම් උපදවන ණය නිකුත් කිරීම ගෙවීමේ හැකියාව සමඟ ඍජු සබඳතාවක් ගොඩනැගෙන කටයුත්තකි.

**සමුද්දේශ**


Adedeji, E. A. (2014). A Tool For Measuring Organization Performance Using Ratio Analysis. *Research Journal of Finance and Accounting*, *5*. Retrieved October 29, 2023, from https://core.ac.uk/reader/234630180

Damyanova, V., & Ahmad, R. (2021, April 12). *European banks' loan loss provisions set to decline in 2021 after 2020 peak*. S&P Global. Retrieved November 2, 2023, from




සාමගී Unity


CC BY NC ND


ISSN 3121-4266
9 773121 426004

https://www.spglobal.com/marketintelligence/en/news-insights/latest-news-headlines/european-banks-loan-loss-provisions-set-to-decline-in-2021-after-2020-peak-63555182

Gunawardhana, C. S., & Damayanthi, M. (2021, May 18). *Factors Influencing the Capital Adequacy Ratios of Sri Lankan Banks- A Panel Data Analysis*. Search eLibrary :: SSRN. Retrieved November 2, 2023, from https://papers.ssrn.com/sol3/papers.cfm?සාරසංක්ෂේපය_id=3844279

Nayak, N. (2023). Ratio Analysis An Accounting Technique Of Analysis And Interpretation Of Financial Statements. *International Journal of Current Science (IJCSPUB)*, *13*(2). https://ijcspub.org/download.php?file=IJCSP23B1441.pdf

Parvin, S. (2019). Effect of Liquidity and Bank Size on the Profitability of Commercial Banks in Bangladesh. https://osf.io/5g2q4/download#:~:text=Although%20there%20were%20relationships%20among,the%20profitability%20of%20the%20banks.&text=The%20banking%20sector%20is%20the,in%20the%20economy%20of%20Bangladesh.

Rathore, M. (2023, June 9). *SIDBI: return on assets ratio 2021*. Statista. Retrieved November 2, 2023, from https://www.statista.com/statistics/1049970/india-sidb-roa-ratio/

*Sri Lanka - Bank Net Interest Margin - 2023 Data 2024 Forecast 1999-2021 Historical*. (n.d.). Trading Economics. Retrieved November 2, 2023, from https://tradingeconomics.com/sri-lanka/bank-net-interest-margin-percent-wb-data.html

TheGlobalEconomy.com. (2023). *Return on assets by country, around the world*. TheGlobalEconomy.com. Retrieved November 1, 2023, from https://www.theglobaleconomy.com/rankings/bank_return_assets/

Whittington, G. (2007). Profitability, Accounting Theory and Methodology: The Selected Essays of Geoffrey Whittington. In G. Whittington (Ed.), (pp. 127-140). Taylor & Francis. http://rbmcollege.ac.in/sites/default/files/files/reading%20material/Profitability%2C%20Accounting%20Theory%20and%20Methodology%2C%20The%20Selected%20Essays%20of%20Geoffrey%20Whittington.pdf#page=139


සාමගී Unity
ISSN 3121-4266

සාමග්‍රී Unity
Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines
**ISSN 3121-4266**
**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 03

# මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව සහ අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතා: ශ්‍රී ලංකාවේ වතු, ග්‍රාමීය සහ නාගරික සමාජ ආශ්‍රිත සංසන්දනාත්මක අධ්‍යයනයක්

ඕ. ඒ. වයි චාමත්‍යා[6]
yasasi.chamathya@gmail.com
සමිත උදයංග[7]
senithsrisami@gmail.com
ටී. විජේසුන්දර[8]
wthilak@gmail.com

**සාරසංක්ෂේපය**

මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව, පාසල් අධ්‍යාපන ක්‍රමයට අනුගත විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතා කෙරෙහි කරනු ලබන බලපෑම ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, නාගරික සහ වතු යන සමාජ ක්ෂේත්‍ර ඇසුරෙන් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙහි මූලික අභිමතාර්ථය යි. සමාජය තුළ නාගරික, ග්‍රාමීය, වතු වශයෙන් ආර්ථික සහ සමාජ ව්‍යුහය සකස් වී තිබෙන අතර එම සමාජ ව්‍යුහයන් අභ්‍යන්තරයේ ආර්ථික හා සමාජ ප්‍රාග්ධන හැකියාවෙන් යුක්ත පිරිස් මෙන්ම අවම හැකියාවක් පවතින පිරිස් ද හඳුනා ගැනීමට හැකිවේ. එබැවින් සමාජ ක්‍රමයේ ක්ෂේත්‍ර විභේදනයට සාපේක්ෂව ආභ්‍යන්තරිකව නිලීන පන්ති ක්‍රමයක් ද සකස් වී ඇත. අධ්‍යාපනය සම්බන්ධ ප්‍රවණතා ද ඒ අනුව සකස් වන බවක් පෙනේ. මෙම අධ්‍යයනයෙහි මූලික අවධානයක් යොමු වන විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතා අයත් වන්නේ විසිඑක්වන සියවසේ අධ්‍යාපන කුසලතාවන්ට ය. විසිඑක්වන සියවසට සරිලන කුසලතා සපුරා ගැනීම කෙරෙහි ලෝකයේ බොහෝ රටවල් අවධානය යොමු කරයි. ඒ අනුව යමින් උක්ත පර්යේෂණ ගැටළුව අධ්‍යයනය කිරීම සඳහා

[6] පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය [B.A (sp), M.A, MSW, M.Phil(reading)]
[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලය [M.Phil, MA, BIT, BA (sp)]
[8] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලය [BA, MA, DL (Wuhan)]


CC BY NC ND
ISSN 3121-4266

අධ්‍යයන සැලැස්ම වශයෙන් ව්‍යුහගත ඒකක සහිත කේවල සිද්ධි අධ්‍යයන සැලැස්ම භාවිත කරනු ලැබිණි. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගන්නා ලදි. ග්‍රාමීය, නාගරික සහ වතු පවුල් නියෝජනය වන පරිදි සමස්ත පවුල් ඒකක 50ක් ඇසුරින් අධ්‍යයනය සිදු කරන ලදී. මධ්‍යම පංතියෙහි ආදායම ප්‍රධාන සාධකයක් ලෙස හඳුනා ගැනෙන අතර අධ්‍යාපනික තත්ත්වය, වෘත්තීය මාර්ග සමාජ වටිනාකම් වලින් යුත් ලක්ෂණ කිහිපයක් මෙයට අයත් වේ. ආදායම් වියදම් රටාව, උසස් ජීවන අපේක්ෂාවන්, අධ්‍යාපන අපේක්ෂාව හා වෘත්තිය ස්ථායිතාව, අධ්‍යාපනය සම්බන්ධ තරගකාරී ක්‍රමය, සංකේත පරිභෝජනය හා ජීවන ප්‍රකාරය මධ්‍යම පංතිය සතු විශේෂ ලක්ෂණ වේ. එමෙන්ම අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතාව කෙරෙහි සමාජ ප්‍රාග්ධනය ඍජුව ම බලපෑම් කරනු ලැබුව ද, එහි යම් යම් විවිධතා සමාජ ක්ෂේත්‍ර අනුව දැකිය හැකි ය. තාක්ෂණික සම්පත් භාවිතය, තාක්ෂණික සම්පත් භාවිතය සඳහා ගුරු පුහුණුව ලබා ලබාදීම, දෙමව්පියන් හා පාසල අතර පවතින සම්බන්ධතාව මත සමාජ ප්‍රාග්ධනය භාවිතයෙන් දරුවන්ට තාක්ෂණික සම්පත් හා මාර්ගෝපදේශ ලබාදීමට වැඩි හැකියාවක් පවතින බව ද හඳුනාගැනීමට හැකි වේ. විශේෂයෙන් ම සමාජ ප්‍රාග්ධන හැකියාව හුදෙක් නාගරික, වතු හෝ ග්‍රාමීය වශයෙන් බෙදා වෙන් කොට ඉස්මතු වන්නක් නොවන අතර, ක්ෂේත්‍ර අභ්‍යන්තර වශයෙන් සමාජ ප්‍රාග්ධන හැකියාව ගොඩ නැගෙන බව පෙනී යයි. මෙය ළමයින්ගේ තාක්ෂණික සාක්ෂරතාව සමග සමීපව සම්බන්ධ වී ඇත.

**ප්‍රමුඛ පද:** අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතාව, මධ්‍යම පන්තිය, විසිඑක්වන සියවසේ කුසලතා, සමාජ ප්‍රාග්ධනය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, නාගරික සහ වතු ක්ෂේත්‍රයන්හි මධ්‍යම පාන්තික පවුල්වල ළමයින් විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතා සාක්ෂාත් කර ගැනීමේදී සමාජ ප්‍රාග්ධනය කවර ආකාරයෙන් බලපෑම් කරන්නේද යන්න මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කරනු ලැබීය. විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතා අයත් වන්නේ විසිඑක්වන සියවසේ අධ්‍යාපන කුසලතාවලට ය. සමාජයක් සැලකූ විට ග්‍රාමීය, නාගරික හා වතු ලෙස ආර්ථික ව්‍යුහය සකස් වී පවතී. මෙලෙස ආර්ථික ව්‍යුහය තුළ වෙනස්කම් පැවතියද එම අංශයන් අධ්‍යයනය කිරීමේදී එහි අභ්‍යන්තරයේ ආර්ථික හා සමාජ ප්‍රාග්ධන හැකියාවෙන් යුක්ත පිරිස් මෙන්ම ආර්ථික හා සමාජ ප්‍රාග්ධන හැකියාව අවම මට්ටමක පවතින පිරිස් ද හඳුනාගත හැකි අතර එමගින් සුවිශේෂී වූ සමාජ පංතියක් ගොඩ නැගේ. එම නිසා මෙම ආර්ථික ව්‍යුහය පොදුකරණය කිරීමක් සිදු කළ නොහැකි බව පැහැදිලි වේ. මෙහිදී මධ්‍යම පාන්තික පවුල් යනුවෙන් අදහස් කරනු ලබන්නේ රජයේ හෝ පුද්ගලික අංශයේ සේවය කරනු ලබන හා ස්ථිර ආදායමක් සහිත පවුල් ඒකක වේ. සියල්ලන් ඇතුළත් කරගත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය හා සියලු දෙනාටම ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීම යන අභිමතාර්ථය අධ්‍යාපනය සම්බන්ධව ඉදිරිපත් කර ඇති තිරසාර සංවර්ධන ඉලක්කයකි. එහිදි විසිඑක්වන සියවසට සරිලන කුසලතා සපුරා ගැනීම කෙරෙහි ලෝකයේ බොහෝ රටවල් අවධානය යොමු කරනු ලබයි.


BY NC ND
ISSN 3121-4266
9 773121 426004

සංවර්ධනය පිළිබඳව වරින් වර ලෝකයට ඉදිරිපත් කරන සංකල්ප අනුව අධ්‍යාපනයේ වෙනස්කම් සිදු කරයි. එම සංකල්පවලට අනුකූල වන ලෙස අධ්‍යාපනයේ සෑම සංරචයකම, ඉගැන්වීමේ ක්‍රම සහ ඇගයීම් ක්‍රමවල ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහගතකිරීම් සිදු කරයි (Athukorala, 2016). විශේෂයෙන්ම සමකාලීන අධ්‍යාපනය තුළ පින්ලන්තය, ජපානය, සිංගප්පූරුව, ස්වීඩනය, නෝර්වේ යන රටවල ගෝලීය සංවර්ධන ඉලක්කවලට සමගාමීව අධ්‍යාපන ප්‍රවණතා හඳුනාගත හැකි ය (Trilling & Fadel) 2009). සමාජයක් සංවර්ධනය කිරීම කෙරෙහි අධ්‍යාපනය සුවිශේෂී වූ කාර්යභාරයක් සිදු කරනු ලබයි. පුද්ගල වශයෙන් පමණක් නොව රටක් වශයෙන් සැලකීමේදී ද අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සලකනු ලබයි. රටක සංවර්ධනය දිගුකාලීනව සැලසුම් කරන්නේ නම් ඒ රටේ පුරවැසියන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. අධ්‍යාපනය සඳහා යෙදෙන Education නැමති ඉංග්‍රීසි වචනය සැකසී ඇත්තේ ලතින් භාෂාවේ එන Bring Up – ඇති දැඩි කරනවා, Bring Forth – බිහි කිරීම යන යෙදුම් එකට එකතු වීමෙනි (සේනාධීර, 2012). අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවිධ දාර්ශනික අදහස් මගින් අධ්‍යාපනයේ අර්ථය නිවැරදිව අවබෝධ කර ගැනීමට අවස්ථාව ලැබේ. පීටර් වර්ස්ලි විසින් අධ්‍යාපනය නිර්වචනය කරනු ලබන්නේ 'අපගේ සමාජීය හා ශිල්පීය කුසලතාවන්ගෙන් සුවිශාල කොටස සම්පූර්ණ කරගනු ලබන්නේ අධ්‍යාපනය නමින් හඳුන්වනු ලබන සැලසුම් සහගත උපදේශන ක්‍රියාවලිය මාර්ගයෙනි' යනුවෙනි (Killen, 2002). එමෙන්ම අධ්‍යාපනය සම්බන්ධව ඉදිරිපත් වී ඇති ජෝන් ඩුවීගේ නිර්වචනයට අනුව 'අධ්‍යාපනය යනු සමාජයක ජීවත් වීමේ ක්‍රියාවලිය අවබෝධ කර දීමයි' (සේනාධීර, 2012). ඉහතින් දක්වන ලද නිර්වචන විමසීමෙන් පැහැදිලි වන්නේ අධ්‍යාපනය පිළිබඳ ස්ථිර නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත් වී නොමැති බවත් එය ප්‍රාදේශික විභේදනයකින් යුතුව කාලයෙන් කාලයට, සමාජයෙන් සමාජයට වෙනස් වන්නක් බවත් ය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ විකාශනය දෙස බලන විට 1947 දී නිදහස් අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. මෙයට පෙර යටත්විජිත පාලන කාලයෙහි පැවති යම් යම් අධ්‍යාපන මැදිහත්වීම් පැවති අතර, මුල් කාලීනව ආගම් පාදක කොටගත් අධ්‍යාපන ක්‍රමයක් පැවති බව පෙනේ. 1947 න් පසුව ප්‍රාථමික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාලයේ පළමු උපාධිය දක්වා නිදහස් අධ්‍යාපනය ලබාදීම මෙරට අධ්‍යාපන ඉතිහාසයට තිරසාර බලපෑමක් ඇති කළ සංසිද්ධියකි. ප්‍රාථමික පාසල්වල ඉගැන්වීම මව් භාෂාවෙන් සිදු කිරීම, මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ කිරීම, විෂයමාලා ස්ථාපිත කිරීම සහ ශිෂ්‍යාධාර වැනි ශිෂ්‍ය සුබසාධන අවස්ථා ස්ථාපිත කිරීම, දරිද්‍රතාවය ඇති පවුල්වල සිසුන්ට හා පාසල් සිසුන් සඳහා නොමිලේ දිවා ආහාරය ලබා දීම නිදහස් අධ්‍යාපනය ස්ථාපිත වීම සමඟ සිදු වූ වැදගත් සිදුවීම් මාලාවකි (Devapriya, 2019). මානව සංහතියේ ප්‍රගමනය හා සමාජ සංවර්ධනය සඳහා අධ්‍යාපනයෙන් කළ හැකි සේවාව අති මහත් බැව් පිළිගැනීමත් සමඟ අධ්‍යාපනය හා ජාතික සංවර්ධනය අතර ඇති සම්බන්ධය විශේෂයෙන් අවධාරණය කරනු ලැබිණ. ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම මගින් විධිමත් හා නිදහස් අධ්‍යාපන ක්‍රමයක් සඳහා අවශ්‍ය පසුබිම සකස් වී තිබිණ.


සාමග්‍රි Unity
ISSN 3121-4266
CC BY NC ND

මානව ප්‍රාග්ධනය යන්නෙන් විසිඑක්වන සියවසේ දී අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රමිකයාගේ කුසලතා වර්ධනය කිරීමයි. විසිඑක්වන සියවස වන විට නූතන සමාජය තුළ අධ්‍යාපනය ලබා දෙන ප්‍රධාන ආයතන වන පාසල හා විශ්වවිද්‍යාලවලට ද පවත්නා දැනුම, කුසලතාවලට අනුවර්තනය කිරීම අභියෝගයක්ව ඇත. විසිවන සියවසෙහි අධ්‍යාපනය කුසලතා කිහිපයක් මේ අනුව හඳුන්වා දෙනු ලැබිණ. මෙහිදී ප්‍රධාන වශයෙන්ම කොටස් තුනකට බෙදා විසිඑක්වන සියවසේ අධ්‍යාපන කුසලතා හඳුනා ගනී. එය ඉගෙනුම් හා නව්‍යකරණ කුසලතා (Learning and Innovation Skills), තාක්ෂණික සාක්ෂරතාවය (Digital Literacy Skills), වෘත්තීය හා ජීවන කුසලතා (Career and Life Skills) ලෙස වර්ගීකරණය කළ හැකිය (UNESCO, 2017). එය පහත පරිදි වේ.

1. ඉගෙනුම් හා නව්‍යකරණ කුසලතා - Learning and Innovation Skills
2. තාක්ෂණික සාක්ෂරතාවය - Digital Literacy Skills
3. වෘත්තීය හා ජීවන කුසලතා - Career and Life Skills

අධ්‍යාපනය දිගු කලක් තිස්සේ මූලික මානව අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත. අර්ථාන්විත ජීවිතයක් ගතකිරීම හා ඵලදායක මිනිසෙක් ගොඩනැගීම සඳහා මෙන්ම පුද්ගලයාට ආර්ථික හා සමාජීය වශයෙන් වැඩි දියුණු වීම සඳහා තීරණාත්මක අවශ්‍යතාවක් ලෙස අධ්‍යාපනය යන්න හඳුනාගත හැකි වේ. ලෝකයේ සෑම රටක්ම වර්තමානය වන විට මූලිකත්වය දෙන සංකල්පයක් ලෙස අධ්‍යාපනයේ සම අවස්ථා සැපයීම හඳුනා ගත හැකිය. මෙහිදී සම්පත්වලින් පොහොසත් සංවර්ධිත රටවල් තම සම්පත් භාවිත කර සම අධ්‍යාපන අවස්ථා සැපයීමේ අරමුණු සාක්ෂාත් කරගැනීමට වඩා පහසු වන අතර සංවර්ධනය වෙමින් පවතින සහ ඌන සංවර්ධිත රටවල සම අධ්‍යාපන අවස්ථා සැපයීම තවදුරටත් අපේක්ෂාවක් පමණක් වී ඇත. මෙම හේතු නිසා අධ්‍යාපනයේ අසමානතාවක්, විෂමතාවක් නිර්මාණය වී ඇත. අධ්‍යාපන අසමානතාව අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ වෙනස්කම්වලට සම්බන්ධ වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අඩු වැඩි වශයෙන් මෙම අසමානතාව ක්‍රියාත්මක වේ. අධ්‍යාපනයේ සම අවස්ථා සැපයීමට අපොහොසත් වීම ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය මුහුණ දී ඇති ප්‍රධාන ගැටළුවකි. ගුණාත්මක අධ්‍යාපනය හා එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ඉගෙනුම් ඵලය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, උපන් ස්ථානය, ජනවාර්ගිකත්වය, ආගම, ධනය, බලය වැනි පුද්ගලයාගේ පාලනයෙන් ඔබ්බෙහි පවත්නා වූ පුද්ගල තත්වයන්ගේ බලපෑමට ලක් නොවිය යුතු ය (Sarwa, 2018).

අධ්‍යාපනය සම්බන්ධව සිදුකරන ලද බොහෝ අධ්‍යයනයන්වල නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ ආර්ථික සාධකය මූලික කොටගෙන විග්‍රහයට භාජනය කොට ඇත. මධ්‍යම පන්තිය සම්බන්ධව නිර්වචනය කිරීමේදී මාක්ස්වාදී විග්‍රහයන්ට අමතරව වෙනත් පර්යාවලෝක ආශ්‍රිත නිර්වචනද සඳහන් වේ. පවුල්වල ආදායම් මට්ටම පදනම් කරගෙන ආර්ථික විද්‍යාත්මක විග්‍රහයන් ද මධ්‍යම පන්තිය අර්ථකථනය කිරීමේදී සිදු කරනු ලබයි. සමාජ විද්‍යාත්මක විග්‍රහයන්ට අනුව සමාජය බෙදෙන්නේ පන්ති වශයෙන් නොව සමාජ ස්ථර වශයෙනි. සමාජ


සාමග්‍රී Unity ISSN 3121-4266
CC BY NC ND

ස්ථරයන් අතරින් ආදායම, ප්‍රදේශය, ජන වර්ගය, ආගම, අධ්‍යාපනය, රැකියාව, සමාජ පිළිගැනීම හා සමාජබලය අනුව බෙදා වෙන් කිරීමක් සිදු කරනු ලබයි. එක් එක් සමාජ ස්ථරයන් තුළ එයට ආවේණික වූ සමාජ සංස්කෘතික හා දේශපාලන හැසිරීම් දක්නට ඇත. සමාජ ස්ථරයක් හඳුනාගැනීමේදී ආදායම යනු එහි එක් නිර්ණායකයක් පමණි. යම් පුද්ගලයෙක් මධ්‍යම පන්තියට ඇතුළත් කිරීමේදී ඔහුගේ ආර්ථික වටිනාකම පමණක් නොව සමාජීය වටිනාකම්ද සැලකිල්ලට ගත යුතුය. එම පර්යේෂණ මගින් ලබාගන්නා දත්ත මත පිහිටමින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

මේ අනුව මෙම පර්යේෂණයෙහි මූලික වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ආර්ථික නිර්ණායක අනුව වර්ග කරන ලද සමාජ ක්ෂේත්‍ර තුනක් ආශ්‍රය කොටගෙන, ඒවායේ සමාජ ප්‍රාග්ධන හැකියාව අධ්‍යාපනික තාක්‍ෂණික සාක්ෂරතා කුසලතා කෙරෙහි සිදු කරනු ලබන බලපෑම කෙරෙහි ය. මූලික වශයෙන් එහි හඳුනා ගනු ලැබුවේ ආර්ථිකමය වශයෙන් හඳුනාගනු ලබන සමාජ වර්ගීකරණයට වඩා සමාජ ප්‍රාග්ධන හැකියාව අනුව සමාජ පන්තියේ ව්‍යුහීය ස්වභාවය හඳුනා ගැනිම වැදගත් වන බව ය. මේ නිසා ආර්ථිකමය හැකියාවක් නොමැති අවස්ථාවක් තුළ වුවත් ඇතැම් සමාජ කණ්ඩායම් අතර ඉහළ තාක්‍ෂණික සාක්‍ෂරතාවක් අයත් කර ගැනීමට හැකි වී තිබෙන්නේ සමාජ ප්‍රාග්ධන හැකියාව ශක්තිමත් වීම නිසා බව මූලික වශයෙන් පෙන්වා දෙනු ලබයි.

**සාහිත්‍ය විමර්ශනය**

මධ්‍යම පන්තිය යනු සමාජය සම්පත් බෙදා හැරීමේ ව්‍යුහය තුළ අඩු ආදායම් පංතිය හා ඉහළ ආදායම් පංතිය අතර මධ්‍යයේ පිහිටි සමාජ ආර්ථික ලක්ෂණ මත හඳුනා ගත හැකි වර්ගීකරණාත්මක කාණ්ඩයකි. මෙම පංතියේ නියත පුද්ගලයන් සාපේක්ෂව ස්ථාවර ආදායමක් වෘත්තීය ප්‍රවීණත්වයක් ලබාගනු ලබයි. මධ්‍යම පංතියට අයත් ජන කොටස්වලට සාමාන්‍යයෙන් උසස් අධ්‍යාපනික පසුබිමක්, දෛනික පරිභෝජන අවශ්‍යතා පියවීමට ගැළපෙන ආර්ථික හැකියාවක් සහ සම්පත් සුරක්ෂිතව භාවිත කිරීමට හා කළමනාකරණය කර ගැනීමට හැකියාවක් ඇත.

මධ්‍යම පන්තියට අයත් පුද්ගලයන් මධ්‍යම හෝ මධ්‍යම මට්ටමට වඩා වැඩි ආදායමක් ලබයි. මෙම අධ්‍යයනයේදී මධ්‍යම පංතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ රජයේ හෝ පුද්ගලික අංශය සේවය කරනු ලබන ස්ථිර ආදායමක් සහිත පිරිස් වේ. මධ්‍යම පාන්තිකයින්ගේ ආදායම් මට්ටම සාමාන්‍යයෙන් ඉහළ වන අතර රජය හෝ පුද්ගලික අංශයේ ස්ථාවර වෘත්තීන්හි නියුක්ත වීම පුළුල් වශයෙන් දක්නට ලැබේ (Gilbert, 2015). මධ්‍යම පන්තියේ පුද්ගලයන්ට මූලික අවශ්‍යතා සඳහා පමණක් නොව අධ්‍යාපනය සෞඛ්‍ය සේවා, තාක්ෂණික උපකරණ හා විනෝද කටයුතු සඳහාද වියදම් කිරීමට හැකිවීම තුළින් ඔවුන්ගේ ජීවන මට්ටම යහපත් බව පෙන්වයි (Weber, 1946). ඒ අනුව මධ්‍යම පංතිය ආර්ථිකයේ පාරිභෝගික ශක්තිය, ව්‍යාපාරික දායකත්වය හා සමාජ ස්ථාවරත්වය ප්‍රබල ලෙස පවත්වාගෙන යන වැදගත් සමාජ කාණ්ඩයකි (Wright, 1997).


සාමග්‍රී Unity
ISSN 3121-4266
cc BY NC ND

ග්‍රාමීය, නාගරික, වතු වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම ජනගහනය සහ ආර්ථික සංරචක අනුව ප්‍රධාන වර්ගීකරණයක් දැක ගතහැකි වේ. ග්‍රාමීය ක්ෂේත්‍රය යනු ශ්‍රී ලංකාවේ නගර සභා (Municipal/ Urban Councils) හෝ වතු ක්ෂේත්‍රයට (Estate Sector) අයත් නොවන සියලු ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශවල ජනගහනයේ ප්‍රධාන ආර්ථික කටයුතු ගොවිපළ, කුඩා ව්‍යාපාර සහ කර්මාන්ත මත පදනම් වේ. ග්‍රාමීය ප්‍රදේශයේ ජීවන රටාව සාමාන්‍යයෙන් සරල සහ සමාජ සම්බන්ධතා සමග මිශ්‍ර වී ඇති බවක් හඳුනාගත හැකිය (Population and housing census, 2012). නාගරික ක්ෂේත්‍රයට අයත් වන්නේ මහ නගර සභා (Municipal Council) සහ නගර සභා සීමා (Urban Council) මගින් පාලනය වන ප්‍රදේශ වේ. මෙහි ජනගහනය සාපේක්ෂව ඉහළ මට්ටමකින් යුක්ත වන අතර ආර්ථිකය ප්‍රධාන වශයෙන් වාණිජ, කර්මාන්ත, පරිපාලන හා තාක්ෂණ ක්ෂේත්‍ර මත පදනම් වෙයි (Population and housing census, 2012). වතු ක්ෂේත්‍රය යනු වගා භූමිය අක්කර 20 හෝ ඊට වැඩි සහ 10කට වැඩි සේවක පිරිසක් සේවය කරනු ලබන ක්ෂේත්‍රයක් වේ. තේ, රබර්, කෝපි වගා භූමියට අයත් බෝග වර්ග වේ. මෙම ප්‍රදේශයේ වෘත්තිමය කම්කරුවන් මත රඳා පවතින ආර්ථික හා සමාජ පද්ධතියක් පවතී. වතු ක්ෂේත්‍රයේ ජීවන රටාව සහ ආදායම වතු සම්පත් හා ව්‍යාපාර මත පදනම් වන අතර සංකීර්ණ සමාජ සම්බන්ධතා නොපවත්වයි (Herath & Kaunarathna, 2019).

සමාජ ප්‍රාග්ධනය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඵලදායී සමාජ සම්බන්ධතා වේ. මේ අනුව සමාජ ප්‍රාග්ධනය විග්‍රහ කර ඇත්තේ පුද්ගල බද්ධ ආකාරයෙනි. සමාජ ප්‍රාග්ධනය හඳුන්වනු ලබන්නේ සමාජයේ පුද්ගලයන් සහ කණ්ඩායම් විවිධ සම්පත් බලය ආදායම රැකියාව සමාජ ගෞරවය වැනි ලක්ෂණ මත පදනම්ව ය. මේ අනුව කිසියම් පුද්ගලයෙක් සමාජය තුළ හිමිකරගන්නා බලය හා තත්ත්වයේ ස්වභාවය අනුව සමාජ ප්‍රාග්ධනය මගින් මිනිසුන්ට අවස්ථාවන් නිර්ණය කරනු ලබයි. සමාජ ප්‍රාග්ධනය ආකාර තුනකි. එය ආබද්ධක සමාජ ප්‍රාග්ධනය, සම්බන්ධක සමාජ ප්‍රාග්ධනය හා අනුබද්ධක සමාජ ප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කළ හැකිය (Lin, 2001).

විසිඑක්වන සියවස වන විට පුද්ගලයාගේ සමාජ තත්ත්වය අධ්‍යාපනය මත ගොඩනැගේ (හෙට්ටිආරච්චි, 1999). එබැවින් විසිඑක්වන සියවසට උචිත පුරවැසියෙකු බිහි කර ගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නවීකරණය, ප්‍රතිසංස්කරණය ආදි වෙනස්කම් පිළිබඳව උනන්දු විය (සිරිසේන, 1999). විසිඑක්වන සියවස සඳහා අධ්‍යාපන වාර්තාව හෙවත් ජැක්වෙස් ඩෙලර්ස් වාර්තාවේ ළමයා ලැබිය යුතු අධ්‍යාපනය පහත පරිදි අපේක්ෂා කරන ලදී.

1. පෞද්ගලික සංවර්ධනය
2. සමාජ සංවර්ධනය
3. ශාස්ත්‍රීය සංවර්ධනය
4. ආගමික සංවර්ධනය
5. වෘත්තිය සංවර්ධනය


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

විසිඑක්වන සියවසේ පළමුවන දශකයෙන් පසුව ඉගෙනුමෙහි ඵලය දැනුම නොව කුසලතා ලෙස සලකනු ලබයි. මේ අනුව අධ්‍යාපනයේ අවසාන ඉලක්කය දැනුම් ආර්ථිකයෙන් ජාතික සංවර්ධනය කරා පුද්ගලයා යොමු කිරීමයි. අධ්‍යාපනය තුළ දැනුමට වඩා මානව ප්‍රාග්ධනයට ඉල්ලුම පවතී. ඒ අනුව විසිඑක්වන සියවසේ දී අධ්‍යාපනය සඳහා දරන වියදම ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස සලකනු ලබයි. විසිඑක්වන සියවසේ දෙවන භාගය වන විට පාසල හා විශ්වවිද්‍යාලයට අභියෝගයක් වන්නේ දැනුම කුසලතාවලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙනි. විසිඑක්වන සියවසේ ගුරුවරයා දැනුම මතු පරපුරට ලබා දෙන්නෙක් විය යුතුය (Trilling & Fadel, 2009). වර්තමාන සමාජය තුළ ගුරුවරයාගේ භූමිකාව වඩාත් සංකීර්ණත්වයට පත්ව ඇත. ගුරුවරුන් තම ඉගැනීම් හා ඉගැන්වීම් කටයුතු සඳහා තාක්ෂණිකව නැඹුරු වීම හඳුනා ගත හැකිය. මෙහිදී දැනුමේ ගුණාත්මකභාවය හා වලංගුභාවය පිළිබඳව විනිශ්චය කිරීමට යොමුව ඇත. ගුරුවරයා සමබර පුරවැසියෙක් බිහි කිරීමට කටයුතු කරයි. විසිඑක්වන සියවසේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි නිරන්තරයෙන් වගකීමෙන් යුතුව ගුරුවරයා කටයුතු කරනු ලබන අතර විවෘත මනසකින් යුතුව ස්වාධීන වෘත්තිකයෙක් ලෙස සක්‍රිය සහයෝගීතාවයකින් යුක්ත වේ (Reshma, Fathima & Adhikrao, 2018).

යුනෙස්කෝ ආයතනය විසින් 1970 දී පත්කරන ලද අන්තර්ජාතික කොමිසම විසින් දිවිපැවැත්ම සඳහා ඉගෙනීම (Learning to be) නැමති වාර්තාවේ කරුණු විසිඑක්වන ලෝකයේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිණිස ජාතික උපාය මාර්ග සකස් කිරීමට උපකාර විය. අධ්‍යාපනය නැමති සංකල්පය වඩා පුලුල් අන්දමින් සැලකිය යුතු බවත් අධ්‍යාපනික සංවර්ධනය සමස්ත සමෝධානික සංවර්ධන රාමුව තුළ අධ්‍යයනය කළ යුතු බවත් අධ්‍යාපනය වූ කලී අරමුණක් මෙන්ම සංවර්ධන මාර්ගයක් ලෙස ද සඳහන් කළ යුතු වේ.

දිවිපැවැත්ම සඳහා ඉගෙනීම් වාර්තාව පළවීමෙන් පසු කාලය තුළ ද ලෝක ජාතීන් මුහුණ පා ඇති අතිශය සංකීර්ණ ගැටළුවල ස්වභාවය අඩු වී නැත. සමාජය තුළ අධ්‍යාපනයට හිමි කාර්යභාරයක් ඇත. විසිඑක්වන සියවසේ අධ්‍යාපනය සඳහා වඩා පුළුල් වූත්, සංකීර්ණවූත්, ගතිකවූත් සමාජයක් සකස් කිරීම පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීම සඳහා යුනෙස්කෝව විසින් විසිඑක්වන සියවස සඳහා වූ ජාත්‍යන්තර අධ්‍යාපන කොමිසම (International Commission on Education for the Twenty-First Century) විසිඑක්වැනි සියවසට අනුගත වන ලෙස පුද්ගලයන් සකස් කිරීම සඳහා අධ්‍යාපනය තුළින් ගතික සංවර්ධනාත්මක කාර්යභාරයක් සිදු කරනු ලබයි.

විසිඑක්වන සියවසේ අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කොමිසමේ වාර්තාව සකස් කිරීමේදී පහත මූලධර්මයන්හි ආභාසයද ඒ සඳහා ඉවහල් වූ ආකාරය හඳුනාගත හැකිය. ඒ අතර

- අධ්‍යාපනය මූලික මිනිස් අයිතිවාසිකමක් මෙන්ම විශ්වීය මනුෂ්‍ය වටිනාකමකි. එය මුලු ජීවිතය පුරාම සියල්ලන්ටම ලබා ගැනීමේ අවස්ථාව සැලසිය යුතු වේ.
- විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය විසින් දැනුම් නිර්මාණය කිරීම, වර්ධනය කිරීම හා පතළ කර හැරීම සඳහා ක්‍රියා කළ යුතු වේ.


සාමග්‍රි Unity
CC BY NC ND
ISSN 3121-4266


- අධ්‍යාපන ප්‍රතිපත්ති තුළ සාධාරණත්වය කාලීනභාවය සහ විශිෂ්ටත්වය යන ත්‍රිවිධ නිෂ්ඨා පිළිබිඹු විය යුතු වේ. අධ්‍යාපනය සැලසුම් කිරීමේදී හා ව්‍යවහාරයේදී යථෝක්ත කරුණු අතර සමෝධානයක් හට ගත යුතු වේ.
- අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ හා සංශෝධන ඉතා ගැඹුරු විමර්ශනයකින් පසුව කළ යුතු වේ.
- විවිධ ආර්ථික, සමාජීය හා  සංස්කෘතික තත්ත්වයන් යටතේ අධ්‍යාපනයේ සංවර්ධනය විවිධ ප්‍රවේශයන් අනුව සිදු වුවද, ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිගත් මානව අයිතිවාසිකම්, සහනශීලීභාවය ප්‍රජාතන්ත්‍රවාදය, සාමය,පරිසරය සුරැකීම දිළිඳුකම පිටුදැකීම සහ ජනගහනය පාලනය ආදී වටිනාකකම් ඉන් රැක ගත යුතු වේ.
- අධ්‍යාපනය සමස්ත සමාජයේම වගකීමක් වශයෙන් සැලකිය යුතු වේ
(කාරියවසම්, 1995).

විසිඑක්වන සියවසේ අධ්‍යාපන මෙහෙයුම් කමිටුව පෙන්වා දෙනු ලබන්නේ විසිඑක්වන සියවසේ නව ඉල්ලුම සපුරාලීම සඳහා ගෝලීය වශයෙන්ම අධ්‍යාපන නිෂ්ඨා යළි නිර්වචනය කළ යුතු බවයි. ඒ සඳහා අධ්‍යාපනය ක්‍රියාත්මක කරන අන්දම හා ශිෂ්‍ය සාධනය තක්සේරු කරන ක්‍රමශිල්ප යාවත්කාලීන කිරීම අවශ්‍ය වන බවයි. මේ සඳහා ගුරුවරුන් සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රමයෙන් බැහැරව විෂය මාලාව හා යාවජීව කුසලතා ඉගැන්වීම සඳහා නව්‍ය හා නිරවද්‍ය වූ එළඹුම් හඳුන්වා දිය යුතු වේ (අතුකෝරාල, 2016). වර්තමානයේ ක්‍රියාත්මක වන පාසල් අධ්‍යාපන ක්‍රියාවලියෙහි නව දැක්මක් හා වෙනසක් සිදු කිරීම විසිඑක්වන සියවසේ ඉගෙනුම් ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි අත්‍යවශ්‍ය වේ. මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා පාසල්වල යහපැවැත්ම වර්ධනය (Wellbeing) හා අධ්‍යාපන සාධනය යන සාධක දෙකම ක්‍රියාත්මක කළ යුතු වේ.

විසිඑක්වන සියවස සඳහා ඉදිරිපත් කරනු ලබන ඉගෙනුම් රාමුවෙහි හර විෂයන්ට හා විසිඑක්වන සියවසේ තේමාවන්ට ප්‍රමුඛස්ථානයක් දෙනු ලබන අතර එහි ප්‍රධාන තේමා තුනක් හඳුන්වා දී ඇත.

- ඉගෙනුම හා නවෝත්පාදන කුසලතා (Learning and Innovation Skills)
- වෘත්තීය හා ජීවන නිපුණතා කුසලතා (Life and Career Skills)
- මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ කුසලතා (Information, Media, and Technology Skills)
( Trilling & Fadel, 2009).


සාමග්‍රි Unity
ISSN 3121-4266




මූලාශ්‍රය (Trilling & Fadel, 2009)

විසිඑක්වන සියවසේ ඉගෙනුම් කුසලතා අතරින් පළමු කාණ්ඩය ඉගෙනුම හා නවෝත්පාදන කුසලතා (Learning and Innovation Skills) කෙරෙහි අවධානය යොමු කරයි. එහිදී විවේචනාත්මක චින්තනය හා ගැටලු විසඳීම: (Critical thinking and problem solving), සන්නිවේදනය හා සහයෝගීතාව : (Communication and collaboration), නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය (Creativity and innovation) යන කොටස් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

විසිඑක්වන සියවසේ විවේචනාත්මක චින්තනය සහ ගැටලු විසඳීම මෙන්ම සන්නිවේදනය හා සහයෝගීතාව නව වැඩ ලෝකය ආමන්ත්‍රණය කරනු ලබන කුසලතා වේ. ගෝලීය ආර්ථිකයට නව නිපැයුම් සඳහා පරිකල්පනය නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනවල ඉහළ මට්ටම් අවශ්‍ය වේ. ගෝලීය වෙළෙඳපොළ සඳහා නව සහ වඩා ගුණාත්මක සේවා හා නිෂ්පාදන ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණශීල්වය හා නවෝත්පාදන කුසලතා අවශ්‍ය වේ. විවේචනාත්මක චින්තනය හා ගැටලු විසඳීම යන කුසලතාවය මගින් යම් විෂයක් පිළිබඳ අන් අය පවසන දේ විවේචනාත්මකව සමාලෝචනය කිරීමට, ගැටලු මතු කිරීමට, විසඳීමට හා සන්නිවේදනය කිරීමට ඇති හැකියාව ලබා දෙයි.

වෘත්තීය හා ජීවන කුසලතා පුද්ගලයින්ට සිතීමේ නව ක්‍රමවේදයන් සොයා ගැනීමට හා ගැටලු විසඳීමට හා ස්වයං දැනුවත් බවක් වර්ධනය කිරීමට ඉඩ සලසයි. සිසුන් තම ශ්‍රේණි වැඩි දියුණු කිරීමට උපරිම උත්සාහ ගත්තද බොහෝ දෙනෙක් මෙම කුසලතා සම්පූර්ණ කිරීමට අරගල කරති. සේවා යෝජකයන් තම අධ්‍යයන කාර්ය සාධනය මෙන්ම ජීවන කුසලතා අවශ්‍ය බව සලකන අතර රැකියාවක් සඳහා අයදුම් කිරීමේදී මෙම නිපුණතා විශාල වාසියක් ලෙස සලකනු


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266

ලබයි. මෙහිදී ප්‍රමාණවත් ජීවන හා වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා සිසුන් දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

- නම්‍යශීලී බව සහ අනුවර්තනය වීමේ හැකියාව (Flexibility and Adaptability)
- මුලපිරීම සහ ස්වයං අධ්‍යක්ෂණය (Initiative and Self Direction)
- සමාජ සහ හරස් සංස්කෘතික කුසලතා ( Social and Cross Cultural Interaction)
- ඵලදායිතාව සහ වගවීම (Productivity and Accountability)
- නායකත්වය සහ වගකීම (Leadership and Responsibility)

(Trilling & Fadel, 2009).

විසිඑක්වන සියවසේ ඉගෙනුම් කුසලතා මත සිසුන්ගේ ඉගෙනීමේ හැකියාව, නවෝත්පාදන හැකියාව, විවේචනාත්මක චින්තනය, තොරතුරු සාක්ෂරතාවය ඉතා ඉහළ මට්ටමක පවතින බව ඇතැමෙක් පවසයි. නමුත් ගැටලු විදීමේ හැකියාව අවම මට්ටමකින් පවතින ආකාරය අනාවරණය කරයි. විසිඑක්වන සියවසේ ඉගනීමට අනුගත වන විවිධ ඉගැන්වීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සිදු කළ යුතු වේ (Zyrah & Nelia, 2022).

විසිඑක්වන සියවසට අයත් වෘත්තීය හා ජීවන කුසලතා සංකීර්ණ ජීවිතය හා වැඩ පරිසරය තුළ හැසිරිය යුතු ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා දෙයි. ලෝකයේ වේගවත් වෙනස්වීම් හමුවේ එම වෙනස්වීම්වලට අනුවර්තනය වීම හා එයට අනුගත වීමේ හැකියාව වැදගත් වේ. තාක්ෂණික වශයෙන් සිදුවන නවෝත්පාදනයන් මගින් නව ආකාරයේ වෘත්තීන් නිර්මාණය වේ. නම්‍යශීලිබව හා අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධ කුසලතාවය වඩාත් සංකීර්ණ හා ක්‍රමානුකූලව වැඩකළ හැකි සංවිධානයන්හිදී විවිධ භූමිකාවන්, රැකියා වගකීම්, කාලසටහන් අනුව කාර්යක්ෂමතාවයෙන් යුතුව ප්‍රමුඛතා ලැයිස්තුවකට අනුව වැඩකටයුතු කිරීම සිදුවේ. විසිඑක්වන සියවසේ පරිපූර්ණ පුද්ගලයෙකු තැනීම සඳහා වෘත්තීය හා ජීවන කුසලතා ඉවහල් වේ. ජීවන කුසලතා යනු සමාජයේ සිදුවන වෙනස්වීම්වලට ධනාත්මකව අනුවර්තනය වීමට හැකියාවක් ලබාදෙන කුසලතාවයක් වන අතර ජීවන කුසලතා මනෝ සමාජීය නිපුණතා ලෙසද හඳුන්වා දිය හැකිය (Trilling & Fadel, 2009).

ඩිජිටල් මෙවලම් සමග වර්තමාන පරම්පරාව ඔවුන්ගේ හැකියාවන් විස්තාරණය කිරීමට කටයුතු කරනු ලබයි. තාක්ෂණික සාක්ෂරතා කුසලතාවය මගින් නව ආකාරයකින් සිතීමට, ඉගෙනීමට, සන්නිවේදනය කිරීමට, සහයෝගයෙන් කටයුතු කිරීමට සහ නිර්මාණාත්මක ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අවබෝධය ලබා දෙයි. මේ අනුව තාක්ෂණික සාක්ෂරතාවය අනු අංශ කිහිපයකින් සමන්විත වේ.

- තොරතුරු සාක්ෂරතාවය Information & Literacy)


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

- මාධ්‍ය සාක්ෂරතාවය - (Media Literacy)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සාක්ෂරතාවය - (ICT Literacy) (Trilling & Fadel, 2009).

විසිඑක්වන ශතවර්ෂය වන විට තොරතුරු සාක්ෂරතාවයේ මට්ටම වර්ධනය වී ඇත. පාසල තුළදී සේවා ස්ථානයේ දී සහ සමාජයේදී තාක්ෂණික සාක්ෂරතාවයේ මට්ටම අනුව වැඩි ඉල්ලුමක් පවතී. එහිදී

1. කාර්යක්ෂව සහ ඵලදායී ලෙස තොරතුරු වෙත ප්‍රවේශ වීම
2. තොරතුරු විවේචනාත්මකව හා දක්ෂ ලෙස ඇගයීම
3. තොරතුරු නිවැරදිව හා නිර්මාණශීලීව භාවිත කිරීම

විසිඑක්වන සියවසේ ඩිජිටල් සාක්ෂරතා කුසලතා මගින් විවිධ මාදිලියේ තාක්ෂණික මාධ්‍ය භාවිත කරනු ලබන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා දෙයි.

1. තොරතුරු වෙත ප්‍රවේශ වීම
2. තොරතුරු විවේචනාත්මකව හා දක්ෂ ලෙස ඇගයීම තුළින් තොරතුරු භාවිත කිරීම සහ ඇගයීම
3. විවිධ මූලාශ්‍රවලින් තොරතුරු ගලා යාම පාලනය කිරීමට අවශ්‍ය කුසලතාව

තොරතුරු සාක්ෂරතාවය ඔස්සේ ගොඩනැගේ.

ඩිජිටල් මාධ්‍ය සහ මාධ්‍ය තේරීම්වලින් සමන්විත වූ මාධ්‍ය සම්පත් වඩාත් හොඳින් භාවිත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව විසිඑක්වන සියවසේ සිසුන් අවබෝධ කරගත යුතුය.

මාධ්‍ය සාක්ෂරතාවය තුළින් මාධ්‍ය භාවිත කරනු ලබන ආකාරය ඉගෙනීමට, මාධ්‍ය ඔස්සේ නව නිෂ්පාදන සිදු කිරීමට, වීඩියෝ ශ්‍රව්‍ය විකාශන වෙබ් අඩවි සුදුසු පරිදි භාවිත කිරීමට අවශ්‍ය වන හැකියාව මාධ්‍ය සාක්ෂරතාව ඔස්සේ ලබා ගත හැකිය (Hashim, 2014). මේ අනුව මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍ය පණිවිඩ වෙත ප්‍රවේශ වීමට, විශ්ලේෂණය කිරීමට මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනිමින් මාධ්‍ය තුළ යම් වෙනසක් ඇති කිරීමට පවතින හැකියාව මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ පුලුල් සංකල්පීකරණයක් ලෙස හඳුන්වයි.

විසිඑක්වන සියවසේ දරුවන් සාම්ප්‍රදායික මාධ්‍යවලින් ඔබ්බට පුලුල් පරාසයක මූලාශ්‍රවලින් විශාල තොරතුරු ප්‍රමාණයක් ලබා ගනියි. එහිදී කෙටි පණිවිඩ, සමාජ මාධ්‍ය, වීඩියෝ ක්‍රීඩා, ප්‍රචාරණ වෙබ් අඩවි ඇතුලු තවත් බොහෝ මාධ්‍ය දක්නට ලැබේ. ඩිජිටල් යුගය තුළ ඕනෑම පුද්ගලයෙකුට මාධ්‍ය නිර්මාණය කිරීමට පහසුකම් ඇත. එසේම ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳ තොරතුරු සත්‍ය වශයෙන්ම අප නොදනී. නමුත් ඩිජිටල් යුගයේදී මාධ්‍ය සාක්ෂරතාවය අත්‍යවශ්‍ය කුසලතාවයක් ලෙස හඳුන්වනු ලබයි (Salama, 2018). මාධ්‍ය සාක්ෂරතාවය විශේෂයෙන්ම මාධ්‍ය තොරතුරු පිළිබඳව විවේචනාත්මකව සිතීමට අවශ්‍ය හැකියාව ලබා දෙනු


සාමගී Unity
CC BY NC ND
ISSN 3121-4266

ලබයි. මාධ්‍ය ළමයින් විසින් ඇගයීමට ලක් කරන විට පණිවිඩවල පවත්නා වලංගුතාවය පණිවිඩයට ඇතුළත් කර ඇති තොරතුරුවල ප්‍රධාන අදහස පිළිබඳව ඔවුන් අවබෝධයක් ලබා ගන්නා අතර ඔවුන්ට පවතින දැනුමේ පදනම පිළිබඳව මතයක් සකස් කර ගැනීමට හැකියාව ලැබේ. සංස්කෘතිය තුළ මාධ්‍ය භූමිකාව හඳුනා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාවය ඉවහල් වේ. මාධ්‍ය සාක්ෂරතාවය මගින් කතුවරයාගේ අරමුණ තේරුම් ගැනීමට හැකියාව ලැබේ. මෙහිදී කතුවරයාට මාධ්‍ය පණිවිඩය හරහා පැවසීමට අවශ්‍ය වන්නේ කුමක්ද? එමගින් සම්පූර්ණ තොරතුරු සපයන්නේද, එම පණිවිඩය මගින් කුමන ආකාරයේ බලපෑමක් සිදු කරනු ලබන්නේද පිළිබඳ අවබෝධයක් මාධ්‍ය සාක්ෂරතාව ඔස්සේ ලබා දෙනු ලබයි.

විසිඑක්වන සියවසේ වැදගත් මෙවලමක් ලෙස තොරතුරු හා සන්නිවේදන සාක්ෂරතාවය හඳුන්වා දිය හැකිය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය මගින් පැහැදිලි කරන්නේ ඩිජිටල් උපාංග යෙදුම් සහ සේවාවන්වලට අනුගත වීමට හා භාවිත කිරීමට ඇති හැකියාවයි (Trilling & Fadel, 2009). තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේදී ආරක්ෂිතව වගකීමෙන් හා සදාචාරාත්මක ලෙස මෙම තොරතුරු භාවිත කළ යුතුය.

තොරතුරු සන්නිවේදන සාක්ෂරතාවය මගින්

1. සිසුන්ට තාක්ෂණය ඵලදායී ලෙස යොදා ගැනීමට හැකියාව ලැබිය යුතුය.
2. තොරතුරු වෙත ප්‍රවේශ වීමෙන් නව දැනුමක් තුළ සාර්ථකව ක්‍රියාත්මක වීමට කළමනාකරණය කිරීම ඒකාබද්ධ කිරීමට හා ඇගයීමට ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් සන්නිවේදන ජාල මෙවලම් සහ සමාජ ජාල සුදුසු ලෙස භාවිත කිරීමට අවභ්‍ය හැකියාව ලබා දෙයි.
3. තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේදී එහි සදාචාරාත්මක පසුබිම හා නීතිමය ගැටලු පිළිබඳ මූලික අවබෝධයක් ලබා දෙයි.

තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ තොරතුරු භාවිත කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳවයි. තොරතුරු හා සන්නිවේදන සාක්ෂරතාවය හා තාක්ෂණික සාක්ෂරතාවය අතර වෙනස්කම් පවතී. දැනුම් සමාජයක ක්‍රියාකිරීමේදී ඒ සඳහා අවශ්‍ය නිපුණතා සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. තාක්ෂණික සාක්ෂරතාවය මගින් දැනුම් සමාජයක පවත්නා ගැටලු හා අභියෝගයන්ට මුහුණදීම සම්බන්ධව තාක්ෂණික මූලධර්ම අවබෝධකර දීම තොරතුරු හා සන්නිවේදන සාක්ෂරතාව මගින් සිදු කරයි.

සහයෝගීතාව, සන්නිවේදනය, තොරතුරු සාක්ෂරතාව මාධ්‍ය සාක්ෂරතාව සහ තාක්ෂණික සාක්ෂරතාව ඇතුළත්ව විසිඑක්වන සියවසේ ඉගෙනුම් කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පන්ති කාමරය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කිරීමේ බලපෑම අධ්‍යයනය කිරීමේදී ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය මත පදනම්ව ඉගෙනුම් න්‍යායන් සහ තොරතුරු හා


සාමග්‍රී Unity
ISSN 3121-4266
BY NC ND

සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කිරීම සුදුසු බව අනාවරණය කොට ඇත (Nutteerat, 2013).

මිනිස් සමාජයේ පවත්නා වූ සමාජ සංස්ථා අතරින් අධ්‍යාපනය ඉතාමත් වැදගත් සමාජ සංස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකි අතර ලාංකීය සමාජය තුළ අධ්‍යාපනය ආර්ථික දිශානතිය හා සමාජ ප්‍රාග්ධන හැකියාව අනුව ඒ ඒ කණ්ඩායම්වලට බලපාන ආකාරය විවිධ වේ. මෙම ආර්ථික කටයුතු හේතුවෙන් ඔවුන්ට සුවිශේෂී වූ සමාජ පසුබිමක් ගොඩ නැගී ඇත. විශේෂයෙන් මෙම අධ්‍යයනය ඔස්සේ අවධානයට යොමු කරනුයේ ග්‍රාමීය, නාගරික, වතු අංශවල මධ්‍යම පාන්තික පවුල්වල දරුවන්ට විසිඑක්වන සියවසේ කුසලතාවක් ලෙස තාක්ෂණික සාක්ෂරතා කුසලතාව අයත්කර ගැනීමට සමාජ ප්‍රාග්ධනය කරනු ලබන බලපෑම සම්බන්ධයෙනි.

අධ්‍යාපනය අර්ථාන්විත ජීවිතයක් ගත කිරීම හා ඵලදායක මිනිසෙකු වීම සඳහා පුද්ගලයාටත් ආර්ථික හා සමාජීය වශයෙන් වැඩි දියුණු වීම සඳහා සමාජයටත් එය තීරණාත්මක පූර්ව අවශ්‍යතාවයක් වේ. ගුණාත්මක අධ්‍යාපනයක් වෙත නැවත ප්‍රවේශ වීමේ වැදගත්කම හා ජාත්‍යන්තර සම්මුතීන්හි සහ ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්හි සෑම තැනම නැවත නැවතත් අවධාරණය කරනු ලබයි. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා ආර්ථික සමාජීය සංස්කෘතික අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර ප්‍රඥප්තිය තුළ කුසලතාවය හා පුද්ගල හැකියාව මත සියලු දෙනාටම  අධ්‍යාපනයට එක හා සමානව ප්‍රවේශ විය යුතු බව අවධාරණය කරනු ලබයි (සර්වා. ලයිවිට්. සහ කළුගෙදර, 2018). තිරසර සංවර්ධන අරමුණු අතර වැදගත් අරමුණක් ලෙස සියල්ලන් ඇතුළත් කරගත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහ සියලු දෙනාටම ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා පුලුල් කිරීම යන අධ්‍යාපනයේ තිරසර සංවර්ධන අභිමතාර්ථය ප්‍රමුඛ ස්ථානයෙහිලා සලකනු ලබයි (United Nations, 2015). එබැවින් ගුණාත්මක අධ්‍යාපන ප්‍රවේශය සහ ඉගෙනුම් ඵල ස්ත්‍රී පුරුෂ සමාජභාවය, උපන් ස්ථානය, සමාජ පන්තිය, ජනවාර්ගිකත්වය, ආගම, ධනය හෝ ආබාධිත තත්ත්ව වැනි පුද්ගල පාලනයෙන් පිටත පවත්නා සාධකයන්ගේ බලපෑමට යටත් නොවිය යුතුය.

සමාජ ප්‍රාග්ධනය හා සිසුන්ගේ අධ්‍යයන කුසලතාවන්හි අසමානතාව අතර සම්බන්ධයක් පවතින බව ඇතැමෙක් පවසයි. මෙම අධ්‍යයනයේදී පර්යේෂකයින් ශිෂ්‍යයින්ගේ ඉගෙනුම කෙරෙහි සිදු කරන බලපෑම Coleman සහ  Bourdieu විසින් ඉදිරිපත් කරන ලද න්‍යායික දර්ශන තුළින් පැහැදිලි කර ඇති අතර Kindergarten Cohort නම් පාසලෙහි පළමු ශ්‍රේණියේ සිසුන්ගේ දත්ත විශ්ලේෂණය කරමින් පර්යේෂකයින් සමාජ ප්‍රාග්ධනය සමාජ පන්තිය විසින් අසමාන ලෙස බෙදා හරිනු ලබන බව පවසයි. ඔවුන් ප්‍රකාශ කරනුයේ සමාජ ප්‍රාග්ධනයේ පවතින විෂමතා අර්ධ වශයෙන් සමාජ පන්තිය සඳහා මැදිහත්වන බවයි. මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් Bourdieu ගේ දර්ශනයට සහය දක්වමින් පර්යේෂකයින් පවසන්නේ දරුවෙකුගේ අධ්‍යාපනයේ ප්‍රාථමික ශ්‍රේණිවලදී ද අධ්‍යාපනය හා පංති අසමානතාවය පැහැදිලි කිරීමේදී සමාජ ප්‍රාග්ධනය ඉතා වැදගත්වන බවයි (Kendralin, Freeman, 2011).


සාමග්‍රි Unity
ISSN 3121-4266
cc BY NC ND

සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ මධ්‍යම පන්තිය සම්බන්ධව නිසි අධ්‍යයනයක් නොකිරීම අප රට පිළිබඳව විවිධ ක්ෂේත්‍රයන්වලදී ගනු ලබන තීරණ වැරදීමට මූලික හේතුවකි. කාල් මාක්ස්ට අනුව පන්ති අරගලය ඇති වන්නේ නිර්ධන පන්තිය හා ධනපති පන්තිය අතරය. මෙම පන්ති දෙක අතර මැද සිටින පන්තිය මධ්‍යම පන්තියයි. දේශපාලන විද්‍යාවෙන් ඔබ්බට ගිය කරුණු කාරණා මත මධ්‍යම පන්තිය සීමා නිර්ණය කර ගැනීමට අර්ථකථන භාවිත කරනු ලබන්නේ මෙම අර්ථකථනවලින් බහුතරයක් පවුල්වල ආදායම් මට්ටම මත පදනම්ව සිදු කරන ආර්ථික විද්‍යාත්මක විග්‍රහයන් ය (Xiaoming, 2012). ඇතැම් විග්‍රහයන් සමාජවිද්‍යාත්මක හා සංස්කෘතික ලක්ෂණ අනුව සිදු කරන විග්‍රහයන්ය. මේ අනුව යම් පුද්ගලයෙක් මධ්‍යම පන්තියට ඇතුළත් කිරීමේදී ඔවුන්ගේ සමාජ සංස්කෘතික වටිනාකම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. Banerjee සහ Duflo දක්වා ඇති පරිදි මධ්‍යම පන්තිය අර්ථකථනය කිරිමේදී පරිභෝජන තේරීම් සෞඛ්‍ය, අධ්‍යාපනය, ආයෝජනය හා ආර්ථික ජීවිතය මත තීරණය වන අතර දෛනික පරිභෝජනය දිනකට $2- /$10 අතර වේ යනුවෙන් මධ්‍යම පන්තිය අර්ථකථනය කර ඇත (Banerjee & Dulo, 2008).

අධ්‍යාපනය යන්න සමාජානුයෝජනය, සමාජ චලතාවය මෙන්ම සමාජ අනුකලනය ගොඩ නැගීම කෙරෙහි බලපෑම් ඇති කරනු ලැබුවද එසේ නොවීම වර්තමානය වන විට ප්‍රධාන සමාජ අර්බුදයක් බවට පත්ව ඇත. අධ්‍යාපනයේ සමාජීය විවිරණයන් පිළිබඳව විමර්ශනය කිරීමේදී අධ්‍යාපනය හා සමාජ අසමානතාවය පිළිබඳ න්‍යායාත්මක මතවාදයන් දෙකක් හඳුනාගත හැකිය. ඇතැම් න්‍යායවාදීන් පෙන්වා දෙනු ලබන්නේ අධ්‍යාපනය නිසාවෙන් සමාජ අසමාතාවය ඇතිවන බවයි. අනෙක් මතවාදය නම් සමාජ අසමානතාවය අධ්‍යාපනය හරහා සිදුවන බවයි (Addo, 2024). අධ්‍යාපනය මගින් සමාජ අසමානතාවය ඇති කරන බවට වූ මතවාදය බොහෝ පිරිස් විසින් දරා ඇති බව පැහැදිලිය. මධ්‍යම පාන්තික ප්‍රජාව ඉහළ මධ්‍යම පන්තිය, මැද මධ්‍යම පන්තිය හා පහළ මධ්‍යම පන්තිය වශයෙන් වර්ගීකරණයකට ලක් කරයි.

යම් පුද්ගලයෙක් මධ්‍යම පන්තියට ඇතුළත් කිරීමේදී ඔවුන් සතු වටිනාකම් ආර්ථික වටිනාකම්, සංස්කෘතික වටිනාකම් හා සමාජමය වටිනාකම් ලෙස කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. මෙහි ආර්ථික වටිනාකම් ගණයට මාසික අදායම, නිවාස හිමිකම, වාසය කර නිවසේ ප්‍රමාණය, නිවසේ ඇති ගෘහ භාණ්ඩ හා රථවාහන පිළිබඳ අවධානය යොමු කරයි. සංස්කෘතික වටිනාකම් ගණයට පුද්ගලයා සතු කුසලතා ආගමික විශ්වාස පද්ධතිය හඳුන්වාදෙනු ලබයි. යම් පුද්ගලයෙක් සතු සමාජ වටිනාකම් යනු ඔහු වටා ඇති සමාජ සම්බන්ධතා ජාලය තුළින ඔහුට ලැබෙන වටිනාකම්ය. ඒ අනුව ඔහු සතු සමාජ ප්‍රාග්ධන හැකියාව රැකියාව අධ්‍යාපනය මත සමාජ වටිනාකම් පද්ධතිය තීරණය වේ ^Reay, 2017).

දරිද්‍රතාව අවම කිරීම, මහජනතාව බලගැන්වීම, මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම, දේශපාලන සහභාගීත්වය වැඩි දියුණු කිරීම, සමාජය තුළ ඒකාබද්ධතාවය විශ්වාසය ශක්තිමත් කිරීම සහ ආර්ථික වර්ධනය පෙරට වඩා ශක්තිමත් කිරීම අධ්‍යාපනය තුළින් සිදු කරනු ලබන සමාජ පරිවර්තනය ලෙස හඳුනාගත හැකි වේ (Mary, 2010). ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය


සාමග්‍රි Unity
BY NC ND
ISSN 3121-4266
9 773121 426004

හඳුන්වා දීමෙන් පසුව සමාජය තුළ පැවති සමාජ අසමානතාවයන් බිඳ දමමින් පහළ සමාජ ස්ථරවල පුද්ගලයින් සමාජ හා ආර්ථික වශයෙන් ඉහළ ස්ථරයකට ගෙන ඒමට අධ්‍යාපනය සමාජ චලතාවයක් බවට පත්විය. අධ්‍යාපනය සමාජ විෂමතාවය අවම කිරීම සඳහා මාධ්‍යයක් බවට පත් වූවද වර්තමානය වන විට එය වෙනස් වෙමින් පවතී. අද වන විට ලාංකේය සමාජයේ පාසල් භෞතික සම්පත් හා ඉහළ මානව සම්පත්වලින් සංයුක්ත වන බැවින් එම පාසල් ජනප්‍රිය නාගරික පාසල් බවට පත්ව ඇත. එම ජනප්‍රිය නාගරික පාසල් හා ග්‍රාමීය හා වතු අංශයේ අඩු පහසුකම් සහිත පාසල් අතර විශාල සමාජ ආර්ථික පරතරයක් පවතී. මෙය සමාජ පන්ති පරතරය ලෙසද එක්තරා ආකාරයකට හඳුන්වා දිය හැකිය. මෙවැනි හේතු සාධක මත අධ්‍යාපනයෙන් සමාජ සමානාත්මතාව ඇති ඇති කිරීම වෙනුවට සමාජ අසමානතාව ඇති වන්නේද යන ගැටලුව නිර්මාණය වේ. විශේෂයෙන්ම ග්‍රාමීය හා වතු අංශයේ දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමේදී විවිධ වූ ගැටලු ඇති වන බව මින් පැහැදිලි වේ.

අධ්‍යාපනයේ අසමානතාවේ යාන්ත්‍රණයන් හා සාධක ඒ ඒ වාතාවරණය මත රඳා පවතී. යම් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය කරනුයේ කුමන ආකාරයේ ප්‍රතිසංස්කරණ හා යෙදවුම් දැයි තීරණය කිරීම සඳහා පුද්ගල තත්ත්වය හා අඩු අධ්‍යාපනය එකිනෙක කෙරෙහි බලපෑම් කරනු ලබන ආකාරය අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව පැන නගියි. අධ්‍යාපන අසමානතාවය හා දුර්වල අධ්‍යාපනයේ ඵල නිසා පුද්ගලයාගේ ජීවිතයේ පසු කාලයේදී කරන තේරීම් හා ලබන අවස්ථා සීමිත වේ. එමෙන්ම ගුණාත්මක අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයන් පැවතීම බොහෝ සමාජයන්ට නිසඟ වටිනාකම් ගැබ් කරන්නක් වන්නේය.

**න්‍යායාත්මක ප්‍රවේශය**

**සමාජ ප්‍රාග්ධනය සම්බන්ධ පියෝ බෝර්දියෝ (Pierre Bourdieu) ගේ විග්‍රහය**

සමකාලීනව බොහෝ රටවල් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ළඟා කර ගැනීම උදෙසා විශේෂ අවධානයක් යොමු කරයි. සමාජ ප්‍රාග්ධනය පිළිබඳව වෙනස් දෘෂ්ටිකෝණයකින් මෑත කාලීනව අදහස් ඉදිරිපත් කර ඇති විද්වතුන් අතරින් බෝදියු (Bourdieu) හඳුන්වා දිය හැකි වේ. සමාජයේ පවතිනා ප්‍රාග්ධන වර්ග හතරක් පාදක කොට ගනිමින් සමාජ ප්‍රාග්ධනය සම්බන්ධ අදහස ඉදිරිපත් කිරීමට ඔහු උත්සාහ දරා ඇත.

1. ආර්ථික ප්‍රාග්ධනය (Economic Capital)
2. සංස්කෘතික ප්‍රාග්ධනය (Cultural Capital)
3. සමාජ ප්‍රාග්ධනය (Social Capital)
4. සංකේතාත්මක ප්‍රාග්ධනය (Symbolic Capital) යනුවෙනි (Bourdieu, 1986).

Bourdieu විසින් සමාජ ප්‍රාග්ධනය යන්න හඳුනාගනු ලැබුවේ අන්‍යෝන්‍ය දැනුවත් හා පිළිගැනීමක් ඇති ආයතනික සබධතා වැඩි හෝ අඩු වශයෙන් සන්තකයේ තබා ගැනීමෙන් පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් අත්පත්කරගත් තථ්‍ය හෝ අතථ්‍ය සම්පත් ලෙසිනි.


සාමග්‍රී Unity
ISSN 3121-4266
BY NC ND

Bourdieu විසින් සමාජ ප්‍රාග්ධනය යන්න පුද්ගලයා සතුවන දේපළක් ලෙසින් විග්‍රහ කර ඇත. ග්‍රාමීය, නාගරික, වතු යන අංශ සැලකීමේ දී මෙම ක්ෂේත්‍ර තුන නියෝජනය කරනු ලබන මධ්‍යම පාන්තික ජනතාව ඔවුන්ගේ සමාජ සබධතා ගොඩනගා ගනු ලබන්නේ රැකියාව හා ආර්ථික ක්‍රියාවලිය පදනම් කරගෙනයි. විශේෂයෙන්ම රජයේ හෝ පුද්ගලික අංශයේ සේවය කරනු ලබන ස්ථිර ආදායමක් සහිත මධ්‍යම පාන්තික ප්‍රජාව සතුව ඔවුනට සුවිශේෂී වූ සමාජ සබධතා පද්ධතියක් ගොඩනැගී ඇත. එලෙස ගොඩනගාගත් සමාජ ප්‍රාග්ධනය දරුවන්ගේ අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතාව කෙරෙහි ඇති කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම මෙහිදී වැදගත් වේ. සමාජ ප්‍රාග්ධනය වශයෙන් බොහෝ විද්වතුන් පෙන්වා දීමට උත්සාහ කර ඇත්තේ පුද්ගලයින් සමාජීය වශයෙන් ගොඩනගා ගන්නා අන්‍යෝන්‍ය විශ්වාස, විනය සහ අන්තර් සබධතා තුළින් ඔහුට ආර්ථික හා සමාජීය වශයෙන් යහපත් ප්‍රතිඵල ලබාගත හැකි බව පෙන්වා දීමටය (Bourdieu, 1986). සමාජ ප්‍රාග්ධනය නම් සංකල්පය වර්ධනය කිරීමෙහිලා ප්‍රජාව තුළ ආයතනික හා සංවිධානාත්මක හැකියාවන් දියුණු කිරීම තුළින් ඔවුන් මුහුණ දෙන ගැටලු නිරාකරණය කරගත හැක්කේය යන අදහස වර්තමානයේ ජනප්‍රිය වී ඇත. සමාජ ප්‍රාග්ධනයෙහි කේන්ද්‍රීය පදනම විශ්වාස හා අන්තර් සබධතාය. ඕනෑම සමාජයක ඉහත සංසිද්ධීන් ක්‍රියාත්මක නොවන්නේ නම් එම ප්‍රජාව දැඩි ලෙස ආර්ථික හා සංස්කෘතික පරිහානියට පත් වේ. Bourdieu විසින් සමාජ ප්‍රාග්ධනය යන්න විග්‍රහ කිරීම සිදු කර ඇත්තේ පුද්ගලබද්ධ ආකාරයෙනි. සමාජ ප්‍රාග්ධනය සම්බන්ධව Bourdieu ඉදිරිපත් කරනු ලබන තර්කය වනුයේ අනෙකුත් ප්‍රාග්ධන වර්ග හා සමානවම සමාජයේ සියලුම පුද්ගලයන්ට සමාජ ප්‍රාග්ධනය සඳහා ප්‍රවේශවීමට සමාන අවස්ථාවන් හිමි නොවන බවයි. සමාජ ප්‍රාග්ධනය තුළ බල සම්බන්ධතාවය Power Relations තීරණාත්මක සාධකයක් ලෙස පැහැදිලි කරයි (Portes, 1998). ඒ අනුව කිසියම් පුද්ගලයෙක් සමාජය තුළ හිමි කරගන්නා බලය හා තත්ත්වයේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය අනුව සමාජ ප්‍රාග්ධනය සඳහා මිනිසුන්ට ඇති අවස්ථාව නිර්ණය කරනු ලබයි.

සමාජ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලබන ඇමෙරිකානු සමාජ විද්‍යාඥ Robert D. Putnam ට අනුව සමාජ ප්‍රාග්ධනය කොටස් කිහිපයක් මගින් පැහැදිලි කර ඇත.

1. Bonding Capital – ආබද්ධක සමාජ ප්‍රාග්ධනය

   සමාන අරමුණු සහිත සමජාතීය කණ්ඩායම් හා පුද්ගලයන් අතර ඇති කරගනු ලබන සමීප සමාජ සම්බන්ධතා වේ.

2. Bridging Capital – සම්බන්ධක සමාජ ප්‍රාග්ධනය

   සමාජ දේශපාලන බලය ඇති හෝ ආර්ථික වශයෙන් සමානතා ඇති කණ්ඩායම් අතර ඇතිවන සබධතා මෙහිදී හඳුනාගනු ලබයි.

3. Linking Capital – අනුබද්ධක සමාජ ප්‍රාග්ධනය


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

විවිධ මට්ටමේ සමාජ බල ධූරාවලියක පුද්ගලයන් අතර ඇතිවන බැඳීම මෙහිදී පැහැදිලි කරයි (Putnam, 2000).

Robert .D. Putnam (2000) ගේ මෙම විග්‍රහය මගින් පුද්ගලයින් හා පුද්ගල සමූහ අතර පවතින සමාජ සබධතා ක්‍රියාත්මක වන ස්වරූපය අනුව මූලික වශයෙන් සමාජ ප්‍රාග්ධනය ඉහත කොටස් අනුව හඳුනාගත හැකි වේ.

සමාජ ප්‍රාග්ධනයට අනුව විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතාවයට අයත් කර ගැනීමේදී ග්‍රාමීය, නාගරික හා වතු යන අංශවල මධ්‍යම පාන්තික පවුල්වල දරුවන්ට ඔවුන්ගේ සමාජ පන්තිය හා බලය අනුව ගොඩනගා ගත් සමාජ ප්‍රාග්ධන හැකියාව කොතෙක් දුරට බලපෑම් කරන්නේ ද විමසා බැලීමට අපේක්ෂා කරනු ලබයි. Bourdieu සමාජ ප්‍රාග්ධනය ඔස්සේ පෙන්වා දෙන ආකාරයට අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීමේදී සමාජ පන්තිය (Social Class), බලය (Power), ස්ත්‍රී පුරුෂභාවය (Gender) වැනි සාධක සමාජ ව්‍යුහයේ පවත්නා විවිධ සීමාකම් හේතුවෙන් සමාජයේ සියලු දෙනාට එක හා සමානව ප්‍රවේශ වීමේ අවස්ථාවන් හිමි නොවන බවයි. සමාජ ප්‍රාග්ධනය ගොඩනැංවීමෙහිලා සමාජ සබධතා හේතුවන බව Bourdieu පෙන්වා දෙනු ලබයි. මෙහිදී ග්‍රාමීය, නාගරික, වතු අංශ අනුව ඔවුන් තුළ පවත්නා සමාජ සබධතාවන් සමාජයේ සම්පත් කරා ප්‍රවේශ වීම විග්‍රහ කරනු ලබන බව සමාජ ප්‍රාග්ධන සංකල්පයෙන් පෙන්වා දිය හැකිය.

**අධ්‍යාපනය සම්බන්ධ මයිකල් ඇපල්ගේ විග්‍රහය**

දශක තුනකට වැඩි කාලයක සිට මයිකල් ඇපල් (Michael Apple) අධ්‍යාපනයේ දැනුම, ඉගැන්වීම සහ බලය අතර සම්බන්ධතා අනාවරණය කිරීමට හා ප්‍රකාශ කිරීමට උත්සාහ කර ඇත. 1982 දී ඇපල් විසින් ප්‍රකාශයට පත් කරන ලද අධ්‍යාපනය සහ බලය (Education and Power) විවේචනාත්මක අධ්‍යාපනය සඳහා කැප වූවන් සඳහා වැදගත් වෙළුමක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙහිදී මයිකල් ඇපල් විසින් අධ්‍යාපන ආයතන සහ අසමාන බල සම්බන්ධතා ප්‍රතිනිෂ්පාදනය සහ ප්‍රතිරෝධනය පිළිබඳ ඔහුගේ න්‍යාය ප්‍රථමයෙන් ප්‍රකාශ කළ අතර ස්ත්‍රී පුරුෂභාවය, වර්ගය හා ගතිකත්වයන් අන්තර්ගත වී ඇති ආකාරය පිළිබඳ ගැඹුරු පර්යේෂණයක් සිදු කොට ඇත. මයිකල් ඇපල් අධ්‍යාපනයේ බල සම්බන්ධතාවය පිළිබඳව විග්‍රහ කරනු ලබයි. සංස්කෘතිය දේශපාලනය හා අධ්‍යාපනය අතර ප්‍රබල සම්බන්ධයක් පවතින බව ඇපල් පැහැදිලි කරයි (Michael, 2007). සමාජය තුළ වරප්‍රසාද හිමි හා අහිමි යනුවෙන් පංතීන් දෙකක් ක්‍රියාත්මක වන බැවින් දැනුම බොහෝ විට වරප්‍රසාද හිමි පන්තිය විසින් සමාජය තුළ යුක්තිගත කරනු ලබන බව හඳුනාගත හැකිවේ. ඔවුන්ගේ වටිනාකම් හා ධර්මතාවයන් සමාජය තුළ දැනුම වශයෙන් අර්ථකථනය කරනු ලබයි. මොහු අධ්‍යාපන සංස්ථාව තුළ සමාජ අසමානතාවය හා අසාධාරණත්වය ගොඩනැගෙන ආකාරය පිළිබඳව අධ්‍යයනය කර ඇත. සමාජයේ පවත්නා විවිධ ආර්ථික අංශයන් තුළ අධ්‍යාපනය සම්බන්ධ විෂමතාවයන් දක්නට ලැබේ. ග්‍රාමීය, වතු, නාගරික මධ්‍යම පාන්තික පවුල්වල දරුවන් විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතාවය අයත්කර ගැනීමේදී විවිධ විෂමතාවන් පවතින බව


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266

හඳුනාගත හැකි වේ. විශේෂයෙන්ම එම අධ්‍යාපන විෂමතාවයන් ඇති වීම කෙරෙහි සමාජ ප්‍රාග්ධන හැකියාව සිදු කරනු ලබන බලපෑම මෙම අධ්‍යයනය ඔස්සේ ගවේෂණය කරනු ලබයි.

**ක්‍රමවේදය**

යම්කිසි අධ්‍යයනයක් සිදු කිරීම මගින් නව දැනුම ඒකරාශී කිරීමට මෙන්ම පවතින දැනුම තවදුරටත් තහවුරු කිරීමට ද දාර්ශනික පසුබිම ගොඩනගා ගත හැකි අතර ඒ සඳහා සමාජවිද්‍යාත්මක අධ්‍යයනයන් තුළ උපකාරී කරගත හැකි ක්‍රම රැසක් පවතී. දැනුම ඒකරාශී කිරීම සඳහා ඥානමීමංසාත්මක ක්‍රම උපයෝගී කරගත හැකි අතර ඥානමීමංසාව (Epistemology) යනු ඥානය ග්‍රහනය කර ගැනීම පිළිබඳ දර්ශනවාදයේ එක් අංශයක් වශයෙන්ද හැඳින්වේ.

විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතා අයත් කර ගැනීම කෙරෙහි සමාජ ප්‍රාග්ධනය හා ආර්ථික ශක්‍යතාවය බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී අභිසංස්කරණාත්මක ප්‍රවේශය (Constructivist Approach to Meaning) එනම් විෂය වස්තූන්ගේ අර්ථය පුද්ගලයන් හා සමාජය විසින් ගොඩනගනු ලබන්නක්ය යන්න පිළිගනු ලබයි (උයන්ගොඩ, 2010).

ග්‍රාමීය, වතු හා නාගරික මධ්‍යම පාන්තික පවුල්වල දරුවන් විසිඑක්වන සියවසේ තාක්ෂණික සාක්ෂරතා කුසලතා අයත් කර ගැනීමේදී ආර්ථික ශක්‍යතාවය හා සමාජ ප්‍රාග්ධන හැකියාව කරනු ලබන බලපෑම ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අභිමතාර්ථයයි. මේ අනුව අධ්‍යයන සැලැස්ම වශයෙන් ව්‍යුහගත ඒකක සහිත කේවල සිද්ධි අධ්‍යයන සැලැස්ම (Embedded multiple unit single case study design) භාවිත කරනු ලැබිණි. ග්‍රාමීය, වතු හා නාගරික මධ්‍යම පාන්තික පවුල් ඒකක ව්‍යුහගත සිද්ධි අධ්‍යයනය මගින් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනිණි. ව්‍යුහගත ඒකක සහිත කේවල සිද්ධි අධ්‍යයන සැලැස්ම භාවිත කරමින් ක්ෂේත්‍ර පාදක න්‍යාය අධ්‍යයන ක්‍රමවේදය සමග සම්බන්ධ කරනු ලැබීය.

මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පවුල් , නාගරික මධ්‍යම පාන්තික පවුල් සහ වතු පවුල් නියෝජනය වන පරිදි අරමුණු සහගත නියැදීමට අනුව ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඔස්සේ අධ්‍යයනය කෙරිණි. න්‍යායාත්මක නියැදීම අනුව ග්‍රාමීය, නාගරික, වතු අංශ නියෝජනය වන පරිදි ගුරුවරු, විදුහල්පතිවරු, දෙමාපියන් හා දරුවන් සමඟ ගැඹුරු සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කෙරිණි. එහිදී දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය, තාක්ෂණය භාවිත කිරීමේදී ඇතිවන ගැටලු, දෙමාපියන්ගේ සමාජ සම්බන්ධතා, දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය ළඟා කර ගැනීමට උපකාරී වීම සම්බන්ධ තොරතුරු ලබා ගැනීම, දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතා මට්ටම හා හැකියාව, භාවිත කරනු ලබන තාක්ෂණික මෙවලම්, පුද්ගල සමාජ සම්බන්ධතා තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය සඳහා දෙමාපියන්ගේ මැදිහත්වීම, පවුලේ ආර්ථික හැකියාව යන කරුණු පාදක කොට ගෙන දත්ත රැස් කිරීම ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඔස්සේ සිදු කරනු ලැබීය.


BY NC ND
ISSN 3121-4266

මෙම අධ්‍යයනයේදී ලබා ගන්නා ගුණාත්මක දත්ත ප්‍රධාන වශයෙන් තේමාත්මක විශ්ලේෂණය ඔස්සේ විශ්ලේෂණය කෙරිණි. තේමාකරණ විශ්ලේෂණය පියවර හයක් ඔස්සේ සිදු කරන ලදී.

1. අනුපිටපත් කිරීම
2. කේතීකරණය
3. තේමාවන් ජනනය කිරීම
4. තේමාවන් සමාලෝචනය කිරීම
5. 5.තේමාවන් නිර්වචනය කිරීම
6. තේමාවන් නම් කිරීම සහ ලිවීම
   (Braun & Clarke, 2006).

අධ්‍යයනයට අදාළ ගුණාත්මක දත්ත විශ්ලේෂණය තේමාවන් 2ක් ඔස්සේ සිදු කරන ලද අතර එම තේමාවන් පහත පරිදි විය.

තේමාව 1: සමාජ ක්ෂේත්‍ර අනුව විෂමතාවක් පවතින අතර ම පන්තිමය වශයෙන් සමාජ ප්‍රාග්ධනය ගොඩ නැගෙන ආකාරය

තේමාව 2: සමාජ ප්‍රාග්ධනය අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතා කෙරෙහි සිදු කරනු ලබන බලපෑම

**විශ්ලේෂණය**

ග්‍රාමීය, නාගරික, වතු අංශවල මධ්‍යම පංතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයෙහි සේවය කරනු ලබන ස්ථාවර ආදායමක් සහිතව සේවා සම්පාදනය කරනු ලබන පිරිසකි. නාගරික, ග්‍රාමීය, වතු ආශ්‍රිතව මධ්‍යම පංතියක් හඳුනා ගැනීම සමාජ විද්‍යාත්මකව සිදු කරනු ලබව වර්ගීකරණයක් වන අතර එය අධ්‍යාපන, ආර්ථික සමාජය හා සංස්කෘතික මට්ටම අනුව වෙනස් වේ. Bourdieu විසින් සඳහන් කරන පරිදි මධ්‍යම පාන්තිකයින්ගේ චර්යා ප්‍රකාරයෙහි (Habitues) විවිධතා පවතී. මධ්‍යම පන්තිය ඉහළ සහ පහළ පන්ති අතර සමාජ ආර්ථික කණ්ඩායමක් ලෙස ස්ථානගත වන අතර එය ආර්ථික ස්ථාවරත්වය, අධ්‍යාපනය සහ සංස්කෘතික වටිනාකම් මිශ්‍රණයකින් සංරක්ෂිත වේ. මධ්‍යම පාන්තිකයින් සම්බන්ධව සාකච්ඡා කිරීමේදී ආදායම ප්‍රධාන සාධකයක් වන අතර අධ්‍යාපනික තත්ත්වය වෘත්තීය මාර්ග සහ සමාජ වටිනාකම් වැනි අංග මධ්‍යම පාන්තික තත්ත්වය නිර්වචනය කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මේ අනුව මධ්‍යම පන්තිය හඳුනා ගැනීම සඳහා හුදෙක් ආර්ථික සාධක පමණක් පාදක කොටගත නොහැකි අතර පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතු බව හඳුනාගනු ලැබිණ. ඒ ඒ ලක්ෂණ සමාජ ප්‍රාග්ධනය සම්පාදනයට බහුවිධ වශයෙන් සම්බන්ධ වන අතර, අවසාන වශයෙන් එකී වෙනස්වීම් ළමයින්ගේ තාක්ෂණික සාක්ෂරතා කෙරෙහි ද විවිධ වශයෙන් බලපෑම් කරනු ලබයි.


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266

තේමාව 1: සමාජ ක්ෂේත්‍ර අනුව විෂමතාවක් පවතින අතර ම පන්තිමය වශයෙන් සමාජ ප්‍රාග්ධනය ගොඩ නැගෙන ආකාරය

**1. අදායම් සහ වියදම් රටාව**

මධ්‍යම පාන්තික පවුල්වල ආදායම මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් ඔබ්බට ගොස් අතිරේක අවශ්‍යතා සපුරාලීමේ හැකියාවකින් ද යුක්තය. මොවුන්ගේ වාර්ෂික ආදායම ස්ථායී වැටුප් හෝ ව්‍යාපාරික ආදායම් මත පදනම් වේ. මෙම ආදායම තුළින් පවුලේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය නිරන්තරයෙන් වර්ධනය කිරීමට මධ්‍යම පාන්තිකයින් උත්සාහ කරයි. මධ්‍යම පාන්තිකයින්ගේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ආදායමෙන් සීමිත කොටසක් පමණක් මූලික අවශ්‍යතා සඳහා වැය කරනු ලැබීමයි. ඉතිරි කොටස අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස සංවර්ධන, තාක්ෂණික උපකරණය සහ විනෝදාස්වාදය ආදී අතිරේක අවශ්‍යතා සඳහා වෙන්කරයි.

නාගරික මධ්‍යම පන්තියක් සතුව ග්‍රාමීය හා වතු මධ්‍යම පන්තියට සාපේක්ෂව ඉහළ සහ විවිධ ආදායම් මූලාශ්‍ර පවතී. නාගරික පවුල් බොහෝවිට රාජ්‍ය හා පුද්ගලික අංශයෙහි සේවය, ව්‍යාපාරික ආදායම් මත පදනම් වේ. ඔවුන්ගේ ආදායම ප්‍රධාන වශයෙන් මාසිකව අවශ්‍ය වන ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීම, ඇඳුම් පැළඳුම්, නිවාස නඩත්තු කිරීම සඳහා වැය කරනු ලබයි. එමෙන්ම මොවුන් සෞඛ්‍ය රක්ෂණ සේවා සඳහාද මුදල් යොදවන අතර එමගින් හදිසි රෝගාබාධ හා අනතුරුවලදී අවශ්‍ය රැකවරණය අපේක්ෂා කරයි. තම පවුලේ පරිහරණය සඳහා පවතින පුද්ගලික වාහන සඳහා සහ ගමනාගමනය සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරනු ලබයි. නාගරික මධ්‍යම පංතියේ ආදායම් සහ වියදම් රටාව තුළ ඔවුන් ස්ථාවර තැන්පතු ක්‍රමයක්ද රාජ්‍ය සහ පෞද්ගලික බැංකු ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබයි.

> "සැලරි එක ලැබුණු මාසෙට ගෙදරට කෑම බඩු ටික ගේනවා. ලයිෆ් ඉන්ෂුවරන්ස් (එකට ඉන්ස්ටෝල්මන්ට් එක දානවා. කාර් එකේ ලීසිං එක ගෙවනවා. තව දරුවන්ගේ ක්ලාස් ෆීස් ඒවගෙන් වෙන් කරනවා. ඩිපොසිට් කරන්නත් ගාණක් දානවා. ඊට අමතරව ඉතින් ෆැමිලි ට්‍රිප්, පාටිවලට එහෙම යන්නත් තැනක් වෙන් කරනවා සමහර මාසවලදී."

ග්‍රාමීය මධ්‍යම පංතියේ ආදායම නාගරික මධ්‍යම පංතියට සාපේක්ෂව අවම වන අතර බොහෝවිට ඔවුන් රාජ්‍ය සේවය, ගුරු වෘත්තිය, ව්‍යාපාර මත රඳා පවතී. ඔවුන්ගේ වියදම් රටාව තුළ වැඩි කොටසක් ආහාර සඳහා වැය වේ. ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුල් සතියකට සරිලන ලෙස සහ මාසෙකට සරිලන ලෙස ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීමට හුරු වී සිටිති.

ග්‍රාමීය මධ්‍යම පංතියේ ආදායම නාගරික මධ්‍යම පංතියට සාපේක්ෂව අවම වන අතර බොහෝවිට ඔවුන් රාජ්‍ය සේවය, ගුරු වෘත්තිය, ව්‍යාපාර මත රඳා පවතී. ඔවුන්ගේ වියදම් රටාව තුළ වැඩි කොටසක් ආහාර සඳහා වැය වේ. ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුල් සතියකට සරිලන ලෙස සහ මාසෙකට සරිලන ලෙස ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීමට හුරු වී සිටිති. එමෙන්ම ඔවුන් සෞඛ්‍ය සේවා සඳහා විශේෂයෙන්ම මාසිකව අවශ්‍ය වන බෙහෙත් ද්‍රව්‍ය මිළදී ගැනීමට, ගමනාගමන පහසුකම් සඳහා මෙන්ම ඥාතීන්ගේ සහ හිතවතුන්ගේ අවමංගල්‍ය කටයුතු,


සාමග්‍රි Unity
ISSN 3121-4266
cc BY NC ND

දානමය කටයුතු සඳහාද කොටසක් වැය කරනු ලබයි. ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීමට ආදායමෙන් කොටසක් වැය කරනු ලබයි.

> “අපේ වැටුපෙන් ගොඩක්ම කෑම බීම මිලදී ගන්න යනවා. එමෙන්ම ලෙඩකට, හදිසි දේවල්වලට, පින්කම්, දානමාන වගේ කටයුතුවලට අනිවාර්යෙන්ම මාසෙකට 10000 කට වැඩිය යනවා ඉතුරු කරන්න අමාරුයි මාසෙ පඩියෙන් ”. (පුරුෂ - ග්‍රාමීය අංශය - පියා)

වතු මධ්‍යම පංතිය සලකා බැලූ විට ඔවුන් කාර්යාලයන්හි සේවය කරනු ලබන අතර රාජ්‍ය අංශයන්හි සහ පුද්ගලික අංශයන්හි ද සේවය කරනු ලබයි. එමෙන්ම වතු මධ්‍යම පාන්තිකයන්ගෙන් කොටසක් විදේශ සේවාවන්හි නියුක්ත වේ. මොවුන්ගේ ආදායමෙන් විශාල කොටසක් දෛනිකව ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වැය කරනු ලබයි. ඉතිරි කොටස අසනීප අවස්ථාවන්හි බෙහෙත් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා වැය කරනු ලබයි. මොවුන් නව තාක්ෂණික උපකරණ හෝ විනෝදාස්වාදය සඳහා මුදල් වැය කිරීම සීමා සහිත වේ.

> “අපිට ලැබෙන මුදල් ගොඩක්ම කෑමට ලෙඩ වෙද්දි හදිසි දේවල් වලට යනවා. බැංකුවල ඉතිරි කරන්න නම් ගොඩක් වෙලාව යන්නේ නැහැ. හදිසියකට ගන්න ගෙදර කීයක් හරි අරන් තියලා තියෙනවා.” (ස්ත්‍රී - වතු අංශය - මව)

පැහැදිලි වශයෙන්ම මධ්‍යම පන්තියෙහි ආදායම් හා වියදම් රටාව අනුව පොදු ලක්ෂණ තිබුණද ග්‍රාමීය, නාගරික සහ වතු යන ක්ෂේත්‍රයන්හි චර්යා ප්‍රකාරය අනුව විවිධත්වයක් දක්නට ලැබේ. නාගරික මධ්‍යම පංතියේ සැලකීමේ දී විවිධ ආදායම් මාර්ගයන්ට විවෘත වන අතර ග්‍රාමීය මධ්‍යම පංතිය ආදායම් කළමනාකරණය කර ගනිමින් ප්‍රධාන වශයෙන්ම නඩත්තු කටයුතු සඳහා ආදායම වැය කරනු ලබයි. නාගරික හා ග්‍රාමීය මධ්‍යම පංතියට සාපේක්ෂව වතු මධ්‍යම පංතිය ආදායමෙන් සැලකිය යුතු කොටසක් දෛනික ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැය කරනු ලබන බව පැහැදිලි වේ.

**2. උසස් ජීවන අපේක්ෂාවන්**

මධ්‍යම පංතියේ පවුල්වල ජීවන රටාවේ විශේෂත්වයක් වන්නේ මූලික අවශ්‍යතා පමණක් සපුරාදීමෙන් තමන් ඉදිරියට ගොස් උසස් ජීවන තත්ත්වයක් පිළිබඳ අභිලාෂයක් වර්ධනය වීම ය. මධ්‍යම පංතියේ පුද්ගලයින් උසස් තත්ත්වයේ පරිසරයක් ඇතිකර ගැනීමට කටයුතු කරන අතර නිවාස අලුත්වැඩියාව, වාහන මිලදී ගැනීම, නඩත්තු කිරීම සඳහා සැලකිය යුතු වියදමක් දරනු ලබයි. උසස් ජීවන අපේක්ෂාවන් වර්ධනය කර ගැනීම සඳහා සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනය සඳහා අතිරේකව මුදල් යෙදවීම සිදු කරනු ලබයි. පුද්ගලික රෝහල්, වෛද්‍ය පරීක්ෂණ සහ දරුවන්ගේ අනාගත අධ්‍යාපන අවස්ථා වඩාත් විශ්වාසදායක සහ තරගකාරී කිරීමට උත්සාහ කරනු ලබන බව පැහැදිලි වේ. ඒ අනුව උසස් ජීවන අපේක්ෂාවන් යනු මධ්‍යම පංතිය පෝෂණය කරනු ලබන විශේෂ අංගයක් ලෙස සැලකිය හැකි අතර එය ආදායම සමාජ තත්ත්වය සහ සංස්කෘතික අපේක්ෂාවන් සමඟ සම්බන්ධ වෙයි.


සාමග්‍රී Unity
ISSN 3121-4266
cc BY NC ND

මධ්‍යම පංතියේ ජීවන රටාවේ විශේෂත්වයක් ලෙස මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙන් ඔබට ගොස් උසස් ජීවන තත්ත්වයන් පිළිබඳ අභිලාෂයන් බොහෝ අවස්ථාවන්වලදී දැකිය හැකි වේ. නාගරික මධ්‍යම පන්තියේ පවුල් ඉහළ ආදායම් මූලාශ්‍රවලට පිවිසීමේ හැකියාව හේතුවෙන් නිවාස නවීකරණය, නව මෝටර් රථ මිලදී ගැනීම සහ නඩත්තු කිරීම, උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම දැකිය හැකි වේ.

> “අපි හැම අවුරුද්දකම ගෙදර කැබලි කැබලි අලුත්වැඩියා කරනවා. පවුලේ පාවිච්චියට නවීන තත්ත්වයේ වාහනයක් තියාගන්න එක අනිවාර්යයි කියලා හිතනවා” (පුරුෂ -නාගරික අංශය- පියා)

එමෙන්ම නාගරික මධ්‍යම පන්තියේ පවුල් සෞඛ්‍ය හා අධ්‍යාපන වියදම් සඳහාද විශේෂ අවධානයක් යොමු කරයි. පෞද්ගලික රෝහල් සේවා, වෛද්‍ය පරීක්ෂණ සහ දරුවන්ට තරගකාරී අධ්‍යාපන අවස්ථා ලබා දීම ඔවුන්ගේ උසස් ජීවන අපේක්ෂාවන්ට අනුබලය ලබාදෙනු ලබන අංග වෙයි. නාගරික මධ්‍යම පංතියෙහි උසස් ජීවන තත්ත්වය යනු නව තාක්ෂණික උපකරණ ලබා ගැනීම, නවීන ඇඳුම් විලාසිතා භාවිත කිරීම තුළ ඔවුන් සමාජයේ ගෞරවය ලබා ගැනීමක් අපේක්ෂා කරයි.

> “අපේ අරමුණ දරුවන්ට හොඳ අධ්‍යාපන අවස්ථාවක් දෙන එක. ඒකට පෞද්ගලික පන්ති, කොම්පියුටර්, පොත්පත් වගේ ඉගෙන ගන්න ඕන උපකරණ සඳහා මුදල් යොදවනවා. ඉගෙන ගන්නවා කියන්නේ හොඳ ආයෝජනයක් ඒකෙන් අපේ තත්ත්වය වැඩිවෙනවා” (පුරුෂ - නාගරික අංශය- පියා)

ඒ අනුව නාගරික මධ්‍යම පංතියේ ජීවන රටාව සීමිත මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙන් ඔබ්බට ගොස් සෞඛ්‍ය, අධ්‍යාපන, නිවාස නවීකරණය, තාක්ෂණික උපකරණ සහ ගමනාගමන වැනි අංග මත පදනම් වූ උසස් ජීවන අපේක්ෂාවන්ට වැඩි අවධානයක් යොමු කරන බව පැහැදිලිය. ග්‍රාමීය මධ්‍යම පන්තියෙහි ජීවන රටාව නාගරික මධ්‍යම පන්තියට වඩා සීමිත ආදායම් මූලාශ්‍රවල යෙදී ඇති නමුත් ඔවුන්ගේ උසස් ජීවන අපේක්ෂාවන් බොහෝ විට සමාජ ගෞරවය හා පවුලේ සාමාජිකයින් මත රඳා පවතී. ග්‍රාමීය පවුල්වල නිවාස තුළින් පවුලේ ගෞරවය, ආරක්ෂාව සහ සමාජ අභිමානය දක්වනු ලබයි. එබැවින් ඔවුන් ගොඩනගා ගත් නිවාස, නවීන ගෘහ භාණ්ඩ මොවුන්ගේ සමාජ තත්ත්වය පෙන්නුම් කරන මාර්ගයන් වෙයි. ග්‍රාමීය මධ්‍යම පංතියේ පවුල් වාහන සපයා ගැනීම හා නඩත්තු කිරීම උසස් ජීවන තත්ත්වයක් ලබන මූලික අංගයකි. නාගරික සමාජය තුළ පුද්ගලික වාහන වැඩි වශයෙන් ගමනාගමන පහසුකමක් වශයෙන් සලකා බලන අතර ග්‍රාමීය සන්දර්භයේදී එය සමාජයේ ගෞරවය හා අභිමානය පෙන්වන සංකේතයකි. ග්‍රාමීය මධ්‍යම පන්තියේ උසස් ජීවන අපේක්ෂාවන් සමාජ සංස්කෘතික අවස්ථා ආශ්‍රිතවත් දැකිය හැකිය. විවාහ උත්සව, ආගමික උත්සව, පෙරහර මංගල්‍යයන්, වාරි කර්මාන්ත උත්සවයන් සඳහා ඔවුන් සිදු කරනු ලබන වියදම් සමාජ ගෞරවය තහවුරු කිරීමට උපකාරී වේ. ග්‍රාමීය මධ්‍යම පාන්තික පුද්ගලයින්ගේ අරමුණු බොහෝ විට අපේ දරුවන්ව ගොඩනගා ගත් නිවසක් ලබාදීම හෝ අපේ ගමේ අය අතර ගෞරවනීය ජීවිතයක් ගත කිරීම ලෙස අර්ථකථනය වෙයි .


සාමගී Unity ISSN 3121-4266

"අපි අපේ ගමේ ගෞරවනීය විදිහට ජීවත් වෙන්න උත්සාහ කරනවා හැම වෙලාවෙම, මම ගමේ ඉස්කෝලේ විදුහල්පති විදිහට වැඩ කරපු නිසා ගමේ මිනිස්සු බොහොම ගෞරවනීය විදිහට තමයි අපේ පවුලට සලකන්නේ සළකන්නේ. කොහේ ගියත් ඉස්කෝලේ මහත්තයා කියලා මූලික තැන ලැබෙනවා". (පුරුෂ - ග්‍රාමීය අංශය -පියා)

ග්‍රාමීය පන්තියේ උසස් ජීවන අපේක්ෂාවන්, නාගරික සමාජයන්හි පවතින විශාල ආර්ථික ආයෝජන මත නොව සමාජ සම්මානය, නිවාස ගොඩනගා ගැනීම සහ ගෞරවනීය රැකියාවක් මත සාමාජික සබඳතා ශක්තිමත් කර ගැනීමේ හැකියාව පවතින බව අනාවරණය විය. වතු මධ්‍යම පන්තියේ ආදායම වතු සේවා, කුඩා පරිමාණ ව්‍යාපාර, විදේශගත රැකියා ආදායම් මත රඳා පවතී. මෙවැනි ආදායම් පදනමක් පවතින බැවින් ඔවුන්ගේ උසස් ජීවන අපේක්ෂාවන් නාගරික හා ග්‍රාමීය සමාජයට සාපේක්ෂව වෙනස් ආකාරයට ගොඩනගා ගනු ලබයි. වතු මධ්‍යම පංතියේ පවුල් බොහෝ විට මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙන් පසු ඉතිරි කොටස් ගෘහභාණ්ඩ මිලදී ගැනීම, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදවනු ලබන ආකාරයක් හඳුනාගත හැකිය.

ඉහළ ජීවන තත්ත්වයන් පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂාවන් ගොඩනැගී පවතින්නේ නිවසක් ගොඩනගා ගැනීම, දඹදිව සංචාර, දරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථාවන් ලබාදීම ආශ්‍රිතවය. නාගරික මධ්‍යම පංතිය වාහන සහ නවීන පහසුකම් සහිත නිවාස, උසස් වැටුප් සහිත රැකියාවන් පිළිබඳ වඩා වැඩි අවධානයක් යොමු කරන විට වතු මධ්‍යම පාන්තිකයින්ගේ උසස් ජීවන අපේක්‍ෂාවන් බොහෝ විට නිවසේ ස්ථායිකරණය හා දරුවන්ගේ උසස් අධ්‍යාපන අවස්ථාව මත පදනම් වේ.

"අපිට තියෙන ලොකුම හීනයක් හොඳ පහසුකම් තියෙන ගෙදරක් හදාගන්න එක. ඒ වගේම දරුවන්ට ඉගෙන ගන්න දීලා එයාලට හොඳ රැකියාවක් කරන්න ඉඩ දෙන එක. එහෙම වුණාම වත්තෙ අය අතර පිළිගැනීමක් තියෙනවා" (ස්ත්‍රී - වතු අංශය - මව)

ඉහත උද්ධෘතය තුළින් පෙන්වා දෙන පරිදි වතු මධ්‍යම පාන්තිකයින්ගේ ජීවන අපේක්ෂාවන් බොහෝ විට අනාගත පරම්පරාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ගෘහස්ථ ස්ථාවරත්වය ගොඩනැගීම මත පදනම් වේ. එමගින් වතු මධ්‍යම පංතියේ උසස් ජීවන අපේක්‍ෂාවන් ඍජුවම ආර්ථික තත්ත්වයට හා ජීවන රටාවට සම්බන්ධ වේ.

බෝර්දියෝගේ සංස්කෘතික ප්‍රාග්ධන සංකල්පය හා සංකේතාත්මක ප්‍රාග්ධනය යන සංකල්පයට අනුව මධ්‍යම පාන්තිකයින්ගේ උසස් ජීවන අපේක්ෂාවන් විශ්ලේෂණය කිරීමේදී නාගරික මධ්‍යම පන්තියේ උසස් ජීවන අපේක්‍ෂාවන් ඍජුවම සංකේතාත්මක පරිභෝජනයන්ගෙන් අනූන වේ. නිදසුන් ලෙස වාහන, නිවාස, තාක්ෂණික උපකරණ හරහා සමාජයේ තම පන්තියට ලැබිය යුතු ස්ථානය තහවුරු කිරීමට යොමු වේ. ග්‍රාමීය මධ්‍යම පන්තියේ උසස් ජීවන අපේක්‍ෂාවන් ප්‍රධාන වශයෙන් සමාජ ගෞරවය, පිළිගැනීම මත පදනම් වේ. එය ආර්ථික ප්‍රගතියකට සාපේක්ෂව සමාජ පිළිගැනීම මත ගොඩනැගී ඇත. වතු මධ්‍යම පංතියෙහි උසස්


සාමගී Unity
ISSN 3121-4266

ජීවන අපේක්ෂාවන් සීමිත ආර්ථික සම්පත් මත රඳා පවතින නමුත් ඔවුන් අනාගත පරම්පරාවන්ගේ ජීවිතය උසස් කිරීම සඳහා ඔවුන්ගේ සංස්කෘතික හා ආගමික අංගයන් සමඟ බැඳෙමින් කටයුතු කරයි.

**3. අධ්‍යාපන ක්‍රමය සම්බන්ධ පවතින තරගකාරී ක්‍රමය**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින තරගකාරී ක්‍රමය නාගරික, ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල පවුල්වල උසස් අධ්‍යාපන අපේක්ෂාවන් හා සම්බන්ධයෙන් වෙනස් වන ආකාරය හඳුනාගත හැකි වේ. නාගරික මධ්‍යම පන්තියේ පවුල් බොහෝවිට මූල්‍යමය වශයෙන් අධ්‍යාපනය සඳහා පිරිවැයක් දරනු ලබන අතර එයා අනාගත ආයෝජනයක් ලෙස සලකනු ලබයි.

> "අපේ දුව ප්‍රධාන ජනප්‍රිය පාසලකට යන්නේ අමතර පන්තිවලටත් යනවා". (ස්ත්‍රී - නාගරික අංශය-මව)

යන අදහස ඔවුන්ගේ ඉහළ අධ්‍යාපන අපේක්ෂා සහ අධ්‍යාපන ක්‍රමයේ තරගකාරීත්වය සඳහා සූදානම් වන බවක්ද පැහැදිලි කරනු ලබයි. නාගරික මධ්‍යම පන්තියේ පවුල් උසස් අධ්‍යාපන අපේක්ෂාවන් මත තරගකාරී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන අතර දරුවන්ට ජනප්‍රිය පාසල් සහ අමතර පන්ති සඳහා සහභාගී වීම තුළින් අධ්‍යාපනයේ පවතින තරගකාරී ස්වභාවය සම්බන්ධව පැහැදිලි කරයි. නාගරික මධ්‍යම පංතියේ දෙමාපියන් අතර පවතින තරගකාරී අධ්‍යාපන සංස්කෘතිය තුළින් දරුවන්ට පාසල් අධ්‍යාපනික තත්ත්වයේ උසස් වීම් පිළිබඳ ඉහළ මට්ටමේ අපේක්ෂා පවතී. නාගරික මධ්‍යම පංතියේ දෙමාපියන් විසින් අධ්‍යාපන තරගකාරීත්වය ඉතා ඉහළ මට්ටමක පවත්වාගෙන යනු ලැබේ.

> "අපේ කාලයේ මේ වගේ අමතර පන්ති ගියේ නෑ. දැන්නම් ඒවා නැතුව ළමයින්ට ඉස්සරහට යන්න බැහැ". (පුරුෂ - නාගරික අංශය - පියා )

යන අදහස නාගරික දෙමාපියන් විසින් ඉදිරිපත් කරනු ලබයි. එම හේතුව නිසා ළමයින්ගේ පාසල් විභාග ප්‍රතිඵල ආදිය ඉහළ නැංවීම සඳහා අමතර පන්ති, පුද්ගලික ගුරුවරු නිවසට ගෙන්වාගෙන තනි පුද්ගල පන්ති පැවැත්වීම, අන්තර්ජාල පාඨමාලා සඳහා මුදල් වැය කිරීම සාමාන්‍ය සිද්ධියක් බවට පත්ව ඇති බවත් තහවුරු වේ. නමුත් ග්‍රාමීය සමාජයේ මධ්‍යම පාන්තික පවුල් අතර අධ්‍යාපන තරගකාරීත්වය සැලකීමේ දී ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුල් අධ්‍යාපනය වැදගත් ලෙස සැලකුවද ආර්ථික සීමා හා සම්පත් හිඟය හේතුවෙන් අමතර පන්ති හා තාක්ෂණික උපාංග ලබා ගැනීම සීමාවේ.

ග්‍රාමීය පාසල් සම්බන්ධව සැලකීමේදී බොහෝ විට විශේෂ තරගකාරී පරිසරයක් ඇති කිරීමට සාපේක්ෂව ළමයින්ගේ ඉගෙනුම් කාර්යයන් අසමාන මට්ටමෙන් බෙදා හැරීමක් සිදුව ඇත.


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

"මෙහේ තියෙන ලොකු පිළිගත් ඉස්කෝලවලට දාන්න ළමයින්ගේ ප්‍රතිඵල, විෂය බාහිර ක්‍රියාකාරකම්, නායකත්වය ඒවත් බලනවා". (ස්ත්‍රී -නාගරික අංශය -මව)

ඉහත උද්ධෘතය තුළින් පැහැදිලි කිරීමට උත්සාහ කරනුයේ නාගරික දෙමාපියන් තුළ ජනප්‍රිය පාසල් සඳහා ළමයින් ඇතුළත් කිරීම සඳහා තරඟයක් ගොඩනැගී ඇති බවයි. ඒ අනුව ජනප්‍රිය පාසල්වලට තම දරුවා ඇතුළත් කර ගැනීම සඳහා දරුවන් තුළින් තරඟයක් ගොඩනගා ගැනීමට උත්සාහ දරන බව පැහැදිලි වේ. ළමයින් තුළ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා උනන්දුව ඇති කිරීම, නායකත්ව කුසලතා ඇති කිරීම, ප්‍රතිඵල ඉහළ නැංවීම තුළින් ශිෂ්‍ය කාර්ය සාධනය ඉහළ තත්ත්වයකට පත් කිරීමට උත්සාහ දරන බව පැහැදිලි වේ. මෙයට අමතරව නාගරික පවුල් අතර

"අනිත් ළමයින් කරන දේවල්වලට අපේ ළමයින් පොළඹවන්න ඕන" (ස්ත්‍රී -නාගරික අංශය -මව)

යන අදහස තුළින් නාගරික සමාජය දරුවන් අතර පුළුල් තරඟයක් ඇති වී ඇති ආකාරයත් එම තරඟය ගොඩනැගීම සඳහා දෙමාපියන් ද දරුවන් පොළඹවනු ලබන ආකාරය හඳුනාගත හැකිය. එමෙන්ම නාගරික පවුල් අතර එක් එක් ළමයින් සංසන්දනය කිරීමක් ද සිදුකරන ආකාරය පැහැදිලිය. "අනෙක් ළමයින් කරන දේ අපේ දුවටත් කරන්න දෙන්න ඕන" යන සංසන්දනාත්මක ප්‍රකාශය තුළින් අධ්‍යාපනය තුළ තරඟකාරී පරිසරයක් ගොඩනැගී ඇත. මේ හේතුව නිසා ඇතැම් නාගරික දරුවන් අධ්‍යාපනය සම්බන්ධයෙන් අඛණ්ඩ වශයෙන් තීරණයට ලක්වන ආකාරයක් හඳුනාගත හැකිය. නාගරික මධ්‍යම පංතියේ අධ්‍යාපන තරඟකාරීත්වය සම්බන්ධව දරුවන් තුළ පීඩනයක් ඇතිවී ඇති ආකාරයද හඳුනාගත හැකිය.

"හැමදාම ටියුෂන් එහෙම තියෙනවා එකක්වත් මිස් වුනොත් ලකුණු අඩු වෙයි කියලා බයයි" (ස්ත්‍රී - නාගරික අංශය - ශිෂ්‍ය)

නාගරික මධ්‍යම පංතිය තුළ දරුවන් සඳහා අමතර පන්තිය අනිවාර්ය වී ඇති ආකාරය හඳුනාගත හැකිය. එමගින් දරුවන් තුළ අධ්‍යාපනය සම්බන්ධව අනවශ්‍ය පීඩනයක් ගොඩනැගෙන බව පැහැදිලිය. එමෙන්ම නාගරික මධ්‍යම පන්තියේ දෙමාපියන්ද දරුවන්ට අමතර පන්ති යැවීම සම්බන්ධව ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරන ආකාරයත් අමතර පන්ති මගහැරීම තුළින් ළමයින්ගේ ප්‍රතිඵල අවම මට්ටමකට පත්ව කාර්ය සාධනය සඳහා බලපෑම් කරනු ලබන බවට අවධාරණය කරයි. නාගරික මධ්‍යම පංතියේ අධ්‍යාපන තරඟකාරීත්වය යනු ළමයින්ගේ අධ්‍යාපනික සාර්ථකත්වය සම්බන්ධ අධික අපේක්ෂාවක් සහ තරඟකාරී සංසන්දනය මත පදනම් වූ සංස්කෘතියකි. නාගරික මධ්‍යම පාන්තික පවුල් විශාල වශයෙන් අමතර පන්ති, තාක්ෂණික පුහුණු වැඩසටහන්, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා මුදල් හා කාලය කැප කරනු ලබයි. එමෙන්ම නාගරික ජනප්‍රිය පාසල් තෝරා ගැනීම සඳහාද ප්‍රවේශ ලකුණු හා විශේෂ හැකියාවන් මත ප්‍රමුඛත්වය හිමි වේ. තවද අනෙක් ළමයින්ගේ සාර්ථකත්වය සමග අඛණ්ඩ ලෙස සංසන්දනය වීම නිසා ළමයින් තරමක් දුරට මානසික පීඩනයකින්ද පසුවන බව


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

පැහැදිලිය. මේ අනුව නාගරික ළමයින්ගේ අධ්‍යාපනය අතිශය තරගකාරී බලපෑමක් ඇති කරනු ලබන තත්ත්වයකි.

ග්‍රාමීය සමාජයේ අධ්‍යාපන තරගකාරීත්වය සාපේක්ෂ වශයෙන් නාගරික ප්‍රදේශවලට වඩා අඩු මට්ටමක පැවත තිබුණද විවිධ මට්ටමින් එම තරගකාරීත්වය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම ග්‍රාමීය මධ්‍යම පංතියේ පවුල් අතර අධ්‍යාපන අපේක්ෂාවන් පවත්වාගෙන යනු ලබන සුළු පිරිසක් සිටී.

> "අනිත් ළමයින් උනන්දුවෙන් ඉගෙන ගන්නවා නිසා අපිත් උත්සහ කරනවා දරුවන්ට උගන්නන්න" ( ස්ත්‍රී - ග්‍රාමීය අංශය - මව)

යන අදහස තුළින් එම සබඳතාවය පෙන්වයි. තවද ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල මූලික අධ්‍යාපනය හා විභාග ප්‍රතිඵල පිළිබඳ හැඟීම තරගකාරීත්වයක් ඇති කරනු ලබයි. නමුත් නාගරික ප්‍රදේශවල මෙන් සංසන්දනය කිරීම විශාල වශයෙන් අපේක්ෂාවන් හා අධික මානසික පීඩනයේ සාමාන්‍යයෙන් අවම වේ. සාම්ප්‍රදායික වශයෙන් වතු සමාජයේ අධ්‍යාපන තරගකාරීත්වය ග්‍රාමීය සමාජයට සාපේක්ෂව වර්ධනය වෙමින් පවතින බව හඳුනා ගැනීමට හැකි වේ. ප්‍රායෝගිකව වර්තමානය වන විට තරගකාරීත්වය වර්ධනය වීම සිදුව ඇත.

> "අපිට ඒ කාලේ වත්තුකම් හැර අනිත් වැඩකට යන්න අධ්‍යාපනික සහතික එහෙම තිබුනනම් හොඳයි කියල හිතනවා". (ස්ත්‍රී - වතු අංශය -මව)

යන අදහස මඟින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය මගින් සමාජ චලනතාවයට දැඩි අපේක්ෂාවක් පවතින බවයි. අතීතයේදී වතු සමාජය තුළ අධ්‍යාපන සුදුසුකම් පැවතුණේ නම් එය වතු රැකියාව හැර වෙනත් රැකියාවන් කිරීමට සුදුසුකමක් වන බව ඔවුන් අනාවරණය කරයි. වතු සමාජවල දෙමාපියන් සතුව ද තරගකාරී අධ්‍යාපනය සම්බන්ධව අපේක්ෂාවන් පවතින බව පහත උද්ධෘතය තුළින් පැහැදිලි වෙයි.

> "මේ වැඩේ හරිම අමාරුයි දරුවා හොඳට ඉගෙන ගත්තොත් වතුකම් කරන එක නවත්වන්න පුළුවන්". (ස්ත්‍රී - වතු අංශය -මව)

ඉහත ප්‍රකාශය තුළින් දෙමාපියන් තුළ අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින අපේක්ෂා සහ සහගත බව පැහැදිලි කරනු ලබයි. දරුවා නිවැරදි අධ්‍යාපනයක් ලබා ගතහොත් එය තම පවුලේ සංවර්ධනය සඳහා හේතුවන බව පැහැදිලි කරනු ලබයි. තවද නාගරික සමාජයන්හි මධ්‍යම පාන්තික ළමයෙන් ඉංග්‍රීසි, තාක්ෂණය ආදී විෂයන් සියල්ලක්ම හදාරන බවත් එම ළමයින් තුළ එම විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පවත්නා වූ උනන්දුව හේතුවෙන් වතු සමාජයන්හි දෙමාපියන් ද එම දරුවන්ට ඉංග්‍රීසි තාක්ෂණය ආදී වූ යාවත්කාලීන වූ විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව සලසා දීම සිදුකරනු ලබයි. එය අධ්‍යාපන තරගකාරීත්වය වතු සමාජයන්හි වර්ධනය වන අවස්ථාවක් ලෙසද හඳුන්වා දිය හැකිවේ. ග්‍රාමීය සමාජයන් සමඟ සංසන්දනයේදී


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266

වතු සමාජයේ අධ්‍යාපන තරගකාරීත්වය සාපේක්ෂව ඉහළ මට්ටමකින් සංවර්ධනය වී ඇති බවද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

අධ්‍යාපන ක්‍රමය සම්බන්ධ පවතින තරගකාරී ක්‍රමය විග්‍රහ කිරීමට පියෝ බෝර්දියෝගේ ප්‍රාග්ධන න්‍යාය භාවිත කළ හැකිය. නාගරික මධ්‍යම පන්තිය සංස්කෘතික හා සමාජ ප්‍රාග්ධනය වැඩිදියුණු කරමින් අධ්‍යාපන තරගකාරීත්වය පවත්වාගෙන යනු ලබයි. ග්‍රාමීය හා වතු සමාජයන්හි එම සමාජ ප්‍රාග්ධන හැකියාවන් අසමාන තත්ත්වයක පවතින නමුත් අධ්‍යාපනය ඔවුන්ගේ සමාජ චලනතාවය සඳහා මූලික උපාය මාර්ගයක් ලෙස සලකනු ලබයි.

**4. තාක්ෂණය සම්බන්ධ ආකල්ප**

තාක්ෂණය සම්බන්ධයෙන් පවතින ආකල්පය නාගරික, ග්‍රාමීය සහ වතු සමාජයන් තුළ පවතින නමුත් එහි ස්වභාවය දැක්ම සහ එය ප්‍රායෝගිකව භාවිත කරන ආකාරය ප්‍රභේදාත්මකව විවිධාකාර මුහුණුවරක් ගනී. නාගරික සමාජය දෙමාපියන්ගේ සහ දරුවන්ගේ අදහස අනුව තාක්ෂණය අනාගත සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්ව ඇත.

> "දැන් ඉගෙන ගන්නවා නම් අයිසීටී හරිම වැදගත්, ඒක නැතිව වැඩක් නැහැ". (පුරුෂ - නාගරික අංශය - පියා)

යන අදහස නාගරික මධ්‍යම පංතිය තුළ ව්‍යාප්ත වී ඇති අතර එහි තවත් පියවරක් ලෙස

> "අපේ දරුවාට අයිසීටී නැත්නම් අනාගතයේ කම්පෙටිෂන් එකේ ඉන්න බැහැ"( ස්ත්‍රී - නාගරික අංශය - මව)

යන ප්‍රකාශය තුළින් ඔවුන් තාක්ෂණය කෙරෙහි දක්වන උනන්දුව පැහැදිලි කරනු ලබයි. නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන් විසින් සඳහන් කරනු ලබන ආකාරයට තාක්ෂණය සම්බන්ධව සුභවාදී ආකල්පයක් ඇති කිරීමේදී තම දරුවා තාක්ෂණය සම්බන්ධව තරගකාරීත්වයට යොමු කිරීම සිදු කළ යුතුය. එහිදී තාක්ෂණික පහසුකම් ලබා දීම තාක්ෂණික අධ්‍යාපනය සඳහා දක්ෂ ගුරුවරුන් සම්බන්ධ කර ගැනීම තුළින් සිදුකරයි. තවද තාක්ෂණය යනු නව විෂය ක්ෂේත්‍රයක් වන අතර එය වර්තමානයේ ගෝලීය සමාජය තුළ ඇති වී ඇති නව අභියෝගයන්ට පිළිතුරු ලබාදීමක් ලෙසත් සැලකෙයි.

> "අපේ දුව රොබටික්ස් ප්‍රොජෙක්ට් එකක ඉන්නවා. ඒක සයන්ස් එක්ෂිබිෂන් එකටත් දාන්න පුලුවන් කියලා හිතනවා". (ස්ත්‍රී - නාගරික අංශය -මව)

යනුවෙන් දෙමාපියන් තාක්ෂණය තුළින් දරුවන්ගේ පුද්ගලික හැකියාවන් වර්ධනය කිරීමට උත්සාහ කරනු ලබයි. දරුවා තාක්ෂණය තුළින් ඉදිරියට ගමන් කිරීමට මෙය හේතුවක් වන බව දෙමාපියන් විශ්වාස කරයි. නමුත් ග්‍රාමීය සමාජය තුළ තාක්ෂණය පිළිබඳ උනන්දුව සහ භාවිතය සීමිත වුවද සුබවාදී ආකල්පයක් පවතී.


සාමග්‍රී Unity
ISSN 3121-4266
cc BY NC ND

"දරුවාට අලුත් කොම්පියුටර් එකක් අරන් දෙන්න තරම් වත්කමක් නම් නැහැ. ඒක නිසා පාවිච්චි කරපු එකක් අරන් දුන්නා.ඒක කොට ගානකට හම්බවුන නිසා" (පුරුෂ - ග්‍රාමීය අංශය - මව )

යන අදහස තුළින් තාක්ෂණික දැනුම වඩාත් වැදගත් යැයි පිළිගැනීමක් පවතී. නමුත් ප්‍රායෝගිකව ග්‍රාමීය මධ්‍යම පංතිය සතුව පවතින ආර්ථික අපහසුතා හේතුවෙන් තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේ හැකියාව සීමා වී ඇති බව පැහැදිලිය. වතු සමාජය තුළ තාක්ෂණය සම්බන්ධයෙන් සුබවාදී ආකල්පය වඩා ඉස්මතු වන ආකාරයක් හඳුනාගත හැකිය.

"අපේ පුතා ඉස්කෝලේ අයිසීටී කරන නිසා පල්ලියේ ෆාදර් දන්න මහත්තුරු වගයක් ඇවිත් කොම්පියුටර් එකක් දීලා ගියා" (ස්ත්‍රී - වතු අංශය - මව)

වතු සමාජය තුළ මධ්‍යම පාන්තික දෙමාපියන්ගේ අදහස් වනුයේ තාක්ෂණය සම්බන්ධව ඉගෙන ගැනීමට ඒ සඳහා අවශ්‍ය වන මූලික පහසුකම් පැවතිය යුතු බවයි. ඔවුන් තාක්ෂණය උදව්කරුවකු ලෙස හඳුනාගනු ලබයි. වතු සමාජයන්ට රාජ්‍ය නොවන සංවිධානයන්හි පවතින උදව් උපකාර පල්ලිය හරහා ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.ඒ අනුව දරුවන්ට තාක්ෂණය ඉගෙනීම සඳහා අවශ්‍ය වන සම්පත් ලබාදීම රාජ්‍ය නොවන සංවිධානයන්ගේ අනුග්‍රහය මත සිදුවී ඇති ආකාරය හඳුනාගත හැකි වේ.

තවද වතු සමාජය තුළ දෙමාපියන් දරුවන්ට යම් තාක් මට්ටමකින් හෝ තාක්ෂණික පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලබන ආකාරයද හඳුනාගත හැකි විය.

"අපේ දුව යූටියුබ් එකෙන් අලුත් වීඩියෝ බලලා ඉගෙන ගන්නවා" (ස්ත්‍රී - වතු අංශය - මව)

වතු සමාජය තුළ තාක්ෂණය සම්බන්ධව පවතින ආකල්පය ඉගෙනීමේ දොරටුවක් ලෙස හඳුනාගනු ලබන බව පැහැදිලිය. වතු සමාජය තුළ දරුවන් ඔවුන්ට පහසුවෙන් ළඟා විය හැකි තාක්ෂණික මෙවලම් භාවිත කරමින් එය අධ්‍යාපනය සඳහා යොදා ගනු ලබන ආකාරයත් පැහැදිලි වේ. නමුත් නාගරික සමාජය තුළ අන්තර්ජාලය, Youtube, මාර්ගගත ඉගෙනීමේ ජාල, Zoom වැනි යෙදුම් නාගරික පවුල් භාවිතා කරනු ලබන දෛනික සාමාන්‍ය ඉගෙනීමේ මෙවලම් බවට පත්ව ඇත. මේ අනුව නාගරික සමාජයන් තුළ මධ්‍යම පාන්තික දරුවන් අධ්‍යාපන ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා තාක්ෂණය යොදා ගනු ලබන ආකාරය හඳුනාගත හැකිය.

ග්‍රාමීය සමාජය තුළ තාක්ෂණය සම්බන්ධයෙන් පවතින සුබවාදී ආකල්පය සීමා වීම කෙරෙහි තාක්ෂණික සේවාවන් හිඟතාවය බලපානු ලබන බව ග්‍රාමීය මධ්‍යම පාන්තික දෙමාපියන් තුළින් හඳුනාගැනීමට හැකි විය.


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

"ඉන්ටනෙට් ස්ලෝ, ඩේටා දාගන්නත් ගොඩක් වෙලාවට ලොග් වෙන්න අමාරුයි" (ස්ත්‍රී - ග්‍රාමීය අංශය - මව)

තාක්ෂණය සම්බන්ධයෙන් පවතින සුබවාදී ආකල්පය ක්‍රියාත්මක වීමට පවතින ව්‍යවහාරික බාධක පිළිබඳව මෙහිදී අවධානය යොමු වේ. මූලික තාක්ෂණික යටිතල පහසුකම්වල පවතින හිඟතාවය, සීමිත දත්ත පැකේජ නිරන්තරයෙන්ම අධිවේගී අන්තර්ජාල ප්‍රවේශ විය නොහැකි වීම ආදී කාරණා මෙයට පදනම් වෙයි. ඒ අනුව ග්‍රාමීය සමාජයේ මධ්‍යම පාන්තික දරුවන්ට තාක්ෂණික ප්‍රවේශය සඳහා අවශ්‍ය වන මූලික අධ්‍යාපනික පහසුකම් සීමා වීමක් දක්නට ලැබෙයි. මේ අනුව ග්‍රාමීය සමාජය තුළ තාක්ෂණය සම්බන්ධයෙන් උනන්දුව හා අවශ්‍යතාවයක් පැවතුනද එය තෘප්තිමත් කිරීමට අවශ්‍ය උපකාරක සම්පත් වෙත ප්‍රවේශ වීම අපහසු වී ඇත. තාක්ෂණය සම්බන්ධව පවතින සුබවාදී ආකල්පය නාගරික, ග්‍රාමීය හා වතු සමාජ තුනෙහිම දක්නට ලැබේ. නමුත් එම ආකල්පයන්ගේ ස්වභාවය දැක්ම හා ප්‍රායෝගික භාවිතය සමාන තත්ත්වයකින් සිදු නොවේ. නාගරික සමාජයන් තුළ තාක්ෂණය අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය මෙවලමක් ලෙස ප්‍රායෝගිකව භාවිත වන අතර මෙය නාගරික සමාජය තුළ තරගකාරී පරිසරය තුළින් බලපෑමට ලක්වන්නකි. ග්‍රාමීය සමාජය තුළ තාක්ෂණය පිළිබඳව පවතින වැදගත්කම පිළිගන්නා නමුත් සම්පත් හෝ ප්‍රවේශය සීමිත නිසා ප්‍රායෝගික භාවිතය අවම වී ඇත. වතු සමාජය තුළ තාක්ෂණය සම්බන්ධව පවතින ආකල්පය වන්නේ අනාගතය වෙනස් කළ හැකි දොරටුවක් ලෙස තාක්ෂණය සම්බන්ධ සුබවාදී දැක්මක් පැවතීමයි. ඒ අනුව තාක්ෂණය සම්බන්ධ සුභවාදී ආකල්ප ග්‍රාමීය, නාගරික, වතු යන සියලුම සමාජයන් තුළ පවතින නමුත් එහි ප්‍රකාශය බලපෑම සහ අභියෝග වෙනස් වේ (Warschauer, 2004).

නාගරික, ග්‍රාමීය හා වතු සමාජයන් තුළ තාක්ෂණය සම්බන්ධ ආකල්ප සහ එහි බලපෑම විවිධාකාර වන බව පැහැදිලි වේ. නාගරික මධ්‍යම පංතිය තාක්ෂණික දැනුම සහ භාවිතය සඳහා සමාජ ප්‍රාග්ධනය භාවිත කරමින් තම දරුවන්ගේ අනාගත සාර්ථකත්වය සඳහා ආයෝජනය කරනු ලබයි. ග්‍රාමීය මධ්‍යම පංතිය තාක්ෂණය පිළිබඳ අපේක්ෂාවකින් පසුවන අතර සීමිත ප්‍රවේශයකින් යුක්ත වේ. එයට සාපේක්ෂව වතු මධ්‍යම පංතිය සමාජ උසස් වීම් සඳහා තාක්ෂණය අවස්ථාවක් ලෙස හඳුනා ගනු ලැබේ.

**5. සංකේත පරිභෝජනය**

මධ්‍යම පන්තිය තුළ සංකේත පරිභෝජනය යනු භාණ්ඩ හා සේවාවන් පරිභෝජනය කිරීම මගින් තම සමාජ පන්තිය සහ අනන්‍යතාවය ප්‍රකාශ කිරීමකි. විශේෂයෙන්ම මධ්‍යම පන්තිය තම සමාජ තත්ත්වය වඩාත් ශක්තිමත් කර ගැනීම, නව තාක්ෂණය හෝ අධ්‍යාපනික ක්‍රම සමඟ අනුකූල වීම සහ අනෙක් පන්තීන්ගෙන් වෙන්වීම සඳහා සංකේතමය පරිභෝජනය භාවිත කරනු ලබයි. නාගරික මධ්‍යම පන්තිය තුළ සංකේත පරිභෝජනය විශිෂ්ට ආකාරයකින් පවතී. එමගින් නාගරික මධ්‍යම පාන්තිකයින්ගේ අධ්‍යාපනය, තාක්ෂණික උපාංග, ඉගෙනීමේ ක්‍රමෝපායන් , භාෂාව ඔස්සේ හඳුනා ගැනීමට හැකිවේ , බොහෝ නාගරික දෙමාපියන් විසින් දරුවන්ට Ipad, උසස් තත්ත්වයේ පරිගණක, iphone, Smart watches වැනි උපාංග ලබාදීම


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266
9 773121 426004

සිදු කරයි. එම උපාංග නාගරික මධ්‍යම පාන්තිකයන්ගේ සමාජ පන්තිය හා සමාජ තත්ත්වය පෙන්නුම් කරනු ලබන සංකේතමය පරිභෝජන අංගයන්ය. නාගරික සමාජය තුළ සංකේතමය පරිභෝජනය මගින් දරුවන්ගේ අනාගතයේ සඳහා ආයෝජනයක් වශයෙන් ද පමණක් නොව ඔවුන්ගේ පන්තියට ආවේණික වූ හැසිරීම් රටාවක්ද පෙන්නුම් කරයි.

එමෙන්ම නාගරික මධ්‍යම පාන්තිකයින් භාෂා භාවිතය සිදු කිරීමේදී ඉංග්‍රීසි භාෂාව කෙරෙහි සංකේතමය වටිනාකමක් ලබා දෙනු ලබන්නේ සමාජයේ උසස් බුද්ධිමය මට්ටමක් පෙන්වීම සඳහා ය. නාගරික මධ්‍යම පන්තියට සාපේක්ෂව ග්‍රාමීය මධ්‍යම පන්තිය තුළ සංකේත පරිභෝජනය ක්‍රමයෙන් ඉස්මතු වෙමින් පවතී. නාගරික මධ්‍යම පන්තියේ සංකේත පරිභෝජනයට සමාන වීමට උත්සාහ කිරීමක් තිබුණද ආර්ථිකමය වශයෙන් පවතින සීමාවන්, පහසුකම් හිඟය, සංස්කෘතිමය වශයෙන් පවතින්නාවූ තරගකාරීත්වය මත සංකේත පරිභෝජනය ග්‍රාමීය සමාජයට අනන්‍ය වූ ලෙස සිදුවේ.

ග්‍රාමීය සමාජය තුළ සංකේතමය පරිභෝජනය ක්‍රියාත්මක වන්නේ පවුලේ ආදායම, අධ්‍යාපනික මට්ටම, කුලය හා සමාජ සම්මතයන් අනුව ය. ඒ අනුව ඇඳුම් පැළඳුම් හා විලාසිතා අනුව නවීන වර්ණ වලින් යුත් ඇඳුම් පැළඳුම්, නවීන වෙළඳපොළ නාමයන්ගෙන් යුත් පාවහන් ආදිය මගින් සමාජ පන්තිය, සංස්කෘතිය පවුලේ තත්ත්වය පෙන්වීම සඳහා විශාල උත්සාහයක් ගනු ලබයි.

> "අපි ඉතින් වැදගත් ගමනක් එහෙම යද්දී ඔසරිය තමයි අඳින්නේ. දැන් කාලේ වගේ ඔසරියට එක එක විච්චූරණ කරන්නේ නැහැ අපි" (ස්ත්‍රී - ග්‍රාමීය අංශය - මව)

ඉහත ප්‍රකාශය තුළින් ග්‍රාමීය සමාජය වැඩිහිටි කාන්තාවක් සම්ප්‍රදාය වඩා වැදගත් ලෙස සලකමින් කටයුතු කරනු ලබන අතර එය නවීනත්වය සමඟ විග්‍රහ කරමින් සංකේතමයන් වටිනාකමක් ලෙස භාවිත කරනු ලබන බව පැහැදිලිය. මෙවැනි ඇඳුම් පැළඳුම් තුළින් ඔවුන් උසස් සමාජ පන්තියකට අයත් බවත් එම පන්තිය තුළ ගෞරවය දිනා ගැනීමටද කටයුතු කරනු ලබයි. නාගරික සමාජයන් තුළ පරිභෝජනය සංකේත එයට ග්‍රාමීය සමාජයට වඩා වෙනස් ආකාරයෙන් පැහැදිලි කරනු ලබයි. එහිදී උසස් වෙළඳ නාමයන්ගෙන් යුත් මිල අධික ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම නවීන විලාසිතාවන් අනුගමනය කිරීම, බටහිර පන්නයට මූලිකත්වයක් ලබාදීම සිදුකරයි.

> "අපි ගොඩක් වෙලාවට Imported ඇදුම් තමයි අඳින්නේ. නැත්නම් Odel එකෙන් වගේ තමයි ඇඳුම් එහෙම ගන්නේ " (ස්ත්‍රී - නාගරික අංශය - මව)

උසස් සන්නාමයන්ගෙන් යුත්ත ඇඳුම් පැළඳුම් භාවිතය තුළින් ඔවුන් නවීන විලාසිතාවන්ට අයත් බව පෙන්නුම් කරයි. එම නවීන විලාසිතා භාවිතය සිදුකරන තරුණ පරපුර හා දෙමාපියන් විසින් තම පංතියේ විශිෂ්ටත්වය හා නවීනත්වය පෙන්වා දෙනු ලබන සංකේතාත්මක ක්‍රියාවලියකි. වතු සමාජය තුළ පරිභෝජනය සරල හා ප්‍රායෝගික ආකාරයෙන් සිදු වූවද ඒ තුළින් තමන්ගේ සංස්කෘතිය, පවුලේ ගෞරවය හා සමාජ පිළිගැනීම පිළිබඳව හැඟීමක් ඇති



CC BY NC ND
ISSN 3121-4266

කරයි. වතු සමාජයේ බොහෝ පවුල් අතර ගෘහ භාණ්ඩ ද සංකේතමය අරුතක් දෙනු ලබයි. එහි විශේෂත්වය වූයේ එම උපකරණවල වෙළෙඳ සන්නාමය පිළිබඳව අවබෝධය අවම මට්ටමක පවතින බවයි.

> "අපි ළඟදි දොර දෙකේ ෆ්‍රිජ් එකක් ගෙනාවා. වත්තෙ ගොඩක් අය ආවා ඒක බලන්න, විස්තර අහන්න එහෙම" (ස්ත්‍රී - වතු අංශය - මව)

මෙම ප්‍රකාශය තුළින් මෙම පරිභෝජන භාණ්ඩයෙහි වටිනාකම පිළිබඳව සැලකිලිමත් වීමත් එම ගෘහ භාණ්ඩ මගින් තම පවුලේ ආර්ථික මට්ටම පෙන්වීමත් ,සමාජ පිළිගැනීමක් ලබා ගැනීමට උත්සාහ කිරීමක් සිදුවේ. වතු සමාජයේ බොහෝ මධ්‍යම පාන්තික පවුල් නිවාස සැලසුම්වලින් තොර වුවද නව ගෘහභාණ්ඩ මගින් පරිභෝජනය සංකේතාත්මක ලෙස පෙන්නුම් කරනු ලබයි. නාගරික සමාජයන් තුළ සංකේත පරිභෝජනය සම්බන්ධව සාකච්ඡා කිරීමේදී ඔවුන් නියෝජනය කරනු ලබන ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් මගින් සමාජ වගකීම සහ ඔවුන්ගේ සමාජ තත්ත්වය උපක්‍රමශීලී ලෙස පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන්ම මෙම නාගරික සමාජයේ මධ්‍යම පාන්තික පවුල්, පාසල්, ආදි ශිෂ්‍ය සංගම්හි නිලධාරීන් ලෙස කටයුතු කිරීම, පුණ්‍යාධාර සමිතීන්ගේ සාමාජිකත්වය, සමාජ ව්‍යාපාර සංගම්, පරිසර සංගම්හි සාමාජිකත්වය දැරීම තුළින් ඔවුන් සමාජ ප්‍රාග්ධන හැකියාව සන්නිවේදන ජාල පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුකරයි.

**6. ජීවන රටාව සහ චර්යා ප්‍රකාරය**

නාගරික මධ්‍යම පාන්තික පවුල්වල ජීවන රටාව පිළිබඳව විමසීමේදී විශේෂත්වයක් පැහැදිලි ලෙස හඳුනාගත හැකි වෙයි. නාගරික මධ්‍යම පංතිය සැලකීමේ දී පවුල් බොහෝ විට විශේෂඥ වෘත්තීන්හි යෙදී සිටිමින් ජීවිකාව ගෙනයනු ලබයි. එම වෘත්තීන් අතර ඉංජිනේරු, ගුරු, බැංකු සේවකයින් වේ. මොවුන්ගේ සමාජ සම්බන්ධතා සාපේක්ෂ වශයෙන් අවම වේ.

> "මම නම් RDB Bank එකේ තමයි වැඩ කරන්නේ, ගොඩක් වෙලාවට ගෙදර එන්නේ ඉතින් රෑ වෙලා ඉරිදා දවසට වගේ තමයි ගෙදර එන්නේ . පොදු වැඩවලට එහෙම යොදවන්න වෙලාව මදි". ( පුරුෂ - නාගරික අංශය - පියා)

මෙම උද්ධෘතය මගින් නාගරික මධ්‍යම පාන්තික ප්‍රජාව ඔවුන්ගේ රැකියාව තුළින් කාර්යබහුලත්වයට පත්වී ඇති ආකාරයත්, එම රැකියාව හේතුකොට ගෙන සමාජයේ පොදු වැඩ සඳහා කාලයක් වෙන් කර ගැනීමට අපහසු වී ඇත. එයට සාපේක්ෂව ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුල් රාජ්‍ය සේවයේ නියුක්තිකයන් ලෙසත් පෞද්ගලික ආයතනයන්හි සේවය කරනු ලබන පාන්තිකයන් ලෙසත් හඳුනාගත හැකි වේ.

> "මම ගමේ ග්‍රාම නිලධාරී විදිහට වැඩ කරනවා, ගමේ ගොඩක් රාජ්‍ය අංශය වැඩ කරන පවුල් ඉන්නවා" (පුරුෂ - ග්‍රාමීය අංශය - පියා)


සාමග්‍රි Unity
ISSN 3121-4266
CC BY NC ND

ඉහත ප්‍රකාශය තුළින් ග්‍රාමීය මධ්‍යම පාන්තික සමාජයන්හි සැලකිය යුතු පිරිසක් රාජ්‍ය අංශය නියෝජනය කරමින් තම රැකියාව සිදුකරනු ලබන බව හඳුනාගත හැකිය. එමෙන්ම මෙම ග්‍රාමීය සමාජය පිළිබඳව අවධානය යොමු කිරීමේ කිරීමේදී නාගරික සමාජයට සාපේක්ෂව සාමූහික සබඳතා හා ආගමික සංවිධානයන් සමඟ සහයෝගීව කටයුතු කරනු ලබන ආකාරයත් හඳුනාගත හැකිය. වතු කලාපය තුළ මධ්‍යම පංතිය සුවිශේෂී තත්ත්වයක් නියෝජනය කරනු ලබයි. වතු මධ්‍යම පංතිය තුළ රජයේ සේවයේ නියුතු ලිපිකරුවන්, ගුරුවරුන්, පෞද්ගලික අංශයේ සේවය කරන්නන් වැනි පිරිස් හඳුනාගත හැකිය. වතු සමාජය තුළ ආගමික නායකත්වය හා සමාජ සංවිධාන බලපෑමක් සිදු කරනු ලබන අතරන් මධ්‍යම පාන්තිකයන්ගේ ජීවන රටාව කෙරෙහි රාජ්‍ය නොවන සංවිධානයන්ගේ බලපෑමක් සිදු කරයි. පුද්ගලයින්ගේ ජීවන රටාව සම්බන්ධව විමසා බැලීමේදී Bourdieu විසින් ඉදිරිපත් කරනු ලබන චර්යා ප්‍රකාරය සංකල්පය (Habitus) වඩාත් වැදගත් වේ. මිනිසුන් තුළ නෛසර්ගික වශයෙන් චර්යා ප්‍රකාරයන් ගොඩනැගෙන අතර එය එක් එක් පුද්ගලයාට සාපේක්ෂව විවිධ මට්ටමෙන් යුක්ත වෙයි. මෙම පුද්ගල ජීවන රටාව හා චර්යා ප්‍රකාරයන්හි ග්‍රාමීය, නාගරික, වතු අනුව විවිධත්වයක් දක්නට ලැබේ.

නගරයේ ඉපදීම වඩාත් වාසිදායක බව නාගරික මධ්‍යම පාන්තිකයින් මගින් විසින් සලකා බලනු ලබයි. ඒ අනුව මොවුන් තුළ නෛසර්ගික චර්යා ප්‍රකාරයන් ගොඩනගා ගැනීම සිදුවේ. මෙම චර්යා ප්‍රකාරය නාගරික සමාජය තුළ තාක්ෂණික සාක්ෂරතාවය ගොඩනැගීම සඳහාද බලපෑමක් සිදුකරයි. නාගරික සමාජයේ ගුරුවරු, දෙමාපියන් සහ ළමයින් තුළ මෙම තාක්ෂණික සාක්ෂරතා කුසලතාව දක්නට ලැබේ.

> "අපේ ඉස්කෝලෙ ICT Society එකක් තියෙනවා OB එකෙන් ගොඩක් laboratory facilities එහෙම develop කරනවා. අපේ පන්තියේ ළමයින්ට තනිවම programme එකක් එහෙම develop කරන්න පුළුවන්" (ස්ත්‍රී - නාගරික අංශය - ගුරුවරියක්)

නාගරික මධ්‍යම පංතිය පිළිබඳව සැලකීමේදී ඔවුන් තුළ තාක්ෂණය භාවිත කිරීමේ නිර්භය ස්වභාවයක් හඳුනා ගැනීමට හැකියාව පවතී. එමෙන්ම ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීමේ කුසලතාවයද ඉහළ මට්ටමකින් පවතින බව හඳුනා ගැනීමට හැකිය. ගුරුවරු දෙමාපියන් මෙන්ම ළමයින් තුළද මෙය හඳුනාගත හැකි වේ.

> "අපේ School එකේ English society එකක් තියෙනවා. අපි English medium class එකේ තමයි ඉගෙනගන්නේ elocution class වලටත් අපි යනවා" ( පුරුෂ - නාගරික අංශය - පාසල් ශිෂ්‍ය)

මේ අනුව නාගරික සමාජයේ මධ්‍යම පාන්තිකයින් සතුව පවතින චර්යා ප්‍රකාරය අනුව ඔවුන්ට විවිධ භාෂා හැසිරවීම සම්බන්ධ පුහුණුවක් සහ ආභාසයක් නාගරික සමාජයේ පාසල් තුළින් නිසඟයෙන්ම ගොඩනැගී ඇති ආකාරයත් ඒ සඳහා තව දුරටත් මධ්‍යම පාන්තික පවුල් පසුබිම තුළින් පිටුබලයක් ලබා දෙනු ලබයි. නාගරික මධ්‍යම පාන්තික පුද්ගලයින් ග්‍රාමීය හා වතු



ISSN 3121-4266

සමාජයන්ට සාපේක්ෂව ඔවුන්ගේ ජීවන රටාව හා චර්යා ප්‍රකාරය නාගරික සමාජයට අනුකූල ලෙස ගොඩනැගී ඇත. එය ඔවුන්ට සමාජය තුළ ඵලදායි සමාජ සබඳතා ගොඩනගා ගැනීමට උපකාරී වේ.

> “මම රාහුලේට ගියපු නිසා කතරගම දේවාලෙ කපු මහත්තයා එහෙමත් හොඳට දන්නවා. ඒ වගේ සම්බන්ධතා ගොඩක් ඉස්කෝලේ නිසා හදාගන්න පුළුවන් වුණා” (පුරුෂ - නාගරික අංශය - පියා )

මෙහි සඳහන් ආකාරයට නාගරික සමාජයේ මධ්‍යම පාන්තික පුද්ගලයින් ඔවුන්ගේ සමාජ ප්‍රාග්ධන හැකියාව අනුව සමාජ සබධතා ගොඩනගා ගැනීම සිදුකර ඇති ආකාරයත් එය ඔවුන්ට ඵලදායීව භාවිතයන් සඳහා ඉවහල් වූ ආකාරයත් පැහැදිලි කරනු ලබයි. ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුල් රාජ්‍ය සේවයේ නියුක්තිකයන් ලෙසද පෞද්ගලික ආයතනවල සේවය කරන පංතිකයන් ලෙසද හඳුනාගත හැකි අතර මෙය ඔවුන්ගේ ආර්ථික හා සමාජය තත්ත්වය නිරූපණය කරයි.

> “මම ගමේ ග්‍රාම නිලධාරී විදිහට වැඩ කරනවා. ගමේ ගොඩක් රාජ්‍ය අංශයේ වැඩ කරන පවුල් එහෙම ඉන්නවා”. (ස්ත්‍රී - ග්‍රාමීය අංශය- ග්‍රාම නිලධාරී)

මෙයින් ග්‍රාමීය ජීවන රටාව සහ සමාජීය තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් කරනු ලබයි. ඒ අනුව ග්‍රාමීය සමාජයේ පිරිස් රාජ්‍ය අංශයේ සේවයේ නියුක්තව කටයුතු කිරීම ගරුත්වයකින් යුත් රැකියාවක් ලෙස සලකනු ලබයි. එමඟින් ඔවුන් ග්‍රාමීය සමාජය තුළ තමන්ගේ සමාජ තත්ත්වය සංකේතවත් කිරීමක් සිදුකරනු ලබයි. මෙම තත්ත්වය විස්තර කිරීමේදී Bourdieu ගේ චර්යා ප්‍රකාර න්‍යාය මගින් පැහැදිලි කර හැකිය. Habitus යනුවෙන් හඳුන්වන්නේ පුද්ගලයින් සමාජීය ලෙස පිළිගත් ආකල්ප, අගය ඇසුරෙන් ඔවුන්ගේ චර්යා රටාවන් ගොඩනගා ගැනීමයි. ග්‍රාමීය සංදර්භය අනුව සඳහන් කිරීමේදී ග්‍රාමීය මධ්‍යම පංතියේ රාජ්‍ය සේවක පවුල් සහ පෞද්ගලික ආයතනයන්හි සේවය කරනු ලබන පවුල් තම ජීවිතය ගොඩනගා ගනු ලබන්නේ ආගමික සංවිධාන, සාමූහික සබඳතා සමාජයේ අගයන්ට සුදුසු වන ආකාරයෙනි. නාගරික සමාජයට සාපේක්ෂව ඔවුන්ගේ තරගකාරීත්වය හා පුද්ගලවාදය පසුබැස සමාජීය සහයෝගීතාවය, ආත්මීය සබඳතා හා එකමුතුකම පදනම් වූ ජීවන රටාවක් වර්ධනය වේ. ඒ අනුව ග්‍රාමීය මධ්‍යම පංතියේ සමාජයේ අත්දැකීම් හා ජීවන රටාව Bourdieu විසින් පැහැදිලි කරනු ලබන චර්යා ප්‍රකාරය මගින් සකස් වන සමාජීය හා සංස්කෘතික ක්‍රියාකාරිත්වයේ විශේෂ ආකාරයක් ලෙස සැලකිය හැකිය. මෙම ග්‍රාමීය මධ්‍යම පන්තියේ පවුල් සමාජයේ ආර්ථික ස්ථාවරත්වය ලබා ගනුයේ රාජ්‍ය හා පෞද්ගලික සේවා තුළින් වුවද ඔවුන්ගේ ජීවන රටාව මධ්‍යම පංතියේ පවුල් සමඟ සෘජුවම සමාන නොවුනත් ඔවුන් අයත් වන ග්‍රාමීය සාම්ප්‍රදායික පසුබිම නිසා ග්‍රාමීය පුද්ගලයින්ගේ දෛනික ජීවිතය ආකල්ප, ආගමික චාරිත්‍ර සහ සමාජයේ එකමුතුකම මත රඳා පවතී.

වතු කලාපය තුළ මධ්‍යම පාන්තිකයන් ප්‍රධාන වශයෙන් වතු කාර්යාල රැකියා, පෞද්ගලික අංශයේ සේවය කරන රැකියාවන්හි නියුක්ත වන අතර ඔවුන්ගේ ආදායම හා වෘත්තීය


සාමග්‍රි Unity
ISSN 3121-4266
BY NC ND

ස්ථාවරත්වය මගින් ජීවන තත්ත්වය වෙනසකට ලක් කරයි. වතු සමාජය තුළ ආගමික ආයතනයන්හි පුහුණු පූජකවරු විශේෂයෙන්ම කතෝලික පල්ලිය හා විවිධ සමාජ සංවිධාන වතු මධ්‍යම පාන්තිකයින්ගේ දෛනික ජීවිතයට බලපෑමක් කරනු ලබන අතර සමාජයීය සබඳතා ශක්තිමත් කරයි. තවද රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපන, සෞඛ්‍ය හා තාක්ෂණික වැඩසටහන් මගින් පුද්ගල දැනුම කුසලතා හා ජීවන රටාව යාවත්කාලීන කරනු ලබයි.

> “මම වත්තේ ඉපදුන කෙනෙක්, අද ගුරුවරයෙක් විදියට වැඩ කරනවා අපේ ගමට පසුකාලීනව NGO වලින් ආවා. ගමේ ළමයින්ට පාසල් උපකරණ එහෙම බෙදලා දෙන්න, අපේ ගමේ පවුල් ගොඩාක් හෙමින් හෙමින් දරුවන්ට ඉගෙන ගන්න හුරු කරනවා. මටත් ඒ කාලේ ලොකු උනන්දුවක් තිබුණා ඉගෙන ගෙන ගුරුවරයෙක් වෙන්න දැන් මම ගුරුවරයෙක් විදියට ගමේ සමාජ වැඩ වලටත් පල්ලියේ වැඩවලටත් එකතු වෙනවා. ගමට NGO එනකොටත් මමත් ගමේ නියෝජිතයෙක් විදිහට යනවා”. (පුරුෂ - වතු අංශය - ගුරු)

ඉහත උද්ධෘතය විශ්ලේෂණය කිරීමෙන් වතු මධ්‍යම පංතියේ ජීවන ප්‍රකාරය ගොඩනගන ආකාරය පැහැදිලි ලෙස අනාවරණය කළ හැකිය. රාජ්‍ය නොවන සංවිධාන මගින් අධ්‍යාපනික සහන ලබා දීම පසු කාලීනව ඔහුට සහ තවත් වතු පවුල් කිහිපයකට නව අවස්ථා විවෘත කර ඇත. එමගින් ඔහුට අධ්‍යාපනික වශයෙන් ඉහළට යාමටත් ගුරු වෘත්තියේ නිරත වීමටත් හැකියාව ලැබී ඇත. මෙම සාර්ථකත්වයේ Bourdieu ගේ Habitus සංකල්පය යටතේ සාම්ප්‍රදායික වතු සමාජයේ අංගයන් වන ආගමික සංවිධාන, නවීන සමාජීය හා අධ්‍යාපනික අවස්ථා, රාජ්‍ය නොවන සංවිධාන (NGO) වැනි ආයතනික සහයෝගය හා වෘත්තිය තත්ත්වයන් එකිනෙක ගැළපීමේ ප්‍රතිඵලයකි. ඒ අනුව වතු මධ්‍යම පංතියේ චර්යා ප්‍රකාරය යනු සම්ප්‍රදාය, ආගමිකත්වය හා නව සමාජ අධ්‍යාපනික සම්පත් එක්ව ගොඩනගන සමාජය හා සංස්කෘතික රටාවක් ලෙස හඳුනාගත හැකිය.

Goffman ගේ චර්යා ප්‍රකාරය නමැති සමාජ විද්‍යාත්මක සංකල්පයට අනුව එක් එක් පන්තියේ පුද්ගලයින්ගේ හැසිරීම් රටා ආකල්ප හා අගයන් ඔවුන් සම්බන්ධ වන සමාජ පරිසරය අනුව ගොඩනැගේ (Tim, 2019). නාගරික මධ්‍යම පංතියේ තාක්ෂණික හා පුද්ගලවාදී චර්යා රටාව ග්‍රාමීය මධ්‍යම පංතිය තුළ සමාජ සහයෝගී චර්යාව සහ වතු මධ්‍යම පංතියේ සංස්කෘතික හා ආගමික කටයුතු සමඟ බද්ධ වූ චර්යා රටාවෙහි විවිධත්වයක් පවතින බව පැහැදිලි වේ.

සමස්තයක් වශයෙන් ඉහත පැහැදිලි කරන ලද්දේ සමාජ ක්ෂේත්‍ර වශයෙන් විෂමතාවක් පවතින අතර ම මධ්‍යම පන්ති අනන්‍යතාව අනුව සමාජ කණ්ඩායම් ගොඩ නැගී ඇති ආකාරය යි. නාගරික, ග්‍රාමීය සහ වතු වශයෙන් සමාජ කණ්ඩායම්වල විවිධත්වයක් හඳුනාගත හැකි ආකාරය එහි පැහැදිලි කළ අතර මධ්‍යම පාන්තික අනන්‍යතාවෙහි ද වෙනස්කම් පවතින ආකාරය පෙන්වා දෙන ලදි. සමාජ ප්‍රාග්ධන ශක්‍යතාව හෙවත් පන්තිමය අනන්‍යතාව අනුව සමාජ සම්බන්ධතාවන්හි ප්‍රයෝජ්‍යත්වය ඉස්මතු වන්නේ කෙසේ ද යන්න එහි දී විශේෂයෙන් පෙන්වා දෙනු ලැබිණ. මේ ආකාරයෙන් පන්තිමය අනන්‍යතාවක් සහිතව ගොඩ නැගෙන සමාජ


සාමගී Unity ISSN 3121-4266
BY NC ND

ප්‍රාග්ධන හැකියාව, ක්ෂේත්‍රමය විවිධත්වයක් සහිතව අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතාව කෙරෙහි බලපෑම් කරනු ලබන ආකාරය දෙවන තේමාවෙහි පෙන්වා දෙනු ලබයි.

තේමාව 2: සමාජ ප්‍රාග්ධනය අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතා කෙරෙහි සිදු කරනු ලබන බලපෑම

මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව අධ්‍යාපන තාක්ෂණික සාක්ෂරතා කුසලතාවය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳව මෙහි දී විශ්ලේෂණය කරනු ලබයි. ග්‍රාමීය, නාගරික හා වතු යන ක්ෂේත්‍රයන්හි ගොඩනැගී ඇති අන්තර් පුද්ගල සබඳතා හා විශ්වාස තාක්ෂණික සාක්ෂරතා කුසලතාවය කෙරෙහි සිදුකරනු ලබන බලපෑම සමාජ ප්‍රාග්ධන සංකල්පයට සාපේක්ෂව විමසුමට ලක් කරයි.

**1. තාක්ෂණික සම්පත් භාවිත කිරීම සම්බන්ධව සමාජ ප්‍රාග්ධනය වැදගත්වන ආකාරය**

මධ්‍යම පංතිය කේන්ද්‍රකොට ගනිමින් සමාජ ප්‍රාග්ධනය ගොඩනැගී ඇති ආකාරය මෙහිදී විමර්ශනය කරනු ලැබේ. නාගරික මධ්‍යම පාන්තික සමාජය සම්බන්ධව අධ්‍යයනය කිරීමේදී සමාජ ප්‍රාග්ධනය යනුවෙන් හඳුන්වන්නේ පුද්ගල සබඳතා, අන්තර් සබඳතා හා විශ්වාසයන් මත පදනම් වූ සම්පත්වල එකතුවකි. මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව අධ්‍යාපන තාක්ෂණ සාක්ෂරතා කුසලතාවය කෙරෙහි කරනු ලබන බලපෑම නාගරික සමාජයන්හි පාසල්වල විදුහල්පතිවරුන් සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවේදී ඔවුන් ප්‍රකාශ කරනුයේ නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන් තම සමාජ ප්‍රාග්ධනය (Social Capital) භාවිතයෙන් දරුවන්ට තාක්ෂණික සම්පත්, අවස්ථා හා මාර්ගෝපදේශ ලබාදීමට වැඩි හැකියාවක් පවතින බවයි. මෙය Bourdieu විසින් විග්‍රහ කරනු ලබන සමාජ ප්‍රාග්ධන සංකල්පය සමඟ සම්බන්ධ කිරීමේ හැකියාවක් පවතින අතර දෙමාපියන් සතුව පවතින සමාජ ප්‍රාග්ධන හැකියාව හරහා දරුවන්ට තාක්ෂණික අවස්ථා ලබා දීම, තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කරන ලද උපාංග ලබාදීම සහ පාසල් පද්ධතිය තුළ තොරතුරු තාක්ෂණ වැඩසටහන් ආරම්භ කිරීමට සහාය වීම සමාජ ප්‍රාග්ධනය ක්‍රියාත්මක වීමක් ලෙස හඳුන්වාදීමට හැකිය.

> "අපේ alumni එකේ කට්ටියට ඔවුන්ගේ හැකියාවන් use කරන්න space එකක් දෙන්නෙ ICT වගේ areas වලින්. ඒකෙන් තමයි competitions වලට Sponsor කරන එක, Trainers ලා දෙන එකත් කරන්නේ " (පුරුෂ - නාගරික අංශය -විදුහල්පති )

මෙමගින් පැහැදිලි කරනුයේ නාගරික ජනප්‍රිය පාසලක ආදි ශිෂ්‍ය සංගමය විසින් පාසලේ දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනයට උපකාර කිරීමට අවස්ථාවක් ලබා දීමත් දරුවන්ට අවශ්‍ය ඉගෙනීමේ අවස්ථා ලබා දෙනු ලබයි. මේ අනුව නාගරික පාසල්හි ආදි ශිෂ්‍ය සංගම් සමග සිදුකරන ලද සාකච්ඡාව තුළින් අනාවරණය කරගැනීමට හැකි වූයේ ආදි ශිෂ්‍ය සංගම් විසින් දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස කටයුතු කරනු ලබන බව හඳුනාගත හැකි අතර


සාමග්‍රී Unity
ISSN 3121-4266
BY NC ND

"අපේ alumni එකෙන් එකතු එකතු වෙලා මෑතකදී projector එකක් router එකක් ගෙනාවා. ICT lab එකක් setup කරන්න" ( පුරුෂ - නාගරික අංශය - විදුහල්පති )

මේ අනුව ආදී ශිෂ්‍ය සංගම් විසින් පරිගණක උපාංග පාසලට පරිත්‍යාග කිරීම, අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට ආධාර කිරීම, මෘදුකාංග පද්ධති සඳහා වලංගු බලපත්‍ර ලබා ගැනීමට සහය දැක්වීම මෙන්ම විවිධ අනුග්‍රහක ආයතන මෙහිදී පෞද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව තාක්ෂණය සම්බන්ධ වැඩමුළු පැවැත්වීම සිදු කරනු ලබන බවයි. නාගරික පාසල් තුළ වඩාත් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වනු ලබන මෙම ආදී ශිෂ්‍ය සංගම් මගින් ඔවුන්ගේ සමාජ ප්‍රාග්ධනය යොදා ගනිමින් පාසලට සම්පත්, දැනුම සහ තාක්ෂණික සාක්ෂරතාවය ලබා දීමට මැදිහත්වීමක් සිදු කරනු ලබයි. එමෙන්ම පාසලේ ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සමග සංවිධානමය සහයෝගීත්වයක නිරත වෙමින් දරුවන්ට තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ හැකියාවන් උනන්දුව හා වෘත්තීය දැනුමක් ලබා දෙනු ලබයි. නාගරික පාසල්වල ආදි ශිෂ්‍ය සංගම් පවතින්නේ සංවිධානාත්මකව වඩාත් සක්‍රියව සහ වෘත්තිමය සබඳතා මත පදනම් වේ. මෙම සංගම් තම සාමාජිකයන්ගේ වෘත්තීය, ආර්ථික සහ තාක්ෂණික සම්පත් සන්නිවේදන ජාල විශේෂඥ සබඳතා යොදා ගනිමින් පාසලට නව සම්පත් හා උපාංග ලබාදීමට මැදිහත් වේ. මෙම ආදි ශිෂ්‍ය සංගම් විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සමග සමීප සහයෝගීතාවයක් පවත්වන්නේ පාසල තුළ තාක්ෂණය සම්බන්ධ වැඩසටහන් සංවිධානය කිරීමෙනි. තවද තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ දැනුම පාසලට ලබාදෙමින් සිසුන්ට coding, cyber safety, photoshop වැනි වෘත්තිමය හැකියාවන් ඉගැන්වීම සිදුකරයි. මෙවැනි සජීවී සහ සංවිධානාත්මක මැදිහත්වීමක් ඔස්සේ දරුවන්ට තාක්ෂණය පිළිබඳ උනන්දුවක් හා අවබෝධයක් ඇති වේ. ඒ අනුව නාගරික පාසල්වල ආදි ශිෂ්‍ය සංගම් සිසුන්ගේ තාක්ෂණික දැනුම හා දක්ෂතා වර්ධනය කිරීමේදී වැදගත් සමාජ ප්‍රාග්ධන මූලාශ්‍රයක් ලෙස සැලකේ.

**2. තාක්ෂණික සාක්ෂරතාව වර්ධනය සඳහා ගුරු පුහුණුව**

නාගරික සමාජයේ ගුරුවරු, දෙමාපියන්, විදුහල්පතිවරුන්, පාසල් ආශ්‍රිතව ගොඩනැගී ඇති ආදි ශිෂ්‍ය සංගම් නියෝජනය කරනු ලබන නිලධාරින් මූලික කොටගෙන සිදු කරන ලද දත්ත එක්රැස් කිරීම මත පදනම්ව මෙම විග්‍රහය සිදුකරනු ලබයි. ඒ අනුව නාගරික පාසල්වල ගුරුවරුන් තොරතුරු තාක්ෂණය පදනම් වූ ඉගැන්වීම් ක්‍රම භාවිතයට වඩාත් පෙළඹී ඇත. ඒ අනුව ඔවුන්ට ලබා දෙනු ලබන අඛණ්ඩ පුහුණු වැඩසටහන්, MOE ICT Workshops සහ E - Thaksalawa වැනි පද්ධති භාවිතය මගින් සිසුන්ට තාක්ෂණික දැනුම ප්‍රවේශ කරවීම සිදුකරනු ලබන බව අනාවරණය විය.

නාගරික පාසල්වල ගුරුවරුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (Information and Communication Technology) භාවිතය පිළිබඳ සාධනීය පිළිගැනීමක් දක්වනු ලබයි. ඔවුන් තොරතුරු තාක්ෂණය භාවිතය සම්බන්ධව විශ්වවිද්‍යාල මට්ටමේදී ලැබූ පුහුණුව, තාක්ෂණික සම්පත් භාවිතය, මත මූලික වශයෙන් ගොඩනගා ගනු ලබයි. සම්බන්ධක සමාජ ප්‍රාග්ධනය තුළ


CC BY NC ND
ISSN 3121-4266

එකම සමාජ පසුබිමක හෝ සංස්කෘතික පදනමකින් යුක්ත පුද්ගලයින් අතර පවතින ආරක්ෂාකාරී සබඳතා විශ්වාස හා සහයෝගීතාවය පැහැදිලි ලෙස අර්ථ නිරූපණය කරයි. නාගරික පාසල්වල ගුරුවරුන් සඳහා වෘත්තීය සබඳතා, දෙමාපියන් තුළ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් පවතින උනන්දුව විශ්වාසය, නාගරික මධ්‍යම පාන්තික ප්‍රජාවේ සහයෝගීතාවය මෙම සම්බන්ධක ප්‍රාග්ධනයෙන් නියෝජනය වේ. ආබද්ධක සමාජ ප්‍රාග්ධනය යනු විවිධ සමාජ, ආගමික, වෘත්තීය හෝ භූගෝලීය පසුබිමකින් පැමිණි පුද්ගලයන් හා කණ්ඩායම් අතර ඇති සබඳතාය. නාගරික සමාජය තුළ ගුරුවරුන්, පර්යේෂණ ආයතන, තාක්ෂණික පුහුණු වැඩමුළු සහ වෘත්තීය ජාල තුළින් තොරතුරු සම්පත් හා අවස්ථාව වෙත ප්‍රවේශ වීමකින් යුක්ත වේ. මෙම සබඳතා ඔවුන්ගේ තාක්ෂණික දැනුම දිගු කාලීනව නව්‍යකරණය කරමින් තාක්ෂණය පිළිබඳ වඩාත් ප්‍රවේශ පහසුකම් සලසනු ලබයි.

අධ්‍යාපන ක්‍රියාවලිය තුළදී විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගත සමයෙන් පසුව සාමාන්‍ය පාසල්වල ICT භාවිතය සරල වශයෙන් ආරම්භ කළ ද නාගරික පාසල්වල ගුරුවරුන් ඔවුන්ගේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ අවබෝධය හා භාවිතය සම්බන්ධව ගුරුවරුන් තුළ පවතින අවබෝධය වර්ධනය වී ඇත.

> "අපේ ICT Class එකක් formally තියෙනවා. ඒක විතරක් නෙමෙයි ගොඩක් ගුරුවරුන් තමන්ගේ lessons වලට Google forms, Powerpoint වගේ දේවල් භාවිත කරනවා." (ස්ත්‍රී - නාගරික අංශය - ගුරු)

මෙම උද්ධෘතය මගින් තොරතුරු තාක්ෂණය භාවිතය පෙන්නුම් කරයි. එහිදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය, පරිගණක මෘදුකාංග භාවිතය, මාර්ගගත ඇගයීම් ක්‍රම පිළිබඳ අවබෝධය හා භාවිතය පිළිබඳ පැහැදිලි වෙයි. නාගරික පාසල් තුළ ගුරුවරුන් සහ සිසුන් අතර විශ්වාසය හා අන්‍යෝන්‍ය සබඳතාවය පවත්වාගෙන යාම තාක්ෂණය පදනම්ව ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක වීමට බලපානු ලබයි.

**3. දෙමව්පියන්ගේ දැනුම ළමයින්ගේ තාක්ෂණික කුසලතාවයට බලපාන ආකාරය**

නාගරික මධ්‍යම පංතියේ දෙමාපියන් සමඟ සිදු කරන සාකච්ඡා තුළින් අනාවරණය කර ගැනීමට හැකි වූයේ ඔවුන් නිරන්තරයෙන් සමාජ සම්බන්ධතා සක්‍රියව යෙදී සිටින අතර ඔවුන්ගේ වෘත්තීය හා අධ්‍යාපනික පසුබිම හේතුවෙන් තාක්ෂණික උපාංග හා තාක්ෂණය භාවිතයට වඩා හුරු පුරුදු බවයි.

නාගරික මධ්‍යම පන්තියේ දෙමාපියන් සමඟ සිදු කරන සාකච්ඡා තුළින් අනාවරණය කර ගැනීමට හැකි වූයේ ඔවුන් නිරින්තරයෙන් සමාජ සබධතාවන්හි සක්‍රීයව යෙදී සිටින අතර දෙමව්පියන්ගේ වෘත්තීය හා අධ්‍යාපනික පසුබිම හේතුවෙන් තාක්ෂණික උපාංග හා තාක්ෂණය භාවිතයට වඩා හුරුපුරුදු බවක් පෙන්නුම් කරයි. නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන් සඳහා අන්තර්ජාල පහසුකම්, ස්මාර්ට් උපාංග, මෘදුකාංග ලබාදීමේ හැකියාවක් පවතින අතර එය සෘජුවම දරුවන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා


සාමග්‍රී Unity
ISSN 3121-4266
cc BY NC ND

වර්ධනයට හේතු වේ. එමෙන්ම මෙම නාගරික සමාජයද එමෙන්ම මෙම නාගරික සමාජය දෙමාපියන්ගේ මෙම ක්‍රියාකාරීත්වය Bourdieu විසින් පැහැදිලි කරන ලද සමාජ ප්‍රාග්ධනයේ හැසිරීම් රටා මෙන්ම Putnum (2000) විසින් පෙන්වා දුන් ආබද්ධක සමාජ ප්‍රාග්ධනය සහ සම්බන්ධක සමාජ ප්‍රාග්ධනය අනුව පැහැදිලි කිරීමේ හැකියාවක් පවතී.

> "අපේ පුතාට Word Software එක මුලින්ම පුරුදු කළේ මගේ office laptop එක දීලා. අලුත් laptop එකක් අරන් දෙන්න කලින් පරණ එකෙන් ICT වැඩ කරන්න Try කරනවා" (ස්ත්‍රී - නාගරික අංශය -මව).

මෙයින් පැහැදිලි වන්නේ තාක්ෂණික උපාංග ලබාදීම සමග තොරතුරු සාක්ෂරතාවය සඳහා නිවසේදීම සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමයි. මෙය ආබද්ධක සමාජ ප්‍රාග්ධනය මත පදනම්ව විග්‍රහ කළ හැකිය. එහිදී දෙමාපියන්ගේ සමාජ ප්‍රාග්ධන හැකියාව මත පදනම්ව ඔවුන්ගේ සම්පත් දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය කිරීමට සෘජුවම යොදා ගනු ලබයි. දෙමාපියන්ගේ සමාජ ප්‍රාග්ධන හැකියාව යනු තම දරුවන්ගේ අධ්‍යාපනික සාමාජික සහ තාක්ෂණික වර්ධනයට සහය වන පරිදි තම සමාජ සම්බන්ධතා, සන්නිවේදන හැකියාවන්, විශ්වාසයන් සහ සම්පත් සක්‍රීයව යොදා ගැනීමේ හැකියාවයි. ඒ අනුව දෙමාපියන්ගේ සමාජ ප්‍රාග්ධනය යනු ඔවුන්ගේ මිත්‍ර සබඳතා, ආගමික, සාමාජික ආධාරක කණ්ඩායම්වලට සම්බන්ධ වීම සහ එම සම්බන්ධතා හරහා තම පවුලට හා දරුවන්ට වටිනාකම්, ආධාර තොරතුරු හා සමාජ උපකරණ ලබාදීමේ හැකියාවක් පවතී. මෙම සමාජ ප්‍රාග්ධනය මගින් දෙමාපියන්ට තම දරුවන්ගේ අධ්‍යාපනය, වටිනාකම් හා සමාජ ජීවිතය වඩාත් ඵලදායී ලෙස හැදෑරීමේ හැකියාවක් පවතී.

> "මම පුතාට Youtube Channel එකක් හදලා දුන්නා. ඔයාට තියෙන දැනුම අනිත් කට්ටියට බෙදලා දෙන්න පුළුවන් කියලා". (පුරුෂ - නාගරික අංශය - පියා)

නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන් තොරතුරු තාක්ෂණික සාක්ෂරතාවය සඳහා ක්‍රියාත්මක වන ආකාරය ඔවුන්ගේ සමාජ සබඳතා හා දරුවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය ගොඩනගන ක්‍රියාවලියේදී එය සෘජුව හා ප්‍රත්‍යක්ෂව යොදා ගන්නා ආකාරය දක්වනු ලබයි. මෙම ක්‍රියාවලිය තුළ Bourdieu විසින් විවරණය කරන සමාජ සංස්කෘතික හා ආර්ථික ප්‍රාග්ධන අන්තර් ක්‍රියාකාරීත්වය හරහා දරුවන්ගේ තොරතුරු තාක්ෂණ හැකියාවන් වර්ධනය කරනු ලබයි. දෙමාපියන් සතුව පවතින සම්පත් පමණක් නොව ඔවුන් සතුව ඇති සබඳතා වෘත්තීය ජාලයන් විශ්වාස හා අධ්‍යාපනික මාර්ගෝපදේශ තාක්ෂණික හැකියාවන් ක්‍රියාවලිය තුළ Bourdieu විසින් විවරණය කරන සමාජ, සංස්කෘතික හා ආර්ථික ප්‍රාග්ධන අන්තර් ක්‍රියාකාරීත්වය හරහා දරුවන්ගේ තොරතුරු තාක්ෂණ හැකියාවන් වර්ධනය කෙරෙයි. දෙමාපියන් සතුව පවතින සම්පත් පමණක් නොව ඔවුන් සතුව ඇති සබඳතා, වෘත්තීය ජාලයන් ,විශ්වාස හා අධ්‍යාපනික මාර්ගෝපදේශ, තාක්ෂණික හැකියාවන් වර්ධනයට මූලික වේ.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

**සාකච්ඡාව, නිගමනය හා සාරාංශය**

මධ්‍යම පංතිය ඉහළ හා පහළ පන්ති අතර පිහිටි සමාජ ආර්ථික කණ්ඩායමක් වන අතර එය ආර්ථික ස්ථාවරත්වය, අධ්‍යාපන අපේක්ෂාවන්, වෘත්තීය ස්ථායිතාවය හා සංස්කෘතික උනන්දුව මත ගොඩනැගේ. මධ්‍යම පාන්තික පවුල් මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මෙන්ම අමතර අවශ්‍යතා සඳහාද තම ආදායම වැය කරනු ලබයි. නාගරික මධ්‍යම පංතිය විවිධ ආදායම් මාර්ග, උසස් අධ්‍යාපන අපේක්ෂාවන්, තාක්ෂණික ප්‍රවේශය මත පදනම් වන අතර ග්‍රාමීය මධ්‍යම පංතිය වැඩි වශයෙන් රාජ්‍ය සේවා සහ කෘෂිකර්මය මත රඳා පවතී. වතු මධ්‍යම පංතිය ස්ථායී වැටුප් සහ සුබසාධනය මත පදනම්ව ජීවත් වේ. එමෙන්ම නවීන තාක්ෂණය සම්බන්ධව හා අධ්‍යාපනය අධ්‍යාපනය සම්බන්ධ උනන්දුව ක්‍රමයෙන් ඉහළ තත්ත්වයකට පත්වෙයි. තාක්ෂණය සම්බන්ධව සාකච්ඡා කිරීමේදී ග්‍රාමීය, නාගරික, වතු යන ක්ෂේත්‍ර තුනටම අදාළව තාක්ෂණික නියැලියාව (Taste) එකිනෙකට වෙනස් වේ. මේ අතරින් නාගරික සමාජය තාක්ෂණය සම්බන්ධයෙන් වාසිදායක ප්‍රතිලාභ අයත් කරගෙන ඇති ආකාරය පැහැදිලි වේ.

මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධනය තුළ ඵලදායී සමාජ සබඳතා යන්න සමාජ ප්‍රාග්ධනය යන සංකල්පය සමාජ සබඳතා මත මධ්‍යගත වූ සංකල්පයක් ලෙස හැඳින්විය හැකි වේ. වෘත්තීය ජාල, පවුල් සබධතා, සමාජ සබධතා මගින් සමාජ සම්පත් සහ ජාලයන් මත සමාජ ප්‍රාග්ධනය ගොඩනැගේ. නාගරික මධ්‍යම පංතිය තුළ නවීන පරිගණක කුසලතා, වෘත්තීය සබධතා, පාසල් හා විශ්වවිද්‍යාල සබධතා සහ සමාජ ජාලයන් මගින් සමාජ ප්‍රාග්ධනය වර්ධනය වේ. ග්‍රාමීය මධ්‍යම පන්තියේ ආගමික නායකයින්, ග්‍රාමීය සමිති, රාජ්‍ය සේවයේ වෘත්තිකයන් සමඟ පවතින සමාජ සබධතා මත සමාජ ප්‍රාග්ධනය ගොඩනගා ගනු ලබයි. එමෙන්ම වතු මධ්‍යම පංතිය තුළ රාජ්‍ය නොවන සංවිධාන, වතු සුබසාධන අධිකාරිය, වතු කාර්යාලය මත පදනම්ව සබධතා ගොඩනඟා ගනී.

මධ්‍යම පංතිය කේන්ද්‍ර කොටගෙන සමාජ ප්‍රාග්ධනය ගොඩනැගී ඇති ආකාරය අනුව තාක්ෂණික සම්පත් භාවිත කිරීම නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන් ඔවුන්ගේ සමාජ ප්‍රාග්ධනය භාවිතයෙන් දරුවන්ට තාක්ෂණික සම්පත් , අවස්ථා හා මාර්ගෝපදේශ ලබාදීමට වැඩි හැකියාවක් පවතින බව හඳුනාගැනීමට හැකි විය. එය ඔවුන්ගේ සම්බන්ධක ප්‍රාග්ධනය ගොඩනැගෙන අවස්ථාවකි. එයට සාපේක්ෂව ග්‍රාමීය හා වතු පාසල් සඳහා තාක්ෂණික භාවිතය සීමා සහිත වීම හේතුවෙන් ගුරුවරු, විදුහල්පතිවරු, රාජ්‍ය නොවන සංවිධාන, පරිත්‍යාගශීලීන් වැනි විවිධ මට්ටමේ සමාජ ධූරාවලි සමඟ සබධතා පවත්වා ගනිමින් කටයුතු කිරීමෙන් තාක්ෂණික පහසුකම් ලබා ගැනීමට සහ පාසල සතුව පවතින අභ්‍යන්තර සම්පත්වල ගුණාත්මකබව වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලබයි. එය අනුබද්ධක සමාජ ප්‍රාග්ධනය ඉස්මතු වන අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය (OECD, 2020).

තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා ගුරු පුහුණුව ලැබිය යුතු ආකාරය විමර්ශනය කිරීමේදී නාගරික සමාජවල ගුරුවරුන් තොරතුරු තාක්ෂණය පදනම් වූ ඉගැන්වීම් ක්‍රම භාවිතයට වඩාත් පෙළඹී ඇත. නාගරික පාසල්වල ගුරුවරුන් තාක්ෂණික සාක්ෂරතාවය


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

වර්ධනය කිරීම සඳහා නව තාක්ෂණික වැඩසටහන් සඳහා විවෘත වන අතර ආදි ශිෂ්‍ය සංගම්, රාජ්‍ය නොවන සංවිධාන මගින් අවශ්‍ය සහයෝගය ලබා දෙනු ලබයි. නමුත් මෙයට සාපේක්ෂව ග්‍රාමීය සමාජයේ ගුරුවරුන්ගේ තාක්ෂණික ප්‍රවේශය ගැටලුකාරී තත්ත්වයක් පවතින බව පැහැදිලි වේ. ග්‍රාමීය පාසල්වල සමාජ ප්‍රාග්ධනයෙහි සීමා පැවතීම ආදි ශිෂ්‍ය සංගම්, දෙමාපියන්, ප්‍රජා ප්‍රජා ආයතන හා ආයතනික සබඳතා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා සිදුවේ.

වතු සමාජය සම්බන්ධ අධ්‍යයනය කිරීමේදී වතු පාසල් සඳහා යම්කිසි මට්ටමක ගුණාත්මක ආකාරයේ අන්තර්ජාල සබඳතාවයන් පවතින බව අනාවරණය විය. අන්තර්ජාල පහසුකම් පැවතීම හේතුවෙන් මාර්ගගත අධ්‍යාපන අවස්ථාවන්ද දරුවන්ට ලබා දීමට ගුරුවරුන්ට හැකියාව පවතී. දෙමාපියන් හා පාසල අතර සම්බන්ධතාවය තාක්ෂණික සාක්ෂරතාවය කෙරෙහි ග්‍රාමීය, නාගරික හා වතු ක්ෂේත්‍රයන්හිදී බලපාන ආකාරය විමර්ශනය කිරීමේදී නාගරික සමාජය තුළ දෙමාපියන් පාසල සමග සම්බන්ධ වෙමින් තාක්ෂණික සාක්ෂරතාවය ලබාගැනීමට අවශ්‍ය මෙවලම් හා උපාංග, පද්ධති, ආධාර සපයනු ලබයි. ග්‍රාමීය දෙමාපියන් තුළ තාක්ෂණය සම්බන්ධ අවබෝධය සීමා සහිත බවත් හඳුනා ගැනීමට හැකිවේ. ඔවුන් දෛනිකව ඉඩකඩම් කටයුතු නිසා කාර්ය බහුලත්වයට පත්වීම මෙයට හේතු වී ඇත. නමුත් ගුරුවරුන් තාක්ෂණය සම්බන්ධව ළමයින්ට ඉගැන්වීමට උත්සාහයක් ගනු ලබන බවත් එම හේතුව නිසා දරුවන් පෙරට වඩා වර්තමානය වන විට තාක්ෂණය සම්බන්ධව ඉතා උනන්දුවකින් කටයුතු කරනු ලබන බවත් හඳුනාගත හැකි විය. ග්‍රාමීය සමාජයට සාපේක්ෂව වතු සමාජය දෙමාපියන් අන්තර්ජාල පහසුකම් සම්බන්ධව දැනුවත් බවකින් යුක්තව කටයුතු කිරීම හඳුනා ගැනීමට හැකිවේ.

දෙමාපියන්ගේ දැනුම ළමයින්ගේ තාක්ෂණික කුසලතාවයට බලපාන ආකාරය විමසා බැලීමේදී නාගරික මධ්‍යම පන්තියේ දෙමාපියන් සමාජ සබධතාවයන්හි සක්‍රීය යෙදී සිටින බවත් ඔවුන්ගේ වෘත්තීය හා අධ්‍යාපනික පසුබිම හේතුවෙන් තාක්ෂණික උපාංග හා තාක්ෂණික භාවිතයට වඩා හුරු පුරුදු ස්වභාවයක් දක්වයි. ග්‍රාමීය සමාජය තුළ අවශ්‍ය වන තාක්ෂණික පහසුකම් ළඟා කර ගැනීම අසීරු තත්ත්වයකට පත්වී ඇති බවත් එය වතු සමාජයට සාපේක්ෂව අවාසිදායක බවත් සඳහන් කරයි. ග්‍රාමීය සමාජයේ දෙමාපියන් සතුව තාක්ෂණය සම්බන්ධ පැහැදිලි අවබෝධයක් නොමැති අතර  ඔවුන් සතුව පවතින සමාජ ප්‍රාග්ධනයේ සීමාවන් හේතුවෙන් දරුවන්ගේ තාක්ෂණික වර්ධනයට අවාසිදායක අයුරින් බලපෑම් කරනු ලබන ආකාරය හඳුනා ගැනීමට හැකිවේ. නමුත් ග්‍රාමීය සමාජයේ දෙමාපියන් සතුව යටිතල පහසුකම් අවම මට්ටමින් පැවතියද තොරතුරු තාක්ෂණ පහසුකම් වෙත තම දරුවන් ප්‍රවේශ කරලීමේ උත්සාහයක් ගනු ලබයි.

ග්‍රාමීය සමාජයට සාපේක්ෂව වතු සමාජය තුළ ආර්ථික මට්ටම සීමා සහිත වුවද ඔවුන්ට පවතින සීමිත සම්පත් ක්‍රමවත් ලෙස තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය උදෙසා යොදා ගනු ලබන බවත් , වතු සමාජයේ දෙමාපියන්ගේ විශේෂත්වය වන්නේ ඔවුන් ඉගෙන නොගත් තොරතුරු


සාමගු Unity
CC BY NC ND
ISSN 3121-4266

තාක්ෂණය වැනි විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව තම දරුවා සාර්ථකව යෙදවීමට උත්සාහයක් ගනු ලැබීමයි. දත්ත විශ්ලේෂණය තුළින් අවධානය යොමු කරනු ලබන සමාජ ප්‍රාග්ධනය හා දෙමාපියන්ගේ ආකල්ප නාගරික සමාජය තුළ අනුබද්ධක සමාජ ප්‍රාග්ධනය තුළින් සම්පත් හා ආධාරක සබඳතා කෙරෙහි අවධානය යොමු කරයි. එයට අමතරව පවුල තුළින්ද තාක්ෂණික සාක්ෂරතා සංවර්ධනය සඳහා උපකාර කරනු ලබයි.

මධ්‍යම පන්තිය අර්ථකථනය කිරීමේදී සමාජ සංස්කෘතික වටිනාකම් කෙරෙහි අවධානය යොමු කරනු ලබන බව පැහැදිලිය. නමුත් වර්තමානය වන විට මධ්‍යම පංතිය සම්බන්ධව සිදුකර ඇති විග්‍රහයන් ආදායම් මට්ටම මත පදනම් වන ආර්ථික විද්‍යාත්මක විග්‍රහයන් වේ.

මධ්‍යම පන්තිය කේන්ද්‍ර කොට ගෙන සමාජ ප්‍රාග්ධනය ගොඩනැගීමේ දී ඔහුට හිමිවන සමාජ වටිනාකම් පද්ධතිය ඔහු වටා ඇති සමාජ සම්බන්ධතා ජාලය තුළින් ලැබෙන බව පැහැදිලිය. සංස්කෘතික ප්‍රාග්ධනයේ පරමාර්ථ සහ වෙනස්කම් දරුවන්ගේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් චීනයේ නාගරික මධ්‍යම පාන්තික කම්කරු පන්තියෙහි අපේක්ෂා අතර වෙනසක් ඇති කරනු ලබන බව පැහැදිලි කරයි (Xiaoming, 2012). නමුත් මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි වන්නේ නාගරික මධ්‍යම පාන්තික දෙමාපියන්ට තාක්ෂණික සම්පත් අවස්ථා හා මාර්ගෝපදේශ ලබා දීමට වැඩි හැකියාවක් පවතින බවයි.

තාක්ෂණික සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා ගුරු පුහුණුව ලැබීමේදී වර්තමාන සමාජය තුළ ගුරු භූමිකාව වඩාත් සංකීර්ණත්වයට පත්ව ඇති ආකාරයත් ඒ සඳහා තාක්ෂණික නැඹුරුවීමක්ද හඳුනාගත හැකි බව හඳුනාගත හැකි විය (Rashma, Fathima & Adhikrao, 2018). නමුත් මධ්‍යම පාන්තික සමාජ ප්‍රාග්ධන හැකියාව තාක්ෂණික සාක්ෂරතා කුසලතාවය කෙරෙහි කරනු ලබන බලපෑම අනුව ග්‍රාමීය, නාගරික හා වතු අංශයන්හි ගුරුවරුන්ගේ තාක්ෂණික ප්‍රවේශය ගැටලුකාරී තත්වයක් පවතින බව පැහැදිලි වේ.

වතු සමාජයේ අධ්‍යාපනය ඉතිහාසය සහ සමාජයේ පසුබෑසීම හේතු කොට ගෙන දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා සීමා සහිත වී ඇති බව මුල් ළමාවිය අධ්‍යාපනය සහ දරුවන්ගේ සූදානම පිළිබඳ ශ්‍රී ලංකාවේ වතු අංශය ආශ්‍රිතව සිදුකරන ලද අධ්‍යයනය ඔස්සේ ඉදිරිපත් කරයි (Udayanga, 2021). එම අධ්‍යයනයට අනුව වතු ප්‍රදේශ අධ්‍යාපනික වශයෙන් අසමානතාවයට ලක්වන අතර නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව පහසුකම් හා ගුණාත්මක අවස්ථා සහ සමාජයේ සූදානම අවම මට්ටමක පවතින බවද පැහැදිලි කරයි. එසේම පවුල් පාසල් සහ ප්‍රාදේශීය ආයතන දරුවන්ගේ ඉගෙනීම සඳහා අවශ්‍ය වන සමාජ ප්‍රාග්ධනය ගොඩනැගීමට අසමත් වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනික සූදානම හා තාක්ෂණික සුක්ෂිතතාවය දුර්වලව පවතින බව අනාවරණය කෙරිණි. නමුත් මෙම අධ්‍යයනයට අනුව ග්‍රාමීය සමාජයට සාපේක්ෂව වතු සමාජය දෙමාපියන් අන්තර්ජාල පහසුකම් සම්බන්ධව දැනුවත් බවකින් යුක්තව කටයුතු කරනු ලබන බවයි.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

එබැවින් තාක්ෂණික සාක්ෂරතාවය ග්‍රාමීය නාගරික වතු සමාජ ආශ්‍රයෙන් සංවර්ධනය කිරීමේදී ප්‍රාදේශීය සමාජය සවිබල ගන්වමින් දරුවන්ගේ අධ්‍යාපන ප්‍රගතිය සඳහා පවුල් මට්ටමින් සූදානම් කිරීම සහ තාක්ෂණික සම්පත් හා සබඳතා වර්ධනය කිරීම මගින් තාක්ෂණික විෂමතාවයන් අවම කිරීමට නවීන මාර්ග නිර්මාණය කළ යුතුවේ.

**ආශ්‍රිත මූලාශ්‍ර**


අතුකෝරාල, ඩී. (2016). අධ්‍යාපන මූලධර්ම ලිපි හා අධ්‍යාපන රචනා. ශික්ෂා මන්දිර ප්‍රකාශන.

උයන්ගොඩ, ජේ (2010) . සමාජීය මානව විද්‍යා පර්යේෂණ. සමාජ විද්‍යාඥායින්ගේ සංගමය.

කාරියවසම්, සී. (1995). විසිඑක්වන සියවසට අධ්‍යාපනය. සාර ප්‍රකාශන.

සර්වා. ලයිච්ට්. සහ කළුගෙදර. (2018). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අසමානතා ජාතික දත්ත හා ප්‍රවේශය ගුණාත්මකභාවය හා ඉගෙනුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රාදේශීය නිරීක්ෂණය. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය.

සේනාධීර, එස්. (2012). ඉගෙනුම් කාර්යක්ෂමතා වර්ධනය. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිසේන, එච්. (1999). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු. නූතන භාෂා අංශය කැළණිය විශ්වවිද්‍යාලය.

හෙට්ටිආරච්චි, කේ. (1999). අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ජාතික සංවර්ධනය. ඇස් ගොඩගේ සහෝදරයෝ.

Addo, F. (2024). Middle-class attainment in young adulthood: higher education, student debt, and racial wealth inequality. Oxford review of economic policy. https://www.researchgate.net/publication/386053355_Middle-class_attainment_in_young_adulthood_higher_education_student_debt_and_racial_wealth_inequality

Banerjee, A. Duflo.V. (2008). What is middle class about the middle classes around the world. Journal of economic Perspectives. https://www.aeaweb.org/articles?id=10.1257/jep.22.2.3

Bourdieu, P.(1986).The Forms of Capital. Handbook of theory and research for the sociology of education, Greewood press.

Braun, V. Clarke.V. (2006). Using Thematic analysis in psychology. https://psychology.ukzn.ac.za/?mdocs-file=1176



සාමග්‍රී Unity

cc BY NC ND
ISSN 3121-4266

Devapriya, U. (2019).A History of Education in Sri Lanaka. https://udithadevapriya.medium.com/

Gilbert, D. (2015). The American Class Structure in an age of growing inequality. Sage Publications.

Hashim, Y. (2014). 21st century education are we headsing towards the right direction of improving teaching and learning s needed by educational transformation programme. Asia E University.

Herath, H.M.S.P. , Karunarathna.R (2019). Socio -Economic profile of the estate sector in sri Lanka. Journal of social sciences and Humanities.

Kendralin, J., Freeman. (2011). Schmoozing in elementary school:The imporatance of social capital of first Graders. Sage Journal. https://doi.org/10.1525/sop.2011.54.4.521

Killen, R. (2002). Outcomes – Based Education Principles and Possibilities.

Lin, N. (2001). Social capital: A theory of social structure and action. Cambridge University Press.

Mary. S. (2020). How Social class and context shape student's mentorship experiences. Sociological Forum. http://dx.doi.org/10.1111/socf.12626

Michael , A. ( 2007). Education and Power. Routledge Taylor & Francis Group.

Nutteeratteerat, P. (2013). Enhancement of the 21st century skills for Thai higher education by integration of ICT in classroom.Science Direct.

OECD. (2020). Education in the digital age: Healthy and happy children. OECD Publishing. https://doi.org/10.1787/1209166a-en

Putnam, R. D. (2000). *Bowling alone: The collapse and revival of American community*. Simon & Schuster.

Population and Housing Census. (2012). Preliminary Report. Department of census and statistics.



සාමග්‍රී Unity

CC BY NC ND

ISSN 3121-4266

Portes, A. (1998). Social capital: Its origins and applications in modern sociology. Annual Review of Sociology' https://doi.org/10.1146/annurev.soc.24.1.1

Reay, D. (2017). *Miseducation: Inequality, education and the working classes.* Policy Press.

Reshma, S. , Fathima, M. & Adhikrao, D. (2018).The role of teacher in the 21st century AQAR and academic and administrative audit in revised assessment and accreditation framework.https://www.researchgate.net/publication/331823541_THE_ROLE_OF_TEACHER_IN_THE_21_st_CENTURY

Salama, E, (2018). Critical thinking as a 21st century skill: conceptions, implementation and challenge sin the EFL classroom. European Journal of Foreign Language Teaching. https://www.researchgate.net/publication/329035377_Critical_Thinking_as_a_21Century_Skill_Conceptions_Implementation_and_Challenges_in_the_EFL_Classroom

Tim, C. (2019). A behavior analytic translation of Erving Goffman's Analysis. University of Denver. https://digitalcommons.du.edu/

Triling , B., Fadel, C. (2009). 21st Century Skills: Learning for life in our times. John Wiley & sons.

Udayanga, (2021). Early childhood education and preparedness of children, PGIHS research congress University of Peradeniya.

UNESCO. (2017). Working Group on Education: Digital skills for life and work. UNESCO.

United Nations, (2015). Sustainable Development Goals. https://unric.org/en/united-nations-sustainable-development-goals/

Warschauer, M. (2004). Technology and social inclusion: Rethinking the digital divide. MIT Press.

Weber, M. (1946). From Max Weber: Essays in Sociology. Oxford University Press.



BY NC ND
ISSN 3121-4266

Wright, E (1997). Class Counts: Comparative studies in class analysis. Cambridge university press.

Xiaomong, S. (2012). Parental Expectations relating to children's higher education in urban china. Cultural Capital and Social Class. Sage Journals. http://dx.doi.org/10.1080/17439884.2019.1620767

Zyrah, G. Nelia, T. (2022). Instructional Preparations and the learning skills of the 21st century students. International Journal of Educational Management and Development. https://www.neliti.com/publications/557038/instructional-preparations-and-the-learning-skills-of-the-21st-century-students



සාමග්‍රී Unity
BY NC ND

ISSN 3121-4266
9 773121 426004

සාමග්‍රී Unity

Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines
**ISSN 3121-4266**
**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජූලි-දෙසැම්බර්**
**පත්‍රිකා අංක 04**

# සමාජ විද්‍යාව පුද්ගලික ආශ්වාදයක් ලෙස හා ඉන් ඔබ්බට: පීටර්. එල්. බ-ගර්ගේ අදහස් පිළිබඳ ප්‍රතිවිමර්ශනයක්

සුධීර ජයවීර[9]
jayaweera@kln.ac.lk

**සාරසංක්ෂේපය**

පීටර් එල්. බ-ගර්ගේ සමාජ විද්‍යාවට ඇරයුමක් (1963), (Invitation to sociology: A humanistic Perspective) ග්‍රන්ථයේ "සමාජ විද්‍යාව පුද්ගලික ආශ්වාදයක් ලෙස" නම් පළමු පරිච්ඡේදය මෙම ලිපියේදී ප්‍රතිවිමර්ශනය කෙරේ. මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ සමකාලීන සමාජ විද්‍යාත්මක දර්ශනය තුළ විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය පරිසරය සමග සමපාත කරමින් බ-ගර්ගේ මානවවාදී හා බුද්ධිමය දෘෂ්ටි කෝණයේ අද්විතීයත්වය හා වර්තමාන අදාලත්වය තහවුරු කිරීමයි. ලිපිය නිර්මාණය කිරීමේදී භාවිත ක්‍රමවේදය සාහිත්‍යමය හා සංකල්පනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය මත පදනම්ව ඇත. සමාජ විද්‍යාඥයා පිළිබඳ පවත්නා ඒකාකෘතික ප්‍රතිරූප හය (සමාජ වැඩකරුවකු, න්‍යායධාරියකු, ප්‍රතිසංස්කරණවාදියෙකු, සංඛ්‍යාලේඛන සමුපාදකයෙකු, විද්‍යාඥයෙකු, හා එක්තරා ආකාරයක පෞරුෂයක් ලෙස) බ-ගර්ගේ දෘෂ්ටිය ඔස්සේ විවේචනාත්මකව විග්‍රහ කරයි. තවද, ඔහුගේ දර්ශනයේ කේන්ද්‍රීය මූලධර්ම වන - සමාජ විද්‍යාඥයාගේ ද්විත්ව මැදිහත් වීම, සමාජ යථාර්ථයේ බහු අර්ථ ස්ථරීය ස්වභාවය, අගය විනිශ්චයෙන් තොර ප්‍රවේශය, සහ සමාජ විද්‍යාත්මක සොයා ගැනීම් සංස්කෘතික ති ගැස්මක් ලෙස - ආදිය නූතන සමාජ විද්‍යාත්මක සංවාදය සමග සමපාත කොට විග්‍රහ කෙරේ. ලිපියේ නව්‍යත්වය වන්නේ බ-ගර්ගේ දර්ශනය, නූතන දත්ත විද්‍යාව (Data Science) හා කෘතිම බුද්ධිය (AI) ආදී ගෝලීය අභියෝග සමග සමකාලීන සමාජ විද්‍යාවේ අනාගත භූමිකාව සඳහා ඇති වැදගත්කම පිළිබඳ විමසා තිබීමයි. බ- ගර්ගේ බුද්ධිමය ලාලසාව හා විපරිවර්තනීය බලය පිළිබඳ අවධාරණය, ආනුභූතික හා ප්‍රයෝජ්‍යවත් අතිරික්ත වටිනාකමක් ගෙන දෙන බව ලිපිය විසින් තර්ක කරයි. අවසානයේදී, බ-ගර්ගේ මානවවාදී දෘෂ්ටිය, සමාජ විද්‍යාවේ ශාස්ත්‍රීය ගැඹුර හා ආශ්වාදය තහවුරු කරමින්, එහි අනාගත මාර්ගය සැලසුම් කිරීමට උපකාරී වන ආධාරකයක් ලෙස හඳුනා ගනු ලැබේ.

[9] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය | B.A (sp), M.Phil


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

**ප්‍රමුඛ පද:** පීටර් බ-ගර්, සමාජ විද්‍යාත්මක පරිකල්පනය, සමාජ විද්‍යාඥයාගේ භූමිකාව, බුද්ධිමය ලාලසාව, ද්විත්ව මැදිහත්වීම, අගය විනිශ්චය

**ප්‍රවේශය**

පීටර්. එල්. බ-ගර්ගේ (Peter L. Berger) "සමාජ විද්‍යාවට ඇරයුමක්: මානවවාදී පර්යාව ලෝකයක්' (1963) නැමති කෘතිය (Invitation to sociology: A humanistic Perspective) සමාජ විද්‍යා ශික්ෂණයෙහි අද්විතීය තැනක් හිමිකර ගන්නා කෘතියකි. ශික්ෂණයෙහි සාරය කුමක්දැයි පෙන්වා දෙමින් සමාජ විද්‍යාඥයාගේ භූමිකාව කුමක්දැයි පාඨකයා අවුළුවාලනු ලබන මෙම කෘතියෙහි මූලික අරමුණ වන්නේ සමාජ විද්‍යාව වෘත්තීමය එකක් පමණක් නොව, ලෝකය අවබෝධ කර ගැනීමේ මාර්ගයක් ලෙස පෙන්වා දෙනු ලැබීමයි. මෙම ලිපියෙහි අරමුණ වන්නේ ඉහත කෘතියෙහි පළමු පරිච්ඡේදය පිළිබඳ ප්‍රතිවිමසුමකට යෙදීමයි. එහිදී බ-ගර්ගේ තර්කන විවේචනාත්මක ඇගයීමකට බඳුන් කිරීමත්, ශ්‍රී ලාංකේය සමාජ විද්‍යාවේ භූමිදර්ශනය සමග සමපාත කොට බැලීමටත් උත්සාහ කරනු ලැබේ. සමාජ විද්‍යාව බුද්ධිමය ලාලසාවක් ලෙස (Sociology as an intellectual passion) ආලේඛ්‍යය කරවන, "සමාජ විද්‍යාවට ඇරයුමක් ' කෘතියෙහි පළමු පරිච්ඡේදය, සමකාලීන සමාජ විද්‍යාවේ සංවර්ධනයත් සමඟ ප්‍රතිඇගයුමකට ලක් කිරීම කාලීන වැදගත්කමකින් යුත් ක්‍රියාවලියකැයි සිතමි. බ- ගර්ගේ ලේඛන චාතුර්ය හා සමාජ විද්‍යාව විෂයෙහි වන ඉමහත් ලැදියාව, සැඟවුණු සමාජ යථාර්ථයෙහි විවිධ ස්තර අවුස්සා බලනට ශික්ෂකයාට ඇරයුම් කරයි. "සමාජ විද්‍යාව පුද්ගලික ආශ්වාදයක් ලෙස" නමැති මේ පරිච්ඡේදය, සමාජ විද්‍යාව යනු කුමක්දැයි හඳුන්වා දෙනු ලබන්නා සේම, ශික්ෂණය පිළිබඳ පවත්නා දුර්මත හා මිත්‍යාව කණ්ඩනය කිරීමට ද වෙර දරයි. සමාජ විද්‍යාඥයා යනු කවරෙක්ද යන්න පෙන්වා දෙන ඒකාකෘතික ප්‍රතිරූප (Stereotypical images)- සමාජ වැඩකරුවකු, සමාජ ප්‍රතිසංස්කාරකයකු, සංඛ්‍යාඥයෙක් - ආදී වශයෙන්ම ඔහු ඉරා දමයි. ඒ වෙනුවට, ඔහු අවධාරණය කරනුයේ සොයා ගැනීමේ ප්‍රහර්ෂය (Thrill of Discovery), බුද්ධිමය කුතුහලය (Intellectual curiosity), සමාජ විද්‍යා චින්තනයෙහි ලැගුම් ගත්තා වූ විපරිවර්තන බලය (Transformative power of sociological thought) ආදියයි. සමාජ විද්‍යාව, මානව විද්‍යාව, සමාජයේ පවත්නා සංකීර්ණතාවයන් ගවේෂණය කිරීමේ උපකරණයක් මෙන්ම, ශාස්ත්‍රීය භාවය උත්කෘෂ්ඨභාවයට පමුණුවනු ලබන විෂයක් ලෙසත් ඔහු හඳුන්වා දී ඇත. සමාජයේ පවත්නා සංකීර්ණ භාවයන් ගවේෂණය කිරීමේ උපකරණයක් මෙන්ම, ශාස්ත්‍රීය භාවය උත්කෘෂ්ට භාවයට පමුණුවනු ලබන විෂයක් ලෙසත් ඔහු සමාජ විද්‍යාව හඳුන්වයි. (Objective of the review) සමාජ විද්‍යාවේ අනන්‍යතාව හා කාර්යභාරය හඳුනාගැනීම සඳහා, බ-ගර්ගේ මේ කුඩා පරිච්ඡේදය උරගලක් ලෙස යොදාගත හැකිදැයි මෙම ලිපිය මගින් අත්හදා බලයි. සමාජ විද්‍යාඥයාගේ භූමිකාව හා කාර්ය භාරය බ-ගර්ගේ දර්ශනයෙන් බැලූ විට, අද වන විට පෙනෙන ආකාරයත්, ඔහුගේ ඉදිරිපත් කිරීමේ ඇති ශක්තීන් හා සීමාවන් මෙන්ම, ව්‍යාකූල අදහස් පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියකින් බැලීම මෙම ලිපියෙහි අරමුණයි.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

**පර්යේෂණ ප්‍රශ්න (Research Questions)**

I. සමාජ විද්‍යාව බුද්ධිමය ලාලසාවක් ලෙස බ-ගර් විසින් මූර්තිමත් කරන්නේ කෙසේද?
II. සමාජ විද්‍යාඥයාගේ භූමිකාව පිළිබඳව ඉදිරිපත් වී ඇති පොදු ඒකාකෘති පිළිබඳව බ-ගර්ගේ මත දැක්මේ ඇති ප්‍රබලතා සහ දුබලතා මොනවාද?
III. නූතන සමාජ විද්‍යාව තුළ බ-ගර්ගේ අදහස් ප්‍රතිඅර්ථ කථනය කළ හැක්කේ කෙසේද?

**1 කොටස**

සමාජ විද්‍යාඥයා හා ඔහුගේ ප්‍රතිරූපය (The sociologist and his image) සමාජ විද්‍යාවට ඇරයුමක් නැමති බ- ගර්ගේ කෘතියෙහි පළමු පරිච්ඡේදයෙහි මූලික අවධානය යොමුව ඇත්තේ සමාජ විද්‍යාඥයාගේ ප්‍රතිරූපය කවරක් ද යන්න හඳුනා ගැනීම විෂයෙහිය. මෙහිදී ඔහු සමාජ විද්‍යාඥයා යනු කවරෙක්ද යන්න පිළිබඳ ගොඩනැගී ඇති ඒකාකෘති හයක් සමඟ ගනුදෙනු කරයි. මෙම ආකෘති අසම්පූර්ණ හා නොමඟ යවන සුළු ඒවා බවය ඔහුගේ අදහස. සමාජ විද්‍යාඥයා යනු තවදුරටත් කවරෙක් ද යන්නට ඔහු ගෙනෙන පිළිතුර හේතුවෙන්, තවදුරටත් බහුඅරුත් සහගත බවක්, විවිධත්වයක් මෙන්ම අර්ථ ව්‍යාකූලතාවයක්ද ගොඩනැගෙතැයි යමකුට තර්ක කළ හැකිය. ඔහු ඉදිරිපත් කරන සමාජ විද්‍යාඥයා පිළිබඳ පවත්නා ප්‍රතිරූප පහත පරිදි වෙයි.

1. සමාජ විද්‍යාඥයා සමාජ වැඩකරුවකු ලෙස (The Sociologist as a social worker) සමාජ විද්‍යාඥයා සමාජ වැඩකරුවකු ලෙස හඳුනාගන්නා විට, ඔහු අනෙකාට උදව් උපකාර කරන්නෙකුගේ ප්‍රතිරූපයක් අත්පත් කර ගනී. එහෙත් යථාර්ථය වන්නේ, සමාජ විද්‍යාත්මක තොරතුරු අනෙකාට උදව් කිරීමේ උතුම් මානවීය උවමනාවෙන් පමණක් පෙනී නොසිටීමයි. උදාහරණයක් ලෙස, අපරාධ පිළිබඳ සමාජ විද්‍යාත්මක තොරතුරු, අපරාධ මැඩීම සඳහා මෙන්ම අපරාධ ප්‍රචාරණය සඳහාද එකසේ භාවිතයට ගත හැකිය (Berger,1963). මිනිසා සමඟ වැඩ කිරීම තොරතුරුවලට අනන්‍ය ගුණයක් නොවේ. එසේම, සමාජවිද්‍යාඥයා සමාජ වැඩකරුවකු ලෙස අර්ථ දක්වන්නට යාම, ඔහුගේ ප්‍රතිරූපය බාල්දු කිරීමක් ලෙස බ-ගර් දකී. එහිදී සමාජ විද්‍යාඥයා සතු නිරීක්ෂණය කිරීමේ ගුණයත්, විශ්ලේෂණය කිරීමේ හැකියාවත් අවතක්සේරු කරනු ලැබේ යැයි ඔහු කියයි.
2. සමාජ විද්‍යාඥයා සමාජ වැඩ සඳහා න්‍යායධරයකු ලෙස (The sociologist as a theoretician for social work) සමාජ විද්‍යාඥයා සමාජ වැඩ කිරීමේ නැඹුරුතාවයක් ඇති න්‍යායධාරියකු ලෙස සලකතොත්, සමාජ වැඩ, සමාජ විද්‍යාවට වඩා ප්‍රායෝගික වශයෙන් නැඹුරු වන්නේ මනෝ විද්‍යාව වෙතටය. සමාජ විද්‍යාව ව්‍යවහාරයක් නොවේ. එය අවබෝධ කර ගැනීම සඳහා වන උත්සාහයකි. (Sociology is not a practice,but an attempt to understand, (Berger, 1963) සමාජ වැඩ පිළිබඳ සැලකීමේදී, සමාජ විද්‍යාත්මක අවබෝධය වැදගත් විය හැකි නමුත්, එකී අවබෝධය වෙළඳ ප්‍රචාරණයෙහි යෙදෙන අලෙවිකරුවන්ට, හෙදියන්ට, ආගම ප්‍රචාරයෙහි


CC BY NC ND
ISSN 3121-4266

යෙදෙන පූජකයන්ට මෙන්ම, දේශපාලන ප්‍රචාරණයේ යෙදෙන දේශපාලනඥයන්ටත් එකසේ නිර්දේශ කළ හැකිය. සදාචාර දර්ශනය අරමුණු කොටගත් යුක්ති සහගත භාවය කවරක් වුවත්, මිනිසා හැසිරවීමට බලාපොරොත්තු වන කාටත් මෙය එකසේ භාවිතයට ගත හැකිය. මේ තර්කය මගින් සමාජ විද්‍යාවේ පවත්නා බහුත්ත්ව භාවයත්, අගය විනිශ්චයකින් තොරව භාවිතයට ගත හැකි ආකාරයත් ප්‍රකාශයට පත් වෙයි. සමාජ විද්‍යාඥයින් සතුව කිසිදු පෞද්ගලික අගය විනිශ්චයක් නොපවතිය යැයි හෝ නොතිබිය යුතු යැයි නොසිතිය යුතුයි. එයින් අදහස් වන්නේ, සමාජ විද්‍යාඥයා අගය විනිශ්චය පිළිබඳ කරුණ සිත් දරා සිටිය යුතුය යන්නයි. ඔහු උත්සාහ දරනුයේ තමා අවට ඇති දෑ දැකීමටයි. ඔහු දක්නා දේ කුමක් විය හැකි ද යන්න පිළිබඳව සමාජ විද්‍යාඥයා තුළ බලාපොරොත්තු, මෙන්ම බිය හා සැක සංකා ද පැවතිය හැකිය. එය පිරිසිදු සංජානනයකි. මානව සීමා යටතේ පිහිටි පවිත්‍රතාවයකි. එය සමාජ විද්‍යාවේ පරිශ්‍රමය කුමක් අරභයා යොමු වන්නේ ද යන්න මත නැගෙන ගැටළුවකි. " යමක් එහෙම නේද?" කියා ඇසීම සමාජ විද්‍යා ප්‍රශ්නයක් නොවන්නේ එබැවිනි.

3. සමාජ විද්‍යාඥයා සමාජ ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස (The Sociologist as a Social Reformer) යුරෝපයේ මෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේදීත්, සමාජ විද්‍යාඥයා සමාජ ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස පෙනී සිටීම දිගුකාලීන ඉතිහාසයකට හිමිකම් කියන්නකි. සමාජ ප්‍රශ්න සමඟ සමාජ විද්‍යාඥයා කරන ගනුදෙනුව හේතුවෙන්, ඔහු හා සමාජ ප්‍රතිසංස්කරණවාදියාගේ භූමිකාව පටලවා ගැනීමක් සිදුවෙයි. එහිදී නැගෙන ගැටලුව,සමාජ වැඩකරුවා පිළිබඳව කලින් කරනු ලැබූ තර්කයට සමපාත වන්නේය. සමාජ විද්‍යාත්මක දැනුමෙහි, සමාජ ප්‍රතිසංස්කරණ විෂයෙහි උරුම වූ නිත්‍ය වූ අනන්‍ය ගුණයක් නොපවතී. එසේම, සමාජ විද්‍යාව උත්සාහ දරනුයේ සමාජය තේරුම් ගැනීමට විනා, එය වෙනස් කිරීමට නොවේ.
4. සමාජ විද්‍යාඥයා තොරතුරු සහ සංඛ්‍යාදත්ත එකතු කරන්නකු ලෙස (The Sociologist as a Gatherer of Statistics) සමාජ විද්‍යාඥයා සමාජ සමීක්ෂණ කරන්නෙකු, වෙළඳ පොළ සමීක්ෂණ පවත්වන්නෙකු, පොදු ජන අදහස මැන බලන්නෙකු වැනි පාර - සමාජ විද්‍යා කටයුතුවල යෙදෙන්නෙකු ලෙස ගොඩ නැගෙන ප්‍රතිරූපය මෙහිලා බ - ගර්ගේ විවේචනයට ලක්වේ. බ-ගර් සමාජ විද්‍යාඥයා සතු ඉහත ප්‍රතිරූපය දකිනුයේ කණගාටුවෙනි. සංඛ්‍යා දත්ත, ඒවා තුළින්ම සමාජ විද්‍යාවක් ගොඩ නොනගන බවත්, ඒවා සමාජ විද්‍යාව වන්නේ සමාජ විද්‍යාත්මක අර්ථ කථනයකට නතු කළායින් පසුව බවත් බ-ගර් පවසයි. පළමු ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකානු සමාජ විද්‍යාව වැඩිමනත් ලෙස මෙබඳු ආරකට නැඹුරු වී ඇති සැටිත්, න්‍යායාත්මක දෘෂ්ටි කෝණයෙන් දැඩි ලෙස අත්මිදෙමින් පටු පරිගත ආනුභූතිකත්වයක් වෙත නැඹුරු වී ඇති සැටිත් ඔහු පෙන්වා දෙයි. ප්‍රතිඵල දායක බවෙහි උපමාණයන් තුළට අනුගත වීම, - ව්‍යාපාරික ලෝකයේ සිදු කරන්නාක් බඳු සාර්ථකත්වය අත්පත්කර ගැනීම සඳහා පළ කරණු නැතහොත් මියෙනු! (publish or perish) නැමති නිර්ණායකය තුළින් ඇකඩමියාව දැකීම, මෙකී ප්‍රතිරූපය නිර්මාණය කිරීමට බලපාන සාධක බවට පත්වේ. "


සාමග්‍රී Unity
ISSN 3121-4266

කොපමණ පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාවක් පළ කර තිබේද? ' ' ඒවා පිළිගත් ජර්නල් වල පළ කොට තිබේද? '' (Scopus indexed journals) "ඔබට පර්යේෂණ දොරටු (Research Gate) හෝ ගුගල් පර්යේෂකයා (Google Scholar) ගිණුම් තිබේද? ', '' ඔබේගේ - Orchid අංකය කුමක්ද? " " ඔබට ගුගල් සටේෂන් (Google Citations) කීයක් තිබේද?" ආදියෙන් වර්තමාන සමාජ විද්‍යාඥයාගේ ප්‍රතිරූපය ඉදිවෙයි. එසේ නැතිනම්, නූතන ලාංකීය විශ්ව විද්‍යාලයක මහාචාර්ය ධූරය සඳහා ලියා පළ කොට ඇති පොත් සංඛ්‍යාව, ඔහුගේ ඵලදායිතාවයේ මිනුමක් බවට පත් වෙයි. මෙමගින් වඩාත් පටු වූත්, කුඩා ආනුභවික පර්යේෂණ මත්තෙහි යැපෙමින්, බුද්ධිමය පටු බව වඩ වඩා සටහන් කරන මාතෘකා වෙත නැඹුරු වීමක් සිදුවේ. පර්යේෂණ ආධාර, හෝ උදාහරණයක් ලෙස විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට ගෙවන පර්යේෂණ දීමනාව (Research Allowance), වෙනුවෙන් කුමක් හෝ අටවාදීම, කෙටිකාලීන ව්‍යාපෘති සඳහා පර්යේෂකයාගේ නැඹුරුව දනවයි. බ- ගර්ගේ අදහස් තුළින් ගොඩනගන, සංඛ්‍යා දත්ත කරුවන් සමාජ විද්‍යාඥයින් නොවේ" යන අදහස, නූතන ලාංකේය විශ්ව විද්‍යාලවල සමාජ විද්‍යා සමීක්ෂණ වල පිනුම් ගසන ඇදුරු, මහදුරුවන්ට වැරෙන් එල්ල කෙරෙන අතුල්පහරක් බඳුය. සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය පරිකල්පනය සහ විග්‍රහය සමඟ බැඳුණක් යන්න බ-ගර්ගේ අදහසයි.

5. සමාජ විද්‍යාඥයා විද්‍යාඥයෙකු ලෙස (The Sociologist as a Scientist) ක්‍රම විද්‍යාත්මක සිරකුඩු සහ පාරිභාෂික අපප්‍රංශ තුළ සිරවීම නමැති කරුණ මෙහිදී බ-ගර්ගේ අවධානයට ලක් වේ. බ-ගර්ගේ තර්කය වන්නේ, සමාජ විද්‍යාවෙහි ලා විද්‍යාත්මක ක්‍රම වේදයක් නිර්මාණය කර ගැනීමට නම්, නැවතත් සමාජ විද්‍යාඥයාට සංඛ්‍යා දත්ත කරුවෙකු බවට පත්වීමට සිදුවනු ඇති බවයි. සංඛ්‍යා දත්ත එකතු කොට නිර්මාණය කෙරෙන, නොතේරුම් සහගත, පටලැවිලි සහගත, අපප්‍රංශමය ගතිය. නැතහොත් අන්ඩර දෙමල ස්වභාවය, ඔහු හඳුන්වන්නේ බුද්ධිමය වනචාරීත්වයක් (Intellectual Barbarism) ලෙසිනි. සමාජ විද්‍යාවෙහි පවත්නා මෙකී උරුමක්කාර ස්වරූපය විවේචනාත්මකව දකින බ - ගර්, සමාජ විද්‍යාවන්ට කිසියම් ක්‍රම විද්‍යාත්මක විධි නියාමනයක් අවශ්‍ය බව ප්‍රතික්ෂේප නොකරයි. සාක්ෂිමය වශයෙන් තහවුරු කිරීමේ රීතිය සහ අවස්ථාවන් පිළිබඳ අවධානයක් පැවතීම අවශ්‍ය බව ඔහු සඳහන් කරයි. සමාජ විද්‍යාඥයා විද්‍යාඥයකු ලෙස බ - ගර් මෙහිලා ගෙන එන විවේචනය, සියලුම සමාජ විද්‍යාඥයන්ට එකසේ අදාළ කළ නොහැකිය. විශේෂයෙන්ම ඇමෙරිකානු සමාජ විද්‍යාඥයින් මෙයින් අත්මිදීම සඳහා උත්සාහ දරා තිබේ. ස්වභාවික විද්‍යාවන්හි පවා, මෑත කාලීන වශයෙන් තදබල යථානුභූතවාදයෙන් අත් මිදීම සඳහා නැඹුරුවක් දක්නට තිබියදී, ස්වාභාවික විද්‍යාවන්ගෙන් උරුම වූ යථානුභූතීන් නැඹුරුව එලෙසින්ම පවත්වාගෙන යාමට උත්සාහ දැරීම දෛවයේ සරදමකි. ඕනෑම විෂයයක් සැලකූ විට, එකී විෂයට අදාළ පාරිභාෂික වචන පැවතීම පොදු කරුණකි. විෂයක් දියුණු වන්නේ එයටම අනන්‍ය වූ වාග් මාලාවක් සමග අනුබද්ධවයි. සමාජ විද්‍යාවන් සැලකූ විට, පාරිභාෂික වදන් ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරන බවට සැක නැත. සමාජ විද්‍යාවේ


සාමග්‍රි Unity
cc BY NC ND
ISSN 3121-4266
9 773121 426004

විෂය කරුණු වඩාත් හුරු පුරුදු, සාමාන්‍යකරණයකට ලක් වන්නේ වචන මඟින් ඒවා හැඟවීමට හැකි වූ විටයි. ඕනෑම විද්‍යාත්මක ක්‍රියාවලියක් තුළදීම, සංකල්ප පිළිබඳ නිරවුල් හා පැහැදිලි අර්ථ කථන ගෙන ඒමට සමාජ විද්‍යාඥයන්ට හැකි විය යුතුය. එහෙත් සමාජ විද්‍යාත්මක ඉදිරිපත් කිරීම් බොහොමයක්, හිතාමතාම අර්ථ ව්‍යාකුල කළ, පටලැවිලි සහගත ඉදිරිපත් කිරීම් ලෙස වර්තමානයේ දී දක්නට ලැබේ. 6. සමාජ විද්‍යාඥයා යනු එක විදිහක මිනිසෙකි (The Sociologist as a Certain Kind of Person) බ-ගර් මෙහිදී කියන්නට උත්සාහ කරන්නේ, සමාජ විද්‍යාඥයා යනු නිදහස්, නොබැඳුණු, නිර්දය නිරීක්ෂකයකු බවයි. ඔහු සමාජ විද්‍යාඥයකු ලෙස භාරගන්න යැයි කියන විට, උත්ප්‍රාසයක් මතුවෙයි. සමාජ විද්‍යාව රජයට හෝ ව්‍යාපාරයකට විකුණන්නට දරන තැත තුළින්, එකී උත්ප්‍රාසයෙහි පෙනෙන රළු විකෘතිය, අප රූපණය පැහැදිලි වෙයි. සමාජ විද්‍යාඥයා යනු කවරෙක් ද යන ප්‍රශ්නයට ලැබෙන පිළිතුර තුළින් ඉදි කෙරෙන ප්‍රතිරූපය. කිසිසේත් සම්පූර්ණ එකක් නොවේ. එය හුදු සංහිතාවකි. ගොඩනැංවීමකි. බ-ගර් කරනුයේ, සමාජ විද්‍යාඥයා මෙබන්දකු විය හැකි යැයි පරමාදර්ශ මාදිලි (Ideal Types) ගොඩනැංවීමයි. සමාජ විද්‍යාඥයා කවරෙක්ද යන්න පිළිබඳව දිරිපත්ව ඇති ඕනෑම දර්ශකයක්, ඔහුගේ සැබෑ භාවිතය තුළ ඕනෑම විටක, එක් එක් ප්‍රමාණයන්ගෙන් අපගමනය වීමට ඇති හැකියාව බැහැර කළ නොහැක්කකි. යමෙකු සමාජ විද්‍යාඥයකු වන්නේ කෙසේද ? සමාජ විද්‍යාව විමර්ශනාත්මක ශික්ෂණයක් ලෙසත්, එකී ශික්ෂණයෙහි ගැවසෙන්නා සමාජ විද්‍යාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳවත්, බ-ගර් මෙම පරිච්ඡේදය තුළ බුද්ධි නිර්මාණ ශිල්පයක යෙදෙයි. සමාජ විද්‍යාව ප්‍රායෝගික භාවිතයක් නොව, බුද්ධිමය ලාලසාවක් බවට ඔහු තර්ක කරයි.

(A) සමාජ විද්‍යාව මිනිසුන් කියුම් කෙරුම් පිළිබඳව වන කුතුහලයෙන් පිරුණු ආශාවකි. බ- ගර්ගේ අවධානය සමාජ විද්‍යාඥයකු නිර්මාණය වීමට බලපාන ප්‍රේරණයන් හා පෙළඹුම් මොනවාද යන්න සොයා බැලීම කෙරෙහි යොමුවෙයි. එයට ඇති ඉතාම කෙටි පිළිතුර වන්නේ, සමාජයේ යමෙකු සමාජ විද්‍යාඥයකු බවට පත් වන්නේ, මිනිස් චර්යාවන්, කියුම් කෙරුම් සොයා බැලීම කෙරෙහි වන නොසිඳෙන ආශාව නිසා බවයි. එය ඉතා බලවත්ව නැගෙන උනන්දුවකි. ලජ්ජා විරහිත හා හොඳින් තෙරක් නොපෙනෙන උනන්දුවකි. ආශාවකි. ජීවිතයේ සෑම අස්සක් මුල්ලක් සොයා බැලීමේ කැදරකමකි. හැම දෙයක් කෙරෙහිම, යම් තැනකම, ඕනෑම මොහොතක දැල්විය හැකි උද්වේගයකි. මිනිසුන් ගැවසීගත් පොදු තැන්හිත්, එදිනෙදා ජීවිත දිගහැරුම තුළත් නැගෙන්නකි. පිළිගත් හුරු පුරුදු සීමා මායම් නොතකන්නකි. අතික්‍රමණය කරන්නකි.

(B) සමාජ විද්‍යාඥයාගේ මෙවලම ප්‍රශ්න කිරීමයි සමාජ විද්‍යාඥයාගේ මෙවලම 'ප්‍රශ්න´ කිරීමයි. ඔහුගේ විමසුම සමාජයේ සෑම ස්ථරයක් වෙතම ඔහු හැරලවාලයි. යා හැකි හැම තැනටම ඔහුව රැගෙන යයි. හොඳින්ම දන්නා තැනට මෙන්ම, කිසිත් නොදන්නා තැනටද ඔහු කැඳවා ගෙන යයි. මහත් ගරු බුහුමන් සපිරි තැන්හිත්, අවමන් හා ගැරහුම්


සාමග්‍රී Unity
ISSN 3121-4266

බහුල තැනහිත් ඔහු සිටින්නේය. ඔහු සැබෑ සමාජ විද්‍යාඥයෙකු නම්, ඔහුගේම ප්‍රශ්න විසින් ඔහුව අයිති කරගෙන, මේ හැම තැනටම හෙතෙම රැගෙන යනු ඇත. එහෙත් සොයා යන බොහෝ දේ ගැන, සොයා ගත හැකි පිළිතුරු ඇත්තේ ඉතා ස්වල්පයක් විය හැකිය. අනෙකාට අතිශය පාරිශුද්ධ යැයි හැඟෙන තැන්හි, අතිශය දූෂිත යැයි පෙනෙන තැන්හි, සමාජ විද්‍යාඥයාට කරන්නට යමක් ඇත. වැසුණු දොරක් ළඟ නැවතී, කුකුස් සිතින් ඇතුළතින් ඇසෙන මිනිස් හඬට කන් යොමා සිටින්නට මදක් ඔහු නවතිනු ඇත. සමාජ විද්‍යාඥයා අසන පැනය නැතහොත් ඔහුගේ විමර්ශනය, අනෙකුත් සමාජීය විමර්ශනයන්ගෙන් - ආර්ථික විද්‍යාඥයන්, මනෝවිද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින් සහ ඉතිහාසඥයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද ? ඔහු ප්‍රශ්න අසන කෝණය හා දර්ශනය යන කරුණු දෙක මත පදනම්ව සමාජ විද්‍යාඥයා වෙනස් වෙයි. " දොර පිටිපස සිටින මිනිසුන්ගේ මිමිනීම තුළ කුමක් ඇසිනිද? " " ඔවුනොවුන් අතර වූ සබැඳියාව කුමක්ද? ", " එම සම්බන්ධතා සමාජ සංස්ථාපනයක් ලෙසින් සංවිධානය වන්නේ කෙලෙසින්ද? " සාමූහික අදහස්, සංවිධාන, සහ පුද්ගලයා මෙහෙය වන්නේ කෙසේද? " ආදී වශයෙන් ඔහුගේ අවිය ප්‍රශ්න කිරීම බවට පත් වේ.

(C) පෙර නොදුටු ලෝකයක් සොයා ගැනීම. මෙතෙක් නොදුටු ලෝකයක් සොයා ගැනීමට සමාජ විද්‍යාඥයාට අවශ්‍ය වෙයි. ඔහු ප්‍රශ්න අසන්නේත්, සොයා යන්නේත් පෙර නොතිබූ, නොදුටු, නොපෙනුණු නව තත්ත්වයකි. සමාජ විද්‍යාවේ උද්යෝගය එයයි. සමාජ විද්‍යාඥයාගේ ආහ්ලාදය එයයි. පෙර නොසිතූ, නොසිතිය හැකිව තිබූ නව යමක් හාරා අනුස්සා ගැනීමයි. අපරාධ, ආගම, වෙළෙඳ දැන්වීම්, ලෙඩ රෝග, බෙහෙත්, කෑම බීම ආදී නොයෙක් මානව ගනුදෙනු තුළ තිගැස්සෙන සුළු අලුත් ලොවක් දැකීම සමාජ විද්‍යාඥයාගේ උවමනාවයි. අප දන්නා හුරු පුරුදු දෑ තුළින් පුදුම කරවන යමක් මතුකොට පෙන්වා දීම, සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරයයි. හුරුපුරුදු දෑ නවමු ලෙසින් පෙනී සිටින විටදී, එහි අරුත් රූපාන්තරණය වෙයි. වෙනත් වදනකින් කීවොත්, අප මුළු ජීවිතයම ගෙවා දැමූ පැරැණි ලෝකයේ අලුත් ආලෝකයකින් විඳින්නට හැකිවීම, සමාජ විද්‍යාවේ ආශ්වාදයයි.

**II කොටස: බ- ගර්ගේ දෘෂ්ටියෙහි අන්තර්ගත ප්‍රධාන සමාජ විද්‍යාත්මක මූලධර්ම**

1. විෂය වස්තුවෙහි ද්වීප්‍රකාර භාවය : සමාජ විද්‍යාඥයාගේ ද්විත්ව මැදිහත්වීම (Subject matter of Duality - the double involvement of the sociologist) සමාජ විද්‍යාඥයන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ, ඔහුගේ විෂය වස්තුව හා ජීවන සවිඥානික භාවයත් එකම ලෝකයක් තුළින් මතු කර ගැනීමට සිදුවීමයි. සමාජ විද්‍යාඥයා ජීවත්වනුයේද සමාජයේය. ඔහුගේ විෂය වස්තුව වන්නේද එම සමාජයමය. ඔහුට නොවැළැක්විය හැකි ලෙස සිය ජීවිතයෙහිම කොටසක්, තමා නියුතු කාර්යෙහිම විෂය වස්තුව බවට පත්කර ගැනීමට සිදුවෙයි. (The sociologist lives in society, on the job and off it, His own life, inevitably is part of his subject matter)


සාමූහි Unity
ISSN 3121-4266
CC BY NC ND

(Berger, 1963). එබැවින් සමාජ විද්‍යාඥයාගේ ජීවිතය ඔහුට ද්විත්ව මෙහෙයුමකි. මෙය බ-ගර් හඳුන් වන්නේ ද්විප්‍රකාර මැදිහත්වීමක් ලෙසිනි. (Double involvement). උදාහරණයක් ලෙස, අධ්‍යාපනයේ පවත්නා අසමානතා පිළිබඳ අධ්‍යයනය කරන සමාජ විද්‍යාඥයකු, තමා පෞද්ගලිකවම එකී අසමාන සැලකීමට ගොදුරු වූවකු විය හැකිය. එවිට සමාජ විද්‍යාඥයාට, සිය සමාජ විද්‍යාඥයාගේ භූමිකාව සහ ආත්මීය අත්දැකීමේ පක්ෂපාතීභාවය අතර සමබරතාව පවත්වාගෙන යාමට සිදුවේ. එය සමාජ විද්‍යා විමර්ශනය සංකීර්ණ භාවයට පමුණුවන්නකි. බ-ගර් ඉදිරිපත් කරන ද්විප්‍රකාරභාවය පිළිබඳව අදහස, සි. රයිට් මිල්ස්ගේ 'සමාජ විද්‍යා පරිකල්පනය (Sociological Imagination) යන සංකල්පය සමඟින් අනුනාද වෙයි. සමාජ විද්‍යා පරිකල්පනයේදී මිල්ස් පවසනුයේ, සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය වන්නේ පෞද්ගලික අත්දැකීම් සහ සමාජ ව්‍යුහයේ අතර පාලමක් ඉදිකිරීම බවයි. (මිල්ස්, 1959) ජීවන වෘතාන්තය (Biography) සහ ඉතිහාසය (History) අතර ඇති සබඳතාවක් නිරාවරණය කර ගැනීම තුළින් සමාජය වටහා ගැනීම ලෙස මෙය මිල්ස් විසින් හඳුන්වයි. ඈන්තනි ගිඩ්ඩන්ස්ගේ ව්‍යුහීකරණ න්‍යායෙහිද (Theory of Structuration) දැකිය හැක්කේ, පුද්ගලයා හා ව්‍යුහය අතර පවත්නා ද්වි ප්‍රකාරත්වය ජය ගැනීමට ගන්නා උත්සාහයක් වශයෙනි. (Giddens, 1996). Pfadenhauer (2013) පවසන්නේ, මෙකී ද්විත්වභාවය සමහන් කළ හැක්කේ යමෙකුගේ තත්ත්වය හා ආස්ථානය (Position) පිළිබඳ විවේචනාත්මක දැනුවත් භාවයකින් කටයුතු කිරීමෙන් බවයි. ජීවන අත්දැකීම් තුළින් ලබාගන්නා ප්‍රතිවේදනය, සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය පොහොසත් කිරීම සඳහා භාවිත කිරීමේ දී ඇතිවිය හැකි පක්ෂපාතීභාවයන් (Biases) පාලනය කළ යුත්තේය.

2. සමාජ යථාර්ථයෙහි බහු අර්ථස්තරීය ස්වභාවය (The many layers of meaning in social reality) බ-ගර් පවසනුයේ, සමාජ යථාර්ථය යනු බහු ස්තරීය පැවැත්මක් සහිත අස්තිත්වයක් බවයි. පරිස්සම් සහගත එළඹුමක් තුළින්, එක් ස්තරයකට යටින් ඇති අනෙක් ස්ථරයේ අර්ථයන්ම කුමක්දැයි සොයාගත යුත්තේය. "පෙනෙන්නට ඇති දේ එයම නොවේ. සමාජ යථාර්ථය අර්ථ ස්ථර ගණනාවකින් යුක්ත බවට පැමිණිය හැකිය. අලුතෙන් සොයාගන්නා සෑම අර්ථ ස්ථරයක්ම, සමස්ථය පිළිබඳ ප්‍රත්‍යක්ෂය වෙනස් කරවයි." (Berger, 1963) සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය ඉහත කී අර්ථ ස්ථර සොයා යාම බව, නැතහොත් සමාජ යථාර්ථයෙහි අර්ථස්ථර අර්ථකථනය කරන්නකු ලෙස ඔහු හඳුනාගත යුත්තේය. මතුපිටින් පෙනෙන දෙයින් ඔබ්බට යමින්, සැඟවුණු මාන දෙස ඉසියුම් ඇසින් බැලීම ඔහුගේ භූමිකාවේ කොටසකි. සමාජයෙහි පවත්නා අගනාකම්, ධර්මතා, සමාජ සංස්ථා හෝ මානව චර්යා පිටිපස සැඟව ඇති දෑ නිරීක්ෂණය තුළින් මෙකී අර්ථ ස්ථර පාදා ගත හැකි වන්නේය. බ-ගර්ගේ අන්තර්දෘෂ්ටිය, අර්වින් ගොෆ්මන්ගේ (Ervin Goffman) එදිනෙදා ජීවිතයේ ස්වයංභාවයේ ප්‍රකාශනය (Presentation of Self in Everyday Life) හි ඉදිරිපත් කිරීම තුළින් කදිමට විනිවිද දැකිය හැකිය. පුද්ගලයා සිය භාව ප්‍රකාශනයන් කළමනාකරණය කරගන්නා අන්දම, මතුපිටින් පෙනෙනවාට වඩා සංකීර්ණ හා බහු වර්ථ සහගත එකකි. එසේම සමාජ ව්‍යුහ


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

සහ සිතැඟි අතර කෙරෙන ගනුදෙනුවද සංකීර්ණ එකක් බවට පත්වෙයි (Goffman" 1959). එබැවින් සමාජ විද්‍යාඥයා, සැඟව ඇති ලේඛනගත අර්ථ විකේතනය කරන රහස් පරීක්ෂකයෙකු බඳුය.

3. අගය විනිශ්චයෙන් තොර සමාජ විද්‍යා විමර්ශනයක් (Value-free approach to sociological inquiry) සමාජ විද්‍යාව, පෞද්ගලික අගය විනිශ්චයකින් ඔබ්බට ගිය වාස්තවික භාවයක් සහිත මධ්‍යස්ථ විෂයක් විය යුතු බවය බ- ගර්ගේ අදහස. සමාජ විද්‍යාඥයාට තමා සොයා යන දෙය පිළිබඳව බලාපොරොත්තුවක් හෝ බියක් පැවතිය හැකිය. නමුත් ඔහු සිය බියෙන් හා බලාපොරොත්තුවෙන් විනිර්මුක්තව, ලැබෙන දෙය දෙස බැලිය යුත්තේය. මෙය මැක්ස් වෙබර්ගේ අදහසක් වන Wertfreiheit (Value-Freedom) අගය විනිශ්චයෙන් තොරවීම - අනුනාද කරවන්නකි. සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයේදී, පෞද්ගලික අගයන් හේතුවෙන් පක්ෂග්‍රාහී නොවී සිටීම මෙයින් අදහස් කෙරේ. සමාජ විද්‍යාඥයාට අගනාකම්වලින් තොර ජීවිතයක් තිබේ යන්න මෙමගින් කිසිසේත් අදහස් නොකරයි. උදාහරණයක් ලෙස, අපරාධ පිළිබඳව අධ්‍යයනයෙහි යෙදෙන සමාජ විද්‍යාඥයෙකුට, අපරාධ නිර්මාණය වීම කෙරෙහි බලපාන සමාජ, සංස්කෘතික, මෙන්ම ආර්ථික හේතු සාධකවල බලපෑම සිය විෂය පථය තුළට හසුකර ගනු ලැබිය හැකිය. එසේම අපරාධයක ඇති සදාචාරාත්මක ආස්ථානය, ඔහුගේ ඇගයුම් පද්ධතිය තුළින් පුද්ගලිකව ක්‍රියා කරන නමුත්, අපරාධයේ යෙදුණු පුද්ගලයාගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳව පුද්ගල විනිශ්චයක් දීම, සමාජ විද්‍යාඥයාගේ කටයුත්තක් නොවනු ඇත. කෙසේ නමුත් විවේචකයින්ගේ තර්කය වන්නේ, සියයට සියයක් අගය විනිශ්චයකින් තොරව සමාජ විද්‍යාඥයන් සිටිය නොහැකි බවයි. අගය විනිශ්චයෙන් තොරවීම එනම්, සමාජ විද්‍යාඥයන්ට මධ්‍යස්ථ ලෙස පර්යේෂණවල යෙදිය හැකිය යන අදහස, සි. රයිට් මිල්ස් විසින් ප්‍රශ්න කොට තිබේ. 'ගැටලුව ' කුමක් ද යන්න අර්ථකථනය කරන්නේ දෙන ලද වටිනාකම ඔස්සේ නම්, මධ්‍යස්ථ සමාජ පර්යේෂණ කියා යමක් තිබිය හැකිදැයි? ඔහු ප්‍රශ්න කරයි. අධ්‍යයනය කළ යුත්තේ කවර ගැටලු ද, නොකළ යුත්තේ කවර ගැටලු ද යන්න අගය විනිශ්චය අනුව තීරණය වන්නේය. (Mills, 1959). සම්පූර්ණ අගය විනිශ්චයකින් තොර සමාජ විද්‍යාවක් පැවතිය නොහැකි යැයි Hjelm පවසන්නේ, යම් සමාජ විද්‍යාඥයකු හැදී වැඩෙන, ජීවත් වන, ඔහු අයත් සංස්කෘතික හා ඓතිහාසික සංදර්භයන් ඔහුගේ දැක්ම හැඩ ගැසීමට බලපානු ලබන්නේ යන මතයේ පිහිටමිනි (Hjelm,2019) 4. සමාජ විද්‍යාත්මක සොයා ගැනීම් සංස්කෘතික තිගැස්මක්' ලෙස (Sociological discovery as cultural shock) සමාජ විද්‍යාඥයා පවසන දෙය අනෙකාට ඉතා සාමාන්‍ය දෙයක් වූ විට, මෙබඳු විග්‍රහයන්ට කාලය කැප කරන්නේ. වෙහෙසෙන්නේ මන්දැයි යමෙකු ප්‍රශ්න කරනු ඇත. සාමාන්‍ය දෙය තුළින් මතු කරගන්නා නවමු ප්‍රතිවේදනයන් තුළින්, සිතා සිටි යමක් එකවරම සිත අවුලුවාලන යමක් ලෙසින් මතු කර ගැනීම, සමාජ විද්‍යාවේ ඇති උද්යෝගයයි. බ-ගර්, සමාජ විද්‍යාව තුළින් මතුවන විදසුන් (Insight) සංස්කෘතික තිගැස්මකට ආදේශ කරයි. පෙර නොසිතූ, විරූ යමක් එදිනෙදා ජීවිතය


සාමග්‍රී Unity
ISSN 3121-4266

තුළින් මතු කර ගැනීම මෙකී තිගැස්මට හේතුවයි. අපට ඉතා හුරු පුරුදු සාමාන්‍ය යමක්, අපූර්ව දැක්මක් බවට විපරිවර්තනය කිරීම සමාජ විද්‍යාඥයාගේ කාර්ය භාරයයි. (Berger, 1963) ලෝකය දෙන ලද ආකාරයෙන් බාරගන්නා අයට අභියෝග කිරීම සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය වේ. ගෝලීය සමාජය තුළ, සමාජ විද්‍යාව සතු විපරිවර්තීය බලය පිළිබඳව සඳහන් කරන නූතන සමාජ විද්‍යාඥයෝ, ගෝලීය පරිමාණයෙන් පවත්නා සංස්කෘතික විශ්වාස (උදාහරණ: සංචරණය/ පරිසරික වෙනස්කම්) ප්‍රතිවිභේදනයකට (deconstruct) යොමු කරති. (Bickel, 2017). III කොටස සාකච්ඡාව (Discussion) මෙම කොටසේදී අපගේ අපේක්ෂාව වන්නේ පීටර් එල්. බ-ගර්ගේ "සමාජ විද්‍යාව පුද්ගලික ආශ්වාදයක් ලෙස" ගෙන එන ඉදිරිපත් කිරීමෙහි ඇති බලගතු සංකල්පන සහ දුබලතා පිළිබඳව සාකච්ඡා කිරීමයි. ඔහුගේ ඉදිරිපත් කිරීම සැබවින්ම සමාජ විද්‍යාව යනු කුමක්ද යන්න පිළිබඳ බුද්ධිමය වියමනකි. " සමාජ විද්‍යාවට ඇරයුමක් ' නමැති ඔහුගේ කෘතියෙහි පළමු පරිච්ඡේදය වඩාත් සුවිශේෂී වන්නේ බ-ගර් භාවිතයට ගන්නා බස් වහර නිසයි. එය පාඨකයා කුපිත කරවන සුළු උපමා රූපකවලින් ගහන වූවකි. බ- ගර්ගේ රචනයෙහි ඇති ප්‍රධානතම ශක්තියක් වන්නේ ඉහතින් කී රූපක ගොඩනංවමින් සමාජ විද්‍යාවේ ස්වභාවය මතකයෙහි රුවා තැබීමට හැකි වීමයි. උදාහරණයක් ලෙස, ඔහු විටෙක සමාජ විද්‍යාව යක්ෂයකුටද (demon) තවත් විටෙක සංස්කෘතික තිගැස්මක් ලෙස ද උපමා කරයි. සමාජ විද්‍යාව ලාලසාවක් (Passion) ලෙස හඳුන්වන ඔහු, එය යම් කිසිවකු ලෝකය දකින ආකාරය විපරිවර්තනයකට ලක් කරවන විඥාණයක් ලෙස පෙන්වා දෙයි. මෙම උපමා රූපක ඔස්සේ සමාජ විද්‍යාව සතු අවුළුවාලන ගුණය හා පුදුම කරවන සුළු ගතිය කදිමට පිළිබිඹු වෙයි. හෙන්ස්ටන් (Henslin) සඳහන් කරන්නේ බ-ගර්ගේ මෙම උපමා හා උපාය මාර්ගික රූපක භාවිතය පාඨකයා තුළ සමාජ විද්‍යාවේ ස්වභාවය පිළිබඳ පැවතිය හැකි අවිදු අඳුරු නසාලන බවයි. (Henslin, 2015) ඔහු පවසන්නේ ලේඛකයාගේ භාෂාමය ප්‍රබලතාවය, අනාගත සමාජ විද්‍යාඥයින් සඳහා ආවේශයක් සපයන බවයි. "දෙන ලද ආකාරයෙන්ම ලෝකය බාර නොගත යුතුය'' යන අදහසෙහි පිහිටා සිටි බ-ගර් (World-taken for- granted) "බොහෝ දේ පෙනෙන්නට ඇති දෙය ම නොවේ'' යනුවෙන් සමාජ යථාර්ථය අර්ථ ස්ථර ගණනාවකින් සමන්විත වූවකැයි (Berger,1963) පවසයි. සමාජ විද්‍යාවේ ඇති අනාවරණය කිරීමේ ගුණයත්, විවේචනාත්මක චින්තන ස්වභාවයත් මෙහිදී ඔහු මතුකර දක්වයි. ව්‍යුහය සහ ධර්මතා ප්‍රශ්න කිරීමේ බලය සමාජ විද්‍යාව සතු බව පෙන්වාදීමෙහිලා උත්සුක වූ ඇමෙරිකානු සමාජ විද්‍යාඥ සී. රයිට් මිල්ස්ගේ අදහස් සමග, බ-ගර්ගේ අදහස් බොහෝ දුරට යාවෙයි. (Mills,1959). බ-ගර්ගේ ඉදිරිපත් කිරීමෙහි තිබෙන තවත් වැදගත් සත්‍යතාවක් නම්, න්‍යායාත්මක හා ප්‍රායෝගික මාන එකිනෙක අනුකලනය කිරීමයි. බ-ගර් සමාජ විද්‍යාඥයෙකු ලෙස, සමාජ විද්‍යාවෙහි න්‍යායාත්මක පැතිකඩ සහ ප්‍රායෝගික යෙදවුම් ඉතා දක්ෂ ලෙස සංතුලනය කරයි. ඔහු ඉදිරිපත් කරන "සමාජ විද්‍යාව අගය විනිශ්චයකින් තොර විය යුතුය” යන අදහස, සමාජ විද්‍යාවට ක්‍රම විද්‍යාත්මක රාමුවක් සපයන අතරම, මානව


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266
9 773121 426004

අපේක්ෂාවන්හි පවත්නා පෘථුල ස්වභාවයද මතක් කර දෙන්නකි. බ-ගර්ගේ දර්ශනයේ සීමා අඩුපාඩු නැත්තේ නොවේ. ඉන් එකක් වන්නේ විෂයෙහි වාස්තවික භාවය පිළිබඳව වන අධි අවධාරණයයි. සමාජ විද්‍යාඥයින් බොහෝ විට තමන්ගේම දෘෂ්ටියෙන් සහ නැඹුරුතා ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා යොදවයි. විටෙක එම ඉදිරිපත් කිරීමෙහි ඇති නව්‍යතාව සහ බ - ගර්ම කියන ආකාරයට අපූර්වත්වය මතුවනුයේ, පෙර කී ආත්මීය නැඹුරුව නිසා විය හැකිය. සමාජ විද්‍යාත්මක පර්යේෂණයන් තුළ තිබිය යුතු ප්‍රත්‍යාවර්තතාවයේ (Reflexivity) ඇති වැදගත්කම, විශේෂයෙන්ම විශ්ලේෂණාත්මක ගැඹුර හා ආත්ම මූලිකතාව අතර ඇති සබඳතාව, සමහර ලේඛකයන් විසින් මතු කොට ඇත (Hjelm,2019). සමාජ විද්‍යාවෙහි ගැනෙන ප්‍රධාන තේමාවන ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ පන්තිය වැනි අංශයන් කෙරෙහි උනන්දු නොවීම නිසා, ඔහුගේ විග්‍රහය තුළ සමාජ විද්‍යාවේ සංකීර්ණතා මගහැරී ඇතැයි සමහර විචේචකයෝ කියති. උදාහරණයක් ලෙස, කොලින්ස් පවසන්නේ සමාජ විද්‍යාවේ බහු උත්තරීය ස්වභාවය තුළ, බලය, අසමානතාව ආදිය ආමන්ත්‍රණය කළ යුතු බවයි. (Collins, 1994). එසේම, බ - ගර්ගේ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය තුළ ඓතිහාසික හා සංස්කෘතික සීමා පවත්නා බවද තවත් මතයකි. උදාහරණයක් ලෙස. ඔහු විසින් හැටගණන් වල ප්‍රමුඛ මතවාදයට වැඩි නැඹුරුවක් දක්වා ඇති අතර, බටහිර සමාජ විද්‍යාව මත පිහිටා, බටහිර නොවන පර්යාවලෝකන (උදා: පශ්චාත් යටත් විජිත හෝ යටත් විජිත හරණ සමාජ විද්‍යාවන්) කෙරෙහි අවධානය යොමවා නොමැත්තේය. තවද, සමාජ විද්‍යාඥයන්ගේ භූමිකාව සයාකාරයකට පරමාදර්ශ මාදිලි ලෙස වර්ග කිරීමෙන්, සමාජ විද්‍යාවේ බහු විධ ස්වභාවය ඕනෑවට වඩා සරල කිරීමක් ඔහු අතින් සිදු වී තිබේ යන්න එල්ල වන තවත් විචේචනයකි. (Bickel, 2017 Pfadenhauer, 2013) බ-ගර්ගේ දෘෂ්ටිය හා අනාගත සමාජ විද්‍යාව (Futuristic Sociology and Bergerzs Perspective) බ-ගර්ගේ "සමාජ විද්‍යාවට ඇරයුමක්" කෘතිය ලියවී අඩසිය වසකට වැඩි කාලයක් ගත වී ඇත. එම කාලය තුළ සමාජ විද්‍යාව මෙන්ම සමාජයේ විවිධ අංශද දැඩි වෙනස්කම් රාශියකට පාත්‍ර වී තිබේ. සමාජ විද්‍යාවේ භාවිත ක්‍රමවේද හා තාක්ෂණයේ ඇතිව තිබෙන පෙරළීන් කීපයක් මෙහිලා සඳහන් කිරීම යෝග්‍ය වේ.

දත්ත විද්‍යාව (Data Science) ඉන් එකකි. දත්ත විද්‍යාවේ සහ කෘතිම බුද්ධියෙහි (Artificial Intelligence) සමාජ මාධ්‍ය විශ්ලේෂණ (Social media analysis) සහ ඩිජිටල් මානව විද්‍යාව (Digital Anthropology) වැනි ක්ෂේත්‍රයන්හි ඇතිව තිබෙන මතු වීම, බ-ගර්ගේ සමාජ විද්‍යාත්මක අවධාරණයන්ට අභියෝග කරයි. උදාහරණයක් ලෙස, සංඛ්‍යාන විද්‍යාත්මක හරඹ (Statistical Modeling) ඔස්සේ "සමාජය කියවීම '' පිළිබඳ බ-ගර් ඉදිරිපත් කළ නිර්දය විචේචනය, දත්ත විද්‍යාවේ සහ කෘතිම බුද්ධියේ ආචරණයත් සමඟ නිතැතින්ම අභියෝගයට ලක්වනු ඇත. සමාජ විද්‍යාව බුද්ධිමය කුතුහලය තුළින් අවුලුවාලනු ලබන අවබෝධයේ ක්‍රියාවක්" ලෙස භාරගත යුතුය යන බ-ගර්ගේ අදහස, යාන්ත්‍රිකත්වය හා ප්‍රයෝජ්‍යතාවය පෙරටු කොට ගත් සමාජ පරිසරයකදී, දත්ත මත පදනම් වූ මතුපිට විශ්ලේෂණයන් විසින් පුරවා දමනු ලැබිය හැකිය. වෙනත් වදනකින් කිවහොත්, බොහෝ සමාජ විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක


CC BY NC ND
ISSN 3121-4266

අධ්‍යයන ආනුභූතික සාක්ෂි මත පදනම් වන නමුත්, සමාජ යථාර්ථය පිළිබඳ ගැඹුරු අර්ථ ස්ථර ස්පර්ශ නොකරන තැනට පත්විය හැකිය. එක්තරා විසඳුමක් වන්නේ, බ- ගර්ගේ ලාලසා සහගත සමාජ විද්‍යාව හා සංකල්පනාත්මකව කැප වූ සමාජ විද්‍යාවත්, දත්ත විද්‍යාව සමඟ අතිනත ගත් ප්‍රායෝගික සමාජ විද්‍යාවේ භාවිතයත් අතර අනුකලනාත්මක පාලමක් ඉදිකිරීමයි; නැතහොත් සහයෝගීතාවය නිර්මාණය කිරීමයි. සමාජ විද්‍යාව තුළ මෙකී සමබරතාවය - එනම් තාක්ෂණය විසින් එකතු කෙරෙන සම්පාදනය කෙරෙන ආනුභූතික දත්ත, බුද්ධිමය වියමනක් බවට පරිවර්තනය කිරීම - සමාජ විද්‍යාවේ අනාගත හැඩහුරුකම හා භූමිකාව තීරණය කිරීමට වැදගත් වනු ඇත. ඒ සඳහා. බ-ගර්ගේ ලාලසාමය සමාජ විද්‍යාව, අනාගතය සඳහා නිරන්තර ජීව ගුණයක් සපයන්නෙකි. පරිසමාප්තිය (Conclusion) 1960 දශකයෙහි ලියැවුණු පීටර් එල්. බ-ගර්ගේ " සමාජ විද්‍යාවට ඇරයුමක්' නමැති කෘතියෙහි පළමු පරිච්ඡේදය පිළිබඳ ප්‍රතිවිමසුමක් මෙම ලිපියෙහි දිග හැරී තිබේ. එහිදී සමාජ විද්‍යාව කෙබඳු විෂයක් ද යන්නත්, සමාජ විද්‍යාඥයාගේ භූමිකාව කවරක් ද යන්නත්, රූපකමය බසකින් හා මනස අවුළුවාලන උද්වේගයකින් ගෙන ඒමට බ-ගර් සමත් වී තිබේ. සොයා ගැනීමේ ප්‍රහර්ෂය, බුද්ධිමය කුතුහලයෙන් කැළඹීම, සහ සමාජ යථාර්ථය බහු විධ අර්ථ ස්ථර ලිහා බැලීම - සමාජ විද්‍යාවේ විපරිවර්තීය බලය - ආදිය ඔස්සේ සමාජ විද්‍යාව පුද්ගල ලාල්සයක් බවට පත්වන්නේ කෙලෙසින් ද යන්න ඔහු විස්තර කරයි. මෙම විමර්ශනාත්මක ලිපියෙහි අරමුණ වූයේ. සමාජ විද්‍යාවේ අනන්‍යතාව හා සමාජ විද්‍යාඥයාගේ භූමිකාව හඳුනා ගැනීම සඳහා බ-ගර්ගේ දෘෂ්ටිය විමර්ශනය කොට බැලීමයි. සමාජ විද්‍යාඥයාගේ ප්‍රතිරූපය සමාජ වැඩකරුවකු, න්‍යායධරයකු, සමාජ ප්‍රතිසංස්කරණවාදියෙකු, තොරතුරු එකතු කරන්නකු, හා විද්‍යාඥයකු ආදී විවිධ භූමිකා තුළ දෝලනය වේ. සමාජ විද්‍යාවෙහි ප්‍රබලතා හා දුබලතා ඇගැයීමේ විවේචනයෙහි යෙදෙන බ-ගර්, සමාජ විද්‍යාඥයාගේ ජීවිතය ද්විත්ව මෙහෙයුමක් බවට පත්වන ආකාරය පැහැදිලි කරයි. ලිපියෙහි සාකච්ඡාව තුළ සංගෘහිත වන්නේ, බ-ගර්ගේ ඉදිරිපත් කිරීමේ ඇති ප්‍රබලතා හා සීමාය. විශේෂයෙන්ම දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය ඔස්සේ හැඩවන අනාගත ලෝකයේ දී, සමාජ විද්‍යාවේ ඉරණම, බ-ගර්ගේ පර්යාවලෝකනය තුළින් කෙලෙස දැකිය හැකි ද යන්න අවසානයේ විමසා බලා ඇත.

**සමුද්දේශ**


Berger, P. L. (1963). *Invitation to sociology: A humanistic perspective*. Anchor Books.

Goffman, E. (1959). *The presentation of self in everyday life*. Anchor Books.

Mills, C. W. (1959). *The sociological imagination*. Oxford University Press.

Hjelm, T. (2019). Rethinking the theoretical base of Peter L. Berger's sociology of religion. *Social Compass*, 66(2), 1–15.



සාමග්‍රී Unity
ISSN 3121-4266

Vera, H. (2016). Rebuilding a classic: The social construction of reality, power, and discourse. *Cultural Sociology*, 10(3), 1–12.

Pfadenhauer, M. (2018). Social construction as a paradigm: Foundations and challenges. *Swiss Journal of Sociology*, 44(2), 1–18.

Sica, A. (2016). Social construction as a fantasy. *Sociological Forum*, 31(4), 1–10.

Mathews, C. T. (2016). An interview with Peter Berger. *Society*, 53(6), 1–7.

Giddens, A. (1984). *The constitution of society: Outline of the theory of structuration*. Polity Press.

Collins, R. (1994). Why the social sciences won't become high-consensus, rapid-discovery sciences. *Sociological Forum, 9* (2), 155–177.



සාමග්‍රි Unity

CC BY NC ND

ISSN 3121-4266

# සාමග්‍රී Unity

Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines

**ISSN 3121-4266**

**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජූලි-දෙසැම්බර්**

**පත්‍රිකා අංක 05**


## කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශයේ විකුණුම් අවප්‍රමාණ වීම හේතුවෙන් ලාභදායිත්වය අඩුවීමට බලපාන සාධක: අලෙවිකරණ ප්‍රවේශාත්මක අධ්‍යයනයක්


අනුරුද්ධ ඉෂාන්[10]

ආර්.කේ. ආර්. එන්. මදුෂානි[11]

nilankamadushani28@gmail.com



**සාරසංක්ෂේපය (Abstract)**

මෙම පර්යේෂණය මගින් සී / ස කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශයේ විකුණුම් හා ලාභදායීත්වය කෙරෙහි බලපාන සාධක විමර්ශනය කෙරේ. 2021 වසරට සාපේක්ෂව වෙළඳපල මිල මට්ටම 100% කින් පමණ ඉහළ ගියද, සමුපකාර පාරිභෝගික අංශයේ විකුණුම් ආදායම ඊට සාපේක්ෂව වර්ධනය නොවීම පර්යේෂණ ගැටලුව ලෙස හඳුනා ගැනුණි. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද (Mixed-method approach) ඇසුරින් සිදු කළ දත්ත විශ්ලේෂණයට අනුව, විකුණුම් පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ භාණ්ඩ මිල ගණන් තරගකාරී නොවීම, ප්‍රමාණවත් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම සහ පාරිභෝගික සත්කාරයේ (Customer Care) පවතින දුර්වලතා බව අනාවරණය විය. ආයතනික ලාභදායීත්වය ඉහළ නැංවීම සඳහා තරගකාරී මිල උපායමාර්ග, ආකර්ශනීය ප්‍රවර්ධන වැඩසටහන්, සේවක ආකල්ප සංවර්ධන පුහුණුව සහ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම මෙහිදී ප්‍රධාන නිර්දේශ ලෙස ඉදිරිපත් කෙරේ.



**ප්‍රමුඛ පද:** විවිධ සේවා සමුපකාර සමිතිය, පාරිභෝගික අංශය, විකුණුම් පරිමාව, අලෙවිකරණ මිශ්‍රිතය, පාරිභෝගික තෘප්තිය.


### හැඳින්වීම හා පසුබිම

[10] වාණිජ කළමනාකරු , සී/ස කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය

[11] සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | B.Sc in Mkt Mgt (2nd Upper Hon) (Sp), M.Sc.Mgt Reading (UOP), Dip in Dig Mkt




CC BY NC ND



ISSN 3121-4266
9 773121 426004

*සමිතියේ ඉතිහාසය*

සමිතියේ ඉතිහාසය බැලීමේදී කඩ සමිති මුල් කරගෙන ආරම්භ වී ඇති අතර වර්තමානයේ කුලියාපිටිය බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සමිති ඒකාබද්ධව පැවති ඇති බවට සඳහන්ව ඇත. 1974 ඔක්තෝබර් මස 19 දින කුලියාපිටිය මහ විදුහලේදී පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය ලෙස ආරම්භ කිරීමටත් 1974.12.09 දින සමිතියක් ලෙස ලියාපදිංචි කර ඇති බවටත් සඳහන්ව ඇත.සමුපකාර උප කොමසාරිස්තුමා ලෙස ටී.පී. රොබට් මූලස්ථාන පරීක්ෂක ලෙස එම්. රණසිංහ, සමුකාර සංවර්ධන නිලධාරි ලෙස එස්. හපුආරච්චි, මහජන බැංකුවේ කළමනාකාරතුමාගේ ද සහභාගිත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිලධාරීන් පස්දෙනකු ඡන්ද විමසීමකින් පසු තෝරාපත් කරගෙන ඇත. 1974 දී ප්‍රථම සභාපති වශයෙන් G.W. සමරසිංහ තෝරා පත්කර ඇත.අතීතයේදී සමිති බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් මිලදී ගැනීමට අවධානය යොමු කර ඇති අතර පොත් පත් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් වෙළඳ ආයතන ක්‍රියාත්මක වී ඇති බවට හෙළිදරව් විය. ප්‍රාදේශිකවලින් පාලන මිලට හා සහන මිලට භාණ්ඩ අලෙවි කිරීම ද, සමිතිය සතු වාහන 14ක් ද පැවති බවට සඳහන්ව ඇත.


ආදර්ශ සිල්ලර හා යකඩ ගබඩාව,සමුපකාර ආරෝග්‍ය ශාලාව,ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත් අංශයක්, මෝටර් රථ අමතර කොටස් අලෙවි අංශයක්,සමිතියට පවරාගත් ඉඩම්වල සත්ව ගොවිබිම්, සහල් සැකසුම් අංශයක්,ඉන්ධන පිරවුම්,මුද්‍රණාල අංශය,ග්‍රාමීය බැංකු අංශයක්,රෙදි මුද්‍රණ කර්මාන්තයක්.1978 දී සභාපති ලෙස එන්. ගුණසේකර, උප සභාපති ලෙස පියසෝම උපාලි කටයුතු කර ඇත. එම වසරේදී සමිති බල ප්‍රදේශ අනුව ප්‍රාදේශික වෙන්කර සමිතිවලට ලබාදී ඇති අතර එහිදී පඬුවස්නුවර විවිධ සේවා සමුපකාර සමිතියට ප්‍රාදේශික 11ක් ද සමග කළමනාකරුවන් හා වෙළඳ සහායකයින් ද ගිනුම් ලිපිකරුවන් ද අනුයුක්ත කර ඇත.බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියෙන් සමිතියට පහත සඳහන් ප්‍රාදේශික 5ක් පවරා ගෙන ඇති බවට සඳහන්ව ඇත.

1. දණ්ඩගමුව
2. වෙරළුගම
3. මාහිම්පිටිය
4. තලහිටිමුල්ල
5. කංචනාපුරය

1978 දී ලබුයාය පිහිටි රෙදි මුද්‍රණ කර්මාන්ත අංශයේ පැවති උපකරණ කාර්මික විද්‍යාලයට අලෙවි කර ඇත.1979 වර්ෂයේ දී සමිතියේ පාලන කටයුතු කරාගෙන යාම සඳහා කාරක නියෝගමාලාවක් සකස් කර උප කොමසාරිස් තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත.1987/12/09 දින පැවති මහ සභා රැස්වීමේදී සී/ස කුලියාපිටිය විවිධ සේවා සමුකාර සමිතිය විබද්ධ කිරීමට යෝජනා වූ අතර එහිදී බල ප්‍රදේශ අනුව වෙන්කිරීමටත් වත්කම් හා වගකීම් බෙදා දීමටත් තීරණය විය. 1987/12/31 දින හොරොම්බාව විවිධ සේවා සමිතියට ලබාදීමටත් එහිදී සමිති සේවකයින් 89 දෙනෙක් ද ලොරි රථ 04 ක් ද ට්‍රැක්ටර් රථයක් ද ලබාදී ඇති බවට සඳහන්ව ඇත. වසර 50 පමණ අතීතයකට ළඟා වෙමින් පවතින අප සමිතිය සඳහා සභාපතිවරු විසිපස්දෙනකුගේ නායකත්වය හිමි වී ඇත. (සමිතියේ ලේකම් භාරයේ පැවති වාර්තා පොත්වලින් උපුටා ගන්නා ලදී.)

*ව්‍යාපාර සාරාංශය*


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND




**වර්තමාන පසුබිම**

***පාරිභෝගික අංශය***

කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය කෝප්සිටි 4 ක්, මිනි කෝප්සිටි 19 ක් හා ප්‍රාදේශික 8 කින් යුතු වෙළඳසැල් ජාලයකින් යුතුව ක්‍රියාත්මක වීමෙන් සහ ජංගම සේවාවන් ක්‍රියාත්මක කිරීමෙන් සාර්ථක විකුණුම් ආදායමක් ලබා ගන්නා අතර සමස්ථ පාරිභෝගික අංශය මාසිකව ලාභදායීව පවත්වාගෙන යනු ලබයි.ජංගම සේවය ක්‍රියාත්මක කිරීම සඳහා on call වැඩසටහන යටතේ භාණ්ඩ ලබා දීම සහ සීට්ටු, පාරිභෝගික ණය සහ වවුචර්පත් වැනි සේවාවන් සැපයීම තුළින් අපේක්ෂිත ආදායම් කරා යොමු වීමට කටයුතු කර ඇත. සේවක මණ්ඩලය වෙනුවෙන් ඔවුන්ගේ වැටුප් සහ දීමනා ද, විදුලිය, දුරකථන ඇතුළු ස්ථාවර වියදම් ද, නඩත්තු සහ අලුත්වැඩියා වියදම් ද දැරීමට සිදුව ඇත.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

*ග්‍රාමීය බැංකු අංශය*

සමිති බල ප්‍රදේශය පුරා විහිදුණු ග්‍රාමීය බැංකු 13 ක් ක්‍රියාත්මක අතර එම 13 ම ලාභදායීව පවත්වාගෙන යනු ලබයි. සාමාජික තැන්පත් රු. 1,133,493,280.00 (එකසිය දහතුන්කෝටි තිස් හතර ලක්ෂ අනූ තුන්දහස් දෙසිය අසූවයි) ක් ද, රු. 548,852,808.00 (පනස් හතර කෝටි අසූ අට ලක්ෂ පනස් දෙදහස් අටසිය අටයි) ක් ද, ස්ථාවර ආයෝජන කෝටි 80 ක්ද පවත්වා ගනිමින් ශක්තිමත් බැංකු ජාලයක් ගොඩ නගා ඇත. එම ග්‍රාමීය බැංකු 13 ම නව තාක්ෂණ ශිල්පීය ක්‍රම අනුව පරිගණක ගත කර ජාලගත කර ඇත.

*ඉන්ධන අංශය*

කුලියාපිටිය නගරයේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිතව ඇත. මෙහි ඩීසල්, පෙට්‍රල් මෙන්ම සියලුම ලිහිසි තෙල් වර්ග සහ වායු පිරවීමේ සේවාවන් ද සපයනු ලබයි. මාසිකව රුපියල් කෝටි හය ඉක්මවූ විකුණුම් ආදායමක් සිදු කරන අතර ශුද්ධ ලාභ සහිතව පවත්වාගෙන යනු ලබයි.

*වෙනත් අංශ*

වෙනත් අංශයන් ලෙස මුද්‍රණාලය / අවමංගල්‍ය / ප්‍රීමා පිටි නියෝජිත අලෙවි අංශය / මංචි බිස්කට් නියෝජිත අලෙවි අංශය / ලිපිද්‍රව්‍ය අලෙවි සැල / පූජා භාණ්ඩ අලෙවිසැල / රෝහල් සැපයුම් අංශය / වෛද්‍ය හා රසායනාගාර අංශය යන අංශවලින් සමන්විත වේ.

වර්තමානයේ සමස්ථ සමිතියේ කාර්ය මණ්ඩලය 242 ක් වන අතර ම සාමාජික සංඛ්‍යාව 33318 කි. මාසිකව සමිතියේ ශුද්ධ අතිරික්තය ලක්ෂ 65 ක් පමණ වන අතර වාර්ෂිකව කෝටි 08 කට ආසන්න වේ. වාර්ෂිකව විගණන කටයුතු සිදු කරන 21/22 විගණනය මේවන විට අවසන් කර ඇත.

**ලාභාලාභ තත්ව**

සමස්ථයක් ලෙස ගත්කල ශ්‍රී ලාංකීය වෙළඳපල තුළ පාරිභෝගික භාණ්ඩ මිල 2021 වසර හා සසඳන විට 100% වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති මුත් විවිධ සේවා සමුපකාර සමිතිවල පාරිභෝගික අංශයන්හි විකිණුම් ඊට සාපේක්ෂව පැහැදිලි ඉහළ යමක් දක්නට නොලැබේ. පෙර වර්ෂයන්ට සාපේක්ෂව විකිණුම් යම් ප්‍රමාණයක් ඉහළ ගිය ද, වෙළඳපල වෙනස්වීම් අනුව විකුණුම් වර්ධනය අවම මට්ටමක් වී ඇති අතර, ලාභ ප්‍රතිශතය අඩුවෙමින් පවතී.මේ ආකාරයට ශ්‍රී ලංකාවේ සමස්ථ සමුපකාර සමිතිවල පාරිභෝගික අංශවල විකුණුම් අඩු වීමට හේතු පාදක වී ඇති කරන පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යනය සිදු කිරීමේ අරමුණ වන අතර, මෙම කරුණු අධ්‍යනයට අදාල පර්යේෂණය කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය ඇසුරින් සිදුකිරීමට අපේක්ෂා කරයි.

කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය - පසුගිය මාස 6 ක ලාභ තත්ත්වය


| පාරිභෝගික අංශය | 2023 අගෝස්තු | 2023 සැප්තැම්බර් | 2023 ඔක්තෝබර් |
|---|---|---|---|


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 94,307,442.00 | 97,628,998.00 | 101,093,178.00 |
| ගැණුම් | 93,013,826.00 | 88,333,825.00 | 94,102,750.00 |
| **ශුද්ධ ලාභය** | 2,460,989.00 | 1,882,338.00 | 1,540,896.90 |

| පාරිභෝගික අංශය | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් | 2024 ජනවාරි |
|---|---|---|---|
| විකුණුම් | 100,906,633.00 | 100,452,269.00 | 95,654,896.00 |
| ගැණුම් | 97,360,808.00 | 86,657,540.00 | 84,193,927.00 |
| **ශුද්ධ ලාභය** | 445,314.00 | 390,234.00 | (285,182.00) |

අංක 01 වගුව:
කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය මාස 6 ක ලාභ අලාභ තත්ත්වය (F28 ඇසුරින්)




අංක 01 ප්‍රස්තාරය: කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය

**මාස 6 ක ලාභ අලාභ තත්ත්වය (F28 ඇසුරින්)**


සාමග්‍රි Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

*පාරිභෝගික අංශය*

රු. ලක්ෂ

| | අයිතමය | 2019.06.30 | 2020.06.30 | 2021.06.30 | 2022.06.30 | 2023.06.30 |
|---|---|---|---|---|---|---|
| 1 | විකුණුම් | 4951.2 | 7278.62 | 9058.7 | 10305.94 | 11178.05 |
| 2 | ගැනුම් | 4638.9 | 6743.41 | 8441.57 | 9656.52 | 10396.65 |
| 3 | දළ ලාභය | 391.11 | 588.94 | 716.96 | 887.13 | 883.14 |
| 4 | පොදු පරිපාලන වියදම් පෙර ලාභ / අලාභ | 31 | 146.23 | 191 | 219.9 | 150.21 |
| 5 | පොදු පරිපාලන වියදම් පසු ලාභ / අලාභ | 1.8 | 4.55 | 90.67 | 53.14 | 27.66 |

අංක 02 වගුව:කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය,වසර 5 ක ලාභ අලාභ තත්ත්වය (විගණන වාර්තා ඇසුරින්)

**පර්යේෂණ ගැටලුව**

වර්තමාන තරඟකාරී වෙළඳපල පරිසරය තුළ විවිධ සේවා සමුපකාර සමිතිවල පාරිභෝගික අංශයන් ක්‍රමයෙන් මූල්‍යමය පරිහානියකට ලක්වෙමින් පවතින බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, වෙළඳසැල් වෙත පැමිණෙන පාරිභෝගික සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහත වැටීම මෙම ආයතන මුහුණ දෙන ප්‍රබල අභියෝගයකි.මෙම තත්ත්වය විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ, ආයතනික මෙහෙයුම් පිරිවැය (Operating Costs) සහ උද්ධමනය හමුවේ පරිපාලන වියදම් ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති නමුත්, ඊට සාපේක්ෂව විකුණුම් ආදායම (Sales Revenue) වර්ධනය වී නොමැති බවයි. පිරිවැය ඉහළ යාම සහ ආදායම එකතැන පල්වීම අතර පවතින මෙම අසමතුලිතතාවය හේතුවෙන් සමුපකාර පාරිභෝගික අංශයන්හි ලාභදායීත්වය අවම වී අලාභදායී තත්ත්වයන් උද්ගත වී ඇත.

මෙම පසුබිම පදනම් කරගනිමින්, ආයතනය මුහුණ දෙන සැබෑ අර්බුදය හඳුනාගැනීම සඳහා පර්යේෂකයා විසින් පහත සඳහන් **පර්යේෂණ ගැටලුව** නිර්වචනය කරනු ලබයි:


සාමග්‍රී Unity
ISSN 3121-4266
BY NC ND

"වර්තමාන වෙළඳපල ප්‍රවණතා හමුවේ සමුපකාර සමිති පාරිභෝගික අංශවල විකුණුම් පරිමාව පහත වැටීමට බලපාන ප්‍රධාන සාධක මොනවාද?"

**පර්යේෂණ අරමුණු**

***ප්‍රාථමික අරමුණු:***

සමූපකාර සමිති පාරිභෝගික අංශ විකිණුම් අඩුවීම මත ලාභ අඩුවීමට හේතු හඳුනා ගැනීම.

***ද්විතික අරමුණු;***

සමුපකාර සමිතිවල පාරිභෝගික අංශයන්හි විකුණුම් අඩු වීමට හේතු සොයා බැලීම.

එම හේතු සමස්ත සමිතියේ ක්‍රියාකාරිත්වයට ඇතිකරන බලපෑම හඳුනා ගැනීම.

පාරිභෝගික අංශයේ දියුණුව සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම හා පාරිභෝගික අදහස් හා යෝජනා ලබා ගැනීම.

**පර්යේෂණයේ වැදගත්කම**

සමුපකාර පාරිභෝගික අංශයන්හි විකුණුම් අඩුවීමට හේතු සොයා බැලීම හේතු කිහිපයක් නිසා වැදගත් වේ. එය සමුපකාර ව්‍යාපාර ආකෘතියේ ආර්ථිකමය ස්ථායීතාව පිළිබඳ අවබෝධයක් ලබා දෙන අතර තිරසාර වර්ධනයක් සහතික කිරීමට උපකාරී වේ. මෙවැනි පර්යේෂණ තීරණාත්මක වීමට ප්‍රධාන හේතු කිහිපයක් පහතින් දක්වා ඇත.

1. වෙළඳපල ප්‍රවණතා හඳුනා ගැනීමට
2. මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට
3. ව්‍යාපාර ආකෘති වැඩිදියුණු කිරීමට
4. පාරිභෝගික හැසිරීම්වලට අනුගත වීමට
5. පාරිභෝගික රඳවා තබා ගැනීමට

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත විශ්ලේෂණයන්ගෙන් සමන්විත මිශ්‍ර ප්‍රවේශ ක්‍රමවේදයක් (Mixed-method approach) අනුගමනය කරමින් සිදු කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස සී/ස කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියට අයත් පාරිභෝගික අංශය තෝරාගත් අතර, දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර භාවිතා කරන ලදී. මෙහිදී ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් (Structured Questionnaire) සහ මුහුණට මුහුණ සිදුකළ සාකච්ඡා උපයෝගී කරගත් අතර, ද්විතීයික දත්ත සඳහා සමිතියේ විගණන වාර්තා, වාර්ෂික වාර්තා සහ ලේකම් කාර්යාලීය වාර්තා පරිශීලනය කරන ලදී. පර්යේෂණ නියැදිය ලෙස සමිති බල ප්‍රදේශයේ ජීවත් වන පාරිභෝගික සහ පාරිභෝගික නොවන ප්‍රජාව, ප්‍රධාන කෝප්සිටි සහ ප්‍රාදේශික වෙළඳසැල් මට්ටමින් ස්තරීභූත අහඹු නියැදි ක්‍රමය (Stratified Random Sampling) යටතේ පුද්ගලයන් 450 දෙනෙකුගෙන් සමන්විත වන සේ තෝරා ගන්නා ලදී. රැස්කරගත් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

සඳහා **Microsoft Excel** මෘදුකාංගය භාවිතා කරමින් වගු, ප්‍රස්ථාර සහ ප්‍රතිශත වැනි විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම (Descriptive Statistics) මගින් නිගමනවලට එළඹුණු අතර, සමස්ත ක්‍රියාවලිය හරහා පර්යේෂණ ගැටලුවට අදාළ සාධක විද්‍යාත්මකව විමර්ශනය කරන ලදී.

**පර්යේෂණ සීමා**

1. සාමාජිකයන් 33,000.00 ක් හා සාමාජික නොවන 100,000.00 ගෙන් පමණ විශාල ප්‍රජාවකගෙන් 0.3% ක ඉතා සුළු කොටසක නියැදි ලබා ගැනීමට සිදුවීම.
2. මසක කාලයකදී පර්යේෂණය සිදුකිරීම නිසා කරුණු සීමා වීම.

**සාහිත්‍ය විමර්ශනය**

පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම තුළින් පුද්ගලයන්ගේ හා ආයතනවල පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා යොමුවූ සමාජීය හා කළමනාකරණ ක්‍රියාවලිය අලෙවිකරණය ලෙස හඳුනාගනු ලබයි. අලෙවිකරණය 19 වන සියවසේ මුල් භාගයේ පටන් ලොව පුරා වර්ධනය වූ සංකල්පයක් වන අතර, විශේෂයෙන්ම ලෝක යුද්ධවල ප්‍රතිඵලයක් ලෙස ඇති වූ සමාජ, ආර්ථික හා දේශපාලන විපර්යාසයන් නූතන අලෙවිකරණයේ ගොඩනැගීමට සෘජුවම බලපා ඇත (Baker, 2014).

වර්තමානය වන විට අලෙවිකරණ ක්‍රියාවලිය හුදෙක් භාණ්ඩ විකිණීම පමණක්ම නොවන අතර, එය ප්‍රචාරණය, පාරිභෝගික ආකර්ෂණය, ආයතනික හෝ පුද්ගල ප්‍රතිරූපය වර්ධනය කර ගැනීම සහ දිගුකාලීන ලාභදායීත්වය පවත්වා ගැනීම දක්වා විහිදුණු සංකීර්ණ ක්‍රියාවලියකි. අලෙවිකරණය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී තිබුණද, එම නිර්වචන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය:

- **සමාජීය නිර්වචන:** අලෙවිකරණය යනු සමාජයේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ ක්‍රියාවලියක් ලෙස මෙහිදී සැලකේ.
- **කළමනාකරණ නිර්වචන:** මෙය ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා සිදුකරන සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කරයි.

විශේෂයෙන්ම, පිලිප් කොට්ලර්ට අනුව අලෙවිකරණය යනු "**වටිනාකම් සහිත නිෂ්පාදන නිපදවීම, ඉදිරිපත් කිරීම සහ අනෙකුත් පාර්ශවයන් සමඟ නිදහසේ හුවමාරු කර ගැනීම මගින් පුද්ගලයන් සහ කණ්ඩායම් තමන්ට අවශ්‍ය දෑ ලබා ගන්නා සමාජීය හා කළමනාකරණ ක්‍රියාවලියකි**" (Kotler & Keller, 2016). මේ අනුව නූතන අලෙවිකරණය යනු පාරිභෝගිකයා සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගනිමින් ආයතනය වෙත වටිනාකමක් ලබාගැනීමේ උපායමාර්ගික ප්‍රවේශයකි.ඒ අනුව අලෙවිකරණය යනු,

> "සංවිධාන කෘත්‍යයක් ලෙස ගනුදෙනුකරුට වටිනාකම් නිර්මාණය සන්නිවේදනය, බෙදාහැරීම යන ක්‍රියාවලීන් හා ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය මඟින් සංවිධාන සහ එහි එහි ව්‍යාපාරික ප්‍රජාවට ප්‍රතිලාභ ළඟාකර දීමයි."(ඇමරිකානු අලෙවිකරණ සංගමය, 1995)


සාමග්‍රි Unity
ISSN 3121-4266
cc BY NC ND

අලෙවිකරණය සමාජීය හා කළමනාකරණ ක්‍රියාවලියක් වශයෙන් සමුපකාර සමිති තුළ ද පුළුල් ලෙස භාවිතයට ගනු ලබයි. සමුපකාර ව්‍යාපාරය යනු හුදෙක් ලාභයම අරමුණු කරගත් ව්‍යාපාරික ආකෘතියක් නොවන අතර, එය සමාජීය සුභසාධනය සහ ආර්ථික ප්‍රතිලාභ සමබරව පවත්වා ගැනීමට උත්සාහ කරන සුවිශේෂී ව්‍යුහයකි (Zeuli & Cropp, 2004). කෙසේ නමුත්, වර්තමාන තරඟකාරී වෙළඳපල පරිසරය තුළ සමුපකාර සමිතිවල පාරිභෝගික අංශය ලාභදායීව පවත්වාගෙන යාමේදී විවිධ කළමනාකරණ දුර්වලතා හඳුනාගත හැකිය.

බොහෝ සමුපකාර සමිතිවල පාරිභෝගික අංශයේ විකුණුම් පහත වැටීමට සහ ලාභදායීත්වය අවම වීමට බලපාන ප්‍රධානතම සාධකය වන්නේ **නූතන අලෙවිකරණ උපායමාර්ග (Modern Marketing Strategies)** නිසි ලෙස භාවිත නොකිරීමයි. විශේෂයෙන්ම, පාරිභෝගික අවශ්‍යතා හඳුනාගැනීම සහ පාරිභෝගික සබඳතා කළමනාකරණය (CRM) වැනි අංශවල පවතින පසුගාමීත්වය මීට ප්‍රබල ලෙස බලපායි.

විකුණුම් යනු ආයතනයක මූල්‍යමය පැවැත්ම තීරණය කරන ප්‍රධානතම සාධකයයි. වෙළඳපල තුළ සිදුකරනු ලබන විකුණුම් ක්‍රියාවලියේදී ඒ තුළ සිටින පාර්ශවකරුවන් සහ එම ක්‍රියාවලිය හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. සාමාන්‍යයෙන් විකුණුම් ක්‍රියාවලියක් තුළ **විකුණුම්කරු (Seller)** සහ **මිලදී ගන්නා (Buyer)** යන ප්‍රධාන පාර්ශව දෙකක් අන්තර් ක්‍රියා කරයි.

ශාස්ත්‍රීය වශයෙන්, **විකුණුම්** යනු තමා සතු භාණ්ඩ හෝ සේවාවන් මුදලකට හෝ වෙනත් වටිනාකමකට (Value) හුවමාරු කිරීමේ ක්‍රියාවලියයි (Jobber & Lancaster, 2015). මෙම ක්‍රියාවලියේදී අලෙවිකරුවා භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයාට පිරිනමන අතර, ඒ වෙනුවට මුදල්මය වටිනාකමක් ලබා ගනී.

විකුණුම් ක්‍රියාවලියේ මූලික ලක්ෂණ කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකිය:

- **අවශ්‍යතා සහ ඉල්ලුම මත පදනම් වීම:** විකුණුමක් සාර්ථක වන්නේ පාරිභෝගිකයාගේ නිශ්චිත අවශ්‍යතා සහ ඉල්ලුමට (Demand) ගැළපෙන පරිදි භාණ්ඩ පිරිනැමූ විටය.
- **වටිනාකම් හුවමාරුව:** මෙය හුදෙක් භාණ්ඩයක් ලබා දීම පමණක් නොව, දෙපාර්ශවයටම වටිනාකමක් එකතු වන ගනුදෙනුවකි.

ඕනෑම ව්‍යාපාරයක ලාභදායීත්වය තීරණය කරන ප්‍රධානතම මූලාශ්‍රය අලෙවිකරණය සහ විකුණුම් අතර පැහැදිලි වෙනසක් පවතී. අලෙවිකරණය යනු පාරිභෝගිකයා කෙරෙහි අවධානය යොමු කරමින් දිගුකාලීන සබඳතා ගොඩනැගීම වන අතර, විකුණුම් යනු එම සබඳතාවේ අවසාන ප්‍රතිඵලය ලෙස සිදුවන ගනුදෙනුවයි (Kotler & Armstrong, 2018). විශේෂයෙන්ම සමුපකාර අංශයේදී, පාරිභෝගිකයාගේ උපරිම තෘප්තිය ඇති කරමින් විකුණුම් ඉලක්ක සපුරා ගැනීම ආයතනික පැවැත්මට අත්‍යවශ්‍ය වේ.වන්නේ විකුණුම් ආදායමයි.

වෙළඳපල ක්‍රියාවලියක් සාර්ථක වීමට නම් එහි නිරත වන විවිධ පාර්ශවකරුවන්ගේ කාර්යභාරය නිවැරදිව හඳුනාගත යුතුය. මෙම පාර්ශවකරුවන් අතර පවතින අන්තර් සබඳතාවය ව්‍යාපාරයක පැවැත්ම තීරණය කරයි.


සාමග්‍රි Unity
ISSN 3121-4266

ගනුදෙනුකරු යනු භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගැනීමේ තීරණය ගනු ලබන සහ ඒ සඳහා මූල්‍යමය වටිනාකමක් ගෙවනු ලබන පාර්ශවයයි. පාරිභෝගිකයා යනු එම භාණ්ඩය හෝ සේවාව අවසාන වශයෙන් පරිභෝජනය කරන පුද්ගලයා හෝ ආයතනයයි. බොහෝ විට ගනුදෙනුකරු සහ පාරිභෝගිකයා එක් අයෙකු විය හැකි වුවද, සමහර අවස්ථාවලදී ඔවුන් දෙදෙනෙකු විය හැකිය (Kotler & Armstrong, 2018). සමුපකාර අංශයේදී සාමාජිකයා ගනුදෙනුකරුවෙකු මෙන්ම පාරිභෝගිකයෙකු ලෙසද ද්විත්ව භූමිකාවක් නිරූපණය කරයි.

ගනුදෙනුව යනු විකුණුම්කරු සහ ගනුදෙනුකරු අතර වටිනාකම් හුවමාරු වන මූලික ඒකකයයි. සාර්ථක ගනුදෙනුවක් සඳහා පාර්ශව දෙකක්, හුවමාරු කළ හැකි වටිනාකමක්, එකඟ වූ කොන්දේසි සහ කාලයක් තිබිය යුතුය (Kotler & Keller, 2016).වෙළඳපල යනු භාණ්ඩ හෝ සේවා හුවමාරු කර ගැනීම සඳහා ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් මුණගැසෙන යාන්ත්‍රණයයි. නූතන තාක්ෂණයත් සමඟ මෙය භෞතික ස්ථානයකට පමණක් සීමා නොවී, අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන දෘශ්‍යමය (Virtual) අවකාශයක් දක්වා පුළුල් වී ඇත.

නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ සපයනු ලබන්නේ සැපයුම්කරු විසිනි. තොග වෙළෙන්දා යනු නිෂ්පාදකයාගෙන් විශාල වශයෙන් භාණ්ඩ මිලදී ගෙන සිල්ලර වෙළෙන්දන් වෙත බෙදාහරින අතරමැදි පාර්ශවයයි (Bowersox et al., 2013). පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩය නිවැරදි වේලාවට ලබා දීම සඳහා මෙම සැපයුම් දාම කළමනාකරණය අතිශය වැදගත් වේ.

තරඟකාරී වෙළඳපල තුළ පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීම සඳහා ආයතනයක් විසින් පාලනය කරනු ලබන උපක්‍රමික මෙවලම් සමූහය අලෙවිකරණ මිශ්‍රිතය ලෙස හඳුන්වයි. මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි:

- **4Ps ආකෘතිය (භාණ්ඩ සඳහා):** භාණ්ඩය (Product), මිල (Price), ස්ථානය (Place) සහ ප්‍රවර්ධනය (Promotion) යන මූලික සාධක හතර මෙයට ඇතුළත් වේ (McCarthy, 1964).
- **7Ps ආකෘතිය (සේවා සඳහා):** සේවා අංශයේදී ඉහත හතරට අමතරව පුද්ගලයින් (People), ක්‍රියාවලිය (Process) සහ භෞතික සාක්ෂි (Physical Evidence) යන සාධක තුන එකතු වේ (Booms & Bitner, 1981).

භාණ්ඩ මිශ්‍රය - Product - නිෂ්පාදිතය

- Price - මිල

- Place - ස්ථානය

- Promotion - ප්‍රවර්ධන

සේවා මිශ්‍රය - Product - නිෂ්පාදිතය

- Price - මිල

- Place - ස්ථානය


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

- Promotion - ප්‍රවර්ධනය
- People - මානව සම්පත
- Physical Environment - භෞතික පරිසරය
- Process - ක්‍රියාවලිය

*අලෙවිකරණ පරිසරය*

ආයතනයක අලෙවිකරණ සාර්ථකත්වය කෙරෙහි වෙළඳපල පරිසරය තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි. අලෙවිකරණ පරිසරය යනු ආයතනයක අලෙවිකරණ කළමනාකරණ කටයුතු සහ ඉලක්කගත පාරිභෝගිකයන් සමග සාර්ථක සබඳතා ගොඩනැගීමට ඇති හැකියාව කෙරෙහි බලපෑම් කරන බාහිර සාධක සහ බලවේගයන්ගේ එකතුවයි (Kotler & Armstrong, 2018). වෙළඳපලේ සිදුවන නිරන්තර වෙනස්කම්වලට අනුකූලව මෙම පරිසර සාධක හඳුනා ගැනීම සහ ඒවාට අනුවර්තනය වීම ඕනෑම ව්‍යාපාරයක පැවැත්මට අත්‍යවශ්‍ය වේ.

අලෙවිකරණ පරිසරය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය:

1. සූක්ෂම අලෙවිකරණ පරිසරය (Micro Environment): මෙය ආයතනයට සමීපව බලපාන පාරිභෝගිකයින්, සැපයුම්කරුවන්, වෙළඳපල අතරමැදියන් සහ තරඟකරුවන්ගෙන් සමන්විත වේ. මෙම විචල්‍යයන් සම්පූර්ණයෙන් පාලනය කළ නොහැකි වුවද, නිවැරදි උපායමාර්ගික තීරණ හරහා යම්තාක් දුරකට පාලනය කිරීමේ හෝ බලපෑම් කිරීමේ හැකියාව අලෙවිකරුවෙකු සතු වේ (Jobber & Ellis-Chadwick, 2019).
2. සාර්ව අලෙවිකරණ පරිසරය (Macro Environment): මෙය ආයතනයකට පාලනය කළ නොහැකි පුළුල් සමාජීය බලවේගයන්ගෙන් සමන්විත වේ. මෙයට ජනගහන විද්‍යාත්මක, ආර්ථික, ස්වභාවික, තාක්ෂණික, දේශපාලනික සහ සංස්කෘතික සාධක ඇතුළත් වේ (Palmer, 2012). මෙම සාධක පාලනය කිරීම අලෙවිකරුවෙකුට දුෂ්කර වන අතර, ආයතනය කළ යුත්තේ එම වෙනස්වන සාර්ව සාධකවලට ගැළපෙන පරිදි තම අලෙවිකරණ උපායමාර්ග නම්‍යශීලීව සකස් කර ගැනීමයි.

සමුපකාර සමිතිවල පාරිභෝගික අංශයන් මුහුණ දෙන වර්තමාන අර්බුදය හමුවේ, විශේෂයෙන්ම ආර්ථික පරිසරයේ සිදුවන උද්ධමනය වැනි සාර්ව බලපෑම්වලට ගැළපෙන පරිදි අභ්‍යන්තර මෙහෙයුම් පිරිවැය සහ මිල උපායමාර්ග කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

*පාරිභෝගික චර්යාව*

ආයතනයක විකුණුම් පරිමාව තීරණය කරන ප්‍රධානතම සාධකය වන්නේ පාරිභෝගික චර්යාවයි (Consumer Behavior). පාරිභෝගිකයන් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට පෙළඹෙන ආකාරය සහ ඒ සඳහා බලපාන මනෝවිද්‍යාත්මක සාධක තේරුම් ගැනීම අලෙවිකරුවෙකුට අත්‍යවශ්‍ය වේ. මෙය පැහැදිලි කිරීම සඳහා අලෙවිකරණ විද්වතුන් විසින් "උත්තේජක-ප්‍රතිචාර ආකෘතිය" (Stimulus-Response Model) හඳුන්වා දී ඇත (Kotler & Keller, 2016).


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

මෙම ආකෘතියට අනුව, අලෙවිකරණ උත්තේජක (නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය) සහ පාරිසරික උත්තේජක (ආර්ථික, තාක්ෂණික, දේශපාලන) පාරිභෝගිකයාගේ "කළු පෙට්ටිය" (Buyer's Black Box) හෙවත් මානසික ක්‍රියාවලිය තුළ සැකසීමෙන් පසුව පාරිභෝගිකයා මිලදී ගැනීම පිළිබඳ අවසාන ප්‍රතිචාරය දක්වනු ලබයි.

තරඟකාරී වෙළඳපලක පවතින අභියෝගයන්ට මුහුණ දීම සඳහා ආයතනයක් විසින් විධිමත් වෙළඳපල උපායමාර්ග (Marketing Strategies) සකස් කරගත යුතුය. මෙහිදී විශේෂයෙන්ම පහත ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ:

- **ඉලක්ක වෙළඳපල හඳුනාගැනීම:** ආයතනයට වඩාත් ඵලදායී ලෙස සේවය කළ හැකි නිශ්චිත පාරිභෝගික කොටස් තෝරා ගැනීම (Targeting).
- **තරඟකරුවන් විශ්ලේෂණය:** වෙළඳපල තුළ පවතින තරඟකාරීත්වය හඳුනාගෙන ඊට සාපේක්ෂව තම ආයතනයේ සුවිශේෂීත්වය (Unique Selling Proposition) ගොඩනැගීම (Porter, 1980).
- **නව ප්‍රවේශයන් හා ආදේශක හඳුනාගැනීම:** වෙළඳපලට අලුතින් පැමිණෙන තරඟකරුවන් සහ පාරිභෝගිකයාට තෝරාගත හැකි ආදේශක භාණ්ඩ (Substitutes) පිළිබඳ විමසිලිමත් වීම.

මෙම අංශයන් නිසි ලෙස හඳුනා ගැනීමෙන් පසුව, අදාළ සෑම ක්ෂේත්‍රයකටම ගැළපෙන පරිදි උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව කළමනාකාරීත්වයට ලැබේ. කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය සම්බන්ධයෙන් ගත් කල, පාරිභෝගිකයාගේ වර්තමාන මිලදී ගැනීමේ චර්යාව විශ්ලේෂණය කිරීම සහ තරඟකාරී පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳසැල්වල උපායමාර්ග හඳුනා ගැනීම විකුණුම් වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තර්ක කළ හැකිය.

### *SWOT විශ්ලේෂණය*

සංවිධානයක (සමාගමක) ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් සහ තර්ජනයන් සමස්ථ වශයෙන් ඇගයීම එහි SWOT විශ්ලේෂණය ලෙස හැඳින්වේ. සමාගමේ බාහිර පරිසරය (External Environment) ඇසුරින් එහි අවස්ථාවන් සහ තර්ජනයන් හඳුනා ගනු ලැබේ. බාහිර පරිසරය තුළින් සමාගමට වාසිදායක ලෙස බලපානු ලබන විචල්‍යයන් එහි අවස්ථාවන් ලෙස හඳුනා ගත හැකි ය. පරිසරය පරීක්ෂා කිරීමේ දී (Environmental Scanning) පළමුවෙන්ම සමාගමක් විසින් එහි වෙළෙඳපොළ අවස්ථාවන් (Market Opportunities) හඳුනා ගනු ලැබේ. වෙළෙඳපොළ තුළ භව්‍ය ගනුදෙනුකරුවන් සංඛ්‍යාව ඉහළ යාම, ගනුදෙනුකරුවන්ගේ ආදායම් මට්ටම ඉහළ යාම, හිතකර දේශපාලනික වාතාවරණය, හිතකර සිවිල් වාතාවරණය, හිතකර ආර්ථික ප්‍රවණතාවන්, හිතකර දේශගුණය යනාදිය සමාගමකට තිබෙන පාරිසරික අවස්ථාවන් කිහිපයකි. බාහිර පරිසරයෙන් සමාගමක් කෙරෙහි අහිතකර ලෙස බලපානු ලබන විචල්‍යයන් එහි තර්ජනයන් ලෙස හඳුනා ගැනීමට පුළුවන. වෙළෙඳපොළ තුළ තරගකරුවන්ගේ බලපෑම්, රජයේ බලපෑම්, ගනුදෙනු කරුවන්ගේ ආදායම අඩුවීම, දේශපාලනික අස්ථාවර භාවය, සිවිල් යුධ කෝළාහල, බලශක්ති අර්බුද යනාදිය සමාගමකට බලපානු ලැබිය හැකි තර්ජනයන් කිහපයකි.


සාමග්‍රී Unity
ISSN 3121-4266

සමාගමක අභ්‍යන්තර පරිසරය (Internal Environment) ඇසුරින් එහි ශක්තීන් සහ දුර්වලතාවන් හඳුනා ගනු ලැබේ. ශක්තීන් යනු සමාගමකට අභ්‍යන්තරිකව වාසිදායක ලෙස පවතින විචල්‍යයන් වේ. දුර්වලතා යනු සමාගමකට අභ්‍යන්තරිකව අවාසිදායක ලෙස පවතින විචල්‍යයන් ය. දක්ෂ කළමනාකරුවන්, දක්ෂ සහ කැපවුණු සේවකයින්, ඉහළ ප්‍රාග්ධනය සහ මූල්‍ය ශක්තිය, ඉහළ නිෂ්පාදිත ගුණත්වය, ඉහළ සේවාවන්, ප්‍රසිද්ධ සන්න නම් යනාදිය සමාගමක් සතු ශක්තීන් වලට නිදසුන් කිහිපයකි. අනෙක් අතට දුර්වල කළමනාකාරීත්වය, අතෘප්තිමත් වූ සේවකයින්, දුර්වල ප්‍රාග්ධනය සහ මූල්‍ය අස්ථාවර භාවය, පහළ නිෂ්පාදිත ගුණත්වය, දුර්වල සේවාවන්, දුර්වල සන්නම් යනාදිය සමාගමක් සතු දුර්වලතාවලට නිදසුන් කිහිපයකි.

නව ව්‍යාපාරික උපාය මාර්ග තීර්ණ ඵ SWOT විශ්ලේෂණය, නව වැඩසටහන් හෝ ව්‍යාපෘති ආරම්භ කරන විට එය සාර්ථක කිරීම සඳහා ගැළපෙන වැඩපිළිවෙළක් තෝරාගැනීමට උපකාරී වේ.ස්ථානගත කිරීමේ අධ්‍යයනය : ව්‍යාපාරයට ඇති ශක්ති, අවස්ථා නිසා පාරිභෝගිකයින් හා වෙළඳපොළක දළ සාර්ථකත්වය වැඩිදියුණු කිරීමට උපකාරී වන බව පෙන්වයි.සංචිත තීරණ ගැනීම : දුර්වලතා සහ තර්ජන හඳුනාගනිමින් විවිධ අභියෝග අභිබවා යාමට වැඩපිළිවෙළක් සකස් කිරීමේදී වැදගත් වන කරුණක් වේ.

SWOT විශ්ලේෂණය කළ විට, සංවිධානයකට ආයෝජන කටයුතු සඳහා අදාළ තීරණයක් ගැනීමට සහ නව විකල්ප හඳුනාගැනීමට සවිස්තරාත්මක මගපෙන්වීමක් ලැබෙයි.

### සංකල්පීය රාමුව (Conceptual Model)

ඉහත න්‍යායාත්මක කරුණු අධ්‍යයනයේ දී හා සාහිත්‍ය විමර්ශනයේ දී පර්යේෂක විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ ගැටලුවට අදාළව පහත පරිදි සංකල්පීය රාමුවක් ගොඩනඟා ගනු ලැබීය.

***ස්වායක්ත විචල්‍ය***

- ➔ භාණ්ඩ මිල
- ➔ භාණ්ඩවල ගුණාත්මකභාවය
- ➔ භාණ්ඩ සම්මිශ්‍රණය
- ➔ වෙළඳසැලේ පිහිටීම
- ➔ පාරිභෝගික චර්යාව හා තෘප්තිය
- ➔ වෙළඳ ප්‍රවර්ධනය
- ➔ පාරිභෝගික සත්කාරය හා භෞතික පහසුකම්

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂක විසින් හඳුනාගන්නා ලද ගැටලුව අනුව ගොඩනගාගන්නා කල්පිත පරීක්ෂා කිරීම සඳහා පාරිභෝගිකයින් හා පාරිභෝගික නොවන ප්‍රජාව වෙත කෙටි ප්‍රශ්නාවලියක් යොමුකර ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට, වෙළඳසැල පාරිභෝගික නොවන ප්‍රජාවගෙන් මුහුණට මුහුණ සිදුකරනු ලබන සාකච්ඡාවක් මඟින් දත්ත රැස් කිරීමටත් පර්යේෂණ ක්‍රම මෙහෙයවන ලදී.


ISSN 3121-4266

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙක මඟින් ම දත්ත රැස්කරමින් මිශ්‍ර ප්‍රවේශ ක්‍රමයට සිදුකරන ලදී.ඉහත පර්යේෂණ ප්‍රවේශයේ දී පෙන්වා දුන් පරිදි දත්ත රැස්කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් පාරිභෝගික හා පාරිභෝගික නොවන ප්‍රජාව වෙත කෙටි ලිඛිත ප්‍රශ්නාවලියක් යොමුකර ඔවුන්ගෙන් තොරතුරු ලබා පර්යේෂක විසින් සිදුකරන ලද අතර ඒ සඳහා යොමුකළ ප්‍රශ්නාවලීන් ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

***පරියේෂණ නියැදිය***

මෙම පර්යේෂණයට ලක්කරන බල සීමාව හෙවත් සංගහණය තුළ සමිති සාමාජිකයින් 33000 පමණක් සමිති සාමාජිකයින් නොවන පිරිස 100,000 පමණක් වාසය කරන අතර එම සංගහණය පර්යේෂණයට භාජනය කිරීම ඉතා දුෂ්කර බැවින් පහත පරිදි නියැදි වෙන්කර ගන්නා ලදී.


| ප්‍රවර්ගය | විස්තරය | නියැදි ප්‍රමාණය |
|---|---|---|
| **ප්‍රධාන කෝප්සිටි 4 අවටින්** | පාරිභෝගිකයන්ගේ නියැදි (15 බැගින්) | 60 |
| | පාරිභෝගික නොවන ප්‍රජාවගෙන් නියැදි (15 බැගින්) | 60 |
| **ප්‍රාදේශික හා මිනි කෝප්සිටි 27 අවටින්** | පාරිභෝගිකයන්ගේ නියැදි (5 බැගින්) | 135 |
| | පාරිභෝගික නොවන ප්‍රජාවගෙන් නියැදි (5 බැගින්) | 135 |
| **ඇල්මැති පාර්ශවයන්** | ඇල්මැති පාර්ශවයන් මගින් නියැදි | 60 |
| **මුළු නියැදිය** | | **450** |

මෙලෙස සංගහණය තුළින් වෙන්කරගන්නා ලද නියැදිවලින් ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය භාවිතා කර ඇති අතර එහිදී ලබා ගත් දත්ත වගු ප්‍රස්තාර මඟින් ඉදිරිපත් කර ඇත. කේන්ද්‍රීය ප්‍රවණතා විශ්‍රාම ක්‍රම මඟින් ඒවා තවදුරටත් විමසා බලනු ලබයි. ඒ සඳහා *Microsoft Excel* මෘදුකාංගය භාවිතා කරනු ලබයි.

**පර්යේෂණයට සම්බන්ධ වූ පාරිභෝගිකයින්ගේ වයස් විශ්ලේෂණය**


සාමගී Unity
ISSN 3121-4266
CC BY NC ND

| වයස් කාණ්ඩය (y) | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| 15-25 | 34 | 7.56% |
| 26-40 | 120 | 26.67% |
| 41-55 | 172 | 38.22% |
| 56-70 | 93 | 20.67% |
| 70 ට වැඩි | 31 | 6.89% |
| එකතුව | 450 | 100% |




අංක 03 වගුව / අංක 01 ප්‍රස්ථාරය: පාරිභෝගික වයස් සීමාව
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)


ඉහත 03 වගුවේ දත්ත විශ්ලේෂණයට අනුව පර්යේෂණය සඳහා ප්‍රතිචාර දක්වා ඇති පිරිසෙන් 41-55 වයස අතර පිරිස වැඩි වන අතර 24-40 අතර ද ඒ හා ආසන්න පිරිසක් ප්‍රතිචාර දක්වා ඇත. මේ අනුව ශ්‍රම බලකායේ මැදිවයසේ බහුතරයක් දෙනා තම අවශ්‍යතා සඳහා සමූපකාරය තෝරාගෙන ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

**පාරිභෝගික තෘප්තියට බලපාන සාධක විශ්ලේෂණය**

මෙහිදී පර්යේෂක විසින් පාරිභෝගිකයා වෙත යොමුකළ ප්‍රශ්නාවලිය මගින් ලබා ගත් තොරතුරු Microsoft Excel මෘදුකාංගය හා ප්‍රස්තාර භාවිතයෙන් වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණයට භාජනය කරයි.


සාමග්‍රී Unity
ISSN 3121-4266
CC BY NC ND

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| මිල වැඩියි | 267 | 59.33% |
| මිල සමානයි | 123 | 27.33% |
| මිල අඩුයි | 60 | 13.33% |
| | 450 | 100% |





අංක 4 වගුව / අංක 02 ප්‍රස්තාරය 4.2: භාණ්ඩවල මිල
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

ඉහත 04 වගුවේ දත්තයන්ට අනුව භාණ්ඩවල මිල පිළිබඳව යොමුකළ ප්‍රශ්නයේ දී 59.33% ක පාරිභෝගික ප්‍රජාවක් සමුපකාර ආයතනවල භාණ්ඩ මිල වැඩි බවට තම අදහස් දක්වා ඇත. 27.33% මිල සාමාන්‍ය බවත්, 13.33% ක් මිල අඩු බවත් ප්‍රතිචාර දක්වා ඇත.

**භාණ්ඩවල ගුණාත්මකභාවය (ප්‍රශ්න අංක 02)**


සාමග්‍රී Unity ISSN 3121-4266

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ඉතා හොඳයි | 272 | 60.44% |
| හොඳයි | 91 | 20.22% |
| සාමාන්‍යයයි | 87 | 19.33% |
| දුර්වලයි | - | |
| ඉතා දුර්වලයි | - | |
| | 450 | 100% |





අංක 05 වගුව / අංක 03 ප්‍රස්තාරය: භාණ්ඩවල ගුණාත්මකභාවය
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

05 වගුවට අනුව භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳව යොමුකළ ප්‍රශ්නාවලියේ දී 60.44% ක පාරිභෝගික පිරිසක් කුලියාපිටිය සමුපකාර සමිතියේ භාණ්ඩවල ගුණාත්මක භාවය ඉතා ඉහළ බවත් 20.22% ක් හොඳ බව හා 19.33% ක් සමාන බවට ප්‍රතිචාර දක්වා ඇත. දුර්වලයි හා ඉතා දුර්වලයි යන වරණ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. ඒ අනුව සමස්තයක් ලෙස කුලියාපිටිය සමුපකාර සමිතිය තුළ ඉතා උසස් ගුණාත්මක බවින් යුතු භාණ්ඩ ලබාගැනීමට ඇති බව පාරිභෝගික අදහස් මගින් ප්‍රත්‍යක්ෂ වේ.

**භාණ්ඩ මිශ්‍රණය (ප්‍රශ්න අංක 3)**


සාමග්‍රි Unity
ISSN 3121-4266
CC BY NC ND

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 418 | 92.89% |
| නැත | 32 | 7.11% |
| | 450 | 100% |





අංක 06 වගුව / අංක 04 ප්‍රස්තාරය: භාණ්ඩ මිශ්‍රණය
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

ඉහත අංක 06 වගුවට අනුව භාණ්ඩ මිශ්‍රණය හෙවත් පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ කුලියාපිටිය සමුපකාර සමිතියේ වෙළඳසැල්වල ඇත් ද යන්න සොයාබැලීමට කළ විමසුමේ දී 66% ක් භාණ්ඩ ඇති බවත්, 24.22% ක් බහුතර භාණ්ඩ ප්‍රමාණයක් ඇති බවත් පිළිවෙලින් 2.89% හා 6.89 ක් භාණ්ඩ නොමැති බවත් ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව සමස්තයක් ලෙස කුලියාපිටිය සමුපකාර සමිතියේ වෙළඳ ආයතනවල පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ ඇති බව පැහැදිලි වේ.

**පිහිටීම (ප්‍රශ්න අංක 4)**


ISSN 3121-4266

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | **418** | **92.89%** |
| නැත | **32** | **7.11%** |
| | **450** | **100%** |




ප්‍රස්තාරය 07 වගුව / අංක 05 ප්‍රස්තාරය: පිහිටීම
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

අංක 07 වගුවට අනුව සමුපකාර වෙළඳ ආයතනවල පිහිටීම පිළිබඳව මත විමසුමේ දී 92.89% ක පාරිභෝගික පිරිසක් සමුපකාර වෙළඳ ආයතනයන් පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක පිහිටා ඇති බවට ප්‍රතිචාර දක්වා ඇත.


සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

**සී/ස කුලියාපිටිය කොට්ඨාසයේ වි.සේ.ස. සමිති බල ප්‍රදේශය**




**වෙළඳ ප්‍රවර්ධනය හා වට්ටම් (ප්‍රශ්න අංක 5)**

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 66 | 14.67% |
| තරමක් | 116 | 25.78% |
| නැත | 268 | 59.56% |
| | 450 | 100% |



සාමග්‍රී Unity
CC BY NC ND

ISSN 3121-4266





අංක 08 වගුව / අංක 06 ප්‍රස්තාරය: වෙළඳ ප්‍රවර්ධනය හා වට්ටම්
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

අංක 08 වගුවට අනුව කුලියාපිටිය සමුපකාර සමිතියේ වෙළඳ ආයතනවල වෙළඳ ප්‍රවර්ධනය හා වට්ටම් පිරිනැමීම පිළිබඳව කරුණු විමසීමේ දී 59.56% ක ප්‍රමාණයක් වෙළඳ ප්‍රවර්ධනය හා වට්ටම් නැති බවත්, 25.78% ක් තරමක් ඇති බවත් 14.67% ක් ප්‍රමාණවත් බවත් ලෙස ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව සමස්තයක් ලෙස කුලියාපිටිය සමුපකාර සමිතියේ වෙළඳ ආයතනවල වෙළඳ ප්‍රවර්ධනය හා වට්ටම් පිරිනැමීම ඉතා අවම බවත් ඒ සඳහා අවධානය යොමු කළ යුතු බවත් පැහැදිලි වේ.

**පාරිභෝගික සත්කාරය**

| ප්‍රතිචාර ය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශත ය |
|---|---|---|
| ඔව් | 99 | 22.00% |
| සාමාන්‍ය | 303 | 67.33% |
| නැත | 48 | 10.67% |
| | 450 | 100% |


ISSN 3121-4266





අංක 09 වගුව / අංක 07 ප්‍රස්තාරය: පාරිභෝගික සත්කාරය
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

අංක 09 වගුවට අනුව පාරිභෝගික සත්කාරය පිළිබඳව කළ මත විමසීමේ දී 22.00% ක ප්‍රමාණයක් හොඳ පාරිභෝගික සත්කාරයක් පවතින බවත්, 67.33% ක් සාමාන්‍ය මට්ටමේ පාරිභෝගික සත්කාරයක් පවතින බවත් 10.67% ක් පාරිභෝගික සත්කාරය ප්‍රමාණවත් නොවන බවත් අදහස් දක්වා ඇත.

**පාරිභෝගික වර්ග (පාරිභෝගික අදහස්)**

| ප්‍රතිචාරය | පාරිභෝගිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| මිල අඩු විය යුතුයි | 247 | 30.09% |
| පාරිභෝගිකයාට සුහදශීලී විය යුතුයි | 77 | 9.38% |
| වට්ටම් හා ප්‍රවර්ධනය වැඩි විය යුතුයි | 370 | 45.07% |
| ආකර්ශනීය හා පහසුකම් වැඩිවිය යුතුයි | 118 | 14.37% |
| වෙනත් | 9 | 1.10% |
| මුළු ශේෂය | 821 | 100% |


සාමග්‍රී Unity
ISSN 3121-4266




අංක 10 වගුව / අංක 08: ප්‍රස්තාරය: පාරිභෝගික වර්ග
(මූලාශය: ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත)

අංක 10 වගුව මගින් පෙන්වා ඇත්තේ පාරිභෝගික අදහස් හා යෝජනා විමසීමේ දී ලබාදුන් පිළිතුරුවලට අදාළ තොරතුරුය. ඒ අනුව 30.09% ක් මිල අඩුවිය යුතු බවත්, 9.38% ක් වෙළඳසැල් සේවකයින් පාරිභෝගිකයාට සුහදශීලී විය යුතු බවත්, 45.07% ක් වට්ටම් හා ප්‍රවර්ධනය වැඩිවිය යුතු බවත්, 14.37% වෙළඳසැල හා අවට පරිසරය ආකර්ශනීය හා පහසුකම් වැඩිවිය යුතු බවත් ලෙස අදහස් දක්වා ඇති අතර 9% ක් වෙනත් පිළිතුරු ලබා දී ඇත.

## නිගමන හා නිර්දේශ

පර්යේෂක විසින් දත්ත විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු උපයෝගී කරගනිමින් නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම පරිච්ඡේදය මගින් සිදුකරනු ලබයි.

## නිගමනය

තෝරාගන්නා ලද නියැදි මගින් ලබා ගත් දත්ත විශ්ලේෂණය මගින් පෙනී යන්නේ සමුපකාර පාරිභෝගික අංශයන් තුළ ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීමට ඇති මුත් භාණ්ඩවල මිල, වට්ටම් අවම වීම, වෙළඳ ප්‍රවර්ධනය අවම වීම, පාරිභෝගික සත්කාරය අඩු වීම යන සාධක පාරිභෝගිකයාගේ චර්යාව කෙරෙහි බලපෑම් ඇතිකර ඇති බවයි. කොතරම් ගුණාත්මක භාණ්ඩ ලබා දුන්නද මිල හා පාරිභෝගිකයාට දක්වන ගෞරවය සැලකිල්ල වෙළඳ අංශයේ ආකර්ශනීය බව කෙරෙහි පාරිභෝගිකයා තම අවධානය යොමු කරන සමුපකාර පාරිභෝගික අංශවල පවතින ඉහත ගැටලු හේතුවෙන් සමුපකාර පාරිභෝගික අංශ කෙරෙහි පාරිභෝගික ආකර්ශනය අඩුවන බවත් දිනෙන් දින බිහිවන නව පාරිභෝගික වෙළඳ ආයතන වෙත පාරිභෝගිකයෝ ආකර්ශනය වන බවත් පෙනී යයි.


සාමග්‍රි Unity
ISSN 3121-4266
BY NC ND

කුලියාපිටිය සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය සැලකීමේ දී භාණ්ඩවල ගුණාත්මකභාවය, භාණ්ඩ සංකලනය හා පිහිටීම යන සාධක මඟින් පාරිභෝගිකයා අතර යහපත් ආකල්පයන් ගොඩනංවා ගැනීමට හැකිවී ඇති මුත්, භාණ්ඩවල මිල වට්ටම් හා ප්‍රවර්ධනය, පාරිභෝගික සත්කාරය වැනි අංශයන් මඟින් පාරිභෝගික අංශයෙන් පාරිභෝගිකයා ඈත්ව ඇති බව පෙනී යයි. එය කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාරිභෝගික අංශයේ විකුණුම් අඩුවීමට බලපා ඇති බව ඉහත දත්ත විශ්ලේෂණය මඟින් නිගමනය කළ හැකිය.

කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින් සිදුකරන ලද මෙම පර්යේෂණ ප්‍රතිපල මඟින් කුලියාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ විකුණුම් අඩුවීමට මිල, වට්ටම් හා වෙළඳ ප්‍රවර්ධනය පාරිභෝගික සත්කාරය ආකර්ශනීය පෙනුම හා පහසුකම් අඩුවීමට බලපා ඇති ලෙසින්ම, සමස්ත සමුපකාර සමිති පාරිභෝගික අංශයන්ගේ ද විකුණුම් අඩුවීමට ඉහත කරුණු බලපා ඇති බව නිගමනය කළ හැකිය.

**නිර්දේශ**

1. විවිධ සේවා සමුපකාර සමිති පාරිභෝගික අංශවල භාණ්ඩවල ගුණාත්මකභාවය පවත්වාගෙන යන අතරම තරඟකාරී ආයතනවලට සාපේක්ෂව අඩු මිලට භාණ්ඩ ලබා දීමට අවධානය යොමු කිරීම.
2. පාරිභෝගික අංශයන්ගෙන් විශේෂිත වට්ටම් ලබා දීම, එම වට්ටම් පිළිබඳව පාරිභෝගිකයාව දැනුවත් කිරීම හා වෙළඳ ප්‍රවර්ධනය වැඩි කිරීමට විවිධ සේවා සමුපකාර සමිති යොමු විය යුතුයි.
3. පාරිභෝගික අංශවල රාජකාරී කරන කළමනාකරුවන්, වෙළඳ සහායකයින් ඇතුළු සියලු සේවකයින්ට පාරිභොගික සත්කාරය පිළිබඳව පුහුණුවක් ලබා දීම, ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය හා එතුළින් මිත්‍රශීලී පාරිභෝගික සේවාවක් සැපයීමට යොමු වීම.
4. පාරිභොගික වෙළඳ ඒකක මහජන හිතකාමී හා ආකර්ශනීය පෙනුමක් ලැබෙන පරිදි පහසුකම් වර්ධනය කර පවත්වාගෙන යායුතු අතර එම අංශ නිතර නඩත්තු කළ යුතුයි.
5. වෙළඳ ආයතනවල වෙනස්විය යුතු අංශ පිළිබඳව වසරකට වරක්වත් පාරිභෝගික අදහස් ලබාගත යුතු අතර සමුපකාර පාරිභෝගිකයා වෙනුවෙන් විශේෂිත ප්‍රතිරූප වැඩසටහන් සංවිධානය කළ යුතුයි.

**සමුද්දේශ**


ගුණතිලක, නිමල් R. . *පර්යේෂණ විධික්‍රම.*

කළුආරච්චි, K. A. S. P. (2004). *අලෙවිකරණය හා අලෙවි කළමනාකරණය.*

Kotler, P. (2003). *Marketing management* (11th ed.). Prentice Hall.

රාමනායක, රංජිත්. (2001). *අලෙවිකළමනාකරණය.* එස්. ගොඩගේ හා සහෝදරයෝ.

හේවාවිස්ස, සංඛ. (2017). *අලෙවිකරණය.* එස්. ගොඩගේ හා සහෝදරයෝ.



ISSN 3121-4266

අබේසේකර, නලින්. (2019). *Marketing සිංහලෙන්*. සදීපා ප්‍රකාශකයෝ.

Baker, M. J. (2014). *Marketing Strategy and Management*. Palgrave Macmillan.

Kotler, P., & Keller, K. L. (2016). *Marketing Management*. Pearson Education.

Parasuraman, A., Zeithaml, V. A., & Berry, L. L. (1985). A conceptual model of service quality and its implications for future research. *Journal of Marketing*, 49(4), 41-50.

Sekerka, L. E., & Chao, C. Z. (2003). The focus of marketing in the 21st century: The consumer is king. *Journal of Relationship Marketing*

Booms, B. H., & Bitner, M. J. (1981). Marketing strategies and organization structures for service firms. *Marketing of Services*.

Bowersox, D., Closs, D., Cooper, M. B., & Bowersox, J. (2013). *Supply Chain Logistics Management*. McGraw-Hill Education.

Kotler, P., & Armstrong, G. (2018). *Principles of Marketing* (17th ed.). Pearson Education.

Kotler, P., & Keller, K. L. (2016). *Marketing Management* (15th ed.). Pearson.

McCarthy, E. J. (1964). *Basic Marketing: A Managerial Approach*. Irwin.

Jobber, D., & Ellis-Chadwick, F. (2019). *Principles and Practice of Marketing* (9th ed.). McGraw-Hill Education.

Kotler, P., & Armstrong, G. (2018). *Principles of Marketing* (17th ed.). Pearson Education.

Palmer, A. (2012). *Introduction to Marketing: Theory and Practice*. Oxford University Press.

Kotler, P., & Keller, K. L. (2016). *Marketing Management* (15th ed.). Pearson Education.

Porter, M. E. (1980). *Competitive Strategy: Techniques for Analyzing Industries and Competitors*. Free Press.

Solomon, M. R. (2019). *Consumer Behavior: Buying, Having, and Being* (12th ed.). Pearson Education.



BY NC ND

ISSN 3121-4266

**ඇමිණුම් අංක 01**


***කුලියාපිටිය සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය පිළිබඳ සමීක්ෂණය***

පාරිභෝගික ඔබ අපේ වටිනාම සම්පතයි. කුලියාපිටිය සමුපකාර සමිතියේ පාරිභෝගික අංශය දියුණු කර පවත්වාගෙන යාම සඳහාත්, ඔබට කාර්යක්ෂම හා සුහදශීලි සේවාවක් ලබාදීම සඳහාත් ඔබගේ අදහස් අප වෙත ලබා දෙන්න. ඔබගේ සහයෝගය අප ඉතා අගයකොට සලකමු.

1. ප්‍රදේශයේ අනෙකුත් වෙළඳසැල් සමග සංසන්දනයේදී සමුපකාර වෙළඳසැල්වල භාණ්ඩ මිල පිළිබඳව ඔබ තෘප්තිමත් ද?

a. මිල වැඩියි b. මිල සමානයි c. මිල අඩුයි

අනෙකුත් වෙළඳසැල් හා සසඳන විට සමුපකාර වෙළඳසැල්වල පිරිනමන නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳව ඔබ තෘප්තිමත් ද?



3. ඔබ බලාපොරොත්තු වන නිෂ්පාදන සමුපකාර පාරිභෝගික වෙළඳසැල්වල ලබාගැනීමට තිබේ ද?

a. ඔව් b. බහුතරයක් ඇත c. බහුතරයක් නැත d. නැත

4. ඔබ ප්‍රදේශයේ සමුපකාර වෙළඳසැල පිහිටා ඇත්තේ ඔබට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක ද?

a. ඔව් b. නැත

5. සමුපකාර වෙළඳසැල් විසින් පිරිනමනු ලබන විකුණුම් ප්‍රවර්ධන සහ වට්ටම් කෙරෙහි ඔබ තෘප්තිමත් ද?



6. වෙළඳසැලේ කර්යයමණ්ඩලයේ සුහදශිලීත්වය හා ඔවුන් ඔබට ලබාදෙන සේවාව පිළිබඳව ඔබ තෘප්තිමත් ද?




සාමග්‍රී Unity
CC BY NC ND
ISSN 3121-4266

සමුපකාර වෙළඳසැල් මගින් ඔබට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා දීමේදී වැඩිදියුණු වියයුතු අංශ පිළිබඳව ඔබට ඇති යෝජනා මොනවා ද?

..................................................................................................................................

..................................................................................................................................


ISSN 3121-4266

සාමග්‍රී Unity

Semi-annual Refereed Journal of Co-operative Studies and Allied Disciplines

**ISSN 3121-4266**

**පළමු වෙළුම, පළමු කලාපය | 2025 ජුලි-දෙසැම්බර්**

**පත්‍රිකා අංක 06**

# විගණනයේ පරිණාමය සහ සංවර්ධනය[12]

Owolabi Sunday Ajao[13]

Jayeoba Olajumoke Olamide

Ajibade Ayodeji Temitope

**සාරසංක්ෂේපය**

හිමිකරුවන්ගෙන් (Principal) නියෝජිතයන්ගේ (Agents) කාර්යභාරය සම්පූර්ණයෙන්ම වෙන්වීම ගිණුම්කරණයේ ඉතිහාසය තුළ සනිටුහන් වන අවස්ථාවේ විගණනයේ ඉතිහාසය ආරම්භ විය. මෙම අධ්‍යයනය තුළදී පවතින සාහිත්‍ය මූලාශ්‍ර සමාලෝචනය කරමින් ගවේෂණාත්මක ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. මේ අනුව අපි විගණනයේ ඉතිහාසය සොයා බැලූ අතර වසර ගණනාවක් පුරා විගණකවරුන්ගේ රාජකාරිවල විවිධ ගතිකත්ව ඇගයීමට ලක් කළෙමු. විගණකවරුන්ගේ රාජකාරි කාලයත් සමඟ වෙනස් වී ඇති බව මෙහිදී පෙනී ගියේය. ආරම්භයේදී විගණකවරුන්ට පැවරුණු මුල් කාර්යය භාරය වූයේ වංචා හඳුනා ගැනීම සහ නියෝජිතයන් විසින් ව්‍යාපාරයේ සැබෑ මූල්‍ය තත්ත්වය පෙන්වා දී ඇති බව තහවුරු කරමින් හිමිකරුගේ මනස සැහැල්ලු කිරීමයි. පසු ඉතිහාසයේ දී මෙම රාජකාරිය වෙනස් විය. විගණකවරුන් යනු ඇපකරුවන් නොවන බැවින් සහ නියෝජිතයන් ඉදිරිපත් කරන වාර්තා 100% ක්ම වංචාවලින් තොර බව තහවුරු කිරීමට ක්‍රමයක් නොමැති බැවින්, මූල්‍ය ප්‍රකාශන මගින් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය විශ්වාසදායක ලෙස නිරූපණය කරන්නේද යන්න පිළිබඳව තම මතය ප්‍රකාශ කිරීමේදී සාධාරණ නිපුණතාවක් සහ සැලකිල්ලක් දැක්වීම විගණකවරුන්ගෙන් අපේක්ෂා කරන ලදී. ලෝකයේ සිදුවන වෙනස්කම් හේතුවෙන් විගණකවරුන්ගේ භූමිකා වෙනස් වන බව පෙනී ගිය අතර, මෙම පත්‍රිකාව මගින් වංචා සිද්ධීන්

[12] Unique Journal of Business Management Research හි පළවූ *Evolution and development of auditing* පත්‍රිකාවේ සිංහල අනුවර්තනය. මෙම පත්‍රිකාවේ මුල් ඉංග්‍රීසි පිටපත මෙම සබැඳියෙන් ලබාගත හැකියි http://www.uniqueresearchjournals.org/UJBMR **(අනුවර්තනය: ප්‍රභාත් ගලගමගේ,** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය )

[13] ගිණුම්කරණ දෙපාර්තමේන්තුව, බැබ්කොක් විශ්ව විද්‍යාලය (Babcock University), නයිජීරියාව (කතුවරුන් තිදෙනාම මෙම ආයතනය නියෝජනය කරයි)



CC BY NC ND

ISSN 3121-4266

විගණන භූමිකාවන් කෙරෙහි ඇති කරන ලද බලපෑම ද ඇගයීමට ලක් කර ඇත. අතීතය සැබවින්ම වර්තමානයට බලපා ඇති අතර, පරිගණක ආශ්‍රිත විගණන ශිල්පීය ක්‍රම (CAATs) භාවිතය හරහා අනාගතයටද බලපානු ඇති බව අපගේ නිගමනයයි.

**මූල පද:** විගණනය, ගණකාධිකරණය, පරිනාමය, CAATs, නියෝජන න්‍යාය (agency theory)

**1. හැඳින්වීම (Introduction)**

සත්‍යාපනය කිරීමට සහ විශේෂඥ මතයක් ලබා ගැනීමට ඇති කුතුහලය විගණනයේ පරම අරමුණ වන අතර, මෙය මානව ස්වභාවයද වෙයි. විගණන ඉතිහාසය, හිමිකරුගෙන් නියෝජිතයාගේ රාජකාරි වෙන්වීමත් සමඟ ආරම්භ වූ ගිණුම්කරණ ඉතිහාසය දක්වා දිව යයි. හිමිකරු අරමුදල් සපයන අතර, නියෝජිතයන් එම අරමුදල් භාවිතා කර (නියෝජිත න්‍යාය - Agency theory) එම මුදල් භාවිතා කළ ආකාරය පිළිබඳ වාර්තා සකසයි (ගිණුම්කරණය). විගණකවරයා එම වාර්තාවල සත්‍යතාව පරීක්ෂා කර හිමිකරුට ඉදිරිපත් කිරීමට පෙර තම මතය ප්‍රකාශ කරයි. ඒ අනුව, නියෝජිත න්‍යාය, ගිණුම්කරණ න්‍යාය සහ විගණන න්‍යාය එකිනෙක බැඳී පවතී.

විගණන න්‍යායේ ඉතිහාසයේ වැදගත් අංගයක් වන්නේ විගණකවරුන්ගේ භූමිකාව සහ කාර්යයන්ය. සලීම් (Saleem, 2012) ට අනුව ආරම්භයේ සිටම ඔවුන්ගේ භූමිකාවන් නිසි ලෙස අර්ථ දක්වා නොතිබුණි. ලුලියානා (luliana, 2012) නිරීක්ෂණය කළ පරිදි, විගණනය නිරන්තරයෙන් පරිණාමය වී ඇති අතර, මධ්‍යතන යුගයේ සිට කාර්මික විප්ලවය හරහා 21 වන සියවස දක්වා පරිසරයේ වෙනස්කම්වලට ප්‍රතිචාර දක්වමින් එහි අරමුණු වෙනස් කර ඇත. කළමනාකරණය සහ ක්‍රියාකාරීත්වය අතර පරතරය පුළුල් වීම නිසා ව්‍යාපාරය කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා පාලන පද්ධති මාලාවක් සංවර්ධනය කිරීම අවශ්‍ය වී ඇත.

පෝටර් (Porter, 1997) ට අනුව, 20 වන සියවසට පෙර විගණකවරුන්ගේ එක් අරමුණක් වූයේ වංචා හඳුනා ගැනීමයි. කෙසේ වෙතත්, දිනෙන් දින දියුණු වන ව්‍යාපාරික ලෝකයේ ගනුදෙනු පරිමාව විශාල වීම නිසා විගණකවරුන්ට ගිණුම් එකින් එක පරීක්ෂා කිරීම දුෂ්කර විය. මේ නිසා නියැදි ශිල්පීය ක්‍රම (Sampling techniques) භාවිතා කරන ලද අතර, එමගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ලබා දෙන්නේ "සාධාරණ සහතිකයක්" (Reasonable assurance) පමණක් බැවින් වංචා හඳුනා ගැනීමේ පෙර පැවති වගකීම ඉවත් කරන ලදී[14]. 1930 ගණන්වලදී, විගණනයේ ප්‍රධාන අරමුණ ගිණුම් සත්‍යාපනය කිරීම බව පිළිගැනුණු අතර, වංචා වැළැක්වීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් බවට පත් විය.

[14] කෙසේ වෙතත් වර්තමාන විගණන මූලධර්ම තුළ එය ද්විතීයික අරමුණක් ලෙස තවම පවතියි.



සාමග්‍රි Unity
BY NC ND

ISSN 3121-4266

## 2. අධ්‍යයනයේ අරමුණ සහ ක්‍රමවේදය (Objective and Methodology)

මෙම අධ්‍යයනය ගවේෂණාත්මක පර්යේෂණයක් වන අතර, අනාගත විගණනය පුරෝකථනය කිරීම සඳහා වර්තමාන විගණනයට හේතු තේරුම් ගැනීමේ අරමුණින් විගණන න්‍යායේ ඉතිහාසය සහ පරිණාමය පිළිබඳ පවතින සාහිත්‍ය මූලාශ්‍ර සමාලෝචනය කර ඇත.

## 3. විගණනයේ ඓතිහාසික පසුබිම (Historical Background of Auditing)

"*Audit*" යන වචනය පැමිණෙන්නේ "ඇසීම" හෝ "සවන්දීම" යන අර්ථය ඇති ලතින් භාෂාවේ ***audire*** යන වචනයෙනි. විවිධ විද්වතුන් විගණනය විවිධ ලෙස අර්ථ දක්වා ඇත:

- **Flint (1988):** විගණනය යනු එහි ප්‍රායෝගික ප්‍රයෝජනය මත පමණක් පවතින සමාජීය සංසිද්ධියකි.
- **Power (1999):** මූල්‍ය ප්‍රකාශන මගින් ආයතනයක සැබෑ සහ සාධාරණ තත්ත්වයක් නිරූපණය කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා පොත්පත්, ගිණුම් සහ ලේඛන ක්‍රමානුකූලව සහ ස්වාධීනව පරීක්ෂා කිරීම විගණනයයි.
- **Raffa (2003):** ආර්ථික ක්‍රියාවන් පිළිබඳ ප්‍රකාශයන් සහ ස්ථාපිත නිර්ණායක අතර අනුකූලතාව තහවුරු කිරීමේ ක්‍රමානුකූල ක්‍රියාවලිය විගණනයයි.

විගණනයේ ඉතිහාසය බොහෝ දුරට ගිණුම්කරණ ඉතිහාසය මත තීරණය වේ. පුරාණ මෙසපොතේමියාව, ඊජිප්තුව, ග්‍රීසිය සහ ඉතාලිය වැනි සංස්කෘතීන් තුළ දියුණු ආර්ථික පද්ධති තිබූ බවට සාක්ෂි ඇත. ක්‍රි.පූ. 400 දී පමණ පැරණි ඊජිප්තුවරුන් සහ බැබිලෝනියන්වරුන් ගබඩාවලට ඇතුළු වන සහ පිටවන ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා විගණන පද්ධති භාවිතා කළහ. මෙහිදී වාචිකව වාර්තා ඉදිරිපත් කළ නිසා "විගණක" (Auditor) යන පදය නිර්මාණය විය.

මධ්‍යතන යුගයේදී කතෝලික පල්ලිය ගිණුම්කරණයේ වර්ධනයට විශාල බලපෑමක් කළේය. ලූකා පැසියෝලෝ (Luca Paciolo) විසින් 1494 දී ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ඇතුළත් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන ලදී. එංගලන්තයේ පළමුවන හෙන්රි රජුගේ පාලන සමයේදී (1100-1135), රාජ්‍ය ආදායම් සහ වියදම් නිසි ලෙස ගිණුම්ගත කර ඇති බව සහතික කිරීම සඳහා විශේෂ විගණන නිලධාරීන් පත් කරන ලදී.

## 4. විගණන ඉතිහාසයේ කාලානුක්‍රමික පරිච්ඡේද (Chronological Periods)

විගණන ඉතිහාසය පරීක්ෂා කිරීමේදී ලී සහ අසාම් (Lee and Azham, 2008) ගේ කෘතිය ප්‍රමුඛ වේ. ඔවුන් විගණන ඉතිහාසය ප්‍රධාන කාල පරිච්ඡේද පහකට බෙදා දක්වයි. ඔවුන්ගේ නිරීක්ෂණ පහත පරිදි සාරාංශ කළ හැකිය:

### 1840 ගණන් වලට පෙර

මෙම කාල පරිච්ඡේදය තුළ විගණකවරුන්ගේ ක්‍රියාකාරකම් පහත පරිදි සාරාංශ කළ හැකිය:


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266

1. ව්‍යුහගත ව්‍යාපාරික ස්වභාවයක් නොතිබූ බැවින් විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.
2. එකල විගණනය සෑම ගනුදෙනුවක්ම සවිස්තරාත්මකව පරීක්ෂා කිරීමට පමණක් සීමා විය. ඒ අනුව, නියැදි පරීක්ෂා කිරීමේ (Sampling) සංකල්පය විගණන ක්‍රියාවලියේ කොටසක් නොවීය.
3. මුල් කාල පරිච්ඡේදයේ විගණන අරමුණ මූලික වශයෙන් සැලසුම් කර තිබුණේ මූල්‍ය වගකීම් පැවරී ඇති පුද්ගලයින්ගේ අවංකභාවය තහවුරු කිරීම සඳහා ය.
4. විගණකවරුන්ගේ එකම රාජකාරිය වූයේ වංචා හඳුනා ගැනීමයි. ඔහු "මුර බල්ලෙකු" (Watchdog) ලෙස නොව "දඩ බල්ලෙකු" (Bloodhound) ලෙස සලකනු ලැබීය (පොලිස් නිලධාරී න්‍යාය - Policeman theory).

**1840 - 1920 (1840 ගණන් - 1920 ගණන්)**

එක්සත් රාජධානියේ කාර්මික විප්ලවය මෙම කාලය තුළ සිදු වූ අතර එය ව්‍යාපාර ව්‍යාප්ත වීමට සහ විගණකවරුන්ගේ භූමිකාව පරිණාමය වීමට බෙහෙවින් දායක විය. මෙම කාල පරිච්ඡේදයේ දායකත්වයන් පහත පරිදි වේ:

1. 1844 දී එක්සත් රාජධානියේ හවුල් කොටස් සමාගම් පනත (Joint Stock Companies Act) සම්මත වූ අතර, සමාගම්වල ගිණුම් පරීක්ෂා කිරීම සඳහා විගණකවරුන් පත් කිරීමට එමගින් ප්‍රතිපාදන සැලසීය.
2. මෙම කාලය තුළ විගණකවරුන්ගේ රාජකාරි කෙරෙහි අධිකරණ තීන්දු බලපෑවේය.
3. මෙම යුගයේ විගණන අරමුණු වූයේ: (i) වංචා හඳුනා ගැනීම, (ii) තාක්ෂණික දෝෂ හඳුනා ගැනීම, සහ (iii) මූලධර්මවල වැරදි (Errors of principles) හඳුනා ගැනීමයි.

**1920 - 1960 (1920 ගණන් - 1960 ගණන්)**

සමාගම් ප්‍රමාණයෙන් විශාල වන විට හිමිකාරිත්වය සහ කළමනාකාරිත්වය වෙන්වීම වඩාත් පැහැදිලි විය. ඒ අනුව නියෝජිත න්‍යාය (Agency theory) ප්‍රමුඛ විය. මෙම කාල පරිච්ඡේදයේ ප්‍රධාන ක්‍රියාකාරකම් මෙසේය:

1. ආයෝජකයින්ගෙන් සමාගම්වලට අරමුදල් ගලා ඒම සහ මූල්‍ය වෙළඳපල ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයතනවල අභ්‍යන්තර පාලන කාර්යයන් ආරම්භ විය.
2. විගණන කාර්යයේ ප්‍රධාන අරමුණ වූයේ කළමනාකාරිත්වය විසින් කොටස් හිමියන් වෙනුවෙන් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය (Credibility) තහවුරු කිරීමයි. ඒ අනුව විගණනයේ මූලික අරමුණ වංචා සහ දෝෂ සෙවීමේ සිට මූල්‍ය ප්‍රකාශනවලට විශ්වාසනීයත්වයක් එක් කිරීම දක්වා වෙනස් විය.
3. "ප්‍රමාණවත්භාවය" (Materiality) යන සංකල්පය මෙම කාලය තුළ භාවිතා විය. විශාල සමාගම්වල ගනුදෙනු පරිමාව අධික වීම නිසා සියලුම ගනුදෙනු පරීක්ෂා කිරීම


සාමග්‍රී Unity
BY NC ND
ISSN 3121-4266

ප්‍රායෝගික නොවන බැවින් නියැදි ශිල්පීය ක්‍රම (Sampling techniques) භාවිතා කරන ලදී.

4. මෙම යුගයේ විගණන ප්‍රවේශයේ ලක්ෂණ වූයේ: (i) අභ්‍යන්තර පාලනය මත විශ්වාසය තැබීම, (ii) අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රවලින් සාක්ෂි රැස් කිරීම, (iii) සත්‍ය සහ සාධාරණ (Truth and fairness) තත්ත්වය අවධාරණය කිරීම, (iv) ලාභ අලාභ ගිණුම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම, සහ (v) ගිණුම් පොත්වලින් බැහැර වූ භෞතික නිරීක්ෂණ සිදු කිරීමයි.

**1960 - 1990 (1960 ගණන් - 1990 ගණන්)**

ඩේවිස් (Davies, 1996) ට අනුව මෙම කාලය තුළ විගණනය තීරණාත්මක වර්ධනයන්ට ලක් විය.

1. විගණන ප්‍රවේශය "පොත්වල ඇති ගනුදෙනු සත්‍යාපනය කිරීමේ" සිට "පද්ධති මත විශ්වාසය තැබීම" දක්වා වෙනස් විය.
2. සමාගම්වල අභ්‍යන්තර පාලනය ශක්තිමත් වූ විට, විගණකවරුන් සවිස්තරාත්මක පරීක්ෂාවන් (Substantive testing) අවම කළහ.
3. 1980 දශකයේ මැද භාගයේදී අවදානම් මත පදනම් වූ විගණනය (Risk-based auditing) සංවර්ධනය විය. මෙහිදී විගණකවරයා වැරදි සිදුවීමට වැඩි ඉඩක් ඇති ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

**1990 ගණන් වල සිට වර්තමානය දක්වා**

මෙම කාල පරිච්ඡේදයේ ලක්ෂණ පහත පරිදි වේ:

1. ව්‍යාපාරික අවදානම් ප්‍රවේශය (Business risk approach) අනුගමනය කිරීම.
2. වාර්ෂික වාර්තාවල අඩංගු මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු සඳහා විශ්වාසනීයත්වයක් ලබා දීම.
3. විගණන ආයතන උපදේශන සේවා සැපයීම සහ චෝහාරික ගිණුම්කරණය (Forensic accounting) ආරම්භ වීම.
4. දත්ත විශ්ලේෂණය පහසු කිරීම සඳහා පරිගණක ආශ්‍රිත විගණන ශිල්පීය ක්‍රම (CAATs) හඳුන්වා දීම.


සාමග්‍රි Unity
BY NC ND
ISSN 3121-4266

| කාල පරිච්ඡේදය | ප්‍රධාන ලක්ෂණ |
|---|---|
| 1840 ට පෙර | විධිමත් අභ්‍යන්තර පාලනයක් නොතිබුණි. විගණකවරයා සෑම ගනුදෙනුවක්ම සවිස්තරාත්මකව පරීක්ෂා කළේය. ප්‍රධාන අරමුණ වංචා හඳුනා ගැනීමයි (Policeman theory). |
| 1840 - 1920 | කාර්මික විප්ලවය නිසා ව්‍යාපාර ව්‍යාප්ත විය. 1844 (එක්සත් රාජධානියේ) හවුල් කොටස් සමාගම් පනත මගින් විගණකවරුන් පත් කිරීම අනිවාර්ය විය. |
| 1920 - 1960 | හිමිකාරිත්වය සහ කළමනාකාරිත්වය වෙන්වීම නිසා නියෝජිත න්‍යාය ප්‍රමුඛ විය. ප්‍රධාන අරමුණ වංචා සෙවීමේ සිට මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය තහවුරු කිරීම දක්වා වෙනස් විය. |
| 1960 - 1990 | ගනුදෙනු සංඛ්‍යාව වැඩි වීම නිසා "පොත් පරීක්ෂා කිරීමේ" සිට "පද්ධති මත විශ්වාසය තැබීම" දක්වා විගණනය වෙනස් විය. අවදානම් මත පදනම් වූ විගණනය (Risk-based auditing) සංවර්ධනය විය. |
| 1990 සිට වර්තමානය | ව්‍යාපාරික අවදානම් ප්‍රවේශය, උපදේශන සේවා සැපයීම සහ වෝහාරික ගිණුම්කරණයේ (Forensic accounting) උපත මෙහි ලක්ෂණ වේ . පරිගණක ආශ්‍රිත විගණන ශිල්පීය ක්‍රම ද (CAATs) හඳුන්වා දෙන ලදී. |

## 5. විගණනය සහ තොරතුරු තාක්ෂණය (Auditing and Information Technology)

1950-60 දශක පරිගණකවල උදාව ලෙස සැලකේ. මුල් කාලයේ විගණකවරුන් "පරිගණකය වටා විගණනය කිරීමේ" (Auditing around the computer) ප්‍රවේශය අනුගමනය කළහ[15]. එනම් දත්ත ඇතුළත් කිරීම සහ ප්‍රතිදානය පමණක් පරීක්ෂා කිරීමයි. 21 වන සියවස වන විට සෑම ව්‍යාපාරික ගනුදෙනුවක්ම තොරතුරු තාක්ෂණය හරහා සිදුවන බැවින් විගණකවරුන්ට "පරිගණකය හරහා වැඩ කිරීමට" (Work through the computer) සිදු විය.

බ්‍රවුන් සහ ඩේවිස් (Braun & Davis, 2003) ට අනුව, CAATs[16] යනු විගණනයක් සම්පූර්ණ කිරීමට සහාය වන ඕනෑම තාක්ෂණික භාවිතයකි. මින් විශාල දත්ත ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීමේ කාර්යක්ෂමතාව අත්පත් වෙයි. CAATs වලට පොදු විගණන මෘදුකාංග (GAS[17]), දත්ත විශ්ලේෂණ මෘදුකාංග සහ ජාල ආරක්ෂණ ඇගයීම් මෙවලම් ඇතුළත් වේ.

---

[15] ආදාන-ප්‍රතිදාන පාදක සත්‍යාපන විගණන ප්‍රවේශය ලෙසද හැඳින්විය හැකියි. මෙහිදී පරිගණකය තුළ දත්ත සැකසෙන තාර්කික ක්‍රියාවලිය (Processing logic) පරීක්ෂා නොකර, පද්ධතියට ඇතුළත් කරන දත්ත (Input) සහ ඉන් ලැබෙන ප්‍රතිදානයන් (Output) පමණක් සසඳා බැලීම සිදුවෙයි (අනුවර්තක).

[16] Computer Assisted Audit Techniques

[17] Generalized Audit Software


සාමග්‍රි Unity
CC BY NC ND
ISSN 3121-4266
9 773121 426004

### 6. එන්රොන් (Enron) සිද්ධිය සහ විගණනයේ පරිණාමය

2001 ඔක්තෝම්බර් මාසයේදී අනාවරණය වූ එන්රොන් වංචාව ලෝකයේ විශාලතම විගණන අසාර්ථකත්වය ලෙස සැලකේ . මෙහි ප්‍රතිඵලයක් ලෙස Arthur Andersen සමාගම බිඳ වැටුණි. එන්රොන් විධායක නිලධාරීන් විශේෂ කාර්යය ඒකක[18] (Special purpose entities) භාවිතා කරමින් ණය බිලියන ගණනක් සඟවා තිබුණි.

මෙම සිද්ධිය නිසා **Sarbanes-Oxley Act (SOX)**[19] පනත ක්‍රියාත්මක විය. මෙමගින්:

- විගණකවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ නීති දැඩි කළේය.
- විගණන හවුල්කරුවන් වරින් වර මාරු කිරීම (Rotation) අනිවාර්ය කළේය.
- මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව විගණනය කිරීමට විගණකවරුන්ට වගකීමක් පැවරීය (පනතේ 404 වගන්තිය).
- විගණන ආයතන අධීක්ෂණය සඳහා පොදු සමාගම් ගිණුම්කරණ අධීක්ෂණ මණ්ඩලය (Public Company Accounting Oversight Board - PCAOB) පිහිටුවන ලදී.

### 7. නයිජීරියාවේ විගණන සංවර්ධනය (Development of Audit in Nigeria)

නයිජීරියාවේ විගණන කටයුතු වලදී මුලින්ම බ්‍රිතාන්‍ය විලාසිතාව අනුගමනය කළේය. 1960 ට පෙර නයිජීරියාවේ ගිණුම්කරණ වෘත්තීය ආයතනයක් නොතිබුණි. නයිජීරියාවේ පැරණිතම දේශීය විගණන ආයතනය වන්නේ 1952 දී පිහිටුවන ලද අකින්ටෝලා විලියම්ස් සහ සමාගම (Akintola Williams & Co.) ආයතනයයි. 1965 දී නයිජීරියානු වරලත් ගිණුම්කරණ ආයතනය (ICAN) පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලදී. දැනට ICAN සහ ANAN[20] යන ආයතන දෙක නයිජීරියාවේ විගණන වෘත්තිය නියාමනය කරයි.

### 8. නිගමනය: හෙට දවසේ විගණනය

අනාගත විගණනය වඩාත් දියුණු මෘදුකාංග මගින් අර්ථ ගැන්වෙනු ඇත. වර්තමාන CAATs හි ප්‍රධාන අඩුපාඩුවක් වන්නේ ඒවා තත්‍ය කාලීන (Real-time) දත්ත සමඟ ක්‍රියා නොකිරීමයි. අනාගතයේදී ගනුදෙනු සිදුවන විටම ඒවා විගණනය කරන 24/7 විගණන සම්මුතියක (ප්‍රොටෝකෝලයක) අවශ්‍යතාව පැන නගිනු ඇත.

---

[18] විශේෂ කාර්ය ඒකකයක් යනු මව් සමාගමකින් නෛතිකව වෙන්වූ, නමුත් එම මව් සමාගම විසින්ම යම් නිශ්චිත සහ සීමිත අරමුණක් ඉටුකර ගැනීම සඳහා පිහිටුවනු ලබන අනුබද්ධිත සමාගමකි (Subsidiary) (අනුවර්තක).

[19] මූල්‍ය වංචා වැළැක්වීම සහ ආයතනික පාලනය ශක්තිමත් කිරීම සඳහා 2002 වසරේදී ඇමරිකා එක්සත් ජනපදය විසින් සම්මත කරගත් පනතකි (අනුවර්තක).

[20] Association of National Accountants of Nigeria


සාමග්‍රී Unity
cc BY NC ND
ISSN 3121-4266

සාම්ප්‍රදායිකව හස්තගතව සිදු කරන සහ අතීතය දෙස බලන (Retrospective) විගණනය තවදුරටත් ප්‍රමාණවත් නොවේ. අනාගතය යනු අඛණ්ඩ විගණනය (Continuous Audit) වන අතර, සමෝධානිත විගණන මොඩියුල (Embedded Audit Modules - EAM) වැනි තාක්ෂණික ක්‍රම හරහා දත්ත සැකසෙන විටම දෝෂ සහ වංචා හඳුනා ගැනීමට හැකි වනු ඇත. අවසාන වශයෙන්, විගණකවරුන් තම භූමිකාව කාලීනව තේරුම් ගත යුතු අතර තාක්ෂණය වැළඳගත යුතු වෙයි.

**සමුද්දේශ**


Abdel-Qader, W. (2002). An evaluation of the international auditing standards and their application to the audit of listed corporations in Jordan. (Unpublished Doctoral Thesis, University of Western Sydney, Australia)

AbdulGaniyy, A. (2013). Audit Practice in Global Perspective: Present and Future Challenges. *Research Journal of Finance and Accounting*, 4(6)

Ajayi, C. A. (1997). The Development of Accounting Profession in Nigeria. Published in *Accounting Education in Nigeria: Challenges and Prospects* - A Publication of the Society of Women Accountants of Nigeria (SWAN)

Boyd, E. (1905). History of auditing. *A History of Accounting and Accountants*, 74

Braun, R. L. & Davis, H. E. (2003). Computer-assisted audit tools and techniques: analysis and perspectives. *Managerial Auditing Journal*, 18(9), 725-731

Brown, R. (1962). Changing audit objectives and techniques. *The Accounting Review*, 37(4), 696-703

Byrnes, P. E., Al-Awadhi, A., Gullvist, B., Brown-Liburd, H., Teeter, R., Warren, J. D., and Vasarhelyi, M. (2012). Evolution of Auditing: From the Traditional Approach to the Future Audit. *The AICPA Assurance Services Executive Committee (ASEC) Emerging Assurance Technologies Task Force*, Working Paper

Cangemi, M. (2010). Internal Audit's Role in Continuous Monitoring. *The EDP Audit, Control, and Security Newsletter*, 41 (4)



CC BY NC ND
ISSN 3121-4266

Cañibano, C. L. (1993). *Curso de auditoría contable. Casos practices*. Madrid: Editura Piramide

CICA/AICPA Study Group (1999). Research Report: *Continuous Auditing*. Toronto, Canada: The Canadian Institute of Chartered Accountants, American Institute of Certified Public Accountants

Collins, L. and Gérard, V. (1992). *Audit and internal control*. Paris: Dalloz printing

Curtis, M. B. & Payne, E. A. (2008). An examination of contextual factors and individual characteristics affecting technology implementation decisions in auditing. *International Journal of Accounting Information Systems*, 9(2), 104-121

Davies, M., Paterson, R. & Wilson, A. (1999). *UK GAAP*. Butterwoth's Toiley

Dembinski, P. H., Lager, C., Cornford, A. and Bonvin, J. (2006). *Enron and World Finance: A Case Study in Ethics*. United State: Palgrave Macmillan

Derek, M. (2006). *A history of auditing: The changing audit process in Britain*. United State: Taylor & Francis

Fitzpatrick, L. (1939). The story of bookkeeping, accounting, and auditing. *Accounting Digest*, 217

Flint, D. (1988). *Philosophy and principles of auditing*. Hampshire: Macmillan Education Ltd

Gul, F., Teoh. H., Andrew, B. & Schelluch, P. (1994). *Theory and practice of Australian auditing* (3rd ed.). Australia: Nelson, An International Thomson Publishing Company

Hasyudeen, N. (2009). *Audit profession-Global Development and Key issues*. Retrieved from Http:www.slideshare.net on 30/10/2015

ICAN (1965). *Institute of Chartered Accountants' Act 1965*


BY NC ND
ISSN 3121-4266
9 773121 426004

Iuliana, L. P. (2012). The Evolution and the Perspectives of the Audit. *International Journal of Academic Research in Business and Social Sciences*, 2(4), 264-280

Janvrin, D., Lowe, D. J., and Bierstaker, J. (2008). Auditor Acceptance of Computer-Assisted Audit Techniques. Working Paper, Iowa State University, Iowa

Jenkiens, B. & Pinkney, A. (1978). *An Audit Approach to Computers: A new practice manual*. The Institute of Chartered Accountants in England and Wales

Kramer, J. (2003). *The CISA Prep Guide: Mastering the Certified Information Systems Auditor Exam*. Indiana: Wiley Publishing Inc

Lanza, R. (1998). Take My Manual Audit, Please!. *Journal of Accountancy*, 33-36

Lee, J. (1986). Government auditing in China. *The Journal of Accountancy*, 62, 190

Lee, T. & Azham, M. A. (2008). The evolution of auditing: An analysis of the historical development. *Journal of Modern Accounting and Auditing*, 4 (12)

Lee, T. (1994). *Corporate audit theory*. London: Chapman & Hall

Leung, P., Coram, P., Cooper, B., Cosserat. G. & Gill.G. (2004). *Modern auditing & assurance service* (2nd ed.). Australia, John Wiley & Sons

Porter, B., Simon, J. & Hatherly, D. (2005). *Principles of external auditing*. John Wiley & Sons, Ltd

Power, M. (1999). *The Audit Society: Rituals of Verification*. Oxford: Oxford University Press

Queenan, J. (1946). The public accountant of today and tomorrow. *The Accounting Review*, 21(3), 254-260

Raffa, P. C. (2003). *Levels of Service*. Electronic version retrieved from http://www.itrevizija.ba/ on 20/12/2015


සාමග්‍රී Unity
ISSN 3121-4266

Salehi, M. (2008). Audit expectation gap: Concept, nature and trace. *African Journal of Business Management*, 5(21), 8376-8392

Salem, M. S. M. (2012). An overview of research on auditor's responsibility to detect fraud on financial statements. *The Global Business Journal of Management*, 8(2), 218-229

Salisu, A. (2011). *Advancement of Accountancy Profession in Nigeria: A Collaborative Effort of Practicing Accountants and the Academia*

Sayana, S. A. (2003). Using CAATTS to Support IS Audit. *Information Systems Control Journal*, 1

Tanko, M. (2011). Audit Expectation Gap: The Trend to Close the Gap in the 21st Century. Research commissioned by *The Institute of Chartered Accountants of Nigeria (ICAN)*

Turley, S. & Cooper, M. (2005). *Auditing in the United Kingdom*. Prentice-Hall International/ICAEW. Englewood Cliffs

Wang, G. Y. (2004). *Accountability and management audit (M)*. (In Chinese). Beijing: China Modern economic publishing house


සාමගි Unity
ISSN 3121-4266
CC BY NC ND